**322 වන කාණ්ඩය - 04 වන කලාපය**
**தொகுதி 322 - இல. 04**
**Volume 322 - No. 04**

**2025 නොවැම්බර් 11වන අඟහරුවාදා**
**2025 நவம்பர் 11, செவ்வாய்க்கிழமை**
**Tuesday, 11th November, 2025**

# පාර්ලිමේන්තු විවාද
## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
## (HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
සභාපති නාමාවලිය [තීරුව 613]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 613]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 617-648]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
2022 අප්‍රේල් මාසයේදී මූල්‍ය බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමේ නීතිමය පදනම [තීරුව 649]

**අනාගත සංවර්ධන ඉලක්ක සහ ණය තිරසරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර:**
මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 656]

**සරල කළ එකතු කළ අගය මත බද්ද අහෝසි කිරීමෙන් අපනයන ක්ෂේත්‍රයට වන බලපෑම:**
මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 660]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [තුන්වන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 664-787]

**කල්තැබීමේ යෝජනාව:**
ත්‍රිරෝද රථ සඳහා විදේශීය සංචාරකයින්ට රියැදුරු බලපත්‍ර නිකුත් කිරීම නතර කිරීම [තීරු 788–800]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
தவிசாளர் குழாம் [ப: 613]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 613]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 617- 648]

**தனி அறிவித்தல் மூல வினா:**
2022, ஏப்பிரலில் நிதி திவால்நிலையை அறிவித்தமைக்கான சட்ட அடிப்படை [ப: 649]

**எதிர்கால அபிவிருத்தி இலக்குகள் மற்றும் கடன் நிலைத்தன்மையை அடைவதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைள்:**
நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 656]

**எளிமைப்படுத்தப்பட்ட சேர்பெறுமதி வரியை ஒழிப்பதால் ஏற்றுமதித் துறையில் ஏற்படும் தாக்கம்:**
நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 660]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட மூன்றாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 664 - 787]

**ஒத்திவைப்புப் பிரேரணை:**
வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகளுக்கு முச்சக்கர வண்டிகளுக்காக சாரதி அனுமதிப்பத்திரம் வழங்குவதை நிறுத்துதல் [ப: 788– 800]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Panel of Chairs [Col. 613]

AUDITOR-GENERAL'S REPORT [Col. 613]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 617-648]

QUESTION BY PRIVATE NOTICE:
Legal Basis of Declaring Financial Bankruptcy in April, 2022 [Col. 649]

MEASURES TAKEN TO ACHIEVE FUTURE DEVELOPMENT GOALS AND DEBT SUSTAINABILITY:
Statement by Deputy Minister of Finance and Planning [Col. 656]

IMPACT OF ABOLITION OF SIMPLIFIED VALUE ADDED TAX ON EXPORT SECTOR:
Statement by Deputy Minister of Finance and Planning [Col. 660]

APPROPRIATION BILL, 2026 - [Third Allotted Day]:
Second Reading - Debate Adjourned [Cols. 664–787]

ADJOURNMENT MOTION:
Termination of Issuance of Driving Licences for Three-wheelers to Foreign Tourists [Cols. 788-800]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

**2025 නොවැම්බර් 11වන අඟහරුවාදා**
2025 நவம்பர் 11, செவ்வாய்க்கிழமை
Tuesday, 11th November, 2025

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### සභාපති නාමාවලිය
### தவிசாளர் குழாம்
### PANEL OF CHAIRS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 143 ප්‍රකාරව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා නම් කරන ලද සභාපති නාමාවලියේ මන්ත්‍රීවරයන් අතරින් ගරු ) ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය සහ ගරු අරවින්ද සෙනරත් මහතා නියෝජ්‍ය අමාත්‍ය ධුරයන්ට පත්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය සහ ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ද ඊට අමතරව, මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ද සභාපති නාමාවලියට ඇතුළත් කිරීමට මවිසින් නම් කර තිබෙන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
ගරු උපුල් කිත්සිරි මහතා
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු සුජීව දිසානායක මහතා

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIV හා XXVI කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ
(ii) 2024 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අම්පාර, ලංකා බැංකුව ඉදිරිපිට, ඩී.එස්. සේනානායක වීදිය, අංක 39/ඒ යන ලිපිනයෙහි පදිංචි ඒ.ඊ. සමරරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු කථානායකතුමනි, කැලණිය, හුංගමගොඩ, ශාන්ත ජෝශප් වත්ත, අංක 435/23 යන ලිපිනයෙහි පදිංචි අරුණ කුමාර පියසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

Hon. Speaker, I present a petition from Mr. M.G. Sarath of No. 217/1/4, Cemetery Road, Pelenwatta, Pannipitiya.

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)

ගරු කථානායකතුමනි, මාතලේ, නාගොල්ල පාර, අංක 40/11 යන ලිපිනයෙහි පදිංචි ඒ.ජී.ආර්.එම්. රයිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු කථානායකතුමනි, රත්නපුර, හිදැල්ලන, දුම්රිය මාවත, ඊරියගහදෙනිය, අංක 35/106 යන ලිපිනයෙහි පදිංචි එල්.කේ. මියුලින් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, කන්ටේනර් 323ක් නිසි පරීක්ෂාවකින් තොරව පිටමං කරපු ආන්දෝලනාත්මක සිද්ධිය සම්බන්ධයෙන් සොයා බැලීමට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, ඔක්තෝබර් මාසයේ 7වැනි දා. ඊට පස්සේ ඔක්තෝබර් මාසයේ 10වැනි දා රැස් වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ඒකට එකඟත්වය ලැබුණා. ඔක්තෝබර් මාසයේ 17වැනි දා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය සම්බන්ධ පරිපූරකයේ දින නියමයක් නොමැති යෝජනාවක් හැටියට ඒක පළ කරලා තිබුණා. මේ පිළිබඳව Parliamentary Business Committee එකේ එකඟත්වය ලැබිලා මාසයක් ඉකුත් වෙලා තිබෙනවා. නමුත්, ඒ කාරක සභාව ස්ථාපිත කරන්න තවම බැරිවෙලා තිබෙනවා. එම නිසා අපි ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, හෙට අනිද්දාම පක්ෂ නායක රැස්වීමක් කැඳවලා ඒ විශේෂ කාරක සභාව පිහිටුවන්න අවශ්‍ය කටයුතු කර දෙන ලෙස.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක No-Date Motions යටතට ඇතුළත් කරලා තිබෙනවා, ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව රැස් වුණාට පස්සේ අපට ඒ සඳහා දින වෙන් කර ගන්න පුළුවන්. අපි රැස්වෙලා ඒ කටයුත්ත කරමු.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම පාර්ලිමේන්තු වරප්‍රසාදවලට සෘජුවම සම්බන්ධ කාරණයක් තමයි මම මතු කරන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ IIIවැනි කොටසේ 4වැනි වගන්තියේ "සෑම මන්ත්‍රීවරයකු විසින් ම මූලික අයිතිවාසිකම්වලට අදාළ නීතිය පිළිපැදිය යුතු අතර ..." යනුවෙන් සඳහන් කර තිබෙනවා. ඒකත් එක්කම 5වැනි වගන්තියේ තිබෙනවා, "සෑම මන්ත්‍රීවරයකු ම සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී පොදුවේ ජාතියේ යහපත සහ විශේෂයෙන් ම සිය ඡන්දදායකයන්ගේ යහපත පිණිස ක්‍රියා කළ යුතු ය" කියලා.

ගරු කථානායකතුමනි, ඊයේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී සභාව පවත්වා ගෙන යාම සහ සභාවේ ක්‍රියාමාර්ග පිළිබඳව තිබෙන ගැටලුවක් මතු කළොත් විතරයි point of Order එකක් තිබෙන්නේ. ඔය කාරණය,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මේකත් වරප්‍රසාදවලට සම්බන්ධයි. මම මේ ආචාර ධර්ම පද්ධතියත් එක්ක කථා කරන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ IIIවැනි කොටසේ 5වැනි

වගන්තියේ බොහොම පැහැදිලිව තිබෙනවා, "සෑම මන්ත්‍රීවරයකු ම සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී පොදුවේ ජාතියේ යහපත සහ විශේෂයෙන් ම සිය ඡන්ද දායකයන්ගේ යහපත පිණිස ක්‍රියා කළ යුතු" ය කියලා. ගරු කථානායකතුමනි, ඊයේ මුළු දවසම මේ රටේ අල ගොවීන්, ලූනු ගොවීන් පාරේ. අවශ්‍ය කරන, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට මේක කියන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක විවාදයක් විධියට ගෙනෙන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට මේක කියන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එය ලිඛිතව ලබා දෙන්න.*] බාධා කිරීමක්]* 29(2)හි සඳහන් වෙනවා, ලිඛිතව ලබා දෙන්න කියලා. ඔබතුමා කරුණාකරලා ලිඛිතව ලබා දෙන්න.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### හමුදාගත බඳවා ගැනීම් යටතේ ත්‍රිවිධ හමුදාවලට බඳවා ගත් පුද්ගලයින්: විස්තර
### இராணுவம் சார்ந்த ஆட்சேர்ப்பின்கீழ் முப்படைகளுக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்டோர்: விபரம்
### PERSONNEL RECRUITED TO TRI-FORCES UNDER DIRECT ENTRY: DETAILS

1119/2025

**1. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) හමුදාගත බඳවා ගැනීම් යන වර්ගීකරණය යටතේ වෘත්තීය රාජකාරි සඳහා මේ වනවිට ත්‍රිවිධ හමුදාවලට බඳවාගෙන ඇති සංඛ්‍යාව එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) ඔවුන් බඳවාගෙන ඇති වෘත්තීන් කවරේද;
(iii) එම වර්ගීකරණය යටතේ ඔවුන් බඳවා ගැනීමට හේතු කවරේද;
(iv) රාජකාරිවලට යෙදවීමේදී, ඉහත වර්ගීකරණය යටතේ බඳවාගන්නා ලද හමුදා සාමාජිකයන් සහ සෙසු හමුදා සාමාජිකයන් අතර වෙනස්කම් තිබේද;
(v) එසේ නම්, ඒවා කවරේද;
(vi) සෙසු හමුදා සාමාජිකයන්ට පරිදිම තනතුරු සහ උසස්වීම්, ඉහත වර්ගීකරණය යටතේ බඳවාගන්නා ලද හමුදා සාමාජිකයන්ටත් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ත්‍රිවිධ හමුදාව ප්‍රතිසංවිධානය කරන්නේ නම්, ඉහත වර්ගීකරණය යටතේ බඳවා ගත් සාමාජිකයන් ඉවත් කරන්නේද;
(ii) ඒ සම්බන්ධයෙන් ගණනය කර තිබේද;
(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;
(iv) ත්‍රිවිධ හමුදා ප්‍රතිසංවිධානය කිරීමේදී ඉවත් කරන, ඉවත් කිරීමට නියමිත සහ විශ්‍රාම ගන්වන හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් පිළිබඳව සාකච්ඡා කර තිබේද;
(v) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இராணுவம் சார்ந்த ஆட்சேர்ப்புகள் என்ற வகைப்படுத்தலின்கீழ் தொழில்சார் கடமை களுக்காக, இன்றளவில் முப்படைகளுக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை ஒவ்வோர் இராணுவப் பிரிவுக்கமைய வெவ்வேறாக யாது என்பதையும்;
(ii) இவர்கள் ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ள தொழில்கள் யாவை என்பதையும்;
(iii) அத்தகைய வகைப்படுத்தலின்கீழ் இவர்கள் ஆட்சேர்ப்புச் செய்யப்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;
(iv) கடமைகளில் ஈடுபடுத்தப்படும்போது, மேற்படி வகைப்படுத்தலின்கீழ் ஆட்சேர்ப்புச் செய்யப் பட்டுள்ள இராணுவ அங்கத்தவர்களுக்கும் ஏனைய இராணுவ அங்கத்தவர்களுக்கும் இடையில் வேறுபாடுகள் உள்ளனவா என்பதையும்;
(v) ஆமெனில், அவை யாவை என்பதையும்;
(vi) ஏனைய இராணுவ அங்கத்தவர்களுக்கு உள்ளது போன்ற பதவிகளும் பதவி உயர்வுகளும், மேற்படி வகைப்படுத்தலின்கீழ் ஆட்சேர்ப்புச் செய்யப்படுகின்ற இராணுவ அங்கத்தவர் களுக்கு வழங்கப்படுகின்றனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) முப்படை மறுசீரமைக்கப்படுமாயின், மேற்படி வகைப்படுத்தலின்கீழ் ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ள அங்கத்தவர்கள் நீக்கப் படுவார்களா என்பதையும்;
(ii) அது சம்பந்தமான கணக்கெடுப்பு மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;
(iii) ஆமெனில், அந்த எண்ணிக்கை யாது என்பதையும்;
(iv) முப்படை மறுசீரமைக்கப்படும்போது நீக்கப் படுகின்ற, நீக்கப்படவுள்ள மற்றும் ஓய்வெடுக்கச் செய்யப்படுகின்ற இராணுவ அங்கத்தவர்கள் சம்பந்தமான வேலைத்திட்டம் பற்றி கலந்துரையாடப்பட்டுள்ளதா என்பதையும்;

[ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා]

(v) ஆமெனில், அந்த வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the number of personnel who have been recruited to the Tri-forces for professional duties under direct entry by now for each Force, separately;

(ii) the professions into which they have been recruited;

(iii) the reasons for recruiting them under that classification;

(iv) whether there are differences between military personnel recruited under the above classification and other military personnel in deploying to perform duties;

(v) if so, those differences; and

(vi) whether military personnel recruited under the above classification are given the same ranks and promotions as other military personnel?

(b) Will he also inform this House -

(i) whether the personnel recruited under the said classification will be removed, if the Tri-forces are reorganized;

(ii) whether a count has been taken regarding it;

(iii) if so, that count;

(iv) whether a discussion has occurred regarding a programme about the military personnel who would be removed, scheduled to be removed and sent on retirement during such reorganization; and

(v) if so, such programme?

(c) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) මේ වනවිට යුද්ධ හමුදාවේ 9,970ක්ද, නාවික හමුදාවේ 6,144ක් හා ගුවන් හමුදාවේ 471ක් ලෙස බඳවාගෙන ඇත.

(ii) ත්‍රිවිධ හමුදාවේ අවශ්‍යතා මත ඉදිකිරීම්, කාර්මික හා කෘෂි කාර්මික ක්ෂේත්‍රයට අදාළ වෘත්තීන් ඇතුළත්ව ගබඩාකරු**වන්,** පරිගණක ක්‍රියාකරුවන්, රියදුරු රාජකාරි සඳහා හමුදාගත පදනම මත බඳවා ගෙන ඇති අතර එහි සවිස්තරාත්මක විස්තරය **පහත දක්වා ඇත.** විශේෂයෙන්ම වායුසමීකරණ ශිල්පීන්, යාන්ත්‍රික ඉංජිනේරු (නැව්බද), ගුවන් යානා ඉංජිනේරු වැනි අය ජාතික වශයෙන් විශාල මට්ටමේ වැඩ කටයුතු කරමින් සිටින අය. ඒ අනුකූලව කටයුතු කර තිබෙනවා.

| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | |
|---|---|---|---|---|
| | | | නිලධාරින් / නිලධාරිනියන්ගේ වෘත්තින් | ගුවන් භට/ ගුවන් කාන්තාවන්ගේ වෘත්තීන් |
| 1. ඉදිකිරීම් වෘත්තීය රාජකාරි | 1. වායුසමීකරණ යන්ත්‍ර ශිල්පී | 24. යාන්ත්‍රික ඉංජිනේරු (නැව්බද) | 1. ගුවන් යානා ඉංජිනේරු | 1. වැඩමූලික |
| 2.කෘෂිකාර්මික වෘත්තීය රාජකාරි | 2. ශීතණමකරණ | 25. මේසන්කරු | 2. පරිපාලන | 2. සැලසුම් ශිල්පි |
| 3. වෙනත් වෘත්තීය රාජකාරි (පරිපාලන සහායක/ ගබඩාකරු/ පරිගණක ක්‍රියාකර/ රියදුරු ආදී රාජකාරි සඳහා | 3. කෘෂි ව්‍යාපෘති | 26. මාධ්‍ය අංශය | 3. විද්‍යුත් හා විදුලි සංදේශ | 3. ප්‍රමාණ සමීක්ෂණ |
| | 4. ඇලුමිනියම් නිෂ්පාදන | 27. වෛද්‍ය අංශය | 4. සැපයුම් | 4. ගහන ගුවන් විදුලි තාක්ෂණික ශිල්පි |
| | 5. ඇලුමිනියම් වැඩ | 28. පින්තාරුකරු | 5. වෛද්‍ය | 5. විදුලි සන්නිවේදන තාක්ෂණික ශිල්පි |
| | 6. වාදක | 29. ජලනල කාර්මික | 6. නීති | 6. විගණන සහායක |
| | 7. කම්බි නැවුම්කරු | 30. රූකඩකරු | 7.තොරතුරු තාක්ෂණ ඉංජිනේරු | 7. පරිගණක තාක්ෂණ ශිල්පි |
| | 8. රූපලාවන්‍ය කටයුතු | 31. ගුවන් විදුලි කාර්මික | 8. අධ්‍යාපන | 8. කම්හල් හා පැස්සුම් ශිල්පි |
| | 9. පොත් බඳින්නන් | 32.ගුවන් විදුලි කුලුණු නඩත්තුකරු | 9. සිවිල් ඉංජිනේරු | 9. රථවාහන කාර්මික ශිල්පි |
| | 10. වඩු වැඩ | 33. මාර්ග නඩත්තුකරු | 10. කෘෂි | 10.ඉදිකිරීම් උපකරණ තාක්ෂණික ශිල්පි |
| | 11. සිවිල් ඉංජිනේරු ශිල්පි | 34.කරණවැමි හල රාජකාරි | 11. පශු වෛද්‍ය | 11.භෝජනගාර භාරකරු |
| | 12. සිමෙන්ති ගල් පින්තාරුකරු | 35. නාවික මැහුම්හල් රාජකාරි | 12. විගණන | 12. අධ්‍යාපන සහායිකා |
| | 13.සූපවේදී | 36. අකුරුකරු | 13.ප්‍රාසාංගික කලා | 13. රූපලාවන්‍ය සහායිකා |
| | 14.කුෂන් වැඩ | 37. ක්‍රීඩා | 14. දන්ත වෛද්‍ය | 14. හෙද සහායක |
| | 15.සරඹ උපදේශක | 38. ලසුලේඛිකා | | |
| | 16.විදුලි කාර්මික | 39. භෝජනවේදී | | |
| | 17.ෆයිබර් වැඩකරු | 40. පෙර පාසල් ගුරුවරු | | |
| | 18.පොම්පකරුවන් | 41. ටයර්කරු | | |
| | 19තොරතුරු තාක්ෂණ | 42. ප්‍රවාහන සහායක | | |
| | 20.බුද්ධි අංශය | 43. වාහන විදුලි කාර්මික | | |
| | 21. පට්ටල යන්ත්‍රකරු | 44. වෑද්දුම්කරු | | |
| | 22. යාන්ත්‍රික ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු) | 45. ලිපිකරු | | |
| | 23. යාන්ත්‍රික ඉංජිනේරු (කර්මාන්ත) | 46. පොදු රාජකාරි (පිළිගැනීමේ නිලධාරිනි, සේවා වනිතා කටයුතු) | | |

(iii) වෘත්තීය සුදුසුකම් ඇති අය බඳවා ගැනීමේදී වෘත්තීය පුහුණු කරවීම සඳහා වැය කරන මුදල අවම කර ගැනීමට හා වෘත්තීය සේවා පුද්ගලයෙකු බිහි කිරීමට ගතවන කාලය ඒ වාගේම ශ්‍රමය ඉතිරි කර ගනිමින් රාජකාරි අවශ්‍යතාව මත ජාතික ආරක්ෂාව සහ ජාතිය ගොඩනැඟීමේ ක්‍රියාවලියට අත්වැලක් ලබා දීම සඳහා කෙටි කාලයක් තුළදී සක්‍රිය දායකත්වයක් ලබා ගැනීම අරමුණු කරගනිමින් ඔවුන් බඳවාගෙන තිබෙනවා. ඒ වාගේම පරිපාලන කටයුතු ක්‍රමවත්ව සපුරා ලීම ශ්‍රම බලකාය පවත්වාගෙන යාම සඳහා ද එය ඉතාම පිටුවහල් වෙනවා. වෘත්තීය මට්ටම ලෙස NVQ Levels 03, 04, 05 සහ ඩිප්ලෝමා වැනි සුදුසුකම් සපුරා ඇති පිරිසක් කෙටි කාලයක් තුළදී හමුදාවන් සඳහා සක්‍රීය දායකත්වයක් ලබා ගැනීම.

(iv) ඔව්.

(v) හමුදාගත පදනම මත බඳවා ගනු ලබන පුද්ගලයන් විශේෂ වූ වෘත්තීන්ට අදාළ රාජකාරි සඳහා බඳවා ගනු ලබන අතර ඔවුන්හට අනෙකුත් හමුදා සෙබළුන්ට ලබාදෙන ආකාරයේ හමුදා පුහුණුවීමක් හෝ අවිපුහුණුව ලබා දීමක් සිදු නොකරයි. එහෙත් හමුදා අවශ්‍යතාව මත සති දෙකක පමණ හැඩගැස්වීමේ පුහුණුවක් ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව බඳවා ගෙන ඇති වෘත්තීය සහ පාලන රාජකාරි සඳහා පමණක් සේවයේ යොදවනවා.

(vi) මෙම හමුදාගත පදනම මත බඳවා ගන්නා අය සඳහා පහත සඳහන් පරිදි එක් එක් හමුදාවන්ට අදාළ වන පරිදි නිල උසස්වීම් ලබා දීම සිදු කෙරේ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - අදාළ වෘත්තීය පරීක්ෂණය සමත් වීම හා නිලයට සරිලන සේවා කාලය සම්පූර්ණ වීම සලකා බලා, ඒකක සංස්ථාවේ ඇබෑර්තු මත සැරයන් නිලය දක්වා පමණක් උසස් කරනු ලැබේ.

ශ්‍රී ලංකා නාවික හමුදාව - බඳවා ගනු ලබන නිලයේ සිට වසර 5කට වරක් ඊළඟ නිලයට උසස්වීම් ලබා දෙනු ලබයි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව - බඳවා ගනු ලබන නිලයට අනුව නිලයේ සම්පූර්ණ කළ යුතු කාල සීමාවෙන් පසු නිල උසස්වීම් සඳහා විශේෂ ක්‍රමවේදයක් යටතේ නිල උසස්වීම් ලබා දෙනු ලබයි.

හමුදාගත පදනම මත බඳවා ගනු ලබන පිරිස සඳහා ත්‍රිවිධ හමුදාවන්ට අදාළ උසස්වීම් ලබා දීමේ ක්‍රියා පටිපාටිය පහත සඳහන් පරිදි වේ.

| නිලය | උසස්වීම් ලබා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු අවම සේවා කාලය | | |
|---|---|---|---|
| | සාමාන්‍ය බඳවා ගැනීම | බඳවා ගැනීම් (Direct Entry) | |
| | | නායක ගුවන් භට (Direct Entry) | තාවකාලික කෝප්‍රල් (Direct Entry) |
| නායක ගුවන් භට නිලයේ සිට තාවකාලික කෝප්‍රල් නිලය දක්වා | 06 | 4 ½ | අදාළ නැත |
| තාවකාලික කෝප්‍රල් නිලයේ සිට ස්ථිර කෝප්‍රල් නිලය දක්වා | 08 | 6 ½ | 04 |
| ස්ථිර කෝප්‍රල් නිලයේ සිට තාවකාලික සැරයන් නිලය දක්වා | 11 | 9 ½ | 07 |
| තාවකාලික සැරයන් නිලයේ සිට ස්ථිර සැරයන් නිලය දක්වා | 13 | 11 ½ | 09 |
| ස්ථිර සැරයන් නිලයේ සිට තාවකාලික බලපත්‍රි සැරයන් නිලය දක්වා | 15 | 13 ½ | 11 |
| තාවකාලික බලපත්‍රි සැරයන් නිලයේ සිට ස්ථිර බලපත්‍රි සැරයන් නිලය දක්වා | 17 | 15 ½ | 13 |
| ස්ථිර බලපත්‍රි සැරයන් නිලයේ සිට තාවකාලික බලලත් නිලධාරි නිලය දක්වා | 18 | 16 ½ | 14 |
| තාවකාලික බලලත් නිලධාරි නිලයේ සිට ස්ථිර බලලත් නිලධාරි නිලය දක්වා | 19 | 17 ½ | 15 |
| ස්ථිර බලලත් නිලධාරි නිලයේ සිට ප්‍රධාන බලලත් නිලධාරි නිලය දක්වා | 20 | 18 ½ | 16 |

(ආ) (i) මේ වන විට ත්‍රිවිධ හමුදා ප්‍රතිසංවිධානය ඉතා සැලසුම් සහගත ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරමින් පවතින අතර, හමුදාගත පුද්ගලයන් ඉවත් කිරීම සඳහා කිසිදු තීරණයක් ගෙන නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) ත්‍රිවිධ හමුදා ප්‍රතිසංවිධානය කිරීමේ ක්‍රියාවලිය කාලයට ගැළපෙන පරිදි සකස් කිරීමට කටයුතු කරමින් ඇත. එනමුදු, ප්‍රශ්නයේ සඳහන් පරිදි එම ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය තුළින් දැනට සේවයේ සිටින හමුදා සාමාජිකයන් ඉවත් කිරීමක් හෝ විශ්‍රාම ගැන්වීමක් ගැන කිසිදු තීරණයකට එළැඹී නැති බව ප්‍රකාශ කරමි. නියමිත කාලය සපුරා ඉදිරියේදී විශ්‍රාම යාමට නියමිත සහ දැනට විශ්‍රාම ගොස් සිටින හමුදා සාමාජිකයන්ගේ හැකියාවන්, ඒ වාගේම ඔවුන්ගේ නිපුණතා අනුව ඔවුන් ජාතික ආර්ථිකයට බද්ධ කර ඵලදායී සේවයක් රටට ලබා ගැනීමේ විධිමත් වැඩ පිළිවෙළක් සැකසීමේ කටයුතු ආරම්භ කර ඇත. ඒ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර, මූලික අදියරයන් මේ වන විටත් ආරක්ෂක අමාත්‍යාංශය ආරම්භ කර ඇති බව සඳහන් කරමි.

(v) ආරක්ෂක හමුදා ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් මෙතෙක් සාකච්ඡාවට බඳුන් කර ඇති හා ගෙන ඇති ක්‍රියාමාර්ග අනුව ස්වකීය සේවා කාලය සම්පූර්ණ කර විශ්‍රාම යන සහ මේ වන විටත් විශ්‍රාම ගොස් සිටින ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ව ව්‍යවසායකයන් ලෙස පුහුණු කර රටේ ආර්ථිකයට බද්ධ කිරීමේ වැඩසටහනක් කලින් මා සඳහන් කළ පරිදි කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ආරම්භ කිරීමට කටයුතු කර තිබෙනවා. එහිදී අපි විශේෂයෙන්ම සංකල්පයක් හැටියට "Mission Reboot" යන නමින් හැඳින්වූ නියමු ව්‍යාපෘතියක් - pilot project එකක් - සැලසුම් කර

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේක මහතා]

තිබෙනවා. ඊට අවශ්‍ය හමුදා පිරිස් තෝරා ගැනීම සඳහා මේ වන විටත් සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන්. ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ සහයෝගය මත මූලික සම්මුඛ පරීක්ෂණයට භාජන වූ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් හට ඔවුන් තෝරාගත් ව්‍යවසායකත්ව ක්ෂේත්‍ර මත මනා පුහුණුවක් ලබා දීමේ කටයුතු සකසමින් පවතිනවා. ඒ වාගේම එම පුහුණුව ඉදිරි කාලය තුළ ආරම්භ කිරීමට කටයුතු කරන බවත් මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැතියි. මෙම වැඩ පිළිවෙළ ඉදිරි අවුරුදු දෙකකට තමයි ඉලක්ක කර තිබෙන්නේ. ඒ සඳහා දැනුවත් කිරීම්, පිරිස් හඳුනා ගැනීම්, වැඩසටහන් සැකසීමේ කටයුතු පිළිබඳ සැලසුම් මේ වන විටත් සකස් කරමින් පවතිනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, හමුදාගත විශේෂ බඳවා ගැනීම් යටතේ ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කර තිබෙන පුද්ගලයින් සහ ත්‍රිවිධ හමුදාවල සේවය කරන රණවිරුවන් විශ්‍රාම යන්නේ තමන්ගේ ජීවිතයේ අඩු වයස් කාලයක් තුළදී. ඒ කියන්නේ වයස අවුරුදු 40දී, 42දී. එතකොට මේ අය හමුදාවේ සේවය කළ කාලය තුළ අදාළ හමුදාවලින් ලබා දෙන පාඨමාලා මඟින් විවිධ වෘත්තීය දක්ෂතාවක්, එහෙම නැත්නම් නිපුණතාවක් ලබා ගන්නවා.

එසේ ලබාගෙන විශ්‍රාම යන සියලුදෙනා, ඒ කියන්නේ හමුදාගත බඳවා ගැනීම් සහ හමුදාවේ ඉන්න සියලුදෙනා විශ්‍රාම යැමේදී ව්‍යවසායකත්වය සඳහා යොමු වීමට කැමැති වෙන්නේ නැහැ. ඒ නිසා මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් දැනගන්න කැමැතියි, එහෙම ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අකැමැති හමුදාගත සාමාජිකයන් විශ්‍රාම යැමේදී ඔවුන් ලබාගෙන ඇති හැකියාවන් සහ නිපුණතාවන් වැඩිදියුණු කර රැකියාවලට යොමු කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් මේ වන විට යම් සලකා බැලීමක් කර තිබෙනවාද කියලා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඔව්, ඇත්තටම ඔවුන්ගේ නිපුණත්වයන්, වෘත්තීය මට්ටමේ හැකියාවන් විවිධාකාරයි. හැබැයි, කැමැත්තක් හෝ අකැමැත්තක් නොදක්වන අයවලුන්ට පමණක් නොවෙයි, හමුදාවේ සියලු සාමාජිකයන් විශ්‍රාම යනකොටත්, ඒ වාගේම විශ්‍රාම ගිය අයත් ඉලක්ක කරගනිමින් තමයි අපි මේ සලකා බැලීම් කර තිබෙන්නේ.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, එහෙම හඳුනාගෙන තිබෙන වැඩ පිළිවෙළ සම්බන්ධව දැනුවත් කිරීමක් කරන්න පුළුවන්ද කියලා ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, වෘත්තීමය වශයෙන් බඳවා ගත් අය අතර විවිධාකාර හැකියාවන් තිබෙන ගොඩක් අය සිටිනවා. ඒ නිසා ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට වෘත්තීය පුහුණුවත් සමඟ NVQ සහතිකයකුත් ලබා දීමේ විශේෂ වැඩ පිළිවෙළක් සම්බන්ධව ත්‍රිවිධ හමුදා මට්ටමින් දැනට අපි සාකච්ඡා කරලා කරගෙන යනවා. ඒ කියන්නේ, ත්‍රිවිධ හමුදාවේ අය විවිධ ක්ෂේත්‍රයන්හි රාජකාරිවල යෙදීමේදී ලබා ගත් පළපුරුද්ද, ඔවුන්ගේ අත්දැකීම්, ඔවුන්ගේ හැකියාවන් සහ ඔවුන්ට විටින් විට ලබා දුන් පුහුණුවීම් නිසා ඔවුන්ගේ නිපුණතා වාගේම කුසලතා ද අනෙකුත් සිවිල් පුද්ගලයන් හා සම මට්ටමක තිබෙනවා.

වසර ගණනක සේවය තුළින් ඔවුන්ගේ ඒ හැකියාවන් අපි හඳුනාගෙනත් තිබෙනවා. ඒ නිපුණතා සහ කුසලතාවලට ජාතික හා වෘත්තීමය මට්ටමේ පරිසාධන මට්ටම දක්වා වටිනාකමක් ලබා දීම සඳහා ඉදිරියේදී අපි කටයුතු කරනවා. එම කටයුත්ත ඉතා පුළුල්ව ආරම්භ කිරීමට අපේ වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය ගරු නලින් හේවගේ මැතිතුමා සහ අපේ ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාගේ සහභාගිත්වයෙන් අපි සාකච්ඡාවක් පැවැත්වූවා. එහිදී අදාළ අමාත්‍යාංශ දෙකයි, වෘත්තීය පුහුණු අධිකාරියයි, අපේ ආරක්ෂක අමාත්‍යාංශයයි සම්බන්ධ කරමින් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළා. එය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ අපි විශේෂයෙන් සංකල්පගත කළා, "රණවිරු ව්‍යවසායක අභිමන්" කියලා. අපි පසුගිය දවසක මාධ්‍ය සාකච්ඡාවක් තියලා ඒ ගැන ප්‍රචාරය කළා. එම තේමාව යටතේ ක්ෂේත්‍ර 28ක් අපි හඳුනාගෙන තිබෙනවා. එම ක්ෂේත්‍ර 28 ඉලක්ක කරගෙන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් අපි සැලසුම් කරමින් පවතිනවා. එමඟින් ඔවුන් අපේ රටේ ශ්‍රම බලකායට බද්ධ කිරීමට කටයුතු කළ හැකි බවට තමයි අපේ විශ්වාසය තිබෙන්නේ. මෙම වැඩ පිළිවෙළ තුළින් වැඩදායී, ඵලදායී ශ්‍රමිකයන් ජාතික ආර්ථිකයට බද්ධ කර ගැනීමේ හැකියාවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -1182/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## පූන්තෝට්ටම් කර්මාන්තපුරයේ ඉඩම්: වර්තමාන තත්ත්වය

## பூந்தோட்டத்திலுள்ள கைத்தொழில் பேட்டையிலுள்ள காணித் துண்டுகள்: தற்போதைய நிலை

## LAND PLOTS AT INDUSTRIAL PARK IN POONTHOTTAM: CURRENT STATUS

1315/2025

**3. ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වවුනියාව, පූන්තෝට්ටම් ප්‍රදේශයේ අංක 1458 යටතේ ලියාපදිංචි කර්මාන්ත පුරයක් ඇති බවත්;

(ii) එහි සමහර ඉඩම් කැබලි වල් බිහිවී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම කර්මාන්ත පුරයේ ඇති මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් කැබලි අතරින් ව්‍යවසායකයන්ට ලබා දී ඇති සහ මේ දක්වා ව්‍යවසායකයන්ට ලබා දී නොමැති ඉඩම් කැබලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට ව්‍යවසායකයන්ට ලබා දී ඇති ඉඩම් අදාළ අරමුණු සඳහා භාවිත කරන්නේද;

(iv) ව්‍යවසායකයන්ට ලබා දී ඇති නමුත්, මේ දක්වා භාවිතයට ගෙන නොමැති ඉඩම් කැබලි වෙනත් ව්‍යවසායකයන්ට ලබා දිය හැකිද;

(v) එසේ නම්, එලෙස ලබා දිය හැකි ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(vi) ස්වකීය අරමුදල් යොදා ගනිමින් එම කර්මාන්ත පුරය විසින් අවසන් වරට ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන කවරේද;

(vii) එම කර්මාන්ත පුරය උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா, பூந்தோட்டம் பிரதேசத்தில் இல.1458 இன் கீழ் பதிவுசெய்யப்பட்ட ஒரு கைத்தொழில் பேட்டை உள்ளது என்பதையும்;

(ii) அதில் ஒருசில காணித் துண்டுகள் காடாக மாறியுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கைத்தொழில் பேட்டையிலுள்ள மொத்தக் காணித் துண்டுகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி காணித் துண்டுகளில் தொழில் முயற்சியாளர்களுக்கு வழங்கப்பட்டுள்ள மற்றும் இதுவரை தொழில் முயற்சியாளர்களுக்கு வழங்கப்படாதுள்ள காணித் துண்டுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iii) தற்போது தொழில் முயற்சியாளர்களுக்கு வழங்கப்பட்டுள்ள காணிகள் உரிய நோக்கங்களுக்காகப் பயன்படுத்தப்படுகின்றனவா;

(iv) தொழில் முயற்சியாளர்களுக்கு வழங்கப் பட்டுள்ள போதிலும், இதுவரை பயன்படுத்தப் படாதுள்ள காணித் துண்டுகளை, பிற தொழில் முயற்சியாளர்களுக்கு வழங்க முடியுமா;

(v) ஆமெனில், அவ்வாறு வழங்கக்கூடிய காணித் துண்டுகளின் எண்ணிக்கை யாது;

(vi) தமது நிதியைப் பயன்படுத்தி, மேற்படி கைத்தொழில் பேட்டையால் இறுதியாக அமுல் படுத்தப்பட்ட அபிவிருத்தி நிகழ்ச்சித்திட்டங்கள் யாவை;

(vii) மேற்படி கைத்தொழில் பேட்டை உச்சளவு ஆற்றலுடன் இயங்கி வருகிறதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Is he aware that -

(i) there is an industrial park registered under No. 1458 in the Poonthottam area of Vavuniya; and

(ii) some plots of land of it are in a derelict condition?

(b) Will he inform this House -

(i) the total number of plots of land in the said industrial park;

(ii) the number of plots of land that have been granted to entrepreneurs and the number that remain unallocated, separately out of the plots of lands referred to above;

(iii) whether the lands that have been granted to entrepreneurs so far are being utilized for their intended purposes;

(iv) whether the plots of land that remain unutilized, despite being granted to entrepreneurs, can be granted to other entrepreneurs;

(v) if so, the number of plots of land that can be granted as such;

(vi) the last development programme implemented by the said industrial park using its own funds; and

(vii) whether the said industrial park is operating at maximum capacity?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) වවුනියාව පූන්තෝට්ටම් ප්‍රදේශයේ අක්කර 10ක භූමි භාගයක පූන්තෝට්ටම් කර්මාන්තපුරයක් ඉදි කර ඇත. (පිඹුරුපත් අංක 66) එම කර්මාන්තපුරයේ 1452 සිට 1509 දක්වා ලකුණු කරන ලද බිම් කොටස් 65කින් සමන්විත වී ඇත. ඒ අනුව 1458 යනු පූන්තෝට්ටම් කර්මාන්තපුරයේ ඇති එක් බිම් කොටස් කැබැල්ලක අංකයකි.

(ii) කර්මාන්තපුරයක් ආරම්භයේදී එම භූමියේ කැලෑ ප්‍රදේශය සම්පූර්ණයෙන් එළි පෙහෙළි කර ඉඩම් කට්ටි කිරීම සිදු කරනු ලබන අතර, එසේ එළි පෙහෙළි කරන ලද ඉඩම් කොටස් නව ආයෝජකයින්ට ලබා දීම සිදු කරනු ලබයි. දැනට හිස්ව පවත්නා ඉඩම් කොටස්වල හා කර්මාන්ත සිදු නොකරන ඉඩම් කොටස්වල වල් බිහිවීමක් සිදු වුවද, එම ඉඩම් කොටස් නව ආයෝජකයින්ට ලබා දීමෙන් අනතුරුව ඔවුන් විසින් එළි පෙහෙළි කර ගනු ඇත. එසේම කර්මාන්තය පවත්වාගෙන යනු ලබන කර්මාන්ත හිමියන්ගේ ඉඩම් කොටස්වල පවා විශාල පරිමාණයේ ගස් සෙවණ සඳහා ඉතුරු කර ඇත. ඊට අමතරව කර්මාන්තපුරයේ මාර්ගය දෙපස ඇති තණ කොළ කපා මසකට වරක් පිරිසිදු කිරීම සිදු කරනු ලබයි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ආ) (i) පූන්තෝට්ටම් කර්මාන්තපුරය ඉඩම් කැබලි 65කින් සමන්විත වේ.

(ii) කර්මාන්ත හිමියන් 19දෙනෙකු සඳහා මේ වනවිට ඉඩම් කොටස් 50ක් ලබා දී ඇති අතර, තවත් ඉඩම් කොටස් 13ක් හිස්ව පවතී. කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ කටයුතු සඳහා ඉඩම් කොටස් 02ක් වෙන් කර ඇත.

(iii) මේ වනවිට පූන්තෝට්ටම් කර්මාන්තපුරයේ ඉඩම් කොටස් ලබා දුන් කර්මාන්ත හිමියන් 03දෙනෙකු හැරෙන්නට ඉතුරු සියලු කර්මාන්ත හිමියන් සාර්ථකව කර්මාන්ත පවත්වාගෙන යනු ලබයි.

(iv) පූන්තෝට්ටම් කර්මාන්තපුරයේ ඉඩම් කොටස් ලබා දුන් ව්‍යවසායකයින් අතරින් ව්‍යාපාර කටයුතු සිදු නොකරන කර්මාන්ත හිමියන්ට අයත් ඉඩම් කොටස් අවලංගු කර නව ව්‍යවසායකයින්ට ලබා දීමේ හැකියාව ඇත. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(v) දැනට හිස්ව පවතින ඉඩම් කැබලි 13 නව ව්‍යවසායකයින්ට ලබා දීම සිදු කළ හැක. ඊට අමතරව දැනට කර්මාන්ත නොකරන කර්මාන්ත හිමියන් කිහිපදෙනෙකුගේ ඉඩම් කොටස් අවලංගු කර නව ව්‍යවසායකයින්ට ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(vi) පූන්තෝට්ටම් කර්මාන්තපුරයේ අවසන් වරට සංවර්ධන වැඩසටහන සිදු කරනු ලැබුවේ 2020 හා 2021 වර්ෂ තුළදීය.

කර්මාන්ත ජනපදයේ නිෂ්පාදන කටයුතු සඳහා ප්‍රමාණවත් විදුලි ධාරිතාවක් නොමැති ගැටලුවට පිළියමක් ලෙස 2020 වර්ෂයේදී 400KVA නව තාරාපැවියක් -transformer- මිලියන 2.5ක වියදමක් දරා සවි කරන ලදී.

එසේම 2021 වසර තුළදී කර්මාන්තපුරයේ මායිම් වැට ඉදිකිරීම මිලියන 2.5ක වියදමකින් සිදු කරන ලදී.

(vii) පූන්තෝට්ටම් කර්මාන්තපුරයේ උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර දැනට පවතින හිස් බිම් කොටස් කැබලි 13 සඳහා ද නව කර්මාන්තකරුවන් 03දෙනෙකු ඉල්ලුම් කර ඇති බැවින් ඔවුන්ටද හිස් බිම් කොටස් පවරා දීමෙන් අනතුරුව කර්මාන්තපුරය උපරිම ධාරිතාව කරා ළඟා වීමට හැකියාව පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, இன்னும் 13 காணித் துண்டுகள் கொடுப்பதற்கு இருப்பதாக பதிலில் கூறப்பட்டது. ஆனால், சில தொழில் முயற்சியாளர்கள் கூறுகின்றார்கள், தாங்கள் விண்ணப்பித்தும் தங்களுக்கு இந்தக் காணித் துண்டுகள் கிடைக்கவில்லை என்று. எனவே, இந்த விடயம் தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் கூடுதல் கவனம் செலுத்தி, தொழில் முயற்சியாளர்களுக்கு இக்காணித் துண்டுகளை விரைவாகக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இந்தக் காணித்துண்டுகளில் காடு வளர்ந்திருப்பதால், அதனைச் சுற்றிவர இருக்கின்ற குடியிருப்பாளர்களுடன் பிரச்சினை ஏற்பட்டு இருக்கின்றது. எனவே, விரைவாக அந்த 13 பேரையும் அடையாளப்படுத்தி, அந்தக் காணித் துண்டுகளைக் கொடுத்தால் பிரயோசனமாக இருக்கும். அதற்குரிய நடவடிக்கைகளை விரைவாகச் செய்வதற்குரிய ஏற்பாடுகள் ஏதும் இருக்கின்றதா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ගරු කථානායකතුමනි, ලබා දුන් පිළිතුර තුළත් මේ කාරණය අන්තර්ගත වුණා. සමහර ඉඩම් කැබලි බෙදා දෙන්නත්, දැනට කර්මාන්ත ආරම්භ නොකරපු ඒවා අලුත් ව්‍යවසායකයන්ට ලබා දෙන්නත් කටයුතු කරමින් පවතින බව තමයි අමාත්‍යාංශය දැනුම් දීලා තිබෙන්නේ.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ அமைச்சர் அவர்களே, சிலர் அந்தக் காணித் துண்டுகளை எடுத்து, வியாபார நோக்கில் subleaseக்குக் கொடுத்திருக்கிறார்கள். அந்தக் காணித் துண்டுகளை எடுத்தவர்கள் அதில் தொழில்முயற்சிகளைச் செய்கிறார்கள் இல்லை. அதேபோல், கைத்தொழில் பேட்டைகளும் மாற்றீடு செய்யப்படுகின்றன. அவை எந்த நோக்கத்துக்காகக் கொடுக்கப்பட்டதோ, அந்த நோக்கம் அங்கு நிறைவேறாமல், வேறு கைத்தொழில்கள் மேற்கொள்ளப்படுகின்றன. பரவாயில்லை! ஆனால், மேற்குறித்த காணித் துண்டுகளில் அவற்றைப் பெற்றுக்கொண்ட தொழில்முயற்சியாளர்கள் தொழில்முயற்சிகளைச் செய்யாமல் அவற்றை subleaseக்குக் கொடுத்திருக்கிறார்கள். எனவே, அந்தக் காணித் துண்டுகளை அவர்களிடமிருந்து பெற்று, தொழில்முயற்சியாளர்களுக்கே கொடுப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்தால்தான் நல்லது. எனவே, அதனையும் செய்வதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමාට ඉදිරිපත් කරලා, ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්න කියලා මම දැනුම් දෙන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ස්ථාවර නියෝග 29(2) යටතේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මට විනාඩි දෙකතුනක් ලබා දෙන්න. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිපදින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ 5වන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "සෑම මන්ත්‍රීවරයකු ම සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී පොදුවේ ජාතියේ යහපත සහ විශේෂයෙන්ම සිය ඡන්දදායකයන්ගේ යහපත පිණිස ක්‍රියා කළ යුතු ය."

ගරු කථානායකතුමනි, මේ දවස් ටිකේම - ඊයේත් - අල ගොවියෝ වාගේම ලූනු ගොවියෝ පාරේ. ඒ වාගේම ආර්ථික මධ්‍යස්ථානවල වැඩ කෙරෙන්නේ නැහැ. ඒවාට මේ වනතුරු බඩු ඇවිල්ලා නැහැ. මම අද උදේ ගිහිල්ලා ඒවා check කළා. ආර්ථික මධ්‍යස්ථාන ඇතුළේ විශාල වශයෙන් බඩු නැහැ, ගරු කථානායකතුමනි. ඒ සම්බන්ධව ගොවීන් දිගින් දිගටම උද්ඝෝෂණ කළා. ඒ වාගේම වී ගොවීන්ට නිසි මිලක් ලැබුණේ නැහැ. රුපියල් 100ට අඩුවෙන් තමයි වී කිලෝවක් අළෙවි වුණේ. ගරු කථානායකතුමනි, අල ගොවීන් අල ගලවන කාලය වෙනකොට විශාල වශයෙන් පිට රටින් අල ගෙනාවා. ඒ වාගේම ලූනු ගෙනාවා.

පොල්වල ප්‍රමාණය මනින්න එපා කියපු ආණ්ඩුවට දැන් සිද්ධ වෙලා තිබෙනවා, ලූනු ගොවීන්ගේ ලූනුවල ප්‍රමාණය මනින්න. ගරු කථානායකතුමනි, මේ ක්‍රියාදාමයත් එක්ක මේ රටේ ගොවි ජනතාව පාරට බැහැලා බොහොම පැහැදිලිව කියන්නේ මොකක්ද? මේ රටේ කෘෂිකර්ම ඇමතිට ඉවත් වෙන්න කියනවා, නියෝජ්‍ය ඇමතිට ඉවත් වෙන්න කියනවා, ඊළඟට වෙළඳ ඇමතිට ඉවත් වෙන්න කියනවා, ඒ බලතල ජනාධිපතිතුමාට පවරා ගන්න කියනවා. අපට බොහොම පැහැදිලිව පෙනෙන දෙයක් තමයි, මේ ඇමතිවරු අතින් මේ කාර්යභාරය හරියට කෙරෙන්නේ නැති හින්දා තමයි මේ ගොවීන් පාරට බැහැලා "ඉවත් වනු" කියලා කියන්නේ. එම නිසා මා අහන්න කැමැතියි, අල ගොවීන්ට, ලූනු ගොවීන්ට නිසි සාධාරණ මිලක් ලබා දීම සඳහා මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා. කරුණාකරලා එය පැහැදිලි කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණය ඔබතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]*

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඇමතිතුමාත් උත්තරයක් ලබා දේවි. මේ දින 26 පුරාම මේ විවාදය පැවැත්වෙනවා. ආර්ථිකය ගැන නේ විවාද කරන්නේ. ඉතින්, මේ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඇමතිවරුත් උත්තර ලබා දෙනවා. කාරක සභා අවස්ථාවත් තිබෙනවා. අනෙක, හදිසි ප්‍රශ්නවලට අපි ඕනෑම අවස්ථාවක උත්තර දෙන්න සූදානම්. නමුත්, පාර්ලිමේන්තුවේ වැඩකටයුතු අවුල් කරන්නත්, මාධ්‍ය අවධානය දිනා ගන්නත් මේ වාගේ කටයුතු කරන බව තමයි දැන් පෙන්නුම් කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මොකද, තව පැය හයක, හතක කාලය තුළ ඕනෑ තරම් අවස්ථාව තිබෙනවා; ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. අපි මේ පැත්තෙන් පිළිතුරු ලබා දෙනවා. ඇමතිතුමා ඒකට උත්තර ලබා දෙයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) මම කියවන්නම්.

ස්ථාවර නියෝග 29 (1)හි මෙසේ සඳහන් වනවා:

> "පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට සෘජුව ම සම්බන්ධ හදිසි යෝජනාවක් අන් සියලු යෝජනාවන් ද එදිනට නියමිත සියලු කටයුතු ද අභිබවා මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට සෘජුව ම සම්බන්ධ ප්‍රශ්නයක් මැතක දී පැන නැඟ තිබෙන විට, ඡන්දය ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් මත වූ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පාර්ලිමේන්තුවේ කටයුතු කවර හෝ වේලාවක දී තාවකාලිකව නතර කරනු ලැබිය හැකි ය."

ස්ථාවර නියෝග 29(2) හි මෙසේ සඳහන් වනවා:

> "එවැනි වරප්‍රසාද පිළිබඳ කාරණයක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන කිසියම් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ කටයුතු තාවකාලිකව නතර කිරීම සඳහා පළමුව මූලාසනය වෙත දැනුම් දී ඒ සඳහා මූලාසනයේ අවසරය ගනු ලැබිය යුත්තේ ය."

ඒක තමයි ස්ථාවර නියෝග 29(1)හි තිබෙන්නේත්. ස්ථාවර නියෝග 29 (2)හි තිබෙන්නෙත් ඒකම තව පැහැදිලි කරලා.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු හරි ඇමතිවරු හරි වගකීම් ඉටු කරන්නේ නැහැ කියන කාරණය, ඒක ඕනෑම තත්ත්වයක් යටතේ ඉදිරිපත් කරන්න පුළුවන්. ඒක කවදාවත් ඉවර වෙන විවේචනයක් නොවෙයි. ඒක ඕනෑම කෙනෙකුට, ඕනෑම තත්ත්වයක් යටතේදී ලෝකයේ තිබෙන හොඳම ආණ්ඩුවට, හොඳම ඇමතිවරයාට විරුද්ධවත් ඉදිරිපත් කරන්න පුළුවන් දෙයක්. ඒ නිසා ඒ සම්බන්ධව විවේචන ඉදිරිපත් කරන්න විපක්ෂයට ඇති තරම් අවස්ථා තිබෙනවා. ඔබතුමා අද මේ අවස්ථාව ලබා දුන්න ස්ථාවර නියෝගය මත කටයුතු කළොත්, ඔබතුමාට මේ සභාව කරගෙන යන්න වෙන්නේ නැහැ කියන එක විතරක් මට ඔබතුමාට කියන්න පුළුවන්. මේ ස්ථාවර නියෝගය නම් දැන් මේකට අවසර දෙන්න හේතුව, ඕනෑම මන්ත්‍රීවරයෙකුට, ඕනෑම වේලාවකදී, ඕනෑම දෙයක් කියන්න පුළුවන්. ඒ නිසා කරුණාවෙන් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මේ ස්ථාවර නියෝග හදලා තිබෙන්නේ ඔබතුමාවත්, මමවත් නොවෙයි. මේවා මීට කලින් සම්මත කරපු දේවල්. ඒ නිසා කරුණාකරලා පාර්ලිමේන්තුව ස්ථාවර නියෝග අනුව මෙහෙයවන්න. ඒක අනවශ්‍ය පරිදි කිසිම අදාළත්වයක් නැතිව,- ආචාර ධර්ම කියන ඒවාටත් වෙනම නිශ්චිත පද්ධතියක් තිබෙනවා. ආචාර ධර්ම උල්ලංඝනය වුණා නම්, ඒක විභාග කරන්නත් පාර්ලිමේන්තුවේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒක අද ඊයේ පටන් ගත්ත දෙයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, මෙතැන සම්ප්‍රදාය තිබුණේ මොකක්ද? සාමාන්‍යයෙන් වැඩියෙන්ම ස්ථාවර නියෝග කඩලා වැඩ කළේ මීට කලින් ආණ්ඩු පක්ෂය. ආණ්ඩු පක්ෂය තමයි ගොඩක් වේලාවට ඒවා කළේ. අද මොකක්ද වෙලා තිබෙන්නේ, මේ ඇස් පනා පිට? ඇස් පනා පිට දිගින් දිගටම "ස්ථාවර නියෝග, ස්ථාවර නියෝග" කියමින් කාරණා මතු කරනවා. කොහොමත් ස්ථාවර නියෝගයක් තිබෙනවා කිව්වාට පසුව ඔබතුමාට බලයක් තිබෙනවා, අයිතියකුත් තිබෙනවා, ඒ වාගේම ඒ ප්‍රශ්නය මතු කරන්න දෙන්නත් ඕනෑ. ඒ ගැන මට විවාදයක් නැහැ.

නමුත් ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ, ඔබතුමා එහෙම නම් මේ පූර්වාදර්ශය, මේ අයිතිය 225දෙනාටම දෙන්න කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට දැන් මම-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ ප්‍රශ්නයට නේ, උත්තර-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ අමාත්‍යතුමා, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. [බාධා කිරීම්] සභාව ඉදිරියට පවත්වාගෙන යා යුතුයි. [බාධා කිරීම්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, සභානායකවරයා වශයෙන් මට තිබෙනවා විධායකයයි, ව්‍යවස්ථාදායකයි අතර සම්බන්ධීකරණය ඇති කරන්නත්, ආණ්ඩු පක්ෂයේ මූලික කටයුතුවලට මැදිහත් වෙන්නත්, ඒ වාගේම න්‍යාය පත්‍රය හරියාකාරව කරගෙන යාමට ස්ථාවර නියෝගවලට අනුව ඔබතුමාට සහයෝගය දෙන්නත්. ඒක තමයි මට තිබෙන වගකීම. මේක, ප්‍රශ්නය මතු කළ මන්ත්‍රීවරයාගේ ප්‍රශ්නයක් නොවෙයි, සභාවේ ප්‍රශ්නයක්. ස්ථාවර නියෝග 29(1) යටතේ කිව්වාම, පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි නේ. ස්ථාවර නියෝග 29(1)හි තිබෙන්නේ පාර්ලිමේන්තු වරප්‍රසාද ගැන. ඒ නිසා ප්‍රශ්නයට අදාළ කෙනා හැම වෙලාවේම මේකට උත්තර දීමට අවශ්‍ය නැහැ. ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ස්ථාවර නියෝග 29(1) සහ 29(2) කිසිසේත්ම මේ විධියට පාවිච්චි කරන්න දෙන්න එපා කියලායි. මොකද, සභාව කරන්න බැරි වෙයි. අපේ විනය වෙන අයට ස්ථාවර නියෝග උල්ලංඝනය කරන්න අයිතිවාසිකමක් විය යුතු නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න ඕනෑ. මොකද, නැති දේවල් කියනවා, පාර්ලිමේන්තුව පාවිච්චි කරලා. විශේෂයෙන් මේ දිනවල අල සහ ලූනු ගොවීන්ගේ ප්‍රශ්නය පිළිබඳව ආණ්ඩුව සැලකිය යුතු අවධානයක් යොමු කර තිබෙනවා. ආණ්ඩුව අගෝස්තු මාසයේ 25වැනි දා අල සහ ලූනු සම්බන්ධයෙන් බද්ද පනවන්න තීරණය කරලා අගෝස්තු 25වැනි දා මධ්‍යම රාත්‍රියේ තමයි බදු පැනෙව්වේ. අගෝස්තු මාසයේ තමයි බදු පනවන්න තීරණය කරන්නේ. සැප්තැම්බර් මාසයේ මැද තමයි ලූනු අස්වැන්න එන්නේ. එතකොට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය අල සහ ලූනු සඳහා යන නිෂ්පාදන වියදම ගණන් හදලා, ලූනු කිලෝවකට යන මිල රුපියල් 85යි, රුපියල් 130ක මිලක් ඕනෑ කියලා කිව්වාම ලූනු මිලදී ගැනීම සඳහා වෙච්ච යන්ත්‍රණයකුත් හදලා පෞද්ගලික අංශයත්, සතොසත් රුපියල් 130ට ලූනු කිලෝව මිලදී ගැනීම ආරම්භ කරනවා.

ඒ නිසා රුපියල් 10ක් ලෙස තිබුණු බද්ද රුපියල් 50ක් කරනවා. එසේ යන්ත්‍රණයක් සකස් කරලා තමයි මේ තීරණය ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ. හැබැයි, එතැන් සිට ලූනු වෙළෙඳ පොළේ ලූනු මිල ඉහළ ගියා, පහළ ගියා. වැසි තත්ත්වයත් එක්ක ලූනු මිල නැවත බිඳ වැටුණා. ඒ නිසා ලූනු වෙළෙඳ පොළේත්, අල වෙළෙඳ පොළේත් ඇති වෙලා තිබෙන තත්ත්වය රජය හැටියට අපි මේ මාස එකහමාර ඇතුළත ඉතාම හොඳින් අවධානයට ගත්තා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, කෙටියෙන් කියන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ කාරණය අවධානයට ගත්තු නිසා තමයි ලබන අවුරුද්දේත් මේ ප්‍රශ්නය එන එක වළක්වන්න නම් අපට දීර්ඝ කාලීන සැලසුමක් ඕනෑ කියලා, ඒ සැලසුමට අවශ්‍ය කරන සූදානම හදා ගන්න, ගබඩා පහසුකම් හා මිල දී ගැනීමේ ක්‍රියාවලියට යන්න අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර තිබෙන්නේ. ගොවි ජනතාවගේ ඒ ප්‍රශ්නයට සාධාරණ උත්තරයක් ලබා දීම වෙනුවෙන් අපි මේ අවුරුද්දේත් කටයුතු කරනවා. සමස්ත ප්‍රශ්නයට උත්තරයක් නැහැ. අද ලූනු කිලෝව රුපියල් 160යි, 165යි; අල කිලෝව රුපියල් 200යි, 220යි. මේ ප්‍රශ්නයට සාධාරණ උත්තරයක් සොයන්න අවශ්‍ය මැදිහත්වීම ආණ්ඩුව කරලා තිබෙනවා. විපක්ෂය මේක ජාතික ප්‍රශ්නයක් ලෙස මතු කරන්න හැදුවාට, අල මිල දී ගත්තේ නැහැ කියන්න හැදුවාට, ලූනු මිල දී ගත්තේ නැහැ කියන්න හැදුවාට, ඒ දෙකම මිල දී ගත්තා. ප්‍රමාණවත් ලෙස මැදිහත්වීමක් නැති නිසා තමයි මේ ප්‍රශ්නයට දීර්ඝ කාලීන උත්තරයක් ඕනෑ. ඒ නිසා රුපියල් මිලියන 1,000ක් දැන්මම අය වැයෙන් අපි මේ සඳහා වෙන් කළා. ලබන වසරේ ලූනුවලටත්, අලවලටත් නිෂ්පාදන පිරිවැයත්, ගොවියාගේ ලාභයත් එකතු කරපු මිලක් අපි ගොවි ජනතාවට කලින්ම ලබා දෙනවා. ඒ වාගේම, රජයේ මිල දී ගැනීමේ ක්‍රියාවලිය සකස් කරනවා කියන කාරණයත් අපි ඉතා පැහැදිලිව කියනවා. ඒ වැඩේට අදාළ සූදානම තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි සභාවේ කටයුතුවලට යොමු වෙමු,- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Standing Order No. 29 and the same point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙතුමා අහපු ප්‍රශ්නයට දැන් අතුරු පිළිතුරු දුන්නා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
නැහැ, ඒක නොවෙයි. ගරු බිමල් රත්නායක ඇමතිතුමාගේ ප්‍රශ්නයට මගේ උත්තරය,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ආයෙත් ඒක විග්‍රහ කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
නැහැ. එහෙම ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක point of Order එක විවාද කරන තැනක් නොවෙයි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Why not, Sir? ඒක මෙතැන විවාද කරන්නේ නැතුව,- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, this is not related to that; this is another point of Order. Shall I -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Archchuna.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Standing Order No. 82.(1) states, "Any Member who has..." ඒක මම ආයෙත් කියවන්න ඕනෑ නැහැ; වෙලාව නාස්ති කරන්න ඕනෑ නැහැ. ඒකේ පැහැදිලිව තිබෙනවා, කවුරු හරි බරපතළ වචනයක් පාවිච්චි කර තිබෙනවා නම්, කාට හරි බැණලා තිබෙනවා නම් ඔබතුමාට අයිතිය තිබෙනවා,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක expunge කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, මට තත්පරයක් කථා කරන්න පුළුවන්ද? Point of Order එක කියන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක ගැන තමයි කියන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමා, ඒකේ පැහැදිලිව තිබෙනවා, apology එකක් කරන්න ඕනෑ කියලා. මම ඔබතුමාට බැණලා - *[බාධා කිරීමක්]* ඒක expunge කරන්න බැහැ නේ- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ටිකක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. මම මේ සම්බන්ධයෙන් තිබෙන හැන්සාඩ් වාර්තා ටික - සංශෝධනයට කලින් - අධ්‍යයනය කරලා අවශ්‍ය කටයුතු කරනවා. ඔබතුමාද ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කරපු අනවශ්‍ය කථා, අනවශ්‍ය වචන පාවිච්චි කිරීම් පිළිබඳ සියලු දේවල් මේ තුළ තිබෙනවා. ඒ ගැන පරීක්ෂණයක් කරන්න කියලා මම ලේකම් මණ්ඩලයට යොමු කර තිබෙනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා,- *[බාධා කිරීම්]* මේ සාකච්ඡාව දැන් ඇති. අපි ඊළඟ කාරණයට යමු,- *[බාධා කිරීම්]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, මෙතැන අවස්ථාව දුන්නු එකත් එක්ක පැන නැඟිච්ච ප්‍රශ්නයට අදාළව නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* අපේ ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා ඒකට උත්තර දුන්නා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?*[බාධා කිරීම්]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මෙතුමන්ලා කිව්වා,- *[බාධා කිරීම්]* ඒ මන්ත්‍රීතුමා කිව්වේ සම්පූර්ණයෙන් අසත්‍යයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට අමාත්‍යතුමා පිළිතුරු ලබා දුන්නා. *[බාධා කිරීම්]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
රුපියල් 120 සිට,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4, ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තනතුරු කරන්න බැරි හින්දා තමයි මිනිස්සු කියන්නේ,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මංජුල සුරවීර මහතා. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේගොල්ලන් කැලයට ගිනි තියලා ඊට පසුව ඇවිළෙන කොට කියනවා,- *[බාධා කිරීම්]* මම ඒකයි ඔබතුමාට කිව්වේ. *[බාධා කිරීම්]* මම ඒකයි ඔබතුමාට කිව්වේ- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්නා නේ. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඒකයි කියන්නේ, ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න කියලා. *[බාධා කිරීම්]* ඒක විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් තිබෙන වගකීමක්. ඔබතුමාට පිස්සු නටන්න දීලා අනෙක් මිනිස්සු කටවහගෙන ඉන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම පැහැදිලිව ඔබතුමාට කිව්වා, ඒක පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ගේන්න කියලා. *[බාධා කිරීම්]*

ප්‍රශ්න අංක 04, ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
විනාඩියක් ඉන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අනෙක් සියලු ගරු මන්ත්‍රීවරු කරුණාකර වාඩි වෙන්න.

## බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරය ඉදිකිරීම නිසා බලපෑමට ලක් වූ අය: වන්දි
## ப்ரோட்லேண்ட்ஸ் நீர் மின் உற்பத்தி நிலைய நிர்மாணத்தின்போது பாதிக்கப்பட்டோர்: நட்டஈடு
## AFFECTED PERSONS DUE TO CONSTRUCTION OF BROADLANDS HYDROPOWER PLANT: COMPENSATION

1404/2025

**4. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එම ජල විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත බලාගාරය ඉදිකිරීම හේතුවෙන් වන්දි ලබා දීමට නියමිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට මුළු වන්දි මුදලම ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ එම එක් එක් පුද්ගලයාට ලබා දෙන ලද වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) තවදුරටත් වන්දි ලබා දීමට ඉතිරිව සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් පුද්ගලයාගේ නම සහ ගෙවීමට නියමිත වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඔවුන්ට වන්දි ගෙවීම අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்டு வினா:

(அ) (i) ப்ரோட்லேண்ட்ஸ் நீர் மின் உற்பத்தி நிலையத்தின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட்ட வருடம் யாது என்பதையும்;

(ii) தற்போது மேற்படி நீர் மின் உற்பத்தி நிலையத்தின் நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் நிர்மாணப் பணிகள் காரணமாக நட்டஈடு வழங்கப்படவுள்ள நபர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவர்களுள் இதுவரை முழுமையான நட்டஈட்டுத் தொகை செலுத்தப்பட்ட நபர்களின் எண்ணிக்கை மற்றும் அத்தகைய ஒவ்வொரு நபருக்கும் வழங்கப்பட்ட நட்டஈட்டுத் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேலும் நட்டஈடு வழங்கப்பட வேண்டிய எஞ்சியவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு நபரின் பெயர் மற்றும் செலுத்த வேண்டியுள்ள நட்டஈட்டுத் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(v) அவர்களுக்கான நட்டஈடு செலுத்தி முடிக்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the year on which the construction of the Broadlands Hydropower Plant was commenced;

(ii) whether the construction of the said hydropower plant has been completed by now; and

(iii) if not, the reasons for it?

(b) Will he also inform this House -

(i) the number of persons to be given compensation due to the construction of the said power plant;

(ii) out of them, the number of persons to whom the total compensation has been paid by now and the amount of compensation paid to each of them, separately;

(iii) the remaining number of persons who are to be given compensation;

(iv) the name and the amount of compensation to be paid for each such person, separately; and

(v) the date by which the compensation payments to individuals will be completed?

(c) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2013

(ii) ඔව්.

(iii) ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

(ආ) (i) පවුල් 243කි.

(ii) නිවාස හා ඉඩම් අත්කර ගත් පවුල් 108ක් සඳහා මුළු වන්දි ලෙස රුපියල් 379,355,250ක් ගෙවා ඇති අතර, ඒ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ඇමුණුම් I(I) සිට I(IV) ලෙස ඉදිරිපත් කර ඇත. එය දීර්ඝ ලේඛනයක්.

(iii) නිවාසවලට සුළු හානි සිදු වූ පවුල් 135කට රුපියල් 8,987,300.00ක මුදලක් වන්දි වශයෙන් ගෙවීමට ඉතිරිව ඇති අතර, ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඇමුණුම 2 මඟින් දක්වා ඇත.

(iv) ගෙවීමට නියමිත වන්දි මුදල් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඇමුණුම 2 මඟින් දක්වා ඇත. මේකත් දීර්ඝ ලේඛනයක්.

(v) යටියන්තොට සහ අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම්වරු සමඟ සම්බන්ධීකරණයෙන් ගෙවීමට ඉතිරි වී ඇති වන්දි මුදල් නුදුරු දිනයකදී ගෙවා නිම කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) අදාළ නැත.

ඇමුණුම I(I) සිට I(IV) දක්වා හා ඇමුණුම 2 **සභාගත*** කරමි.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ජල විදුලිය උත්පාදනය වෙනුවෙන් මේ බ්‍රෝඩ්ලන්ඩ්ස් ව්‍යාපෘතිය කරගෙන යෑමේදී බදු රහිතව භාණ්ඩ, උපකරණ, යන්ත්‍රසූත්‍ර සහ වාහන විශාල ප්‍රමාණයක් ගෙනැල්ලා තිබෙනවා. මේ බලාගාරයේ වැඩ කටයුතු නිමා වෙලා නම්, එම උපකරණ සහ ද්‍රව්‍ය නැවත ලංකා විදුලිබල මණ්ඩලයට භාර දීලා නැති තත්ත්වයක් අපට දකින්නට තිබෙනවා. මේ වන විට අලුතින් ගෙන්වපු කැබ් රථ තැන් තැන්වල ගාල් කරලා තිබෙනවා. ඒ නිසා සම්පත් අවභාවිතයක් වෙමින් තිබෙනවා. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා, ජනතාව සතු මේ දේපළ රජයට භාර දෙන වැඩ පිළිවෙළ, ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන්නේ කවදාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ වාගේ ගොඩක් ව්‍යාපෘතිවලට වාහන විශාල ප්‍රමාණයක්, project monitoring unit කියලා ලොකු staff එකක්, ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් එහෙම

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කුමාර ජයකොඩි මහතා]

ඇති කරගෙන තමයි, සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වෙන්නේ. ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති ඉවර වෙන දවසක් බොහෝ ව්‍යාපෘතිවලට නැහැ.

මොකද, ලැබෙන වරප්‍රසාද සහ ඒවායේ තිබෙන පහසුකම් භුක්ති විඳීමේ ගිජුකම හින්දා මම හිතන විධියට උඩ ඉඳන් යටටම ඒ ප්‍රශ්න තිබෙනවා. ඇත්තටම අපි දැන් ඒවා ඉදිරියට නොවෙන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. මොකද, මේ ව්‍යාපෘති වුණත් 2013දී ආරම්භ කරපු ඒවා. 2020 පහුවෙනකොට අවසන් වෙලා තිබෙන ව්‍යාපෘති. ඒ හැම දෙයක් ගැනම අපි පරීක්ෂණ කරලා, දැන් CEB එකේ reform එක කරගෙන යනවා. ඒ අනුව මේ assets වෙනම ම පරීක්ෂා කරලා ඒවා අදාළ සමාගම්වලට පත් කිරීමේ කටයුතු කරගෙන යනවා. අපි කොහොමත් ඉදිරියේදී මේවා පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් කරගෙන යනවා කියලා ගරු සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම ගත්තොත්, මේ විදුලි බලාගාරය නිමවෙලා තිබෙන්නේ කැලණි ගඟ පදනම් කරගෙන. දීර්ඝ කාලයක් තිස්සේ මේ කැලණි ගඟේ water rafting ක්‍රියාවලිය සිද්ධ වෙමින් තිබෙනවා. ඒක දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණීය තැනක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ ස්ථානය ආසියාවේ වැදගත්ම water rafting කරන, කිලෝමීටර 10ක පමණ පරාසයකට යන්න පුළුවන් ස්ථානයක් බවට පත්වෙලා තිබෙනවා. මේ Broadlands Hydropower Project එක ආරම්භ කිරීමත් සමඟම කැලණි ගඟ වහනවා, සවස 4.30 සිට පසුදා උදෑසන 8.30 වෙනකම්. මේ නිසා water rafting ක්‍රීඩාවට සූදානම් වෙලා එන විදේශිකයන් උදෑසන 10.00 විතර වෙනකම් බලාගෙන ඉන්න ඕනෑ. මොකද, උදේ 8.00ට විතර කැලණි ගඟ ඇරියාම ජල තලය පිරෙන්න පැය දෙකකට වඩා වැඩි කාලයක් ගත වෙනවා. අපි මේ රටේ අර්බුද විධියට තිබෙන ප්‍රශ්නවලට උත්තර හොයන්න සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන අවස්ථාවක ඉන්නේ. එවැනි අවස්ථාවක බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරයේ උත්පාදන ක්‍රියාවලිය සඳහා කැලණි ගඟ වහනකොට ඇතිවන අර්බුදය විසඳීමට ඇමතිවරයා ලෙස ඔබතුමාගෙන් මේකට ගැළපෙන සාධනීය පිළිතුරක් ලැබෙන්නේ කවදාද කියන ප්‍රශ්නය මම අහනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඇත්තටම ඒ ප්‍රශ්නය ගැන මම දැනුවත් වුණේ දැන්. විශේෂයෙන්ම එවැනි ජල ප්‍රවාහ අනිවාර්යයෙන්ම ගොඩක් වෙලාවට අයිති වෙන්නේ Irrigation Department එකට හෝ මහවැලිය වාගේ ආයතනවලට. ඒ නිසා ඒවාත් එක්ක එකඟතාවෙන් තමයි ඒ වැඩ කටයුතු කරන්න ඕනෑ. පරිසර ප්‍රශ්න ඇතුළු ඔය කියන හැම එකක්ම සලකා බලා, ඒ ආයතනවල අවසරය මත තමයි මේ දේවල් ක්‍රියාත්මක වෙන්නේ. මම හිතන විධියට, ඒ අනුව තමයි ඔය පැය ගණනත් තීරණය වෙලා ඇත්තේ. ඒ ගැන අපි සංචාරක අමාත්‍යාංශයේ අදාළ අංශ එක්ක සාකච්ඡා කරලා වෙනසක් වෙන්න ඕනෑ නම් අවශ්‍ය විධියට වෙනස් කරන්න අපි කටයුතු කරමු.

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය: අමතර කොටස් මිලදී ගැනීමේ ක්‍රමවේදය
## இலங்கை போக்குவரத்துச் சபை: உதிரிப் பாகங்களைக் கொள்வனவு செய்யும் முறையியல்
## SRI LANKA TRANSPORT BOARD: METHODOLOGY OF PURCHASING SPARE PARTS

1428/2025

**5. ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ සඳහා අමතර කොටස් තොග වශයෙන් මිලදී ගනු ලබන ක්‍රමය කවරේද;

(ii) එම ක්‍රමයේ දුර්වලතා පවතින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) දුර්වලතා නොමැති ක්‍රමයක් ඒ සඳහා හඳුන්වාදීමට හැකියාවක් තිබේද;

(v) අමතර කොටස් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන තොග පාලන ක්‍රමය කවරේද;

(vi) එම ක්‍රමය මේ වන විට කොපමණ කාලයක සිට භාවිත වන්නේද;

(vii) තොග පාලනය සඳහා පරිගණක පද්ධතියක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை போக்குவரத்துச் சபையின் பேருந்துகளுக்கான உதிரிப் பாகங்களை மொத்தமாகக் கொள்வனவு செய்யும் முறையியல் யாது என்பதையும்;

(ii) மேற்படி முறையியலில் குறைபாடுகள் காணப்படுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், அவை யாவை என்பதையும்;

(iv) இவ்விடயம் தொடர்பில் குறைபாடுகள் காணப்படாத முறையியல் ஒன்றை அறிமுகப்படுத்துவதற்கான இயலுமை காணப்படுகின்றதா என்பதையும்;

(v) உதிரிப் பாகங்கள் தொடர்பாக பின்பற்றுகின்ற இருப்புக் கட்டுப்பாட்டு முறையியல் யாது என்பதையும்;

(vi) மேற்படி முறையியல் எப்போதிருந்து பயன்படுத்தப்படுகின்றது என்பதையும்;

(vii) இருப்புக் கட்டுப்பாட்டுக்கான கணினி முறைமை ஒன்று தயாரிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the methodology under which spare part stocks required for the buses of the Sri Lanka Transport Board are purchased;

(ii) whether he will admit that there are flaws in the said methodology;

(iii) if so, such flaws;

(iv) whether there is a possibility to introduce a flawless methodology for that;

(v) the stock management methodology that is adopted in relation to spare parts;

(vi) the duration for which the said methodology has been in use; and

(vii) whether a computer system will be developed for stock management?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ xix වන පරිච්ඡේදයේ 156.ආ(1) ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කර ඇති භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 අනුවය.

(ii) නැත.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) වාර්ෂික අවශ්‍යතාව අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් අනතුරුව තෝරා ගන්නා සැපයුම්කරුවන් වෙතින් නිශ්චිත මිලකට හා දින 30ක ණය සහන කාලයකට යටත්ව ශ්‍රී ලංගම ඩිපෝ මඟින් මූල්‍යමය හැකියාව මත සති දෙකක හෝ වැඩි කාලයක අවශ්‍යතාව සඳහා මිලදී ගෙන ගබඩාගත කර, අවශ්‍යතාව අනුව භාවිත කිරීම සහ සංචිතය අනුව යළි යළිත් ඉහත පිරිදි තොග ස්ථාපිත කිරීම සිදු කෙරේ.

(vi) වේරහැර මධ්‍යම ගබඩා සංකීර්ණය 1991 වසරේදී වසා දැමීමෙන් පසු අනුගමනය කෙරේ.

එහෙත්, 2011 සිට 2014 වසර දක්වා කාලය තුළ තෝරාගත් සැපයුම්කරුවන් දෙදෙනෙකුට කටුබැද්ද හා ඒකල ශ්‍රී ලංගම පරිශ්‍රවල බන්ධිත ගබඩා - bonded warehouses - පවත්වාගෙන යැමට ඉඩ ලබා දී ඔවුන් වෙතින් දින 30ක ණය සහනයකට යටත්ව ශ්‍රී ලංගම ඩිපෝ සඳහා අමතර කොටස් මිලදී ගැනීමට පහසුකම් සලසා ඇත.

2014 වර්ෂයෙන් පසුව ඉහත (v) පිළිතුරෙහි සඳහන් කර ඇති ආකාරයෙන් තොග පවත්වාගෙන යැමට කටයුතු කෙරේ.

(vii) තොග පාලනය සඳහා පරිගණක පද්ධතියක් ප්‍රධාන කාර්යාලයීය මට්ටමින් සිදු කරනු ලබන අතර, ඉදිරියේදී ඩිපෝ මට්ටමින් පුළුල් කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலின சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා වෙත යොමු කරන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔය කාරණයට අදාළවම ගත්තොත්, අපි ඩිපෝ කිහිපයක් පරීක්ෂා කළා. එතකොට ඇත්තටම පෙනෙන්නට තිබුණු කාරණයක් තමයි, තොග පාලනයට අදාළව ඉතා පැරණි ක්‍රමයක් අනුගමනය කිරීම. ඒ වාගේම, තොග මිලදී ගැනීම සම්බන්ධවත් ගැටලුවක් තිබෙනවාය කියලා ප්‍රායෝගිකව බැලුවාම තේරෙනවා. ඒකත් එක්ක තමයි මම මේ ප්‍රශ්නය යොමු කළේ.

ඒත් එක්කම, ඩිපෝව ඇතුළේ ක්‍රියාකාරිත්වය ගත්තොත්, ඒ සේවකයන් බස් රථ තුළ සේවය කරද්දී ඔවුන් යම් කිසි විධියකට ආකල්පමය වෙනසකට ලක් කරන්න ඕනෑ කියන කාරණය අපට පෙනෙනවා. මොකද, පෞද්ගලික අංශය ගත්තොත්, ඔවුන් යම් කිසි ලාභයක් ලබනවා. පොදුවේ ගත්තොත්, SLTB එක දිගටම පාඩු ලබන ආයතනයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒක නිසා මෙම කාලය තොග පාලනය සහ ඩිපෝ ආශ්‍රිත කටයුතු පිළිබඳ යම් කිසි විධියකට සේවකයන් තුළ ආකල්පමය වර්ධනයක් අවශ්‍ය වන කාලයක්. ඒ සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

ලිඛිත පිළිතුර මෙහෙම වුණාට, මෙහෙම තමයි මේක ලියන්න වෙන්නේත්. නමුත් ගරු මන්ත්‍රීතුමනි, මේකේ ඇත්ත ප්‍රායෝගික තත්ත්වය මීට වෙනස්. මම ඒක කරුණු හයකින් කියන්නම්.

1. දැනට ඩිපෝවල අමතර කොටස් මිලදී ගැනීමේ ඇති සැබෑ තත්ත්වය.
2. බොහෝ ඩිපෝවලට අමතර කොටස් ගන්න මූල්‍යමය හැකියාවක් නැති නිසා ඔවුන් අමතර කොටස් ලබා ගන්නා කඩවල ණයකරුවන් ලෙස තමයි සිටින්නේ.
3. අවශ්‍ය අවස්ථාවලදී අමතර කොටස් මිලදී ගන්න බැරි වෙන නිසා බස් අලුත්වැඩියා කිරීම ප්‍රමාද වෙනවා.
4. තොග ලෙස අමතර කොටස් මිලදීගෙන ගබඩා කිරීමට මුදල්, ගබඩා පහසුකම්, සේවකයන් නොමැති නිසා බස් රථයක් කැඩුණු ගමන් repair කරන්න බැහැ. Fire fighting විධියට, කැඩුණාට පස්සේ තමයි බඩු හොයන්නේ.
5. ඒ වාගේම සැලකිය යුතු suppliersලා ප්‍රමාණයක් අපි බලයට එන්න කලින් register කරපු අය.
6. ඔවුන් ලබා දෙන්නේ ඉතාම බාල වර්ගයේ අමතර කොටස්.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ ලිඛිත පිළිතුරේ මොනවා සඳහන්ව තිබුණත් ඇත්ත යථාර්ථය ගත්තොත්, තිබෙන්නේ අන්තිම සවුත්තු තත්ත්වයක්; ඉතාම නරක තත්ත්වයක් තිබෙන්නේ. ඊට අමතරව වංචා, දූෂණ තිබෙනවා. Repair කරන බඩු සපයන කට්ටිය අවුරුදු 10, 15, 20 බඩු සපයලා තිබෙනවා. එතැන ඉතාම බරපතළ විධියට වංචා කරන අය සැලකිය යුතු ප්‍රමාණයක් ඉන්නවා. අවංකව කටයුතු කරන අය එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා. ලංගමට පසුගිය කාලයේ කරලා තිබෙන අතිවිශාල විනාශය විසින් තමයි මේකේ ප්‍රධාන කොටස ඇවිත් තිබෙන්නේ.

[ගරු බිමල් රත්නායක මහතා]

ඒ වාගේම අනවශ්‍ය බඩු තොග අරගෙන ඒවා ඒකල තිබෙන ගබඩාවේ ගබඩා කරලා තිබෙනවා. මගේ අවබෝධයේ හැටියට ඒවායින් සැලකිය යුතු ප්‍රමාණයක් නාස්තිවෙමින් තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, අපට ආකල්පමය වෙනසක් කරන්න පුළුවන් වෙන්නේ විෂය මූල වටපිටාව, තිබෙන වටපිටාව වෙනස් කරන්න පටන් ගත්තාට පස්සේයි. අපි යම් කිසි ප්‍රවර්ධනයක් පටන් අරගෙන තිබෙනවා. ලංගම සේවකයන් ඒකට උදවු කරමින් ඉන්නවා. නමුත් කරලා තිබෙන විනාශයේ හැටියට මාසයකින්, දෙකකින් ලංගම ගොඩ නඟනවා කියන්න මට බැහැ. දැන් අවශ්‍ය අය සැලකිය යුතු ප්‍රමාණයක් බඳවා ගැනීමට කටයුතු කරනවා. ඒ නිසා ඔබතුමාගේ ප්‍රශ්නවලට සාධනීය, යථාර්ථවාදී තත්ත්වයක් ඇති කරගන්න තව අවුරුද්දක්වත් යයි.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මම දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහනවා. අපි 2026 වර්ෂයට අදාළ අය වැය ඇතුළේ සාකච්ඡා කරනවා, නව බස් රථ 600ක් මිලදී ගන්නවා, එන්ජින් කට්ටල 307ක් මිලදීගෙන ප්‍රවාහනයට එකතු කරනවා කියලා.

මම ඊයේ දවසේ රජරට බස් සමාගමේ සාමාන්‍යාධිකාරිතුමා එක්ක කථා කළා. මෙවැනි ප්‍රමාණයක් මිලදී ගත්තාට පස්සේ ඩිපෝවලට යම් යම් ප්‍රමාණයෙන් බස් රථ ලැබෙනවා. ගමනාගමනයට යොදා ගත් සමහර බස් රථ ඊට පස්සේ ග්‍රාමීය ප්‍රවාහන පහසුකම් සඳහා ලබා ගන්න පුළුවන් කියන අදහසක් තිබෙනවා. මෙන්න මේ ක්‍රියාවලිය සිදුවීම සඳහා, ඒ වගකීම දරන අමාත්‍යවරයා විධියට ඔබතුමාට කියන්න පුළුවන්ද තව කොපමණ කාලයක් ගතවෙයිද කියලා. සමහර පැතිවල ග්‍රාමීය ප්‍රවාහන පහසුකම් සැපයීමේදී දැනටත් ලොකු ගැටලුවලට මුහුණ දෙමින් තිබෙනවා. ඒක නිසා මේක යම් නිශ්චිත කාලවකවානුවක් ඇතුළේ සිදු වෙන්නට ඕනෑ කියලා හිතනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට දැනෙන ආකාරයෙන් කියන්න, මේ කාර්යය සිදු වෙන්න කොපමණ කාලයක් ගතවේවිද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඩිපෝ 107න් යම් ප්‍රමාණයක් යම්කිසි සාධනීය මට්ටමට ගොඩනැඟෙමින් තිබෙනවා. මට මතක හැටියට, ඔවුන් කැඩිලා තිබෙන බස් රථ 173ක් අලුත්වැඩියා කරලා සේවයේ යොදවා තිබෙනවා. ඒ වාගේම 600කට අදාළ කරන මුදල් වෙන් කරලා තිබෙනවා. ලබන අවුරුද්දේ මැයි මාසයට කලින් මේ repairsවලට අදාළ කරන දේවල් අපට කරගන්න පුළුවන් වෙයි කියලා හිතනවා. බස් හදනවා වාගේම බස් කැඩෙනවා. ඒවාට කළමනාකරණ ගැටලුත් තිබෙනවා. ඊට අමතරව ජූනි මාසයේදී metropolitan area එකේ Metro bus company එකට අදාළ බස් ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ජූනි මාසය වෙන කොට බස් ගෙනෙන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. උපරිම අප්‍රේල් මාසය වනකොට Metro bus company එකට අවශ්‍ය කරන අලුත් නිලධාරි සේවක මහත්ම මහත්මීන් බඳවා ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ මාසයේ අග වෙන්න කලින් bus ticket payment system එක, bank cardsවලින් pay කරන වැඩේ පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. හොඳ පැත්තට යන දේවලුයි, පරණ කැඩිච්ච; නරක දේවලුයි එක වෙලාවේ පවතින කාලයකට අපි මුහුණ දෙමින් ඉන්නවා. ඉතාම නරකම අත්දැකීම් වාගේම, ඉතාම හොඳ අත්දැකීම් ඊළඟ මාස කිහිපය තුළදී SLTB එකට අදාළව සිදු වෙයි කියලා අපි හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## උතුරු සහ නැඟෙනහිර පළාත්වල බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන: ණය සඳහා අය කරන පොලිය

## வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள வங்கிகள் மற்றும் ஏனைய நிதி நிறுவனங்கள்: கடனுக்காக அறவிடப்படும் வட்டி

## BANKS AND OTHER FINANCIAL INSTITUTIONS IN NORTHERN AND EASTERN PROVINCES: LOAN INTERESTS CHARGED

1182/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)
මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) උතුරු පළාතේ ඇති රාජ්‍ය අංශයේ බැංකු සහ පෞද්ගලික අංශයේ බැංකු, රක්ෂණ, ක්ෂුද්‍ර මූල්‍ය සහ වෙනත් මූල්‍ය ආයතන සංඛ්‍යාව සහ ඒවායේ නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ණය ලබා දීමේදී, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අය කරනු ලබන පොලී අනුපාතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) උතුරු සහ නැඟෙනහිර පළාත්වල ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල අමානුෂික ක්‍රියා හේතුවෙන් පුද්ගලයන් සිය දිවි හානි කර ගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, සිය දිවි හානි කර ගත් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ගේ මරණවලට වගකිව යුත්තේ කවුරුන්ද;

(iv) ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් සිදු කරනු ලබන අමානුෂික ක්‍රියා නැවැත්වීම සඳහා ඉදිරියේදී එම ආයතනවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு மாகாணத்திலுள்ள அரச துறை மற்றும் தனியார் துறை வங்கிகள், காப்புறுதி, நுண் நிதி மற்றும் ஏனைய நிதி நிறுவனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் ஒவ்வொரு மாவட்டத்துக்கமைய வெவ்வேறாக யாது என்பதையும்;

( ii) அரச மற்றும் தனியார் துறை வங்கிகள் மற்றும் நுண் நிதி நிறுவனங்கள் கடன் வழங்கும்போது அறவிடும் வட்டி விகிதம் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் நுண் நிதி நிறுவனங்களின் மனிதாபிமானமற்ற செயற்பாடுகள் காரணமாக நபர்கள் தற்கொலை செய்து கொண்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், தற்கொலை செய்து கொண்டவர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்துக்கமைய வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) அவர்களின் மரணங்களுக்குப் பொறுப்புக்கூற வேண்டியவர்கள் யாவர் என்பதையும்;

(iv) நுண்நிதி நிறுவனங்களால் மேற்கொள்ளப் படுகின்ற மனிதாபிமானமற்ற செயற்பாடுகளைத் தடுத்து நிறுத்துவதற்காக எதிர்காலத்தில் மேற்படி நிறுவனங்களின் நடவடிக்கைகளை கண்காணிக்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he state the -

(i) number of State and private sector banks, insurance companies, microfinance and other financial institutions in the Northern Province and their names, separately in each district; and

(ii) interest rates charged by State and private sector banks and microfinance institutions, separately, in providing loans?

(b) Will he also state -

(i) whether he is aware that some individuals have committed suicide due to the inhumane practices of the microfinance institutions in the Northern and Eastern Provinces;

(ii) if so, the number of individuals who have committed suicide in each district, separately;

(iii) the names of the parties who are responsible for the deaths of those individuals; and

(iv) whether steps will be taken to monitor the functions of the microfinance institutions in future to stop the inhumane practices carried out by those institutions?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන ගණන පහත පරිදි සාරාංශගත කළ හැක. එම මූල්‍ය ආයතනයන්හි නම් ඇමුණුම 01හි සඳහන් වේ.

**Table 2: Names of state & private banks operating in districts of Northern province**

| District | Name of the Bank |
|---|---|
| Jaffna | 1. Bank of Ceylon |
| | 2. People's Bank |
| | 3. DFCC Bank PLC |
| | 4. Commercial Bank of Ceylon PLC |
| | 5.. National Development Bank PLC |
| | 6. Hatton National Bank PLC |
| | 7. Nations Trust Bank PLC |
| | 8. Pan Asia Banking Corporation PLC |
| | 9. Sampath Bank PLC |
| | 10. Seylan Bank PLC |
| | 11. Union Bank of Colombo PLC |
| | 12. Cargills Bank PLC |
| | 13. Indian Bank |
| | 14. State Bank of India |
| | 15. The Hongkong & Shanghai Banking Corporation Ltd. |
| | 16. SANASA Development Bank PLC |
| | 17. Housing Development Finance Corporation Bank of Sri Lanka |
| | 18. National Savings Bank |
| | 19. State Mortgage & Investment Bank |
| | 20. Pradeshiya Sanwardhana Bank |
| Kilinochchi | 1. Bank of Ceylon |
| | 2. People's Bank |
| | 3. DFCC Bank PLC |
| | 4. Commercial Bank of Ceylon PLC |
| | 5. Hatton National Bank PLC |
| | 6. Pan Asia Banking Corporation PLC |
| | 7. Sampath Bank PLC |
| | 8. Seylan Bank PLC |
| | 9. SANASA Development Bank PLC |
| | 10. National Savings Bank |
| | 11. Pradeshiya Sanwardhana Bank |
| Mannar | 1. Bank of Ceylon |
| | 2. People's Bank |
| | 3. Commercial Bank of Ceylon PLC |
| | 4. Hatton National Bank PLC |
| | 5. Sampath Bank PLC |
| | 6. Seylan Bank PLC |
| | 7. Union Bank of Colombo PLC |
| | 8. SANASA Development Bank PLC |
| | 9. National Savings Bank |
| | 10. Sri Lanka Savings Bank Ltd |
| | 11. Pradeshiya Sanwardhana Bank |
| Vavuniya | 1. Bank of Ceylon |
| | 2. People's Bank |
| | 3. DFCC Bank PLC |
| | 4. Commercial Bank of Ceylon PLC |
| | 5. National Development Bank PLC |
| | 6. Hatton National Bank PLC |
| | 7. Nations Trust Bank PLC |
| | 8. Pan Asia Banking Corporation PLC |
| | 9. Sampath Bank PLC |
| | 10. Seylan Bank PLC |
| | 11. Union Bank of Colombo PLC |
| | 12. Cargills Bank PLC |
| | 13. SANASA Development Bank PLC |
| | 14. Housing Development Finance Corporation Bank of Sri Lanka |
| | 15. National Savings Bank |
| | 16. State Mortgage & Investment Bank |

[ගරු (ආචාර්ය) අනිල් ජයන්තමහතා]

| District | Name of the Bank |
|---|---|
| | 17. Pradeshiya Sanwardhana Bank |
| Mulaithivu | 1. Bank of Ceylon<br>2. People's Bank<br>3. Commercial Bank of Ceylon PLC<br>4. Hatton National Bank PLC<br>5. Sampath Bank PLC<br>6. Seylan Bank PLC<br>7. National Savings Bank |

**Table 3: Names of finance companies & licensed microfinance companies operating in districts of Northern province**

| District | Name of the Finance Company | Name of the Licensed Microfinance Company |
|---|---|---|
| Jaffna | 1. Abans Finance PLC<br>2. Alliance Finance Co. PLC<br>3. Asia Asset Finance PLC<br>4. Assetline Finance Ltd<br>5. CBC Finance Ltd<br>6. Central Finance Co. PLC<br>7. Citizens Development Business Finance PLC<br>8. Commercial Credit and Finance PLC<br>9. HNB Finance PLC<br>10. LB Finance PLC<br>11. LOLC Finance PLC<br>12. Mahindra Ideal Finance Ltd<br>13. Mercantile Investments and Finance PLC<br>14. Merchant Bank of Sri Lanka & Finance PLC<br>15. Nation Lanka Finance PLC<br>16. Janashakthi Finance PLC<br>17. People's Leasing & Finance PLC<br>18. PMF Finance PLC<br>19. Sarvodaya Development Finance PLC<br>20. Senkadagala Finance PLC<br>21. Singer Finance (Lanka) PLC<br>22. Siyapatha Finance PLC | 1. Berendina Micro Investments Company Limited<br>2. Lak Jaya Micro Finance Limited<br>3. Sejaya Micro Credit Limited |
| Kilinochchi | 1. Alliance Finance Co. PLC<br>2. Asia Asset Finance PLC<br>3. Assetline Finance Ltd<br>4. Central Finance Co. PLC<br>5. Commercial Credit and Finance PLC<br>6. HNB Finance PLC<br>7. LB Finance PLC<br>8. LOLC Finance PLC<br>9. Mercantile Investments and Finance PLC<br>10. Merchant Bank of Sri Lanka & Finance PLC<br>11. Janashakthi Finance PLC<br>12. People's Leasing & Finance PLC<br>13. Senkadagala Finance PLC<br>14. Singer Finance (Lanka) PLC<br>15. Siyapatha Finance PLC | 1. Berendina Micro Investments Company Limited<br>2. Lak Jaya Micro Finance Limited<br>3. Sejaya Micro Credit Limited |
| Mannar | 1. Alliance Finance Co. PLC<br>2. Asia Asset Finance PLC<br>3. Assetline Finance Ltd<br>4. Central Finance Co. PLC<br>5. Commercial Credit and Finance PLC<br>6. HNB Finance PLC<br>7. LB Finance PLC<br>8. LOLC Finance PLC<br>9. People's Leasing & Finance PLC<br>10. Sarvodaya Development Finance PLC | 1. Sejaya Micro Credit Limited |
| Vavuniya | 1. Abans Finance PLC<br>2. Alliance Finance Co. PLC<br>3. Asia Asset Finance PLC<br>4. Assetline Finance Ltd<br>5. CBC Finance Ltd<br>6. Central Finance Co. PLC<br>7. Citizens Development Business Finance PLC<br>8. Commercial Credit and Finance PLC<br>9. HNB Finance PLC<br>10. LB Finance PLC<br>11. LOLC Finance PLC<br>12. Mahindra Ideal Finance Ltd<br>13. Mercantile Investments and Finance PLC<br>14. Merchant Bank of Sri Lanka & Finance PLC<br>15. Janashakthi Finance PLC<br>16. People's Leasing & Finance PLC<br>17. Sarvodaya Development Finance PLC<br>18. Senkadagala Finance PLC<br>19. Singer Finance (Lanka) PLC<br>20. Siyapatha Finance PLC<br>21. Vallibel Finance PLC | 1. Berendina Micro Investments Company Limited<br>2. Lak Jaya Micro Finance Limited<br>3. Sejaya Micro Credit Limited |
| Mulaithivu | 1. Alliance Finance Co. PLC<br>2. Asia Asset Finance PLC<br>3. Assetline Finance Ltd<br>4. Associated Motor Finance Co. PLC<br>5. Commercial Credit and Finance PLC<br>6. HNB Finance PLC<br>7. LB Finance PLC<br>8. LOLC Finance PLC<br>9. Mercantile Investments and Finance PLC<br>10. People's Leasing & Finance PLC | 1. Berendina Micro Investments Company Limited<br>2. Lak Jaya Micro Finance Limited<br>3. Sejaya Micro Credit Limited |

| දිස්ත්‍රික්කය | රාජ්‍ය බැංකු ගණන | පෞද්ගලික බැංකු ගණන* | මුදල් සමාගම් ගණන | බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ගණන |
|---|---|---|---|---|
| යාපනය | 7 | 13 | 22 | 3 |
| කිලිනොච්චි | 5 | 6 | 15 | 3 |
| මන්නාරම | 6 | 5 | 10 | 1 |
| වවුනියාව | 7 | 10 | 21 | 3 |
| මුලතිව් | 3 | 4 | 10 | 3 |

* දේශීය පෞද්ගලික බැංකු සහ විදේශීය බැංකු ශාඛාවන් ඇතුළත් වේ.

(ii) රාජ්‍ය හා පෞද්ගලික බැංකු විසින් ණය ලබාදීමේදී අය කරනු ලබන පොලී අනුපාතයන් පිළිබඳ දත්ත මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සතුව නොපවතී.

2025 සැප්තැම්බර් මාසය තුළ, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් 22.69% සිට 39.40% දක්වා පරාසයක වන වාර්ෂික සඵල පොලී අනුපාතික යටතේ ණය ලබාදී ඇත.

(ආ) (ii) ඒ පිළිබඳ වාර්තා වී නොමැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 61 වන වගන්තිය සමඟ කියවිය යුතු 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත සහ 2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත යන පනත්හි ප්‍රතිපාදන යටතේ මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීමේ කාර්යභාරය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඊට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) පිළිබඳ වන 2009 අංක 01 දරන සංශෝධිත රෙගුලාසි සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) පිළිබඳ වන 2009 අංක 01 දරන සංශෝධිත රෙගුලාසි යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කරනු ලබයි.

එසේම ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරි පනත් කෙටුම්පත සකස් කරමින් පවතින අතර, ඉදිරියේදී එය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත. ඒ අනුව මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතන පිළිබඳව අධීක්ෂණය කිරීමේ කටයුතු විධිමත්ව සිදු කිරීමට අපේක්ෂා කරයි.

(ඇ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### 2022 අප්‍රේල් මාසයේදී මූල්‍ය බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමේ නීතිමය පදනම
### 2022, ஏப்பிரலில் நிதி திவால்நிலையை அறிவித்தமைக்கான சட்ட அடிப்படை
### LEGAL BASIS OF DECLARING FINANCIAL BANKRUPTCY IN APRIL, 2022

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ පහත සඳහන් ප්‍රශ්නාවලිය ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් විමසීමට කැමැත්තෙමි.

2022 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව පසු වසර 74ක ස්වාධීන ඉතිහාසය තුළ පළමුවරටම බංකොලොත් වූ රාජ්‍යයක් ලෙස ප්‍රකාශ විය. එය රජය විසින් විදේශ ණය ගෙවීම් තාවකාලිකව අත්හිටුවීමේ - debt standstill - තීරණයක් ගත් අතර, එය මුදල් අමාත්‍යාංශය හා මහ බැංකු අධිපතිතුමා විසින් "පෙර අනුමානිත ණය පිරිවැය අසම්පූර්ණත්වයක්" - "pre-emptive default" - ලෙස හැඳින්විය.

එම ප්‍රකාශය 2022 අප්‍රේල් 12 වැනිදා මාධ්‍ය නිවේදනයක් මඟින් නිකුත් කර ඇති අතර, ඒ අනුව සියලු විදේශ ණය ගෙවීම් නවතා දැමීමට නියමිත විය. මෙහි සාධක ලෙස විදේශ විනිමය ආරක්ෂණ කෝෂය ඉක්මවා දියුණු වී තිබීම, රාජ්‍ය මූල්‍ය ගොඩනැඟිලි බිඳ වැටී තිබීම සහ ඉන්ධන, ආහාර හා ඖෂධ ආනයන සඳහා මුදල් ලබා දීමට නොහැකි වීම සඳහන් විය.

කෙසේ වෙතත්, මෙම තීරණය පාර්ලිමේන්තුවේ අනුමැතියකින් පරිබාහිරව ගත් එකක් වන අතර, අඛණ්ඩව 2022 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත හෝ ව්‍යවස්ථානුකූල යම් තීරණයක් මඟින් එය අනුමත කර නොමැත. ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව අනුව, "පාර්ලිමේන්තුවට ජන මූල්‍යය පිළිබඳ පූර්ණ පාලනය ලැබේ. කිසිදු බද්දක්, අනුපාතයක් හෝ වෙනත් ගාස්තුවක් කිසිදු ස්ථානීය ආයතනයක් හෝ රාජ්‍ය ආයතනයක් විසින් පැනවිය නොහැකි ය; එය පනතක් මඟින් හෝ පාර්ලිමේන්තුව මඟින් සම්මත කළ පනතක බලයෙන් පමණක් පැනවිය හැක."

එබැවින්, විදේශ ණය ගෙවීම් අත්හිටුවීම තනිව විධායකය විසින් ගත් ක්‍රියාමාර්ගයක් වන අතර, එය ව්‍යවස්ථානුකූල හා නීතිමය සම්මත ක්‍රමවේද පිළිබඳ දැඩි සැකයක් මතු කරයි.

මෙම ක්‍රියාවලිය "ජාතික අවශ්‍යතාවක්" - "a national importance" - යන නමින් මූල්‍ය අමාත්‍යාංශය හා මධ්‍යම බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබුවද, පූර්ව පාර්ලිමේන්තු අනුමැතියක් නොතිබීම, මැතිවරණ මණ්ඩලයට නිල වාර්තාවක් නොමැති වීම හෝ පවතින මූල්‍ය නීති අනුව ගැසට් පත්‍රයක් නිකුත් නොකිරීම යන කරුණු මෙයට අදාළ වේ. එම නිසා පාර්ලිමේන්තුවට මෙම තීරණය පිළිබඳව විවෘතව සාකච්ඡා කිරීමට හෝ විමසීමට අවස්ථාවක් නොලැබිණ. ඒ නිසා මේ තීරණය ශ්‍රී ලංකාවේ අරමුදල් විශ්වාසය, ආයෝජක විශ්වාසය හා ජාත්‍යන්තර ණය වෙළෙඳ පොළ ප්‍රවේශය දැඩි ලෙස අලාභදායී කළේය.

අවුරුදු තුනක් ගත වූ අද දක්වා, ශ්‍රී ලංකාව ප්‍රධාන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ තවමත් නොගෙවූ - default - රාජ්‍යයක් ලෙස සලකුණු වී ඇත. ආධාර සහන ණය මාර්ග පවා තවමත් සීමිතය. ආර්ථික විශ්වාසය බිඳ වැටී ඇත. 2025 නොවැම්බර් 7වැනි දා අය වැය ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී ජනාධිපති අනුර කුමාර දිසානායක මේ විෂයය පිළිබඳව විවෘත අවධානය යොමු කළ අතර, මූල්‍ය වගකීම් සහ පාර්ලිමේන්තු පාලනය වර්ධනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළේය. ඒ නිසා 2022 ණය අත්හිටුවීම පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව ගනු ලැබුවේ කාගේ බලය යටතේද යන්න සොයා බැලීමේ අවශ්‍යතාව සහ අනාගතයේදී එවැනි විශාල මූල්‍ය තීරණ පාර්ලිමේන්තු අධීක්ෂණය සහ අනුමැතිය මත පමණක් ගත යුතු බව තහවුරු කිරීම වැදගත් බව පෙන්වමි.

Hon. Speaker, accordingly, I seek clarification on the following matters:

1. Governance and Authority

   Who was serving as the Governor of the Central Bank of Sri Lanka at the time of the April, 2022 declaration of bankruptcy and what official role did he paly in advising, authorizing or announcing the suspension of external debt payments?

2. Communication and Legal Mandate

   Did the then Governor formally communicate to Parliament or the Minister of Finance that Sri Lanka was unable to meet its external debt obligations? Who were the members of the Monetary Board at that time and had they approved such action? If so, under what statutory or constitutional authority was such a declaration made without prior Parliamentary sanction?

3. Form and Approval of Declaration

   Can the Hon. Prime Minister confirm the exact date, form and the legal basis of the debt-standstill declaration? Was the decision approved by the Cabinet of Ministers or endorsed by Parliament under Article 148 of the Constitution? Was any statutory instrument, gazette or resolution issued to formalize the declaration? Was the Attorney-General's consent or advice obtained?

4. Documentary Evidence

   Was there any Cabinet Paper, written recommendation or internal communication from the Central Bank to the Ministry of Finance seeking approval for a debt moratorium prior to 12th April, 2022? If so, will the Hon. Prime Minister table those documents for Parliamentary scrutiny?

5. Extraordinary Instructions

   Were any special or extraordinary instructions issued or was any temporary power bestowed upon the Central Bank that substituted or abrogated the Constitutional powers of Parliament, thereby enabling such a declaration to be made?

[ගරු රවි කරුණානායක මහතා]

6. Executive Authorization and Legal Basis

If Parliamentary approval was not obtained, who, within the Executive, the Ministry of Finance or the Central Bank, authorized the suspension of debt repayments? On what legal basis was such authority exercised and was it consistent with the Constitution and the Fiscal Management (Responsibility) Act?

7. Constitutional Compliance and Legislative Reform

Does the Government acknowledge that the decision to default on foreign loans, taken without Parliamentary approval, may constitute a violation of Article 148 and related financial provisions?

As you know, Sir, we, the Parliament, has full control over public finance in terms of Article 148 and for the actions taken upto today, we are held responsible. So, a wrong decision taken, basically percolates down, and we are still governing on the same basis.

If so, what remedial or legislative measures have been taken to regularize the decision, restore Sri Lanka's sovereign credit rating and ensure that future suspensions of debt obligations are subject to Parliamentary approval?

I hope this would never happen again. On that basis, today, we basically have credit ratings of C minus or even not allowed to be given ratings.

Specifically, does the Government intend to introduce a Sovereign Debt Management and Accountability Act to codify procedures and prevent unilateral Executive action in external debt matters?

8. IMF Agreement and Citizen-centric Reforms

President Ranil Wickremesinghe's decision to sign the Extended Fund Facility - EFF - Agreement with the International Monetary Fund - IMF- on the 28th of April, 2023, which was subsequently debated in this House, helped stabilize the economy and restore partial international confidence. While the present Government has also accepted the Agreement, could it now be made more citizen-friendly? What specific policy recalibrations or amendments have been proposed to ensure equitable burden-sharing, social protection and transparency in its implementation?

Sir, I am asking for reasons because the IMF is only interested in fiscal maintenance and the Central Bank is only interested in looking at the interest rates and the exchange rates. But, Parliament is held responsible or accountable for restoring the growth of the country.

When we asked the Central Bank Governor about that at the Committee on Public Finance last week, his answer was, I quote, "You can ask the Finance Minister". And, that is the reason why I am asking it now.

9. Conditions for Credit Restoration

What specific conditions, structural benchmarks or policy reforms have been imposed by international lenders and credit-rating agencies for reinstating Sri Lanka's normal access to concessional and commercial borrowing?

10. Quantification of Economic, Fiscal, Human and Reputational Cost

What has been the total economic, fiscal, human and reputational cost to the country as a result of the April, 2022 debt standstill, including its impact on investor confidence, sovereign credit downgrades, elevated borrowing costs, bankruptcy of business entities and individuals and Sri Lanka's prolonged exclusion from global financial markets?

Sir, it was mentioned that the cost of the Central Expressway has increased from Rs. 158 billion to Rs. 350 billion. It is an increase of Rs. 192 billion. Then, the cost of the Bandaranaike International Airport expansion project goes up from Rs. 158 billion to Rs. 260 billion. Those are just two examples which have been impacted on. So, owing to not getting Parliamentary approval before going into a debt standstill, we have lost out Rs. 294 billion on just two projects.

Sir, I am seeking an Answer through the Hon. Prime Minister as to how we overcome this particular situation.

Thank you.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා කල් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මම මේ වෙලාවේදී ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ප්‍රශ්න සම්බන්ධයෙන්. පක්ෂ නායකයන්ට ලබා දී තිබෙන මෙම අවස්ථාවත්, මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමත් අපි අගය කරනවා. නමුත්, මෙහි ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව කරුණාකර ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කළ ප්‍රශ්නය දිහා බලන්න. ගරු මන්ත්‍රීතුමනි, මෙහි font size එක තවත් අඩු කළොත් කියවාගන්නත් බැරි වෙනවා. ඒ වාගේම මේ ප්‍රශ්නයේ ඇතුළත් අනුප්‍රශ්න 10 ඇතුළේ තවත් අනුප්‍රශ්න 24ක් තිබෙනවා. මගේ කාර්යාලයට මේ ප්‍රශ්නය ලැබී තිබෙන්නේ ඊයේ සවස 2.55ට. සවස 2.55ට මේ ප්‍රශ්නය අපටත් ලැබිලා, උත්තරය ඉදිරිපත් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයටත් යොමු කරලා, උදේ 9.30 වෙනකොට උත්තරය දෙන්න පුළුවන්ද? මේ වාගේ කරුණක් මම මීට කලිනුත් ඉදිරිපත් කළා, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ මගේ අමාත්‍යාංශයට ඉදිරිපත් කරපු ප්‍රශ්නයක් සම්බන්ධයෙන්. හැබැයි අපි ඒ ප්‍රශ්නයට උත්තර දුන්නා. ඒ ප්‍රශ්නයේ තිබුණා, විෂය කොටස් 7ක්. ගරු කථානායකතුමනි, එදාත් මා එය ඔබතුමාගේ අවධානයට යොමු කළා. ස්ථාවර නියෝග 27(2) යටතේ යම් තනි විෂයයක් පිළිබඳව විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ප්‍රශ්න අහන්න පුළුවන්.

ඒකෙන් තමයි ප්‍රශ්නය අහන කෙනාටයි, ඒ ප්‍රශ්නයට යොමු වන කෙනාටයි සාධාරණයක් වෙන්නේ. නමුත් මෙහිදී විෂය කරුණු ගණනාවකට අදාළව, සමහර විට අමාත්‍යාංශ ගණනාවකට අදාළව ප්‍රශ්න ඉදිරිපත් කරනවා. ඊළඟට, මේ ප්‍රශ්නය කොළ දෙකකට ඉදිරිපත් කරන නිසා font size එකත් අඩු කරලා ප්‍රශ්න 10 ඇතුළේ අනුප්‍රශ්න 24ක් ඉදිරිපත් කර තිබෙනවා. එතකොට වෙන්නේ මේ ප්‍රශ්නයට එදිනම උත්තර දෙන්න බැරි වෙලා කල් ගන්න සිදුවීම. ඒක තමයි වෙන්නේ. ගරු කථානායකතුමනි, එහෙම නම් එක්කෝ අපි මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කල් ගන්නවා කියන පදනමෙන් සතියක් හරි දෙකක් හරි ඒ විධියට යමු. එහෙම නැත්නම්, ඇත්තටම ප්‍රශ්නය අහන කෙනාටයි, ප්‍රශ්නයට ප්‍රස්තුත වන අයටයි සාධාරණයක් වන විධියට මේ පිළිබඳව යම් එකඟතාවකට එමු. එහෙම නොවුණොත්, මේ විධියට අපි මේ කරුණ misuse කරන්න ගියොත්, ස්ථාවර නියෝග 27(2) යටතේ අහන මේ ප්‍රශ්න තේරුමක් නැති වෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අගය කිරීමක් කරන අතරම මම හිතනවා, අපි හැමෝම මේ ගැන අවධානය යොමු කළ යුතුයි කියලා. එහෙම නැතුව, අපිත් සතියක් දෙකක් කල් අරගෙන උත්තර දුන්නාට පස්සේ ඒකෙන් ඔබතුමාටත් වැඩක් නැති වෙනවා. එම නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලායි මම කියන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂයේ සිටින පක්ෂ නායකතුමන්ලා මේ පිළිබඳව අවධානය යොමු කළොත් හොඳයි කියා මා යෝජනා කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියපු කාරණයටයි මම මේ දේ කියන්නේ. මගේ ප්‍රශ්නය මධ්‍යාහ්න 12.05 වනකොට ලබා දීලා තිබෙනවා. ඒකේ නැවත සංශෝධනය එතුමන්ලා ඉල්ලුවාට පසුව කරන එකක්. මේ අවස්ථාවේ මම අහලා තිබෙන්නේ රටට බලපාන ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කල් ගත්තාට ප්‍රශ්නයක් නැහැ. නමුත්, අපට අවශ්‍ය වෙන්නේ මේ සඳහා උනන්දු වීම. රටට බලපා තිබෙන ප්‍රශ්නයේ බැරෑරුම්කම නිසා තමයි මම එවැනි ප්‍රශ්නයක් අහලා තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහන්න විපක්ෂයේ පක්ෂ නායකයන්ට තිබෙන අයිතිය අපි සහමුලින්ම පිළිගන්නවා සහ එය අගය කරනවා. එතුමන්ලා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ප්‍රශ්නවලින් යම් කිසි දෙයක් අපිත් ඉගෙන ගන්නවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ගරු කථානායකතුමනි, මීට මාස කිහිපයකට කලින් Parliamentary Business Committee එකට මම මේ සම්බන්ධව වාර්තාවක්ම ඉදිරිපත් කළා. මේ ප්‍රශ්නය දිගු වීමෙන් එක පැත්තකින් කාලය කළමනාකරණයේදී ගැටලුවක් ඇති වනවා වාගේම ඇත්තටම පක්ෂ නායකයෙකුගේ පැත්තෙන් ජාතික අවධානයක් යොමු කරලා ගන්න ඕනෑ කරන උත්තරය ප්‍රමාද වුණාට පස්සේ ඒකේ political essence එක නැති වෙලා හැන්සාඩ් වාර්තාවට technical උත්තරයක් එනවා.

ඊළඟට, Ministerial Statements කියන category එක යටතේ තමයි පහු වෙලා අපට මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න වෙන්නේ. මම සභානායක ලේකම්තුමාටත් මේ ගැන විශේෂයෙන් කියලා තිබෙනවා. දවසකට අමාත්‍යාංශ නිවේදන දෙකකට වඩා ඉදිරිපත් කරන්න වුණොත් මොකද වෙන්නේ? පරණ අමාත්‍යාංශ නිවේදන දෙකකුත් එන අතර, මේ වාගේ ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පහුවෙලා උත්තර දෙන්න වෙන්නේත් Ministerial Statements විධියටයි. ඒ අතර එදිනට නියමිත ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නත් එනවා. එතකොට වෙන දේ තමයි, අමාත්‍යාංශ නිවේදන ඉදිරිපත් කිරීම පැය භාගයෙන් කොහෙත්ම කරන්න බැරි වෙන එක.

මොකද, ඇමතිවරුන්ටත් දැන් මන්ත්‍රීවරුන් විවිධ ප්‍රශ්න යොමු කරනවා. එතකොට ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්නත් ඇමතිවරුන්ට සාධාරණ කාලයක් දෙන්න ඕනෑ. ඇත්තටම අපි දැන් ඇමතිවරුන්ව encourage කරන්නේ නැහැ. රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ Question එක මම උදේම දැක්කා. ඒකේ font size එකත් මම හිතන විධියට 9.5 හෝ 10වලින් තිබෙන්නේ. එම නිසා මම stopwatch එක දැම්මා. එය මම දැම්මේ, එතුමා කථා කරන්න පටන් ගත්තාට පසුවයි. ෆෝන් එකේ තිබෙනවා, screenshot එක. විනාඩි නවයයි තත්පර හතළිස් පහක් ගත වෙලා තිබෙනවා. එතකොට එතුමාගේ ප්‍රශ්නයට අදාළ ඇමතිවරයා උත්තරය දෙනකොට ඒ ඇමතිතුමාට කොහෙත්ම බැහැ, විනාඩි නවයකුත් තත්පර හතළිස්පහකින් උත්තරය දෙන්න.

රවි කරුණානායක මන්ත්‍රීතුමනි, අපට වඩා ඔබතුමා ආණ්ඩු පක්ෂය පැත්තේ ඉඳලා ඇති. මේ ප්‍රශ්නයට ඔබතුමා උත්තර දුන්නා නම් ඔබතුමාට විනාඩි පහළොවකට වඩා ගතවනවා. එම නිසා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා වාගේම නිසි ගෞරවය ඇතිව මේ දේ කියනවා. මොකද, මෙය වාදයක් නොවෙයි. මම සම්පන්දන් මැතිතුමාගේ Questions බැලුවා. ඒවා ඉතා ප්‍රබලයි සහ නිශ්චිතයි. එලෙස තව පක්ෂ නායකයන් මෙවැනි ප්‍රශ්න ඉදිරිපත් කරලා ඇති. පක්ෂ නායකයන්ගෙන් මම ඉල්ලා සිටින්නේ මෙයයි.

ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ ඔබතුමන්ලා මේ අවස්ථාව හරියට පාවිච්චි කරන්න. ගරු කථානායකතුමනි, මම ඉතාම පැහැදිලිව ඔබතුමාට කියන්නේ මෙයයි. මම නම් කිසිම ඇමතිවරයෙකුට - මමත් ඇතුළුව - කියන්නේ නැහැ, අනිවාර්යයෙන්ම අනික් දවසේ මෙම ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා. මොකද, කල් අරගෙන තමයි මෙවැනි ප්‍රශ්නවලට උත්තර දෙන්න වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Parliamentary Business Committee එකේදි අපි එකඟතාවකට ආවා, විනාඩි 5කින් ප්‍රශ්නය අහමු, විනාඩි 5කින් උත්තරය දෙමු කියලා. ඒ එකඟතාවට අනුව අපි කටයුතු කරමු කියලා පක්ෂ නායකයන්ගෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ප්‍රායෝගික ගැටලු ගැන තමයි එහිදී සාකච්ඡා කළේ. එම නිසා අපි Parliamentary Business Committee එකේදි මේ සම්බන්ධව දීර්ඝව සාකච්ඡා කරලා අවසන් එකඟතාවකට එමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් අපට කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි.

මීළඟට, අමාත්‍යාංශ නිවේදන. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, එය අපි Parliamentary Business Committee එකේදි කථා කරලා ගත්ත තීන්දුවක්. ඒ තීන්දුව ක්‍රියාත්මක කරමු. එතකොට මේ ප්‍රශ්නය ඉවරයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, අපි ඊළඟ වැඩකටයුත්තට යමු.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන්ගේ දක්ෂතා අනුගමනය කරමින් තමයි මම කටයුතු කරන්නේ. මම දැකලා තිබෙනවා, අනුර දිසානායක ජනාධිපතිතුමාත් ඒ කාලයේ පක්ෂ නායකයෙක් හැටියට මේ වාගේම ප්‍රශ්න අහනවා. මමත් ඉගෙන ගෙන තිබෙන්නේ ඒ ශෛලිය ඉදිරියට ගෙන යන්න. මේ සම්බන්ධව පසුවිපරම් කරලා බලන්න, ඒ දවස්වල මොනවාද වුණේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන. කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

## අනාගත සංවර්ධන ඉලක්ක සහ ණය තිරසරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර: මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## எதிர்கால அபிவிருத்தி இலக்குகள் மற்றும் கடன் நிலைத்தன்மையை அடைவதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## MEASURES TAKEN TO ACHIEVE FUTURE DEVELOPMENT GOALS AND DEBT SUSTAINABILITY: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අමාත්‍යාංශ නිවේදන දෙකක් තිබෙනවා ඉදිරිපත් කරන්නට. ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ 2025 ඔක්තෝබර් 07වන දින අසන ලද ප්‍රශ්නයට මා පළමුව පිළිතුර ලබා දෙනවා.

1. සංචිත මුදල් ආර්ථිකයක මුදල් පදනම ලෙස සලකනවා. එහි අන්තර්ගත වන්නේ ව්‍යවහාරයේ පවතින මුදල්, මහ බැංකුව වෙතැති වාණිජ බැංකු සතු තැන්පතු ඇතුළු මුදල් මැවීමේ ක්‍රියාවලිය සඳහා පදනම සපයන සංරචක පමණයි. සංචිත මුදල් ගණනය කිරීමේදී මහ බැංකුව විසින් සිදු කරන විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට අදාළ ගනුදෙනු ඇතුළත් නොකරයි. 2025 අගෝස්තු මාසය අවසාන වනවිට සමස්ත සංචිත මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 1,712ක් වුණා. සැප්තැම්බර් මාසය වනවිට එය රුපියල් බිලියන 1,695යි.

   වගුවක් ඉදිරිපත් කරලා තිබෙනවා, මාස්පතා මෙම සංචිත මුදල් වෙනස් වෙච්ච ආකාරය පිළිබඳව. 2024 ජනවාරි සිට 2025 අගෝස්තු වෙනකම් මාස්පතා එම මුදල් වෙනස් වුණු හැටි එම වගුව තුළින් ඉදිරිපත් කරලා තිබෙනවා. මම එය කියවන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ අවස්ථාවේදී එම වගුව මම සභාගත* කරනවා.

---

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

2. මේ යටතේ අසා තිබෙන්නේ, මේ රටේ ණය ප්‍රමාණය පිළිබඳවයි. සැප්තැම්බර් මාසය අවසාන වනවිට සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 30.9ක් වෙනවා. මධ්‍ය කාලීන වාර්තාවේත් ණය පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. එම වාර්තාව අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ සමස්ත ණය ප්‍රමාණය ඇතුළේ විදේශීය ණය ප්‍රමාණය ට්‍රිලියන 11.3කුත්, දේශීය ණය ප්‍රමාණය ට්‍රිලියන 19.6කුත් වෙනවා. - *[බාධා කිරීමක්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Minister, Why do you not -

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
I am answering the Question raised by the Hon. Sajith Premadasa, Leader of the Opposition, not your Question, Hon. Ravi Karunanayake. I will come to that later.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මම කිව්වේ දේශීය සහ විදේශීය ණය ප්‍රමාණය.

ඊළඟට, ආණ්ඩුව පත් වීමෙන් පසු ලබා ගත් ණය ප්‍රමාණය කොපමණද කියලා අහලා තිබෙනවා. 2024 සැප්තැම්බර් මාසයේ ඉඳලා අගෝස්තු මාසය වෙනකම් ලබා ගත් ණය ප්‍රමාණය තිබෙනවා. දේශීය ශුද්ධ ණය ලබා ගැනීම් - net issuance of Treasury Bills and Bonds - රුපියල් බිලියන 1,393ක්. ඒ වාගේම විදේශීය ණය ලබා ගැනීම් තිබෙනවා, lendersලාගේ disbursements රුපියල් බිලියන 526ක්.

ඊළඟට, විදේශීය ණය සම්බන්ධයෙන් ගත් කළ එය ද්විපාර්ශ්වීය, බහුපාර්ශ්වීය සහ ස්වෛරී බැඳුම්කර ලෙස වර්ගීකරණය කරන ලෙස ඉල්ලා තිබෙනවා.

සැප්තැම්බර් දක්වා වන මේකේ සම්පූර්ණ වාර්තාව අපේ මධ්‍ය කාලීන - mid-year - වාර්තාවේ තිබෙනවා. නමුත් මෙතැන ඉදිරිපත් කර තිබෙන්නේ පිළිතුරට අදාළව අගෝස්තු දක්වා සකස් කරපු ප්‍රමාණය පමණයි. ඒ අනුව ද්විපාර්ශ්වීය ණය ට්‍රිලියන 3.3ක්, බහුපාර්ශ්වීය ණය ට්‍රිලියන 4.2ක්, ස්වෛරී බැඳුම්කර ට්‍රිලියන 3.1ක් සහ කාලීන ණය පහසුකම් ට්‍රිලියන 0.7ක් යනුවෙන් එහි සඳහන් කර තිබෙනවා.

3. මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, මෙම වසර තුළ ණය වාරික සහ පොලී වශයෙන් ගෙවනු ලැබූ ප්‍රමාණය කොපමණද කියලායි.

විදේශීය ණය වාරික හා පොලී ප්‍රමාණය රුපියල් බිලියන 521ක් වෙනවා. ඒ, ණය වාරික ප්‍රමාණය රුපියල් බිලියන 310ක් සහ පොලී ප්‍රමාණය රුපියල් බිලියන 211ක් වශයෙන්. දේශීය ණය වාරික හා පොලී ප්‍රමාණය රුපියල් බිලියන 6,731ක් වෙනවා. එහි අන්තර්ගතය දෙකට කැඩුවාම, ණය වාරික ප්‍රමාණය රුපියල් බිලියන 5,391ක් සහ ණය පොලිය රුපියල් බිලියන 1,340ක් වෙනවා.

ඉදිරි වර්ෂ 5 තුළදී අප විසින් ගෙවිය යුතු දේශීය සහ විදේශීය සමස්ත ණය ප්‍රමාණයත්, විදේශීය ණය ප්‍රමාණය වෙනමත් ඉදිරිපත් කර තිබෙනවා.

4. මෙම ප්‍රශ්නය තුළින් ඉදිරි වසර 5 ඇතුළත මේ රජයේ ඇස්තමේන්තුගත ආර්ථික වර්ධන වේගය කොපමණද කියන කාරණයත්, ණය සම්බන්ධවත් විමසා තිබෙනවා.

ඒ අනුව අපි ඉදිරි වර්ෂ 5ක කාලය සඳහා baseline projections සලකා බලා දැනට ක්‍රියාත්මක වෙන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වා ගෙන යෑම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව, අපනයන ඉහළ නැංවීම, ශක්තිමත් විදේශීය ශ්‍රම ප්‍රේෂණ සහ සේවා අපනයනවල වර්ධනය යනාදී උපකල්පන මත පදනම්ව මේ කෙටි කාලයේදී අදාළ ආර්ථික වර්ධන වේගය අවමය සියයට 4.5ක මට්ටමකින් පවත්වා ගෙන යන්න අපේක්ෂා කරනවා. අය වැය කථාව ඉදිරිපත් කරන අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමා සඳහන් කළා, මධ්‍ය කාලීනව අපි සියයට 7ක ආර්ථික වර්ධනයක් ඉලක්ක කරමින් වැඩ කටයුතු කරනවා කියලා. මෙම ආර්ථික වර්ධන වේගය සමඟ මූල්‍ය කළමනාකරණය වඩාත් ශක්තිමත් කරමින් රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාව ද ඉහළ නැංවූ විට, ශ්‍රී ලංකාවේ විදේශීය හා දේශීය ණය තිරසර මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය මූල්‍යමය අවකාශය නිර්මාණය කිරීමට අපිට හැකි වෙලා තිබෙනවා. ඒ විස්තරත් අය වැය කථාවේදී ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළා.

5. මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙනවා ණය ගෙවීම සඳහා විදේශ ප්‍රේෂණ සහ අපනයන ආදායම එකතු කර ගැනීම පිළිබඳව.

රජය විසින් වසරකදී විදේශීය ණය සේවාකරණය සිදු කරනු ලබන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, බහුපාර්ශ්වීය-ද්විපාර්ශ්වීය මූලාශ්‍රවලින් ලබා ගත් ණය, දේශීය-විදේශීය විනිමය හුවමාරු, අනෙකුත් දේශීය මූලාශ්‍ර හා දේශීය විනිමය වෙළෙඳ පොළෙන් මහ බැංකුව විසින් කරන ශුද්ධ මිලදී ගැනීම් මඟින් දේශීය-විදේශීය විනිමය වෙළෙඳ පොළත්, මහ බැංකුවේ අවශෝෂණ සඳහා රඳා පවතින වෙළෙඳ භාණ්ඩ අපනයනය, සංචාරක ඉපැයීම් ඇතුළු සේවා අපනයන, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, විදේශීය සෘජු හා විවිධ ආයෝජන සහ අනෙකුත් විදේශීය ලැබීම් ආකාරයෙන් වෙළෙඳ පොළට ලැබෙන විදේශ විනිමය තුළින් තීරණය වන දේශීය-විදේශීය විනිමය වෙළෙඳ පොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වය මතයි.

ඒ අනුව ණය සේවාකරණය සඳහා භාවිත කරන මෙම ලැබීම්වල එකතුව ප්‍රාග්ධනය සහ පොලී සඳහා වාර්ෂික ණය සේවාකරණ අවශ්‍යතාවට වඩා අඩු නම්, ණය සේවාකරණය සිදු කරන්නේ දළ නිල සංචිත භාවිත කරමිනි.

කෙසේ වෙතත්, 2025 වසර තුළ මේ දක්වා ණය සේවාකරණය සඳහා වූ විදේශීය ලැබීම්, විදේශීය ණය ගෙවීම් පමණක් නොව, 2023 වසර අවසානය වනවිට ඩොලර් බිලියන 4.4 සිට 2025 වසරේ සැප්තැම්බර් මස අවසානය වනවිට ඩොලර් බිලියන 6.2 දක්වා නිල සංචිත වැඩි වෙලා තිබෙනවා. වර්තමාන තත්ත්වය පිළිබඳව වන මෙම තොරතුරුත් ගරු ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරන අවස්ථාවේදී සඳහන් කළා.

6. මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, සෘජු විදේශීය ආයෝජන කොච්චර ලැබුණාද කියන එකයි. 2024

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සෘජු විදේශීය ආයෝජන ඇමෙරිකානු ඩොලර් මිලියන 267කුත්, ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ඩොලර් මිලියන 827කුත් ලැබී තිබෙන බව ආයෝජන මණ්ඩලයේ වාර්තා අනුව සඳහන් වෙනවා.

7. මේ යටතේ අසා තිබෙනවා SVAT සම්බන්ධව. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයේත් මේ ගැන සඳහන් වෙලා තිබුණා. කෙසේ වෙතත්, මම මේ ප්‍රශ්නයට කෙටි පිළිතුරක් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නම්. 2011 වර්ෂයේදී තමයි මේ සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ, කෙටි කාලීන ක්‍රමයක් විධියට. ඒ, මේක දිගු කාලීනව පවත්වාගෙන යෑම සඳහා නොවෙයි, කෙටි කාලීන උපක්‍රමයක් විධියට. *[බාධා කිරීමක්]* No, no. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ Question එකෙන් ඕනෑ නම් පොඩි කොටසක් අයින් කරන්න පුළුවන්. නමුත්, ඔබතුමා ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයේ සම්පූර්ණයෙන්ම තිබෙන්නේ VAT සම්බන්ධවයි. 2011දී අපි ඒ ක්‍රමය හඳුන්වා දීලා තිබෙනවා, කෙටි කාලීන උපක්‍රමයක් විධියට. ඉක්මනින්ම බදු ආපසු ගෙවීමට සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දෙන තෙක් තාවකාලික පිළියමක් වශයෙන් ඒ ක්‍රමය හඳුන්වා දී තිබෙනවා.

අන්තර්ජාතික වශයෙන් පිළිගන්නා එකතු කළ අගය මත බදු ක්‍රමවේදය වන්නේ, බදු එකතු කරන්නා විසින් භාණ්ඩ මිලදී ගන්නා අවස්ථාවේදී අදාළ VAT කොටස මුදලින් ගෙවා පසුව විකුණුම් මත අය කරනු ලබන VAT ප්‍රමාණයෙන් යෙදවුම් බද්දක් ලෙස තම නිමැවුම් බද්දෙන් අඩු කර ඉතිරිය රජයට ගෙන ඒමේ ක්‍රමවේදයකි. 2025 වසරේ ඔක්තෝබර් 01වන දින සිට එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරනවා. ඒ අවදානම් පාදක කරගත් ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම මඟින් තමයි කරන්නේ. ඒකට දැන් පියවර අරගෙන, එය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මෙම ක්‍රමවේදය යටතේ වක්‍ර අපනයනකරුවන්හට එකතු කළ අගය මත බද්ද ගැනුම්කරුවන් විසින් ගනුදෙනුව සිදු වන අවස්ථාවේදීම ගෙවිය යුතු බැවින් ණය වවුචර යොදා ගත් කාලයට සාපේක්ෂව මෙම ක්‍රමවේදය ඔවුන්ගේ මූල්‍ය ප්‍රවාහයට හිතකර ලෙස බලපායි.

මෙහි අදහස වෙන්නේ මේකයි. වක්‍ර අපනයනකරුවන් - deemed exporters - කලින් බඩු විකුණනකොට කිසිම ආකාරයකට බදු එකතු කර ගත්තේත් නැහැ, බඩු මිලදී ගන්නකොට බදු ගෙව්වේත් නැහැ. නමුත්, දැන් SVAT එක අයින් කරපු නිසා deemed exportersලාට අතිරේක මුදල් වාසියක් ලැබෙනවා, අපනයනකරුට විකුණනකොට එතැනින් VAT ප්‍රමාණයක් එකතු කරගන්නා නිසා. එතකොට ඔවුන්ගේ ද්‍රවශීලතාව ඉහළ යනවා. ඒ අනුව SVAT ක්‍රමය 2025 වසරේ ඔක්තෝබර් මස 01වැනි දින සිට අහෝසි වීමත් සමඟ අවදානම් මත පදනම් වූ මුදල් ආපසු ගෙවීමේ පද්ධතිය මේ වනවිටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිස්ථාපනය කරලා තිබෙනවා. පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ කොටසක් ලෙස බදු ආදායම් එකතු කිරීමත්, වැඩිදියුණු කිරීමත්, කාර්යක්ෂම කිරීමත්, ඩිජිටල් මූල්‍ය විනිවිදභාවයකින් යුතුව එකතු කළ අගය මත බදු පරිපාලනය ජාත්‍යන්තර සම්මතයන්ට අනුව ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද වගුව:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை:*
*Table tabled:*

| | සංචිත මුදල් | රුපියල් බිලියන |
|---|---|---|
| | | සංචිත මුදල්වල මාසික වෙනස |
| ජනවාරි - 2024 | 1,489 | 159.9 |
| පෙබරවාරි - 2024 | 1,414 | -74.9 |
| මාර්තු - 2024 | 1,406 | -8.2 |
| අප්‍රේල් - 2024 | 1,427 | 21.0 |
| මැයි - 2024 | 1,396 | -30.3 |
| ජූනි - 2024 | 1,418 | 21.5 |
| ජූලි - 2024 | 1,455 | 37.4 |
| අගෝස්තු - 2024 | 1,486 | 30.6 |
| සැප්තැම්බර් - 2024 | 1,524 | 37.9 |
| ඔක්තෝබර් - 2024 | 1,475 | -49.0 |
| නොවැම්බර් - 2024 | 1,498 | 23.4 |
| දෙසැම්බර් - 2024 | 1,539 | 41.3 |
| ජනවාරි - 2025 | 1,567 | 27.6 |
| පෙබරවාරි - 2025 | 1,590 | 22.6 |
| මාර්තු - 2025 | 1,669 | 79.1 |
| අප්‍රේල් - 2025 | 1,678 | 9.1 |
| මැයි - 2025 | 1,651 | -26.6 |
| ජූනි - 2025 | 1,660 | 9.0 |
| ජූලි - 2025 | 1,688 | 28.3 |
| අගෝස්තු - 2025 | 1,712 | 23.8 |

## සරල කළ එකතු කළ අගය මත බද්ද අහෝසි කිරීමෙන් අපනයන ක්ෂේත්‍රයට වන බලපෑම: මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## எளிமைப்படுத்தப்பட்ட சேர்பெறுமதி வரியை ஒழிப்பதால் ஏற்றுமதித் துறையில் ஏற்படும் தாக்கம்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## IMPACT OF ABOLITION OF SIMPLIFIED VALUE ADDED TAX ON EXPORT SECTOR: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා 2025 සැප්තැම්බර් 24වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නය ගත්තොත්, එහි දීර්ඝ ප්‍රශ්න කීපයක් තිබෙනවා. මම එයට පිළිතුරු සාරාංශගත කරලා කියන්න උත්සාහ කරන්නම්. තොරතුරු තිබෙනවා නම් අපි ඒවා ඉදිරිපත් කරන්නම්.

First, I would like to just mention the background of the SVAT system. This SVAT system was adopted from April 1, 2011 in terms of Section 2(2) of the VAT Act as a temporary measure. Under the SVAT system, businesses that are registered as Registered Identified Purchasers will have to deal with input VAT by using a special voucher called Credit Voucher issued by the Inland Revenue Department when inputs are purchased from businesses registered as Registered Identified Suppliers. However, the SVAT system is not a substitute for a properly functioning VAT system. Running two parallel VAT systems within the IRD is not necessary when the system is automated and the refund system is properly functioning.

So, based on that particular background, the Answer to the Question is summarized as follows:

- The VAT return for a taxable period must be submitted on or before the end of the following month, as per the VAT Act. For example, the SVAT system had been abolished from 01st October. Therefore, the VAT return applicable for the month of October, the registered person can submit immediately, if he or she wants to, by the 01st of November through the *e*-filing system. The new Risk-Based Refund Scheme was introduced for smooth implementation of VAT refunds and the refund must be made within 45 days from the due date of the return submission. However, exporters are not required to wait until the last date to submit the returns. Those can be submitted immediately after the taxable period.
- Once the refund claim is submitted, it will be processed immediately by the system without waiting for the last date.
- The new Risk-Based Refund Scheme operates within an *e*-filing system.
- Refunds are processed based on a risk rating system. Accordingly, the eligible persons will receive their refunds within 45 days from the last date of the return submission.
- Accordingly, the risk is determined by using several criteria based on their past transactions, records and all the information that the Inland Revenue Department has.
- The exporters classified as low or medium-risk category will receive their refund within 45 days without pre-verification.
- However, the exporters who are classified by the system as high risk will receive refunds, again, within 45 days, but subject to pre-verification.
- The new system ensures timely refunds to all eligible persons regardless of their risk category, provided they comply with tax requirements.
- Low-risk exporters will receive timely refunds without compromising compliance requirements, as I have just mentioned. But, high-risk exporters will have to follow these compliance requirements.
- The other concern raised is about competitiveness of businesses. Competitiveness will not be affected by this policy, but rather, its implementation will strengthen the business environment, thus enabling exporters to plan and execute their operations more effectively.
- The SMEs will not be adversely affected by the new Risk-Based Refund system. To qualify for refunds within 45 days, exporters must meet one criterion, which is none other than direct exports must only account for more than 50 per cent of their total supplies. Then, they become automatically eligible for this refund system. Once this condition is met, the SME will receive refunds accordingly, regardless of the status and size of the business or the turnover. Importantly, there is no turnover benchmark requirement to be qualified as an eligible exporter.
- Deemed exporters, under this VAT system, will not be affected, as they can collect VAT from exporters or rather, they will have a net liquidity position.

Sir, I tried to summarize the Answer and I also **table*** the detailed Answer.

Concluding the Answer, I would say that the new refund system ensures that within 45 days, the refund is made without delay and that the deemed exporters or the indirect exporters would not be not affected because we are gradually and slowly moving towards for a fully automated VAT refund system. Trials have already been made; simulations have already been run and we will wait and see if there would be any discrepancies, issues or concerns that we will have to address after the first cycle of refund system, which is yet to come up.

Thank you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට කෙටියෙන් පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I appreciate the Answer that has been given though in a summarized form. But, Sir, that is not the real-life situation. The small and medium enterprises, today, are affected badly and you could see it reflected at tea auctions. Today, they have to put in an additional 18 per cent to buy tea. The tea prices have reduced. Hon. Minister, I am sure you would understand that it would be easier for a person to import and supply products to a manufacturer rather than manufacturing them here and helping the big exporter because he has to, technically,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

wait for a minimum 75 to 106 days. So, it is easier to get it down from India, China or wherever it is since you would have it here within 35 days without getting your cash stuck here trying to get refunds. Well, we are still in a make-believe world, thinking that the moneys will come in time. So, even before we go into that situation, today, I am talking of my experience, in practical terms, with regard to small and medium enterprises, textiles and tea auctions, which are having almost a Rs. 110 rupee reduction. I am sure the Hon. Gayantha Karunathilleka, being in the Tea Small Holders' Association, knows that. So, Sir, this is not something that could be done through a textbook style operation. So, I would greatly appreciate if you would look into this matter, Hon. Deputy Minister. Today, especially the small manufacturers in the printing sector feel that it is easier to import and trade rather than manufacture and help the big exporter. I am saying this with experience. That is so in the rubber sector; that is so even in the sectors of textile and ceramic wear. You would find that that is why for the first time in September, there had been a US Dollars 450 million deficit in the balance of payment.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Speaker, such issues have not yet been reported from deemed exporters or indirect exporters and we will see, in case if there would be any such reports. As you explained, Hon. Member, the possibility of exporters taking raw materials or inputs from importers would be a pure situation of direct importation and re-exportation.

Then, we need not talk about any value addition. So, it would be a very rare and an extreme situation. If we want to promote exportation based on raw materials, of course, those have to come into the country and should be subject to a value-addition process. Then, they would be deemed exporters or indirect exporters and in that regard, those SMEs will get the cash from the exporters.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Exports include - *[Interruption.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

No, that would be direct re-exporting. If you import goods, keep them somewhere and then re-export, that has nothing to do with this VAT refund system. If they import goods into the country and then, value addition takes place, they become deemed exporters or indirect exporters. And, deemed exporters can get cash from the exporters. In a way, the SMEs operating within those businesses would benefit more because they would be eased out with more cash. We will see if there would be any concerns reported in the future and then, we will address all those matters. But, as of now, such issues have not been reported. However, we need to understand the fact that, under the VAT refund system, for an exporter to qualify for the VAT refund system, he should account for more than 50 per cent of its supplies and the balance would subject to the normal VAT system. Therefore, they automatically get the input VAT and there would not be a significant amount to be refunded. Whether the amount is significant or insignificant, we assure, as I said before, that the refund would be made duly and promptly.

Thank you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එක අවස්ථාවක් විතරයි ඔබතුමාට ලබා දෙන්න පුළුවන් වන්නේ.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026, දෙවන වර කියවීමේ විවාදය. තෙවැනි වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය - [නොවැම්බර් 07]***
***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 07]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [07th November]*
*"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, the Hon. Sajith Premadasa. You have 30 minutes.

[පූ.භා. 10.58]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කරනවා කියලා ජනවරම් තුනකුත්

ලබාගෙන අද ඇත්ත වශයෙන්ම රටේ ජනතාවට නිර්මාණය වෙලා තිබෙන්නේ, දුක්ඛිත රටක් - අසරණ ජීවිතයක්. 2026 අය වැය ගැන කථා කරන්නට පෙර ඉතාම වැදගත් වෙනවා, 2025 අය වැය ක්‍රියාත්මක කළේ කොහොමද කියන කාරණාව පිළිබඳව සොයා බැලීම. පෙර පැවැති පාර්ලිමේන්තු රැස්වීම් සතියේ අවසාන දිනයේදී මම මුදල් ඇමතිවරයාගෙන් ප්‍රශ්න කළා, 2025 අය වැයේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය මොකක්ද කියලා. දැන් මේ ගරු සභාවේත් සාකච්ඡාවට භාජන වුණා, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ප්‍රශ්න පිළිබඳව. මම එදා බොහොම සරල ප්‍රශ්නයක් ඇහුවේ. 2025 අය වැය යෝජනාවලින් කොච්චරක් කෙරිලා තිබෙනවාද, මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය මොකක්ද කියලායි මම ඇහුවේ. ඒකට උත්තරය දෙන්න කල් ඉල්ලුවා.

මේ අවස්ථාවේදී මම කැමැතියි, විශේෂයෙන්ම ආංශික අධීක්ෂණ කාරක සභාවලට රජයේ නිලධාරින් නිල වශයෙන් ලබා දුන්නු ප්‍රගතිය පිළිබඳ සමහර කාරණා පෙන්වා දෙන්න. මේ මගේ අතේ තිබෙන්නේ, 2025 අය වැයෙන් වෙන් කළ ප්‍රතිපාදන පිළිබඳ විස්තර. පාසල් අධ්‍යාපනය නවීකරණය කරන්න රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. එයින් දැනට පාවිච්චි කරලා තිබෙන්නේ සියයට 20යි. උසස් ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට රුපියල් මිලියන 200ක් වෙන් කර තිබෙනවා. එහි ප්‍රගතිය සියයට 15යි. දැන් හිතාගන්න පුළුවන් නේ, අර කියපු ප්‍රශ්නයට උත්තර දුන්නේ නැත්තේ ඇයි කියලා. ඔටිසම් දරුවන් වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 250යි. එහි ප්‍රගතිය සියයට 30යි. ඔටිසම් දරුවන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන සහ සේවා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 200යි. ප්‍රගතිය සියයට 15යි.

අපි කෘෂිකර්ම අමාත්‍යාංශය උදාහරණයට ගනිමු. කෘෂිකර්ම සහ කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයන්ගේ සංවර්ධනයට වෙන් කළ මුදල රුපියල් මිලියන 500යි. එහි ප්‍රගතිය සියයට 45යි. ක්ෂේත්‍ර භෝග ප්‍රවර්ධනය සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. එහි ප්‍රගතිය සියයට 40යි. අපනයන භෝග ප්‍රවර්ධනය සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙනවා. එහි ප්‍රගතිය සියයට 40යි. ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සඳහා වෙන් කළ මුදල, රුපියල් මිලියන 500යි. භෞතික ප්‍රගතිය සියයට 10යි. උතුරු පොල් ත්‍රිකෝණය පිහිටුවීම තුළින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. ප්‍රගතිය සියයට 46යි. ඌන උපයෝජිත ඉඩම් ආයෝජන සඳහා ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. ප්‍රගතිය සියයට 10යි. ඉතින් හිතා ගන්න පුළුවන් නේ 2025 අය වැයේ ප්‍රගතිය මේක නම්, 2026 අය වැය යෝජනාවලට යන කල ගැන? ඒ ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ.

ඔබතුමන්ලාට ජනවරම් තුනක් ලැබුණා. ඒ තමයි ජනාධිපතිවරණය, මහ මැතිවරණය, පළාත් පාලන මැතිවරණය. හැබැයි, ඒ ජනවරම් තුනම ලබාගෙනත් නිර්මාණය වෙලා තිබෙන්නේ අලුත්ම මාදිලියේ සුපිරි ගණයේ කඩවුණු පොරොන්දු චිත්‍රපටයයි. එය තමයි නිර්මාණය වෙලා තිබෙන්නේ. මම ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගෙන් බොහොම ඍජුව මෙසේ අහන්න කැමැතියි. ඇයි මෙහෙම ජනතාව රැවට්ටුවේ? ඇයි මෙලෙස ජනතාව මං මුළා කළේ? ඇයි මේ බොරුව කළේ? ඇයි ජනතාව ඇන්දෙව්වේ? ඇයි ජනතාව අනාථ කළේ? ඔබ මේ කරපු දේ සාධාරණද? යුක්තිසහගතද? නිවැරැදිද? මේ රටේ ඉතිහාසයේ මෑත කාලයේ මේ වාගේ ඇන්දවිල්ලක් සිදු වෙලා නැහැ. IMF ගිවිසුම වෙනස් කරනවා කිව්වා; ණය තිරසරභාවය පිළිබඳ විශ්ලේෂණය - DSA එක - වෙනස් කරනවා කිව්වා; අලුත් ගිවිසුමකට ප්‍රවේශ වෙනවා කිව්වා. කරපු පළමුවෙනි ලොකුම බොරුව තමයි ඒක. ඒ එකක්වත් කළේ නැහැ. ඔබතුමන්ලා දුප්පත් ජනතාව අනාථ කළා; ගොවි ජනතාව අනාථ කළා; කම්කරු ජනතාව අනාථ කළා; තාරුණ්‍යය අනාථ කළා; ස්වයං රැකියාලාභීන් අනාථ කළා; ව්‍යවසායකයන් අනාථ කළා; ව්‍යාපාර අනාථ කළා; කර්මාන්තකරුවන් අනාථ කළා; කාන්තාව අතරමං කළා; වතු ප්‍රජාව අනාථ කළා; ධීවර ජනතාව අනාථ කළා; මුළු රටම ඇන්දෙව්වා. කොච්චර ඇන්දෙව්වාද කිව්වොත්, රාජ්‍ය සේවකයින් යුනිෆෝම් එක පිටින් ගෙන්වලායි ඇන්දෙව්වේ; යුනිෆෝම් එක පිටින් ගෙන්වලා තමයි බොරු කිව්වේ. එහෙව් ක්‍රියාදාමයක් තමයි අද අනුර කුමාර දිසානායක පාලනය තුළින් සිදු වෙලා තිබෙන්නේ.

ඔබ විහිළු තහළු කරන්නට පෙර මට කියන්නකෝ බලන්න, බඩු මිල වැඩි වීම සම්බන්ධයෙන් ඔබගේ විසඳුම මොකක්ද කියලා. මොකක්ද විසඳුම? *[බාධා කිරීමක්]* ආ, වැඩි වෙලා නැද්ද? බොහොම ස්තුතියි. මෙන්න, රජයේ ඇමතිවරයෙක් කියනවා බඩු මිල වැඩි වෙලා නැති ලු. මේක රටේ ජනතාවටම ඇහෙන්න කියන්න ඕනෑ. බඩු මිල වැඩි වෙලා නැති ලු. බඩු මිල ප්‍රශ්නයක් නොවෙයි ලු. ඔහොම තමයි ඉතින්, ඇමතිකම් ලබලා කැටි වලාකුළුවල ඉන්න කොට මහ පොළොවේ සත්‍ය යථාර්ථය තේරෙන්නේ නැහැ. දසලක්ෂ ගණනක් ජනතාවට එදිනෙදා වේල් තුන පිරිමසා ගන්නට බැහැ. මොකක්ද වැඩ පිළිවෙළ, මොකක්ද පිළිතුර, මොකක්ද විසඳුම? මොකක්ද බඩු මිල අඩු කරන්නට ඔබගේ ක්‍රියාදාමය? මේ සභාවට ඇවිල්ලා විහිළු සපයන එකද? බොරු කයිවාරු කියන එකද? රජයට ජීවන වියදම් කමිටුවක් තිබෙනවාද? ජීවන වියදම පාලනය කරන්න කැබිනට් අනුකාරක සභාවක් තිබෙනවාද? එසේ නම් ඒ ආයතනවලින් මොකක්ද ක්‍රියාත්මක වෙන්නේ? කෝ, ආණ්ඩුවේ විසඳුම? කෝ, රජයේ උත්තරය? කිසිම පිළියමක් යොදන්නට මේ රජයට හැකියාවක් නැහැ. පුළුවන් එකම දේ තමයි විහිළු සපයන එක. එකතැන ඉඳගෙන අංශක 360ම කැරකි කැරකී, විහිළු කර කර, සමච්චල් කර කර, චරිත ඝාතනය කර කර, පළි ගැනීම් හරහා තමන්ගේ දේශපාලන පැවැත්ම ක්‍රියාත්මක කරමින් කයිවාරුවෙන් තමයි මේ රජය පෝෂණය වෙන්නේ.

කෝ, උපාධිධාරින් 35,000කගේ රැකියා ප්‍රශ්නයට විසඳුම? නැහැ, බැහැ කියන්න එපා. වීඩියෝපටත් තිබෙනවා, කියපු කථාත් තිබෙනවා. එක්කෙනෙක් කියනවා, "පොඩ්ඩක් ඉන්න, ජනාධිපතිවරණය දිනන කල්" කියලා. ඊට පස්සේ කියනවා, "පාර්ලිමේන්තු මැතිවරණය දිනන කල් ඉන්න" කියලා. දැන් ඉන්න ඇමතිවරයෙක්ම කියනවා, ඇමතිකම ගන්න කල් ඉන්න කියලා. ඊට පස්සේ කියනවා, පළාත් පාලන මැතිවරණය දිනන කල් ඉන්න කියලා. උපාධිධාරින් 35,000කට පොරොන්දු වුණු රැකියා ටික ලබා දීලා නැහැ. අර විශාල සේවාවක් ඉෂ්ට කරපු ගුරු සංවර්ධන නිලධාරින් කෝ? ගුරු සේවයේ ඉන්න ඒ 16,600 දෙනාට දෙන්න පොරොන්දු වුණු ගුරු පත්වීම් ටික කෝ? සමථකරණයට අනුව වසර 3ක් ඇතුළත postgraduate diploma එක ගන්නකල් ඒ අය 2-II ශ්‍රේණියේ පිහිටුවන්නේ නැත්තේ ඇයි? ඇයි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ නැත්තේ? කෝ වැටුප් විෂමතාවට විසඳුම්, කෝ විශ්‍රාමිකයන්ගේ ගැටලුවලට විසඳුම්, කෝ තාරුණ්‍යයට ලබා දෙනවා කියපු ශක්තිය? තාරුණ්‍යයට කරලා තිබෙන්නේ, freelance digital services ක්‍රියාත්මක කරන අයගේ exportsවලට සියයට 15ක බද්දක් - tax එකක් - ගැහුව එක. ඔක්කොම කරන්නේ බොරුව. අද මුළු රජයම පව දේශපාලනයේ කප්පිත්තන් බවට පත් වෙලා, කපිතාන්ලා බවට පත් වෙලා. ජනාධිපතිවරණ වේදිකාවේ කිව්වේ නැද්ද, රුපියල් 9,000ක විදුලි බිල රුපියල් 6,000 කරනවා කියලා, රුපියල් 3,000ක විදුලි බිල රුපියල් 2,000 කරනවා කියලා? සියයට 33කින් විදුලි බිල අඩු කරනවා කියලා කිව්වාද නැද්ද? පුළුවන් නම් නැහැයි කියන්න. කියපු බොරු ටික ඔක්කොම මා ළඟ තිබෙනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ ඔක්කොම වීඩියෝ පට තිබෙනවා, ඔක්කොම හඬපට තිබෙනවා. නොදන්නා අයගේ දැන ගැනීම සඳහා ඒ වීඩියෝ පට සියල්ල ඇතුළත් සංයුක්ත තැටිය මම **සභාගත*** කරනවා.

කරපු රැවටිල්ල, කරපු බොරුව. මෙහෙම විදුලි පාරිභෝගිකයන්ව රවට්ටපු එක සාධාරණද? ඒක යුක්ති සහගතද? අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විපක්ෂයේ ඉඳපු කාලයේ සිට අද දක්වා කරලා තිබෙන්නේ මුළු රටම ඇන්දවීම. අපි පිළිගන්නවා, මුළු රටම ඇන්දවීමේ, රැවටීමේ ලෝක ශූරතාව දිනලා තිබෙනවා කියලා. ඒක අපි පිළිගන්නවා. ඇන්දවීමේ ලෝක ශූරතාව දිනලා තිබෙනවා. නමුත්, රටේ ජනතාව අනාථයි. Centre for Poverty Analysis කියනවා, අපේ රටේ ජනතාවගෙන් සියයට 25ක් දුප්පත් කියලා. තවත් විශ්ලේෂකයන් කියනවා, නැහැ, සියයට 40ත්, සියයට 50ත් අතර ප්‍රමාණයක් දුප්පත් කියලා. කෝ ඒකට විසඳුම? විසඳුම, අස්වැසුමෙන් ලබා දෙන සොච්චමද? නිර්ධන පන්තිය නියෝජනය කරන ජනතා විමුක්ති පෙරමුණේ එක්තරා ඇමතිවරයෙක් මොනවාද අස්වැසුම ගැන කියන්නේ? අස්වැසුම කියන්නේ හිඟමනේ යන ගමනක් ලු. අද තිබෙන්නේ මේ රටේ දුප්පත් ජනතාව සියයට 40ක්, සියයට 50ක් හිඟන්නු ගණනට දාලා කථා කරන ඇමතිවරු ඉන්න ආණ්ඩුවක්. මහ ලොකුවට ඡන්දය ඉල්ලන කාලයේ කිව්වේ මොකක්ද? "අපි තමයි නිර්ධන පන්තිය නියෝජනය කරන්නේ, අපි තමයි නිර්ධන පන්තියේ ජනතාව වෙනුවෙන් හඬ නඟන වීරයෝ, සූරයෝ" එහෙමයි කථා කළේ. මම අහන්න කැමැතියි. ඒ අස්වැසුමලාභීන් හිඟන්නන් හැටියට හැඳින්වීම රජයේ මතයද කියලා. ඒකද රජයේ ප්‍රතිපත්තිය? ඒක කියපු ඇමතිවරයා ලජ්ජා වෙන්න ඕනෑ. ලජ්ජා වෙන්න ඕනෑ.

කෝ, දුප්පත්කම තුරන් කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ? දුප්පත්කම තුරන් කිරීමේ සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහිදී පාරිභෝජනය, ඉතිරි කිරීම, ආයෝජනය, නිෂ්පාදනය හා අපනයනය කියන ගුණාංග පහම තිබෙන්නට ඕනෑ. කෝ ඒ සඳහා වැඩ පිළිවෙළ? කෝ විසඳුම, කෝ උත්තරය? ඇත්තම කථා කරනවා නම්, අපට පෙනෙන්නේ මේ රජය බොහොම ලස්සනට, බොහොම සුන්දර ආකාරයට IMF පදයට නටන රජයක් කියන එකයි. මේක IMF එක කියන කියන විදියට නටන ආණ්ඩුවක්. ලක්ෂ වාරයක් ස්ථිරයි, මේ අය වැයේ කර්තෘවරයා අනුර කුමාර දිසානායක නොවෙයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි කියන එක. ඒකේ කථා දෙකක් නැහැ. කෝ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තවලට ලබා දෙනවාය කියපු සහනය? ඒ අය මැතිවරණ තුනකදී රැවැට්ටුවා. රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 50කට වැඩි දායකත්වයක් ලබා දෙන්නේ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් - MSMEs. ඔවුන් ලක්ෂ 40කට වැඩි ප්‍රමාණයකට රැකියා ලබා දෙනවා, ජීවනෝපාය නිර්මාණය කරනවා.

ඡන්දය නිසා *parate* execution ක්‍රියාත්මක කිරීම, ඒ වෙන්දේසිය තාවකාලිකව නැවැත්වූවා. හැබැයි, අමාරු දේ කළේ නැහැ. ඒ ණය ප්‍රතිව්‍යුහගත කළේ නැහැ. ඒ අයගේ පොලිය කප්පාදු කරන්නට කටයුතු කළේ නැහැ. අද ඒ අය අනාථයි නේද? ජනතා විමුක්ති පෙරමුණට ආණ්ඩුවක් හදන්න වරම ලබා දුන්නු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් ලක්ෂ ගණනක් අද මේ රජය විසින් අන්ත අසරණභාවයට පත් කර තිබෙනවා. දැන් අය වැය යෝජනාව හරහා අලුත් ණය ක්‍රම ඉදිරිපත් කරනවා. ඒක බොහොම හොඳයි. හැබැයි, අලුත් ණය ක්‍රම ඉදිරිපත් කරන්නට පෙර තිබෙන ණය ප්‍රතිව්‍යුහගත කරන්න. තිබෙන loans ටික restructure කරන්න. ඒ අයගේ පොලිය යම්තාක් දුරට හෝ කපා හරින්න කටයුතු කරන්න. ඒවා කරන්නේ නැතිව අලුත් ණය ක්‍රම ලබාදීම තුළින් සිදු කරන්නේ ඒ අය සදාකාලික ණය බරින් තෙරපෙන, අසහනයට ලක් වෙන පිරිසක් බවට පත් කිරීමයි. කෝ, විරැකියාවෙන් පෙළෙන රැකියා නොමැති තරුණ තරුණියන්ට ලබාදෙන විසඳුම? මොකක්ද ඖෂධ හිඟයට ලබාදෙන විසඳුම? මේවාට උත්තර තිබෙනවා ද? රෝහල්වල තිබෙන උපකරණ හිඟයට මොකක්ද තිබෙන විසඳුම? ඒකට උත්තර තිබෙනවා ද? ඇත්තටම පාසල් වහන්න යනවා ද? පරණ කියමනක් තිබෙනවා, එක පාසලක් විවෘත වෙනකොට හිරගෙවල් 1,000ක් වැහෙනවා කියලා. කෝ පාසල්වලට ලබාදෙන භෞතික සම්පත් ශක්තිය? ඇයි ඒවා ඉෂ්ට නොකරන්නේ? පාසල්වල තිබෙන මානව සම්පත් ගැටලුවට කෝ විසඳුම්? කෝ ඒවාට උත්තර?

අද අල ගොවියාට මොකක්ද වෙලා තිබෙන්නේ? ලොකු ලූනු ගොවියාට මොකක්ද වෙලා තිබෙන්නේ? වට්ටක්කා ගොවියාට මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඌව පරණගම, වැලිමඩ ගොවීන් පාරට බැහැලා. නුවරඑළියේත් වගා කටයුතු කරන ගොවීන් පාරට බැහැලා. මතක තියා ගන්න, මේ ගැන අපි කථා කළේ අද නොවෙයි, සති 3කට, 4කට පෙර. උත්තරය හම්බ වුණා, "ඔක්කෝම හරි" කියලා. "කිසි ප්‍රශ්නයක් නැහැ" කිව්වා. "ඔක්කෝම විසඳලා තිබෙන්නේ" කිව්වා. දැන් හිතාගන්න පුළුවන් නේ, මේ සභාවේම ප්‍රබලයන් නැඟිට නැඟිට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අසනවාට විරුද්ධ වෙන හේතුව. ප්‍රශ්නය දිග වැඩියි ලු; ප්‍රශ්නයේ පරිමාණය වැඩියි ලු. ඒ ප්‍රශ්නවලදී හරියටම වෙලාවත් ගණනය කරනවා. පසුගිය ආණ්ඩුව පොල් ගෙඩියේ ප්‍රමාණය ගණනය කළා වාගේ, දැන් අර්තාපල් ගන්නම්, බී ලූනු ගන්නම් කියලා ඒවාට කොන්දේසි දානවා. ඒවායේ ප්‍රමාණය මැනලා තමයි ගන්නේ කියනවා. මොන විහිළුවක් ද? මේගොල්ලන් යන්නේ ගෝඨාභය රාජපක්ෂගේ අඩි පාරේ. ඒ අඩි පාරේමයි යන්නේ.

පොඩි මනුස්සයාගේ හදගැස්ම මේ ආණ්ඩුවට තේරෙන්නේ නැහැ. ඒක අපට හිතාගන්න පුළුවන්. අලුතින්ම මේ රටේ කැසිනෝ ආරම්භ කරනකොට, ඒවා විවෘත කරනකොට පොඩි මිනිහාගේ ප්‍රශ්න ඔක්කෝම අමතකයි. ඒ කැසිනෝ විවෘත කරනකොට පුංචි මනුස්සයාගේ දුක් ගින්න, බඩගින්න, වේදනාව, ඒවා ඔක්කෝම අමතකයි. ඒ කැසිනෝකාරයෝ රකින්නට මේ සභාවේ ඕනෑ තරම් අය ඉන්නවා. නමුත්, කනගාටුවට කාරණාව තමයි, නිර්ධන පන්තිය නියෝජනය කරන සූරයෝ ටිකට, වීරයෝ ටිකට මේ රටේ සාමාන්‍ය ජනතාව අමතක වීම. මේ අයට අද සාමාන්‍ය ජනතාවගේ දහඩිය සුවඳ, දුක, කඳුළ අමතක වෙලා. කමක් නැහැ, Bosch shirts අඳින්න. අපිත් අඳිනවා. Paco Rabanne perfumes ගහගන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. Bosch shirts ඇන්දාට, Paco Rabanne perfumes ගැහුවාට මේ රටේ ලක්ෂ 220ක් සාමාන්‍ය ජනතාව අමතක කරන්න එපා. ඒ අයගේ හදගැස්ම අවබෝධ කර ගන්න.

මම කැමැතියි මගේ කථාවේ අවසාන කොටසෙන් ජනතාවට නොකියන ඇත්තක් ඉදිරිපත් කරන්න. මොකක්ද ඒ ඇත්ත කථාව? අද අපේ රටේ ජනතාව අනවශ්‍ය ලෙස පීඩනයකට ලක් කරලා තිබෙනවා. මොකක්ද, මේ පීඩනය? ජනතාව බදු බරින් මිරිකන පීඩනය; බදු බර තුළින් අසහනයට ලක් කරන පීඩනය; ජනතාවගේ කර පිට, හිස මත බදු බර පැටවීම. ඔබ දන්නවාද, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට රාජ්‍ය ආදායම සඳහා IMF එක දීලා තිබෙන target එක සියයට 15යි. නමුත් ආණ්ඩුව අනවශ්‍ය විදියට බදු ගහලා රාජ්‍ය ආදායම සියයට 15.9 දක්වා වැඩි කර ගෙන තිබෙනවා. වැඩිපුර බදු ගහලා ආදායම සියයට 0.9කින් වැඩි කරගෙන තිබෙනවා. ගහපු බදුවල මුළු වටිනාකම රුපියල් බිලියන 287ක්. ඉතින්, අහන්න දෙයක් නැහැ නේ, අනවශ්‍ය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විධියට බදු ගහලා මහා භාණ්ඩාගාරය ඕනෑ තරම් සල්ලිවලින් පුරවන්න පුළුවන්. එතකොට කියන්න පුළුවන්, සල්ලි ඉතිරෙනවා කියලා. ඕක ඕනෑ පුද්ගලයෙකුට කරන්න පුළුවන් දෙයක්. පෙර පාසල් දරුවෙකුට වුණත් කරන්න පුළුවන්. ගහන්න පුළුවන් බදු ටික ඔක්කෝම ගහලා, මහා භාණ්ඩාගාරයට සල්ලි ඔක්කෝම එකතු වුණා කියලා අත්පුඩි ගහන්න පුළුවන්. IMF එකේ target එකට අනුව රාජ්‍ය ආදායම වුණේ, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 15යි. බදු ගහලා රාජ්‍ය ආදායම විධියට සියයට 15.9ක් දක්වා වැඩිපුර අරගෙන තිබෙනවා. මේ රටේ බදු ගෙවන්නන්ගෙන් වැඩිපුර රුපියල් බිලියන 287ක් සූරා කාලා තිබෙනවා.

ඊළඟට, primary balance එක හොඳයි කියලා මහ ලොකුවට කථා කළා. ඔක්කෝටම ඉස්සෙල්ලා හැමෝටම පැහැදිලි කරන එක හොඳයි, මොකක්ද මේ ප්‍රාථමික ශේෂය - primary balance - කියන්නේ කියලා. ප්‍රාථමික ශේෂය කියන්නේ, ආදායමෙන් වියදම - පොලී වියදම නැතුව - අඩු කරලා එන අගය; revenue minus expenditure without interest. දැන් ලොකුවට කියනවා, IMF එකේ target එකට අනුව ප්‍රාථමික ශේෂය සියයට 2.3යි, හැබැයි අපි හොඳටම කරලා ඒක සියයට 3.8ක් කරගෙන තිබෙනවා කියලා. මොකක්ද, ඒකේ තේරුම? වැඩිපුර සියට 1.5ක්, ඒ කියන්නේ ශ්‍රී ලංකා රුපියල් බිලියන 479ක් තිබෙනවා. ඒවා සංවර්ධනය සඳහා යොදවන්න පුළුවන්, ඒවා සාමාන්‍ය ජනතාවට බදු සහන ලබා දෙන්න යොදවන්න පුළුවන්. ඒ වාගේම වක්‍ර බදු අඩු කරන්න, සෘජු බදු අඩු කරන්න, තරුණ ව්‍යවසායකයින්ට සහන ලබා දෙන්න යොදවන්න පුළුවන්. ප්‍රාථමික ශේෂය සියයට 1.5කින් වැඩි කරලා සියයට 3.8ක් කරගෙන තිබෙනවා කියලා බොරුවට කෑ ගැහුවාට, ඒ මොකක්ද කරලා තිබෙන්නේ? වක්‍ර බදු ගහලා, සෘජු බදු ගහලා රජය රුපියල් බිලියන 479ක් වැඩිපුර අරගෙන තිබෙනවා. ඒවා දූප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන්වලට යොදවන්න පුළුවන්, ඒවා අපනයන ප්‍රවර්ධනය සඳහා යොදවන්න පුළුවන්, ඒවා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් වෙනුවෙන් යොදවන්න පුළුවන්. ඒ කිසිවක් කරලා නැහැ. රජය කරලා තිබෙන්නේ මේ රටේ ජනතාවගේ පස්සෙන් දුව-දුව ගිහිල්ලා බදු ගහන එකයි; පන්න-පන්නා බදු ගහන එකයි; එළව-එළවා බදු ගහන එකයි.

බලන්න, අද බුද්ධි ගලනය කොච්චරද කියලා. වෛද්‍යවරු කොච්චර පිරිසක් රට අතහැර යනවාද, කොච්චර ඉංජිනේරුවරු පිරිසක් රට අතහැර යනවාද, කොච්චර වෘත්තියවේදින් පිරිසක් රට අතහැර යනවාද? මම කියනවා, අපට - මන්ත්‍රීවරුන්ට - පර්මිට් එපා, ඒ බුද්ධිමතුන්ට පොරොන්දු වුණු පර්මිට් ටික ලබා දෙන්න. එසේ ලබා දෙන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි, ඒ මහා දැනුම් සම්භාරය මේ රටේ රඳවා ගැනීමේ එක්තරා උත්තේජකයක් හැටියටයි. ඒ සඳහා එය පාවිච්චි කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, මම තවත් කාරණයක් අහන්න කැමැතියි. වැඩිපුර බදු ගහලා, IMF එක කිව්වාටත් වඩා වැඩිපුර රුපියල් බිලියන 287ක් එකතු කරගෙන තමන් තමන්ටම අත්පුඩි ගහගන්නවා. ප්‍රාථමික ශේෂයෙන් වැඩිපුර රුපියල් බිලියන 479ක් ඉතුරු වෙලා තිබෙනවා. දෙයියන්ගේ නාමයෙන් ඒ සල්ලි ටික මේ රටේ තොරතුරු තාක්ෂණ විප්ලවය ක්‍රියාත්මක කරන්න, ඩිජිටල් විප්ලවය ක්‍රියාත්මක කරන්න පාවිච්චි කරන්න. මේ මුදල්වලින් incubators, accelerators පටන් ගන්න; new business startupsවලට මූල්‍ය ශක්තිය ලබා දෙන්න; ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට ශක්තිය ලබා දෙන්න; ගොවියාට, ධීවරයාට, කම්කරුවාට, ස්වයං රැකියාලාභියාට, රාජ්‍ය සේවයේ, පෞද්ගලික ක්ෂේත්‍රයේ වැඩ කරන ජනතාවට ශක්තිය ලබා දෙන්න; බුද්ධිමතුන් රට තුළ රඳවා ගන්නට පාවිච්චි කරන්න. බලන්න, ලජ්ජා නැතිව VAT එකෙයි, SSCL එකෙයි registration threshold එක රුපියල් මිලියන 60 සිට රුපියල් මිලියන 30 දක්වා අඩු කරලා තිබෙනවා. සාමාන්‍ය ව්‍යාපාරිකයාගේ බඩට ගහනවා; සාමාන්‍ය ව්‍යවසායකයාගේ බඩට ගහනවා. ඇත්තම කථා කරනවා නම්, බදු සංග්‍රාමයක් දියත් කරන වර්තමාන රජය ලජ්ජා වෙන්න ඕනෑ. ඔබ ජනවරම් තුනක්ම පාවා දීලා තිබෙනවා.

මේ කාරණයත් මම විශේෂයෙන් කියන්න කැමැතියි. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා පත් වුණේ මේ රටේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසායි. නමුත් කනගාටුවෙන් වුණත් කියන්නට ඕනෑ, අද එතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ Managing Director බවට පත් වෙලා තිබෙන බව. එතුමා IMF එකේ MD බවට පත් වෙලා! හැබැයි මම කියන්න කැමතියි, තවමත් පරක්කු නැහැ කියලා. IMF එකේ ඉලක්කයට වැඩිය බදු ගහලා උපයා ගත්ත මුදල - අමතර බිලියන 287, බිලියන 479 - මේ රටේ ලක්ෂ 220කගේ ජන ජීවිත - ජනතාව, මානව සම්පත - වෙනුවෙන් ආයෝජනය කරන්න පුළුවන්, තව කල් තිබෙනවා. විපක්ෂයේ අපි සූදානම්, ඒකට සහයෝගය ලබා දෙන්න. අපි සූදානම්, ඒකට උදවු කරන්න. මේක වෙනස් කරගන්න.

ගරු කථානායකතුමනි, අපේ හිතවත් අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා අපට උපදෙස් දෙන්න ආවා වෙන් වෙනවාද, එකතු වෙනවාද, බෙදෙනවාද කියන කාරණාව ගැන. අනේ, එතුමාගේ සවිඥානාත්මක උපදෙස් අපට අවශ්‍ය වන්නේ නැහැ. එක කාරණයක් අපි කියන්නට ඕනෑ. ඒ එකතුවීම් සියල්ල අපි සිදු කරනවා, දැවැන්ත ආකාරයට. නිසි ලෙසට, නිසි කලට, නිසි ආකාරයට අපි එකතු වෙනවා. හැබැයි, එකතු වෙන්නේ V8 permit එක දෙනවාද, ඇමතිකම් කීයක් දෙනවාද, නියෝජ්‍ය ඇමතිකම් කීයක් දෙනවාද, ඇමතිකම් බෙදා හදා ගන්නේ කොහොමද, සභාපතිකම් බෙදා හදා ගන්නේ කොහොමද කියන කාරණා මත නොවෙයි.

සෞභාග්‍ය සම්පන්න රටක් නිර්මාණය කරලා, ලක්ෂ 220ම මේ සෞභාග්‍යයේ ප්‍රතිලාභ, අරුණලු බෙදා ගන්නා ආකාරය පිළිබඳව ප්‍රතිපත්තිමය එකඟතාවක් මත තමයි අපි හැම එකතු වීමක්ම සිදු කරන්නේ කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. අපි එකතු වෙන්නේ මන්ත්‍රීවරුන්ගේ medical insurance එක වැඩි වෙනවාද, ඒක අඩු කරනවාද යනාදි තොරතුරු, කරුණු කාරණා මත නොවෙයි. හොඳට මතක තබාගන්න, අප අනුගමනය කරන්නේ මැද මාවත. අප අනුගමනය කරන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය. අපි අනුගමනය කරන්නේ මානුෂීය ධනවාදය මුසු කරගත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය. ඒ මැද මාවතේ අපි ඉදිරියට යන්නට අදහස් කරනවා.

මම තව එක කාරණාවක් කියන්නට ඕනෑ. අපි මේ සභා ගර්භයේදී යෝජනා කළා, විවිධ ප්‍රබල රටවල, බලවත් රටවල නායකයින් සමඟ පෞද්ගලික සම්බන්ධතා ගොඩ නඟාගන්න කියලා. අනේ ඉතින්, එහෙම කියනකොට වහල්ලු කොට්ඨාසයක් උසුළු විසුළු කරනවා. නොදැනුවත්කමින් පෙළෙන, අවබෝධයක් නැති, උගත්කමක්, බුද්ධිමත්කමක් නැති සමහර අය හිනා වෙනවා. මෑත කාලයේ සිදුවීම් දෙකක් නිදසුන් හැටියට මම ඉදිරිපත් කරන්නම්, දැන්වත් ඉගෙන ගන්න. ඉගෙන ගන්න ඕනෑ නම් අපි උගන්වන්න සූදානම්. පුටුවකුයි, මේසයකුයි අරගෙන එන්න, අපි හොඳට උගන්වන්නම්.

හන්ගේරියාවේ අග්‍රාමාත්‍ය Viktor Orbán මොකක්ද කළේ? ඔහුට ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. ඇමෙරිකාව රුසියාවට දමපු ඉන්ධන සම්බාධකය නිසා හන්ගේරියාවට ලොකු අගතියක් සිද්ධ වුණා. මොකක්ද ඔහු කළේ? ඔහු සෘජුවම ගිහිල්ලා ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා හම්බ වුණා. මොකක්ද ප්‍රතිඵලය? ප්‍රතිඵලය තමයි, හන්ගේරියානු රටට විතරක් ඒ සම්බාධක බලනොපාන ආකාරයට අවුරුද්දක බදු සහනයක් ලැබුණු එක. කවුද කියන්නේ පෞද්ගලික සම්බන්ධතා මත රටට සහනයක් ගන්න බැරිය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කියලා? රුසියාව සමඟ ගනුදෙනු කරන රටවලට ට්‍රම්ප් ජනාධිපතිවරයා සම්බාධක පනවන කොට, හන්ගේරියාවේ අග්‍රාමාත්‍ය Viktor Orbánට පුළුවන් වුණා, අවුරුද්දක බදු විරාමයක් ලබා ගන්න. කරුණාකරලා අවබෝධ කරගන්න, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තුළ පෞද්ගලික සබඳතා හරහා රටට ප්‍රතිලාභ ගන්න පුළුවන් බව. ඒ විතරක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Your time is over, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තව විනාඩියයි ගන්නේ, ගරු කථානායකතුමනි.

ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක liquefied natural gas ලබා ගන්නටත් ඔහු සමත් වුණා. ඔන්න, පෞද්ගලිකව කර ගන්න පුළුවන් දේවල්. දෙවැනි උදාහරණය, ආර්ජන්ටිනාවේ Javier Milei කියන නායකයාට, ඔහුගේ පෞද්ගලික සම්බන්ධතාව තුළ ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයාත් එක්ක සාකච්ඡා කරලා ඇමෙරිකානු ඩොලර් බිලියන 20ක currency swap එකක් ගන්න හැකියාව ලැබුණා. ඒ වෙන මොනවාටවත් නොවෙයි, ඒ රටේ ආර්ථිකය කඩා වැටීම නතර කර ගන්නට, ඔවුන්ගේ currency එක වන peso එක ආරක්ෂා කර ගන්න. ඔන්න, ආර්ජන්ටිනාවෙනුත් උදාහරණයක් දුන්නා, හන්ගේරියාවෙනුත් උදාහරණයක් දුන්නා. දැන් බොරුවට හිනා වෙන්නේ නැතුව අනිවාර්යයෙන්ම දක්ෂතාව, කුසලතාව, හැකියාව තිබෙන හොඳ රාජ්‍ය තාන්ත්‍රික කණ්ඩායමක් නිර්මාණය කරගෙන ඒ කටයුතු කරන්න. අපි යෝජනා කරනවා, ඒක බහු පාර්ශ්වීය වුණත් කමක් නැහැ කියලා. මොකද අපි හැමෝටම පුළුවන්, රට ගොඩ නඟන්නට අපේ පූර්ණ ශක්තිය ලබා දෙන්න. කරන්න, ඒ වැඩේ. ඒක ක්‍රියාත්මක කරන්න. ඒ තුළින් ජයග්‍රහණ ලබන්න පුළුවන්.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Your time is over, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Just one last minute, Sir; මට තව එක විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

අවසාන වශයෙන් අනුර දිසානායක ජනාධිපතිවරයාට මම මේ කාරණයත් කියන්න කැමැතියි. අය වැය දෙකක, අවුරුද්දකුත් මාස කිහිපයක මේ රාජ්‍ය පාලනය පිළිබඳව හොඳම උත්තරය දෙන්න පුළුවන් වන්නේ රටේ ජනතාවට. එම නිසා කල් මරන්නේ නැතුව, කල් තබන්නේ නැතුව වහාම පළාත් සභා මැතිවරණය පවත්වන්න පුළුවන්. ඒ සඳහා අපේ පූර්ණ සහයෝගයත් ලබා දෙන්නම්. පළාත් සභා මැතිවරණය පවත්වා රටේ ජනතාවට මේ රජය ගැනත්, අනෙකුත් දේශපාලන පාර්ශ්ව ගැනත් තමන්ගේ අදහස -මතය- ක්‍රියාත්මක කරන්නට අවස්ථාව ලබා දෙන්න. තමුන්නාන්සේලා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරන්න හැකි වේවායි කියා අවසාන වශයෙන් මා ප්‍රාර්ථනා කරනවා. IMF එකේ Managing Director වෙනවා වෙනුවට රටේ ජනාධිපතිවරයා හැටියට ඒවා ක්‍රියාත්මක කිරීමට එතුමාටත්, ඔබතුමන්ලාටත් ප්‍රඥාව, හැකියාව පහළ වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Upali Pannilage. You have 20 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.31]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවන අය වැය ලේඛනය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන විවාදයේ තුන්වැනි දිනයේදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් විවාදය ආරම්භ කිරීමට ලැබීම පිළිබඳව මා බෙහෙවින්ම සතුටට පත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනයක් කියන්නේ මොකක්ද කියන එක පිළිබඳව මේ පාර්ලිමේන්තුවට නැවත මතක් කර දීමට සිදු වීම පිළිබඳව මම කනගාටු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා අය වැය යෝජනාවල තිබිච්ච යම් කරුණු කිහිපයක් විතරක් ගෙනහැර දැක්වූවා. පාර්ලිමේන්තුවට විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා. ඊට පසුව මුදල් අමාත්‍යවරයා විසින් අය වැය කථාව ඉදිරිපත් කරනවා. එම විසර්ජන පනත් කෙටුම්පතේ තිබෙන කරුණු තවදුරටත් ගැඹුරින් විශ්ලේෂණය කිරීමත්, අලුතෙන් අය වැය යෝජනා ඉදිරිපත් කිරීමත් එහිදී සිදු වෙනවා. ඒ වාගේම අය වැය ලේඛනයක් කියන්නේ, රජයේ ඉදිරි ගමන් මඟ පිළිබඳව, ඒ වාගේම සැලසුම් පිළිබඳව ප්‍රක්ෂේපණයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කනගාටුවට කරුණ මෙයයි. අපේ රජය 2025 වර්ෂය සඳහා වන අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කළ කාරණා අපි ඉටු කරලා නැහැ කියලා දැන් කියන්න උත්සාහ කළා. කොහෙන්දෝ එකතු කර ගත් කරුණු ටිකක් පදනම් කරගෙන, මම හිතන විධියට, මුල් මාස හයට අදාළ වාර්තාවක් උපුටාගෙන, එතුමා විසින් තෝරා ගත් සමහර යෝජනා ඉටු කරලා නැහැයි කියන්න උත්සාහ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉදිරිපත් කරන්න කැමැතියි, 2025 වර්ෂය සඳහා අප ඉදිරිපත් කළ අය වැය ලේඛනය අනුව 2025 සැප්තැම්බර් 30 දක්වා තොරතුරු. මා ළඟ මේ තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ Research Division එකෙන් දුන් Budget Review as at 07th November, 2025. මොකක්ද, අපේ average expenditure as at 30th September, 2025? අපේ අමාත්‍යාංශ විසිපහේ average එක මොකක්ද? අපි අමාත්‍යවරුන් 21දෙනෙක් පත් කළා. දැන් 22ක් ඉන්නවා. මේ අමාත්‍යාංශ විසිපහේ average එක මොකක්ද? It is 63 per cent, as at 30th September, 2025. අපට තවත් මාස තුනක් ඉතිරිව තිබෙනවා. මේ වන විට සමහර අමාත්‍යාංශ සියයට 70ත් ඉක්මවා වියදම් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් කොහේදෝ තිබිච්ච පරණ දත්ත ටිකක් ඉදිරිපත් කරමින් මෙතුමන්ලා කියන්න උත්සාහ කළා, ජනතාවට දුන් පොරොන්දු අපි ඉටු කළේ නැහැ කියලා. දැන් මේ දේවල් කියන්නේ අපට නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම කියන්නම්, ඒගොල්ලන් කරපු හැටි.

2015දී මේ රටේ විශාල සමාජ පරිවර්තනයක් සිද්ධ වුණා. ඒ පරිවර්තනය දෙවැනි වෙන්නේ, 2024 සැප්තැම්බර් මාසයේදී මේ රටේ ඇති වෙච්ච සමාජ පරිවර්තනයට විතරයි. 2016දී මේගොල්ලන් බලය අරගෙන Capital Expenditure සඳහා කොච්චරද වියදම් කළේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016දී මූලධන වියදම් විධියට මේගොල්ලන් ඇස්තමේන්තු කළා, රුපියල් බිලියන 594ක්. වියදම් කළේ කීයද? රුපියල් බිලියන 298යි; සියයට 50.2යි. 2025 මාර්තු 21වැනි දා තමයි මේ වසරට අදාළ අය වැය සම්මත වුණේ. අලුත් අවුරුද්ද තිබුණා, මැයි 6වැනි දා පළාත් පාලන මැතිවරණය තිබුණා. එහෙම වෙලාත් සැප්තැම්බර් 30වන දා වෙනකොට අපි රුපියල් බිලියන 455ක් වැය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව පෙනෙනවා, මේ රටේ මහ ජනතාවට බොරු කියලා තිබෙන්නේ කවුද කියලා. ඒක මේ රටේ ජනතාව දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බොරුවලට තවදුරටත් මේ රටේ ජනතාව අහු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම විශේෂයෙන්ම අවධාරණයෙන් කියන්න කැමැතියි, වර්තමාන රජයේ ප්‍රධාන කාර්යභාරය කුමක්ද, අපේ දිශානතිය කුමක්ද කියන එක. මම හිතන විධියට, විපක්ෂයේ සමහර අයට මේක තේරුම් ගන්න බැරි උභතෝකෝටිකයක් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ඒගොල්ලන්ට මේ අය වැය ගැන සාධාරණ විවේචනයක් ඉදිරිපත් කරන්න බැරි වෙලා තිබෙන්නේ. අපි සාමාන්‍යයෙන් විපක්ෂයකින් අපේක්ෂා කරන්නේ සාධාරණ විවේචන. නමුත් එහෙම විවේචනයක්වත් ඉදිරිපත් කර ගන්න මේ අයට බැරි වෙලා තිබෙනවා. මේ ඉදිරිපත් කළේ අපේ රටේ 80වැනි අය වැය. එතකොට මීට කලින් පැවැති රජයන්වලින් අය වැය ලේඛන 78ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අය වැය ලේඛන 78 තුළින් මේ රට ළඟා කර ගත් සංවර්ධනය මොකක්ද? මම ඉතාම කැමැතියි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවන එක පිළිබඳව; උපුටා දක්වන එක පිළිබඳව. පසුගිය 76 වසරක දුර්වල පාලනය නිසා අපේ රට මුහුණ දුන් ප්‍රධාන ගැටලු කිහිපයක් තිබුණා. අපේ රටේ සාර්ව ආර්ථිකයේ පදනම දෙදරලා තිබුණේ. එලෙස දෙදරා තිබුණු ආර්ථිකය, ඒ අස්ථාවරත්වය අපි දැන් ස්ථාවර කරලා තිබෙනවා. අන්න ඒක තමයි අපි මේ වසර තුළ කරපු ප්‍රධානතම කාර්යභාරය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව තමයි 2025 වසරේදී ආසන්න වශයෙන් සියයට 5ක ආර්ථික වෘද්ධියක් - ආර්ථික වර්ධනයක් - අත්පත් කර ගැනීමට අප සමත් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම මෙන්න මේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඇති කර ගැනීමේ ක්‍රියාවලියේදී විශේෂයෙන්ම අපේ භාණ්ඩ හා සේවා අපනයන ක්ෂේත්‍රයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 18ක්, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණවලින් ඩොලර් බිලියන 6ක්, ඍජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 837ක් සහ සංචාරක ක්ෂේත්‍රයෙන් ඩොලර් මිලියන 2,800ක් වශයෙන් විදේශ විනිමය ඩොලර් මිලියන 27,637ක් උපයා ගන්න මේ වසරේ ගෙවුණු මාස කිහිපය තුළ අපි සමත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්න එහෙමයි අපි රට ස්ථාවර කරගෙන තිබෙන්නේ. ඒ වාගේම අපේ රටේ දළ විදේශ සංචිත ප්‍රමාණය මේ වෙනකොට ඩොලර් බිලියන 6.5කට ආසන්න මට්ටමකට අපි ගෙනැල්ලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඩොලර් බිලියන 7ක මට්ටමකට එය ගෙන යන්න. අපේ සාර්ව ආර්ථිකය ස්ථාවර කරලා තිබෙන්නේ එහෙමයි. අපි එහෙම කරලා තිබෙන්නේත් ඩොලර් බිලියන 2කට ආසන්න ප්‍රමාණයක් පසුගිය වසරේ නොතිබුණු වාහන ආනයනය සඳහා වියදම් කරන අතරතුරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය මේ ගත වූ වසරක අපේ පාලන කාලය තුළ 2006 වසරෙන් පසුව, දශක දෙකකට පසුව - අවුරුදු 20කට පසුව - දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආසන්න වශයෙන් අපේ රාජ්‍ය ආදායම සියයට 16ක මට්ටමට -සියයට 15.9කට- ගෙනැල්ලා තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා කියනවා, IMF එකේ targets අභිභවා ගිහිල්ලා තිබෙනවාය කියලා. ඉතින් එතුමාට තමයි, IMF එකේ targets තිබෙන්නේ. අපට ඒවා අදාළ නැහැ. අපට අදාළ වෙලා තිබෙන්නේ අපේ සාර්ව ආර්ථිකය ස්ථාවර කර ගැනීමයි. ඒ නිසා අපි ඒ දිශානතියට අපේ රට මෙහෙයවමින් සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම 2026 වසරේ අපගේ ප්‍රාථමික ගිණුමේ ශේෂය තුළ ඉහළම අතිරික්තයක් අපි වාර්තා කරලා තිබෙනවා. ඒකත් අපි සියයට 2.3 අභිභවා ගිහිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙන්න මේ තත්ත්වය යටතේ තමයි අපේ ණය ආපසු ගෙවීමේ හැකියාව ඉහළ ගිහිල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ණය ගැන කියනකොට මට සඳහන් කරන්න කරුණු කීපයක් තිබෙනවා. අපි 2022 වසරේ බංකොලොත් වෙනකොට අපට තිබුණු ප්‍රධාන අර්බුදයක් තමයි, විදේශීය ණය ගෙවා ගන්න බැරි වෙච්ච එක. විදේශීය ණය ගෙවා ගන්න බැරි වෙලා අපි ඩොලර් බිලියන 38කට ආසන්න ප්‍රමාණයක හිර වෙලා හිටියා. හැබැයි, මේ පාර්ලිමේන්තුවේදීවත්, එළියේදීවත් මේකේ සැබෑ තත්ත්වය හෙළි කරන්නේ නැහැ, සැබෑ තත්ත්වය ගැන සාකච්ඡා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට විදේශ ණය ගෙවන්න තිබෙනවා. ද්විපාර්ශ්වික ණය ගෙවන්න තිබෙනවා. ඒ වාගේම බහුපාර්ශ්වික ණය ගෙවන්න තිබෙනවා. මේ දෙකම අපි අදටත් ගෙවා ගෙන යනවා.

නමුත්, අපට වාණිජ වෙළෙඳ පොළෙන් International Sovereign Bonds හරහා ගත්ත ඩොලර් බිලියන 15ක විතර ණය ප්‍රමාණයක් තිබුණා. මෙන්න මේ ඩොලර් බිලියන 15 ගෙවා ගන්න බැරිව,- මේ ණය අධික පොලියට තමයි අරගෙන තිබුණේ. කවුද, මේවා ගත්තේ? 2008දී තමයි ඉස්සෙල්ලාම ISBs ගන්න පටන් ගත්තේ. ඩොලර් බිලියන 15න්, ඩොලර් බිලියන 12.5ක්ම ගත්තේ මේගොල්ලන්ගේ 2015 - 2019 ආණ්ඩු කාලයේ. එහෙම ණය අරගෙන 2015දී සියයට 5ට තිබුණු ආර්ථික වර්ධනය ඍණ මට්ටම දක්වා ගෙන ගියා. ණය අරගෙන ඒ මුදල් හරියට සංවර්ධන කටයුතු සඳහා යෙදෙව්වේත් නැහැ. ආර්ථික වර්ධනයත් සම්පූර්ණයෙන්ම ඍණ මට්ටමට ගෙනාවා. එහෙම ගෙනාපු අය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපට මේ විවේචන ඉදිරිපත් කරන්නේ. එම නිසා අපි දැන් ණය තිරසරභාවය පිළිබඳව විද්‍යාත්මක, හොඳ සැලසුමකට අනුව කටයුතු කරමින් ඉන්නවා. 2022දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 114ක් වුණු අපේ ණය ප්‍රමාණය අපි මේ වෙනකොට සියයට 97කට ආසන්න මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. අපි දන්නවා, ණයක් තිබෙන එක හොඳ දෙයක් නොවන බව. නමුත්, අපි ඉදිරි වසර තුනක කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපේ ණය ප්‍රමාණය සියයට 87කට ආසන්න ප්‍රමාණයකට ගෙන ඒමට කටයුතු කරමින්

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්න එහෙමයි අපි සාර්ව ආර්ථිකය ස්ථාවර කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි 2025 වසරේදීත් විදේශ ණය සේවාකරණය සඳහා ඩොලර් බිලියන 2,435ක් වැය කරලා තිබෙනවා. ඒකෙන් ඩොලර් බිලියන 2,035ක් අපට ගෙවන්න තිබෙනවා. මේ වෙනකොටත් අපි ඒකෙන් 1,948ක් ගෙවා අවසන්. තව ගෙවන්න තිබෙන්නේ ඩොලර් මිලියන සුළු ප්‍රමාණයක්. අපි ඒ ප්‍රමාණයත් මේ වසර අවසන් වෙන්නට ප්‍රථම ගෙවා අවසන් කරනවා. අපි ජාත්‍යන්තර වශයෙන් ගත් ස්වෛරී බැඳුම්කර වෙන්න පුළුවන්, ද්විපාර්ශ්වික ණය වෙන්න පුළුවන්, බහුපාර්ශ්වික ණය වෙන්න පුළුවන්, ඒවා ගෙවා දැමීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අර කිව්වා වාගේ ඒවා පෞද්ගලික සම්බන්ධතා හරහා අපට ගොඩනගා ගන්න පුළුවන් දෙයක් නොවෙයි.

ගරු විපක්ෂ නායකතුමා මේ වෙලාවේ සභාවේ නැති වුණත් එතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. මැක්ස් වෙබර් කියලා සමාජ විද්‍යාඥයෙක් හිටියා. ඔහු නිල බල ක්‍රමය - bureaucracy එක - ගැන කියා තිබෙනවා. ඔබතුමා එය කියවන්න. ඒ bureaucracy එකේ තිබෙන ප්‍රධානම සංකල්පයක් තමයි, අපෞද්ගලික සබඳතා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික සබඳතා නොවෙයි කළමනාකරණයේදී ඉතා වැදගත්, අපෞද්ගලික සබඳතා. මේ පෞද්ගලික සබඳතාවලින් ඒගොල්ලන් රැකියා දුන් හැටි අපි දැක්කා. ඒගොල්ලන් පෞද්ගලික සම්බන්ධතාවලින් අපේ භාණ්ඩාගාරයේ මුදල්; මහජනතාවගේ කෝටි, ප්‍රකෝටි ගණන් මුදල් අවභාවිත කරපු හැටි පසුගිය ඉතිහාසයේ අපි දැක්කා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පෞද්ගලික සම්බන්ධතා නොවෙයි, අපේ ජනාධිපතිවරයා කිව්වේ මහා භාණ්ඩාගාරයට එන සෑම ශතයක්ම සාංඝික දේපළ වාගේ රැක බලා ගන්නවා කියායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මහජනතාවගේ මුදල් ඉතාම ප්‍රවේශමෙන්, විනිවිදභාවයකින් හා හොඳ මූල්‍ය විනයකින් යුතුව, ආරක්ෂාකාරීව වියදම් කරන්න අපට වගකීමක් තිබෙනවා. අන්න ඒ සාර්ව ආර්ථිකයේ අපි අත්පත් කරගත් ජයග්‍රහණ 2026 වසරෙන් ආරම්භ වන ඉදිරි වසර කිහිපය තුළ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් අනිවාර්යයෙන්ම අපි වැය කරනවා. ඒ වෙනුවෙන් අපි කටයුතු කරනවා. අන්න ඒ නිසා තමයි අපි සමාජ ආරක්ෂණය සඳහා මේ වසර තුළ විතරක් අපේ 2026 අය වැය ලේඛනයෙන් රුපියල් බිලියන 837ක් වෙන් කර තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මුදල් වෙන් කර තිබෙන්නේ ඉතාම අරපරිස්සමෙන්, ඉතා හොඳ මූල්‍ය කළමනාකරණයකින්, විනිවිද පෙනෙන ක්‍රමවේදයක් අනුව ඉතාම සැලසුම් සහගතව අපි රාජ්‍ය පාලනය කරන නිසායි. අන්න ඒ පාලනය තුළින් අපි ඇති කරනු ලැබූ ආර්ථික ස්ථාවරත්වයන් මත මහා භාණ්ඩාගාරයේ අපට රුපියල් ට්‍රිලියනයකට වඩා ආදායම් තිබෙනවා; මුදල් තිබෙනවා; වත්කම් තිබෙනවා. ඒ වාගේම තමයි, අපි ඩොලර් සංචිත වර්ධනය කරගෙන තිබෙනවා. අපි ඉදිරි වර්ෂ කිහිපය තුළ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට, වතු කම්කරුවන්ට, සාමාන්‍ය ප්‍රජාවට මෙන්න මේ හරහා ආර්ථික ප්‍රබෝධයක් ඇති කර දෙන්නත්, අපි අපේක්ෂා කරපු අර පොහොසත් රටක් තුළ ජනතාවගේ ජීවිත ලස්සන කිරීමේ ක්‍රියාවලියත් සිදු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි නිකම් සාමාන්‍ය සාර්ව ආර්ථිකය විතරක් ස්ථාවර කළා විතරක් නොවෙයි. පසුගිය වසර ගත්තොත්, විශේෂයෙන්ම අපි මේ රටේ රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කළා, අදියර 3කින්, වසර 3ක කාලයක් පුරා වැඩි වන විධියට. එහි පළමු අදියර අපි මේ වසරේ ක්‍රියාත්මක කළා. මේ අය වැයෙන් අපි එහි දෙවැනි අදියර රාජ්‍ය සේවකයන්ට ලබා දෙනවා. ඒ වාගේම, අපි පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළා. මේ වසරේදීත් ඊට අදාළව කොටසක් ලැබීමට නියමිතයි. ඒ වාගේම, මේ රටේ මලෛයහම් ප්‍රදේශවල ජීවත් වන වතු කම්කරු ජනතාවගේ වැටුප සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වසර ගණනාවක් තිස්සේ මේ ගැටලුව විසඳන්න බැරි වුණා. වතුකරයේ නායකයින්ට, මේ රට පාලනය කරපු පසුගිය ආණ්ඩුවලට මේ ප්‍රශ්නය විසඳන්න බැරි වුණා. අපි ඒ ගැන විශේෂයෙන් සලකා බලා වතු කම්කරුවන්ගේ වැටුප එළඹෙන වසරේ සිට මාසිකව රුපියල් 10,000කට ආසන්න ප්‍රමාණයකින් වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙමයි අපි මේ සමාජයේ ආන්තික ජන කොටස් රැක බලා ගන්නේ, ඔවුන් වෙනුවෙන් සමාජ සුබසාධනය කරන්නේ, ඔවුන් වෙනුවෙන් සමාජ සංවර්ධනය කරන්නේ. ආර්ථික සංවර්ධනයත්, සමාජ සංවර්ධනයත්, ඒ වාගේම මානුෂික සංවර්ධනයත් අපි ජනතාව වෙත ළඟා කර දෙන්න ඕනෑ. අන්න ඒ වෙනුවෙන් තමයි අපි වැඩකටයුතු කරමින් ඉන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙන්න මේ කරුණුත් එක්ක විශේෂයෙන්ම අපේ ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් අය වැය කථාව ඉදිරිපත් කරනකොට ප්‍රධාන අරමුණු 6ක් ඉදිරිපත් කළා. ඒ ප්‍රධාන අරමුණු 6 තුළ තමයි මුදල් ඇමතිවරයා විධියට ගරු ජනාධිපතිතුමා අපේ නව රජයේ ගමන, අපේ දිශානතිය පැහැදිලි කළේ. මේක මේ අයට තේරුම් ගන්න බැහැ. මේකට එක් එක් වෙලාවට එක් එක් අර්ථකථන දෙන්න මේගොල්ලන් උත්සාහ කරනවා. දැන් මෙතැන කිව්වා, මේ අය වැය ලේඛනය ලියා තිබෙන්නේ අපි නොවෙයි ලු. IMF පදේට අපි නටනවා ලු. තව වෙලාවක කියනවා, "මේක නව ලිබරල්" කියලා. ඊට කලින් කිව්වා, "අපි කොමියුනිස්ට් ක්‍රමය ගෙනෙන්න යනවා" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ජාතික ජන බලවේගයේ උපාය මාර්ග මේගොල්ලන්ට තේරුම් ගන්න බැහැ. මොකද, මේගොල්ලන් සාම්ප්‍රදායික ක්‍රමවේදයක ගිලිලා ඉන්නේ. ඒකෙන් ඔවුන්ට ගොඩ එන්න බැහැ. අවුරුදු 76ක් තුළ ඔය සාම්ප්‍රදායික ක්‍රමවේදවලම එල්බගෙන ඉඳලා, මේ රට විනාශ කරලා, වංචා සහ දූෂණ කරලා, ආර්ථිකය වට්ටලා, ජන ජීවිතය සම්පූර්ණයෙන්ම විනාශ කරපු පාලකයින්ට මේක තේරුම් ගන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි neoliberal ක්‍රමයට යනවා ලු. අපි neoliberal ක්‍රමය අනුගමනය කරනවා නම් වෙළෙඳ පොළට රාජ්‍යය මැදිහත් වෙන්නේ කොහොමද? අපේ රාජ්‍යය අත්‍යවශ්‍ය අවස්ථාවලදී වෙළෙඳ පොළට මැදිහත් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි පිළිගන්නවා, පෞද්ගලික අංශය. විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගැන කථා කළා. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක උන්මාදයක් ඇති කරන්න ඕනෑය කියන එක අපේ ජනාධිපතිවරයා මෑත කාලයේ නොවෙයි, 2018 වර්ෂයේ ඉඳලායි කියන්නේ. ඒ සඳහා මේ වසරෙත් අපි රුපියල් මිලියන 80,000ක් වෙන් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි. ඒ රුපියල් මිලියන 80,000ට අමතරව විශේෂයෙන්ම මම වගකීම දරන අමාත්‍යාංශයේ අපේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා රුපියල් මිලියන 60,000කට ආසන්න ප්‍රමාණයක් ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ව්‍යවසායකත්වය නැංවීම සඳහා මූල්‍ය පහසුකම් වශයෙන් ලබා දීමට අපි කටයුතු කරනවා. එතකොට මේ දිළිඳු බව තුරන් කිරීමේ උපක්‍රමය කුමක්ද? එක උපක්‍රමයක් විතරක් නොවෙයි, අපි උපක්‍රම ගණනාවක් අනුගමනය කරනවා. මීට කලින් දිළිඳු බව තුරන් කිරීම සඳහා අනුගමනය කරපු වැඩසටහන්වල මොකක්ද තිබුණේ? එකක් අවසන් කරලා තව එකක් පටන් ගත්තා. ආහාර මුද්දර ක්‍රමය අවසන් කළා; ජනසවිය ආවා; ඒක අවසන් කරලා සමෘද්ධිය ආවා; ආපහු දිවි නැගුම ආවා; ආපහු සමෘද්ධිය එනවා; ඒක අයින් කරලා අස්වැසුම එනවා.

නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අඩු ආදායම්ලාභී ජනතාවට අවශ්‍ය සුබසාධනය අපි ලබා දෙනවා. ඒ සඳහා සමාජ ආරක්ෂණය වෙනුවෙන් රුපියල් බිලියන 837ක් අපි වැය කරලා තිබෙන්නේ. රුපියල් 8,500ක්ව තිබුණු අස්වැසුම සහනාධාරය රුපියල් 10,000 දක්වාත්, රුපියල් 15,000ක්ව තිබුණු දීමනාව රුපියල් 17,500 දක්වාත් වැඩි කළා. අපි ඒ සුබසාධන වැඩසටහන ඒ විධියටම අරගෙන යනවා.

මම මේ පාර්ලිමේන්තුවේදී සෙනසුරාදා කිව්වා, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජා සවිබලගැන්වීම සඳහා අපි සම්පූර්ණයෙන්ම දිශාගත කර තිබෙන බව. ආර්ථික වශයෙන්, මනෝ සමාජයීය වශයෙන්, සමාජයීය වශයෙන්, මූල්‍ය සාක්ෂරතා වශයෙන් සහ සමාජ ආරක්ෂණ වශයෙන් පස් වැදෑරුම් ක්‍රමවේදයක් ඔස්සේ අපි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මෙහෙයවලා තිබෙනවා, ප්‍රජාව සවිබලගැන්වීම සඳහා. ඒ වාගේම අපි සමාජ ආරක්ෂණ අරමුදලක් ඇති කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමාජ ආරක්ෂණය අවශ්‍යයි. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයෙන් මේ වනකොට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. විශේෂයෙන්ම අවිධිමත් ක්ෂේත්‍රයේ ඉන්න ඕනෑම කෙනෙකුට -වඩු වැඩ කරනවා වෙන්න පුළුවන්, කුලී වැඩ කරනවා වෙන්න පුළුවන්- බැඳෙන්න පුළුවන් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක්, සමාජ ආරක්ෂණ ක්‍රමයක් අපි ඇති කර තිබෙනවා. ඒ හරහා අපි සමාජ සුබසාධනය ඇති කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ තුන්වන උපාය මාර්ගය තමයි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සඳහා වන "ප්‍රජා ශක්ති" ජාතික වැඩසටහන. ඒක උපක්‍රමයක් විතරයි. සහභාගිත්ව සංවර්ධන උපක්‍රමයක්. දැනටමත් තිබෙන දිස්ත්‍රික් සංවර්ධන කමිටු, ප්‍රාදේශීය සංවර්ධන කමිටු අපි ගමට ගෙනියනවා. අපි ගමේ හදනවා, ප්‍රජා සංවර්ධන සභාවක්. ඒ ප්‍රජා සංවර්ධන සභාව තුළ දැනටමත් තිබෙන ව්‍යුහය පහළට ගෙනිහිල්ලා අපි ගමේ ජනතාවත් එක්ක සැලසුම් කරනවා, ගමේ ජනතාවගෙන් අපි අහනවා කොහොමද සංවර්ධනය වෙන්න ඕනෑ කියලා. ඒගොල්ලන්ගේ තිබෙන සම්පත් පාවිච්චි කරනවා, විශේෂඥ දැනුම පාවිච්චි කරනවා. ඒ විධියට පහළ සිට ඉහළට ගලාගෙන යන සංවර්ධන ප්‍රවේශයක් අපි හඳුන්වා දී තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙනුවෙන් තමයි අපේ ජනාධිපතිතුමා තම අය වැය ලේඛනයෙන් මෙවර රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, වාරිමාර්ග ක්ෂේත්‍රයට, ග්‍රාමීය මාර්ග ක්ෂේත්‍රයට, වතු යටිතල පහසුකම්වලට වෙන් කළ සියලු මුදල් ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම සඳහා අපි යොදවනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසන් වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටේ අපි ජනතාවට පොරොන්දු වුණා, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් උදා කර දෙනවා කියලා. ඒ පොහොසත් රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී වූ සියලු ජනතාවගේ ජීවිත ලස්සන කරන වගකීම අපි විසින් පවරාගත් වගකීමක්. එය කවුරුවත් අපට ලබා දුන් එකක් නොවෙයි. අපේ මන්ත්‍රීවරු දෙස බලන්න, අපේ කැබිනට් මණ්ඩලය දෙස බලන්න. අපි වෘත්තියවේදීන්. අපේ රැකියාව අත්හැරලා මේ වගකීම පවරා ගත්තේ මේ රටේ ජනතාවට ගෞරවනීය ජීවිතයක් උදා කරදීම සඳහායි. ඒ වෙනුවෙන් අපි කැප වෙනවා, ඒ වෙනුවෙන් අපි සාමූහිකව වැඩ කරනවා. මේක සාමූහික උත්සාහයක්. අපි ඒ වෙනුවෙන් සැලසුම් කරනවා, සාමූහිකව කැප වෙනවා. සාමූහික උත්සාහයක් තුළින් අපි මේ රට පොහොසත් රටක් බවට පරිවර්තනය කරනවා. ඒ ඔස්සේ සියලු ජනතාවගේ ජීවිත ලස්සන කරනවා කියාත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Susantha Kumara Nawarathna. You have ten minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.* Thank you so much.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (8) යටතේ මා මෙම කාරණය ඉදිරිපත් කරන්නේ. මම එය කියවන්නේ නැහැ. ඊයේ මම ගැන කථා කරලා තිබුණා, නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, I will give you a minute.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Sir.

மாண்புமிகு சனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்ட உரையை ஆற்றும்போது நான் இந்தப் பாராளுமன்றத்தில் நித்திரை கொண்டது தொடர்பாக நேற்றையதினம் கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் கதைத்திருக்கிறார். மேலும், என்னுடைய புகைப்படத்தையும் காண்பித்து, நான் நித்திரை கொள்வதாகச் சொல்லியிருக்கிறார். அவர் என்னுடைய personal conduct சம்பந்தமாக விபரித்திருக்கிறார். Sir, அன்றைய தினம் காலை 9 மணிக்குப் பாராளுமன்றத்துக்கு வந்த நான், இந்த Budgetஐ முழுமையாக - fullஆக - படித்தேன். அதிலுள்ள விடயங்களை என்னால் அக்கு வேறாக ஆணி வேறாகச் சொல்ல முடியும். இந்த வரவு செலவுத்திட்டத்தில் எங்களுடைய வடக்கு மாகாணத்துக்கென எதுவுமே specialஆக ஒதுக்கப்படவில்லை. ஆதலால் அந்த நேரத்தை waste பண்ணாமல் நான் நித்திரை கொண்டேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, please make it very concise.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, முடிக்கிறேன். இது எங்களுக்குப் பிரயோசனம் இல்லாத Budget என்ற காரணத்தால்தான் நான் நித்திரை கொண்டேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Susantha Kumara Nawarathna. You have ten minutes.

[පූ.භා. 11.54]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2026 වර්ෂය සඳහා වන අය වැය ඉදිරිපත් කරලා දින කිහිපයක් ගත වී ඇති මොහොතක, අද දවසේ මේ සාකච්ඡාවට එකතු වීමට ලැබීම ගැන මා සතුටු වනවා.

විපක්ෂයේ බොහෝ දෙනෙක් මාස තුනෙන් තුනට ජනාධිපති වෙන්න සිහින දැකපු වෙලාවක, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඉතා ශක්තිමත්ව 2026 වර්ෂය සඳහා මෙම අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. මෙම අය වැය අපි උපාය මාර්ගිකව කාරණා හයක් යටතේ ඉදිරිපත් කළා. අපේ ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමාත් ඒ ගැන අදහස් දැක්වූවා. ඒ තමයි, තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක්, ණය තිරසරභාවය සහතික කිරීම, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම වාගේම ඩිජිටල්කරණය. උපාය මාර්ගිකව කාරණා හයක් මූලික කරගෙන 2026 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ මේ අය වැයෙන් විශේෂයෙන්ම අපනයන විවිධාංගීකරණය, නිෂ්පාදන ආර්ථිකය, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම කියන කාරණාත් එක්ක ගැට ගැහෙන අපේ කෘෂි කර්මාන්තය පදනම් කරගෙන, කෘෂි කර්මාන්තය ඉලක්ක කරගෙන ජනතාවට කොපමණ ප්‍රතිලාභ වෙන් කර තිබෙනවාද? මම මේ කාරණාව ටිකක් වැඩිපුර මතු කර ගන්න අදහස් කරන්නේ මේ නිසායි. අපි දන්නවා, මේ දිනවල අපේ රටේ ලූනු ගොවීන්, අල ගොවීන් පාරට බැහැලා සිටින බව. මොකද, ලූනු ගොවියාට, අල ගොවියාට සාධාරණ මිලක් හම්බ වුණේ නැහැ කියලා. අපි ආණ්ඩුව විධියට සතොස ආයතනයත්, ඒ වාගේම කාගිල්ස් වැනි පෞද්ගලික ආයතනත් එක්ක එකතු වෙලා ලූනු මිලදී ගැනීමට අදාළ මැදිහත්වීම කළා. ඒ මිලදී ගත් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්න පුළුවන්. ඒකේ යම් ගැටලුවක් තිබෙන්න පුළුවන්. ඒ ගැටලුව නිරාකරණය කිරීම සඳහා ගොවි ජනතාවගේ සියලු නිෂ්පාදන -අල වෙන්න පුළුවන්, ලූනු වෙන්න පුළුවන්, වී වෙන්න පුළුවන්- මිලදී ගැනීමට අදාළව මේ අය වැයෙන් අපි කොහොමද වැඩි අවධානයක් යොමු කරලා තිබෙන්නේ? අපි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය හරහා සතොස ආයතනයට ඒ සියලු නිෂ්පාදන මිලදී ගන්න, ගබඩා පහසුකම් හදන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. දඹුල්ලේ ශීතාගාරයක් හදලා ඉවර වෙලා ඒක ආරම්භ කර ගන්න තවම බැරි වෙලා තිබෙනවා. ඒ ගබඩාව යථා තත්ත්වයට පත් කරන්න රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙනවා. ඒ ගබඩාවේ ශීතාගාර පහසුකම් වැඩිදියුණු කරලා මිලදී ගැනීමේ යන්ත්‍රණය යථාවත් කරන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි දන්නවා, මේ මහ පොළොවත් එක්ක පොර බදින, ඔට්ටු වන ගොවි ජනතාව අනේක දුක් විඳින බව. ගොවි ජනතාවට මේ මොහොතේදී තමන් නිෂ්පාදනය කළ අස්වනු සියල්ල විකුණා ගන්න බැරි වුණා නම්, ඔවුන් යම් අපහසුතාවකට පත් වෙලා තිබෙනවා නම්, ඒක ඇත්ත වෙන්න පුළුවන්. හැබැයි, ඒ කාරණය සම්බන්ධයෙන් අපි අවධානය යොමු නොකළාම කිව්වොත් වැරදියි. නැහැ, අපි අවධානය යොමු කළා. අපි මැදිහත් වුණා. අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙමින් ඉන්නවා. සමහර අවස්ථාවලදී විපක්ෂයේ බොහෝදෙනෙක් කියනවා අපි දැක්කා, මේ අය වැය ඉදිරිපත් කළේ මහ පොළොවේ ඉඳගෙන නොවෙයි කියලා. අපේ ගරු ජනාධිපතිතුමා මෙවර අයවැය කථාව පැය 4කුත් විනාඩි 20ක් තිස්සේ ඉදිරිපත් කරන කොට විපක්ෂයේ බොහෝදෙනෙකුට හිතෙන්න ඇත්තේ පොළොව පළාගෙන යන්නයි. ඒක නිසා විකාර දොඩවන තත්ත්වයට පත් වෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රසායනික හා කාබනික පොහොර සහනාධාර වැඩසටහන වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට රුපියල් මිලියන 36,900ක් වෙන් කර තිබෙනවා. ඒ, පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන්නයි. ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව එනකොට පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටෙයාරයකට රුපියල් 15,000යි ලබා දෙමින් තිබුණේ. හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක්ව තිබුණු පොහොර සහනාධාරය අපි ඇවිල්ලා පළමුවෙනි මොහොතේම රුපියල් 25,000ක් කළා. විපක්ෂයේ මේ මන්ත්‍රීතුමන්ලාගෙන් අපි අහනවා, දුප්පත් ජනතාව වෙනුවෙන් නොවෙයිද ඒ සහන දුන්නේ, ගොවි ජනතාව වෙනුවෙන් නොවෙයිද ඒ සහන දුන්නේ කියලා. එහෙම නම්, මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ මහ පොළොවේ ඉඳගෙනයි කියන එක අපි එයිනුත් තහවුරු කරනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම, පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය සඳහා රුපියල් මිලියන 1,243ක් වෙන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 5,550ක් අපි මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 5,550ක්, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්! මේ රටේ දෙකෝටි විසිලක්ෂයකට ආහාර ටික නිෂ්පාදනය කරලා දෙන ගොවි ජනතාව ආරක්ෂා කරන්න ඕනෑ කියන තැන අපි හැම දාමත් හිටියා. ඒ ගොවීන්ගේ විශ්‍රාම වැටුප් වෙනුවෙනුයි ඒ රුපියල් මිලියන 5,550 වෙන් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ සමහරු හැම පාර්ලිමේන්තු රැස්වීම් දිනකම උදේට ඇවිල්ලා මේ සභාවේ කටයුතු කරගෙන යන්න දෙන්නේ නැතිව විවිධ කථා හදලා, මැද්දට පැනලා කටයුතු අවුල් කරන්න හදනවා. අදත් කිව්වා, වීවලට සාධාරණ මිලක් හම්බ වුණේ නැහැ කියලා. මම කියන්න කැමැතියි, රුපියල් මිලියන 6,000ක් වෙන් කරලා වී මෙට්‍රික්ටොන් 50,000කට ආසන්න ප්‍රමාණයක් අපි ගිය අවුරුද්දේ මිල දී ගත් බව. ඒ වාගේම 2026 වර්ෂය සඳහා ආරක්ෂිත වී තොගයක් පවත්වාගෙන යෑම වෙනුවෙන් ලබන අවුරුද්දට රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙනවා, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව. එහෙම නම් අපි අහනවා, මේ අය වැය හදලා තිබෙන්නේ මහ පොළොවේ ඉඳගෙන නොවෙයිද කියලා. විපක්ෂයට පොළොව පළාගෙන යන්න හිතෙනවා තමයි මේවා කියන කොට, මේ තොරතුරු දකින කොට, මුදල් වෙන් වෙලා තිබෙන ප්‍රමාණය දැනගන්න කොට. අපි වී ගොවියාගේ ආරක්ෂාව වෙනුවෙන් වී මිල දී ගැනීමේ යන්ත්‍රණය වී අලෙවි මණ්ඩලය හරහා තවත් ශක්තිමත් කරන්න සූදානම් කරමින් තිබෙනවා.

ඒ වාගේම, කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයන්ගේ සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 750ක් වෙන් කරලා තිබෙනවා. ඉතිහාසය පුරා අපේ රටේ ගොවි ජනතාවට අලුත් තාක්ෂණය හිමි වුණේ නැහැ, නැවුම් තාක්ෂණය හිමි වුණේ නැහැ. ඒ නිසා ව්‍යවසායකයන් නිර්මාණය කිරීම වෙනුවෙනුයි ඒ රුපියල් මිලියන 750 වෙන් කරලා තිබෙන්නේ. අපි දැන් අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය අලුත් දිශාවකට හරවමින් තිබෙන බව මා කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය වෙනුවෙන් අපි රුපියල් මිලියන 3,000ක් වෙන් කරනවා. අපේ රටේ ගොවිතැනත් එක්ක ඔට්ටු වන, පොර බදන ගොවි ජනතාව වගා කරන බෝග රක්ෂණය කිරීම වෙනුවෙන්

අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව වැඩි වැඩියෙන් අවධානය යොමු කර තිබෙනවා; බෝග රක්ෂණය වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කරලා තිබෙනවා. අනෙක් අතට, ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය ඒකට මැදිහත් වෙමින් තිබෙනවා; කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වෙමින් තිබෙනවා. ආහාර සුරක්ෂිතතාව ඉදිරියේදී තවත් වැඩි වැඩියෙන් තහවුරු කරන්නයි අපි ඒ රුපියල් මිලියන 300 වෙන් කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම අතිරේක බෝග වගා වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපි රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය වෙනුවෙන් රුපියල් මිලියන 5,427ක් වෙන් කර තිබෙනවා. මේක පොඩි මුදලක් නොවෙයි. මෙන්න, භාණ්ඩාගාරය උතුරා ගියා කියන මුදල් සාමාන්‍ය ජනතාවට, දුප්පත් ජනතාවට ලබා දෙන විධිය. විපක්ෂයේ බොහෝ දෙනෙක් මෙතැනට ඇවිල්ලා කෙඳිරි ගානවා; වැලපෙනවා. රටේ ජනතාවට බොරු තොරතුරු තහවුරු කරන්න හදනවා; වැරැදි තොරතුරු තහවුරු කරන්න හදනවා. නමුත් මෙන්න, අපේ රජයෙන් ග්‍රාමීය දුප්පත් ජනතාවට, ගොවි ජනතාවට පහසුකම් ලබා දෙන්න මුදල් වෙන් කර තිබෙන විධිය.

අපේ රටේ කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධව තිබෙන ඊළඟ ප්‍රධාන අමාත්‍යාංශය තමයි වාරිමාර්ග අමාත්‍යාංශය. 2025 අය වැයෙන් වාරිමාර්ග අමාත්‍යාංශයට රුපියල් මිලියන 78,000ක් වෙන් කළා. මෙවර අය වැයෙන් එම අමාත්‍යාංශයට රුපියල් මිලියන 91,700ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ, මෙවර වැඩිපුර රුපියල් මිලියන 13,700ක් වෙන් කර තිබෙනවා, අපේ රටේ තිබෙන මහා වාරි පද්ධති නවීකරණය කිරීම වෙනුවෙන්. මේ රටේ ගොවි ජනතාව අමාරුවෙන් වතුර ටික හරවන කොට, අප ඒ අයට අවශ්‍ය පහසුකම් හදා තිබෙන්නේ මහ පොළොවේ ඉඳිමින් නොවෙයිද කියලා මම විපක්ෂයේ උදවියගෙන් අහනවා. ඒ වාගේම තමයි වී වියළීමේ යන්ත්‍ර ලබා දීම වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ රටේ ඊළඟට තිබෙන ප්‍රධාන කර්මාන්තය තමයි කිරි කර්මාන්තය. කිරි කර්මාන්තය ඉහළ නැංවීම වෙනුවෙන් Dairy Hub ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් පශු සම්පත් ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. අපේ රටේ බිඳ වැටී තිබෙන පශු සම්පත් ක්ෂේත්‍රය ඉහළ නැංවීම සඳහාත්, තෝරාගත් ගොවි පොළවල් අභිජනන ගොවි පොළවල් ලෙස සංවර්ධනය කිරීම සඳහාත් NLDB එක වෙනුවෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා.

අපි දන්නවා, 2015දී ආරම්භ කරපු බඩල්ගම කිරි නිෂ්පාදන කර්මාන්තශාලාවට රුපියල් මිලියන 18,000ක් වියදම් කළත් අදටත් එහි නිෂ්පාදන ආරම්භ කරගන්න බැරි මට්ටමේ පවතින බව. අපේ රටේ කිරි කර්මාන්තය කෙරෙහි පසුගිය කාලයේ අවධානය යොමු නොකිරීම හේතුවෙන් එය අවගමනයකට තල්ලු කර තිබෙනවා. නමුත් අපි කියන්න සතුටුයි, කිරි නිෂ්පාදනය තව තවත් වැඩි කිරීම සඳහා මිල්කෝ ආයතනය සතු බඩල්ගම නව කිරි කර්මාන්තශාලාව ඉදි කිරීමේ කටයුතු අවසන් කිරීම වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙන බව. ඊට පසුව, දැනට නාරාහේන්පිට තිබෙන ප්‍රධාන කිරි කර්මාන්තශාලාව බඩල්ගමට අරගෙන යන්න අපි කටයුතු කරනවා.

අපේ රටේ කෘෂි කර්මාන්තය වෙන්න පුළුවන්, පශු සම්පත් ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, මේ හැම ක්ෂේත්‍රයක් එක්කම ගැට ගැසී සිටින ගම්වල සිටින ගොවි ජනතාවගේ, මහ පොළොවත් එක්ක පොර බදන; ඔට්ටු වෙන ජනතාවගේ ප්‍රශ්න විසඳීම වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂි පර්යේෂණ ආයතනය, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය කියන සියලු අමාත්‍යාංශ, ආයතන හා දෙපාර්තමේන්තු එක්කාසු වෙලා කටයුතු කරනවා. ලබන අවුරුද්දේ ගොවි ජනතාව නිෂ්පාදනය කරන අස්වැන්න ගොවියාට සාධාරණයක් වන විධියට මිල දී ගැනීමේ යන්ත්‍රණය ස්ථාපිත කිරීම වෙනුවෙන් මේ වනකොටත් සියලු කටයුතු සූදානම් කරලායි තිබෙන්නේ කියන එක සතුටින් ප්‍රකාශ කරමින් මම නවතිනවා. මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Thurairasa Ravikaran. You have 14 minutes.

[பி.ப. 12.05]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில், மன்னார் மாவட்டப் பொது மருத்துவமனைக்கான விபத்து மற்றும் தீவிர சிகிச்சைப் பிரிவுக் கட்டுமானம், புத்தளம் - மன்னார் மாற்றுவழிக்கான இயலுமை ஆய்வு, விவசாயத்துறை சார்ந்து வவுனியா, மன்னார் சிறுபற்றுநில விவசாயிகளுக்கான வலுவூட்டல், வவுனியா, மன்னார், முல்லைத்தீவு விவசாய உணவு உற்பத்தியாளர்களுக்கான வலுவூட்டல், முல்லைத்தீவு விவசாய உற்பத்திப் பொருட்களுக்கான சந்தை உட்கட்டமைப்பை மேம்படுத்தல் உள்ளிட்ட குறித்துக் கூறப்பட்ட வன்னி மாவட்டத்திற்குள்ளான அபிவிருத்தித் திட்டங்களுக்குரிய நிதி ஒதுக்கீட்டுக்கு, வன்னி மாவட்டத்தைச் சார்பாக்கும் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மேலும், இவ்வாண்டில் தொடங்கப்பட்ட வெட்டுவாய்க்கால் பாலக் கட்டுமானத்துக்கான 2026ஆம் ஆண்டின் தொடர் நிதி ஒதுக்கீட்டுக்கும் முல்லைத்தீவு மக்கள் சார்பான மனமார்ந்த நன்றி!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தத் தீவில் உள்ள அனைவருக்கும் சம அளவான வாய்ப்புகள் கிடைக்கப்பெறுவதை உறுதிப்படுத்துவதே சமத்துவம் என எண்ணுகிறோம். தெற்கில் உள்ளோர் காணும் அதே உலகத்தை, அதே உலகியல் அனுபவத்துக்கான வாய்ப்பை வடக்கில் உள்ளோரும் பெறுவதுதான் சமத்துவம்! போர்க் காலத்தில் காணப்பட்ட சமச்சீரற்ற வள அணுகல் தொடர்பில் நாங்கள் குரலெழுப்பவில்லை; குரல் எழுப்பவேண்டிய தேவையும் எங்களுக்கு ஏற்படவில்லை. அப்போதிருந்த எங்களின் நிழல் அரசு அனைவருக்குமான வளப் பகிர்வை, தற்சார்பு வாழ்வியலை, போதை அறவே அற்ற, அறம் நிரம்பிய வாழ்வைச் சான்றாக்கியிருந்தது. போருக்குப் பின்னரான காலத்தில் வன்னி மாவட்டம், குறிப்பாக முல்லைத்தீவு மாவட்டம் பல்வேறு தரப்படுத்தல்களிலும் கடைசி நிலையிலும் கடைசிக்கு அண்மைய நிலையிலும் விளங்கியதை இலங்கை அரசின் புள்ளிவிபரங்களே சுட்டிக் காட்டுகின்றன. கடந்த ஓராண்டு காலமாக வன்னி மாவட்டம் அபிவிருத்தியில்

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

பெரும்பாலான துறைகளில் மிகவும் பின்னடைவாகக் காணப்படுவதை ஏற்கெனவே துறைதோறுமான புள்ளிவிபரங்களோடு விவாதித்திருந்தேன். மீன்பிடி, விவசாயம், சிறுகைத்தொழில், சுகாதாரம், போக்குவரத்து, கல்வி, சுற்றுலா, பாதுகாப்பு என அனைத்துத் துறை சார்ந்தும் வாழ்வுக்கும் வாழ்வாதாரத்துக்கும் நாள்தோறும் போராடிப் போராடி வாழுகின்ற வாழ்வியலை இந்த அரசும் தக்கவைக்கிறதா? என்ற கேள்வியோடு மிகவும் நெருக்கமாகத்தான் இந்த வரவு செலவுத்திட்டம் பயணிக்கப்போகின்றது.

" திருடர்கள் களவெடுக்கிறார்கள் வந்து பிடியுங்கள்" என்றால், "எங்களிடம் ஆட்கள் இல்லை" என்று தட்டிக்கழிக்கும் நோக்குடன்தான் எந்தவொரு திணைக்களமும் காவல் நிலையமும் கடற்படையும் இயங்குகின்றன. அவர்கள் இப்படியான கருத்தைக் கூற முடியுமா, கூறத்தான் இயலுமா? முல்லைத்தீவுக் கடற்பரப்பிலே ஒவ்வொருநாளும்தான் திருட்டுத் தொழில் நடைபெறுகிறது. கண்ணெதிரே சட்டத்துக்குப் புறம்பாக நடைபெறும் மீன்பிடியை - அத்துமீறலை - உங்கள் அரசால் ஏன் இன்னும் கட்டுப்படுத்த இயலவில்லை? ஊழல் எங்கே உள்ளது, அகத்திலா, புறத்திலா? அடுத்துவரும் ஆண்டிலும் இந்த அரசு எங்கள் மீனவர்களின் வயிற்றில் அடிக்கப் போகிறதா? மீன்பிடியில் தடைசெய்யப்பட்ட தொழில் முறைகளைக் காலந்தாழ்த்தாது விரைவாகக் கட்டுப்படுத்துங்கள்! என்றுதான் கேட்கின்றோம்.

விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டில் எமது பிரதேசங்கள் இருந்த காலத்திலேயே குளிரூட்டிய பேருந்துகளில் பயணித்த எங்கள் மக்களுக்கு, மாறிமாறி வரும் அரசுகளால் யுத்தத்தின் பின்னரான கடந்த பதினைந்து ஆண்டுகளில் முல்லைத்தீவுக்கு ஒரு குளிரூட்டிய பேருந்துக்கான வழித்தட அனுமதியைக்கூட வழங்க இயலவில்லை.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இலங்கையில் 3 தேசிய மருத்துவமனைகள், 15 போதனா மருத்துவமனைகள், 14 சிறப்பு மருத்துவமனைகள் மற்றும் 21 மாவட்டப் பொது மருத்துவமனைகள் என மொத்தமாக உள்ள 53 உயர் மருத்துவமனைக் கட்டமைப்புகளில் மன்னார் மற்றும் முல்லைத்தீவிலுள்ள மருத்துவமனைகள் மட்டுந்தான் இன்னமும் கஷ்டப் பிரதேச மருத்துவமனைகளாக உள்ளன. மாவட்டத்தின் அதியுச்ச மருத்துவமனைக் கட்டமைப்பையே தொடர்ந்தும் இன்னும் எத்தனை ஆண்டு காலத்துக்குக் கஷ்டப் பிரதேச மருத்துவமனைகளாக நீங்கள் தக்கவைக்கப் போகின்றீர்கள்? இலங்கையிலே ஆதார வைத்தியசாலைகளில் கூட பயிற்சி மருத்துவர்களைப் பேணுகின்ற இந்த அரசு, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களின் உச்ச மருத்துவமனைகளுக்கு எப்போது அந்த வசதியை வழங்கப் போகின்றது? 2026இலும் வழங்கப் போவதில்லையா? கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, குடிப்பதற்கு உகந்த நீர் வசதியற்ற மருத்துவமனைகள் இன்னமும் வன்னி மாவட்டத்தில்தான் உள்ளன. இன்னும் எத்தனை ஆண்டு காலத்துக்கு எங்களைத் துறைகள் தோறும் 'கஷ்ட, கஷ்ட, கஷ்ட' என்ற பட்டியலுக்குள் வைக்கப் போகிறீர்கள்? 2026ஆம் ஆண்டிலேனும் 'கஷ்டப் பிரதேச மருத்துவமனை' என்ற அடையாளத்தை நீக்கும்வகையிலான நிதி ஒதுக்கீட்டை நிபந்தனையற்று வழங்கி, எங்களுக்கும் சமமான அணுகலுக்கான வாய்ப்பைத் தாருங்கள்!

நீண்ட காலமாக முழுமைப்படுத்தப்படாது விபத்து ஏற்படக்கூடிய சாத்தியக்கூறுகளைக் கொண்ட பாடசாலைக் கட்டிடங்கள் எமது கல்வி வலயங்கள் தோறும் காணப்படுகின்றன. முல்லைத்தீவு கல்வி வலயத்தின் முள்ளியவளைப் பிரதேசத்திலுள்ள கலைமகள் வித்தியாலயத்தில் ஏழாண்டுகளுக்கும் மேலாகக் கைவிடப் பட்ட நிலையில் உள்ள ஒரு மாடிக் கட்டிடத்தை நான் நேரில் சென்று பார்த்திருந்தேன். வள ஒதுக்கீட்டில் மிகவும் பிற்படுத்தப்பட்டுள்ள வவுனியா கல்வியியற் கல்லூரியிலும் இவ்வாறான நிலை காணப்படுகிறது. இலங்கையிலுள்ள கல்வியியற் கல்லூரியிலே மிகவும் வளம் குறைந்த கல்வியியற் கல்லூரியாக வவுனியா கல்வியியற் கல்லூரி மிகவும் கேவலமான நிலையில் இருக்கின்றது. இவ்வாறு முழுமைப்படுத்தப்படாத கட்டிடங்களை விரைவாக முழுமைப்படுத்தி அவற்றைக் கலைத்திட்ட நடைமுறைக்குக் கையளியுங்கள்! பாடசாலைக் கட்டிட மேம்பாடு, பாராமரிப்பு சார்பான தங்களின் 23.7 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டிலும், இடர்களுக்கு எதிராகப் பாடசாலைகளின் பாதுகாப்பை மேம்படுத்தல் சார்பான 0.8 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டிலும் இத்தகைய சூழல் நிலைமைகளுக்கு முன்னுரிமை அளியுங்கள்!

தகவல் தொழில்நுட்ப நிலைமாற்றத்துக்கான வள ஒதுக்கீட்டிலும் தீவளாவிய வகையில் வடக்கும் கிழக்கும் பின்தங்கியுள்ளது. வடக்கிலே மூன்று கல்வி வலயங்களிலும் கிழக்கிலே நான்கு கல்வி வலயங்களிலும் தகவல் தொழில்நுட்ப தொலைக் கல்வி நிலையங்கள் இன்னமும் நிறுவப்படாதுள்ளது. புள்ளிவிபரங்களின் அடிப்படையில் 'STEM' கல்வியில் முல்லைத்தீவு மாவட்டம் மிகவும் பின்தங்கியுள்ளது. ஆய்வுகூட வசதி போதாமை, ஆய்வுகூட பரிசோதனைகளை மேற்கொள்வதற்கான வளங்கள் போதாமை, வட மாகாணத்தில் உள்ள கல்வி வலயங்களில் கணித, விஞ்ஞான ஆசிரியர்களின் சமச்சீரற்ற பரம்பல், தகவல் தொழில்நுட்ப ஆய்வுகூட வசதிகள் போதாமை, பழுதடைந்த கணினிகளைத் திருத்துவதற்கும் திருத்த இயலாத காலங்கடந்த கணினிகளைப் பதிவழிப்பதற்கும் வினைத்திறனான பொறிமுறை இன்றிய நிலை என்பன தகவல் தொழில்நுட்ப நிலைமாற்றத்துக்குச் சவாலாகின்றன. 2026 தொடக்கம் நடைமுறைப்படுத்தப்படவுள்ள புதிய கல்வி மறுசீரமைப்புக்கும் இவை பாரிய சவால்கள்! இலத்திரனியல் வள நிரப்பலுக்கான நிதி ஒதுக்கீடு அனைத்து மாவட்டங்களுக்கும் சமத்துவ அடிப்படையில் கிடைப்பதைத் தயவுசெய்து உறுதிப்படுத்துங்கள்!

வீதிப் புனரமைப்பு, கிராப்புறப் பாலங்கள் புனரமைப்பு, பிரதேசங்கள் மற்றும் கிராமங்கள் வரையான பேருந்து வசதி, பேருந்துத் தரிப்பிடங்களுக்கான தேவை என்பவற்றில் முல்லைத்தீவு மாவட்டத்தின் துணுக்காய், மாந்தை கிழக்குப் பிரதேசங்கள் கடுமையான சமச்சீரற்ற நிலைக்குச் சான்றாகின்றன. விவசாய உற்பத்திப் பொருட்களைச் சந்தைப்படுத்துவதிலும், ஊழியர்கள் பணிக்குச் செல்வதிலும், மாணவர்கள் பாடசாலையிலிருந்து வீடு திரும்புவதிலும், நோயாளிகள் மருத்துவ வசதிகளைப் பெறுவதிலும் குறித்த பிரதேச மக்கள் சமமான அணுகலை இன்றுவரை பெறவில்லை. போக்குவரத்துக்கான 456 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டிலே அவர்களின் இடர்களையும் இழிவளவாக்க வகை செய்யுங்கள் என இந்தச் சபையிலே நான் கேட்டுக் கொள்கிறேன். கல்வியால் நாட்டை முன்னேற்றலாம் என்பது எல்லோருக்கும் தெரியும். ஆனால், இங்கே பாதுகாப்புக்கு அதிக நிதியும் கல்விக்கு மிக மிகக் குறைவான நிதியுமே ஒதுக்கப்பட்டிருப்பதை நான் குறிப்பிடுகின்றேன்.

அடுத்து, வவுனியாவில் முன்னெடுக்கப்படவுள்ள பூர்வீகத் தமிழர்களுக்குப் பாதகமான 'கிவுல் ஓயா' திட்டத்தை நான் மிகவும் கடுமையாக எதிர்க்கின்றேன். மகாவலி அபிவிருத்தி அதிகாரசபையினால் முன்னெடுக்கப்படவிருக்கின்ற

'கிவுல்ஓயா' நீர்த்தேக்கக் கட்டுமானத் திட்டத்திற்கு 2.5 பில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இந்த 'கிவுல் ஓயா' திட்டத்தைச் செயற்படுத்தினால் வவுனியா வடக்குப் பிரதேசத்திலுள்ள பூர்வீகத் தமிழ் மக்களின் பத்துக்கும் மேற்பட்ட சிறிய நீர்ப்பாசனக் குளங்களும் அவற்றின் கீழான வயல் நிலங்களும் பழந்தமிழ்க் கிராமங்களும் பறிபோகும் அபாயம் ஏற்படவுள்ளது. 'மாஓயா' அல்லது பேராறு மற்றும் சூரியன் ஆறு ஆகிய ஆறுகளை மறித்துப் பாரிய அணைக்கட்டு அமைக்கப்பட்டு 'கிவுல் ஓயா' திட்டம் ஆரம்பிக்கப்படவுள்ளது. இந்தப் பாரிய நீர்ப்பாசனத் திட்டத்தின்கீழ் 6,000 ஏக்கர் விவசாயக் காணிகள் வெலிஓயாவில் அத்துமீறிக் குடியேறியுள்ள பெரும்பான்மை இனத்தவர்கள் 3,000 பேருக்கு வழங்கப்படவுள்ளது. இவை அனைத்தும் தமிழ் மக்களுடைய பூர்வீகக் காணிகள்! இக்குளங்கள் அனைத்தும் தமிழ் மக்களுடைய பூர்வீகக் குளங்கள்! இப்படியிருக்கும்போது அந்த இடத்தில் பாரியதொரு நீர்ப்பாசனத் திட்டத்தை ஆரம்பித்து, அப்படியே சிங்கள மக்களுக்கு வழங்குவதென்றால், நீங்கள் சொல்லும் 'இனவாதம் இல்லை' என்பது எங்கே? தயவுசெய்து இனவாதத்தை ஏற்படுத்தாமல், அவர்களையும் அணைத்துக்கொண்டு செல்லுங்கள்! இவ்வாறாக 'கிவுல் ஓயா' திட்டத்தினைச் செயற்படுத்தினால், வவுனியா வடக்கிலுள்ள தமிழர்களின் பூர்வீக விவசாயக் குளங்கள் மற்றும் அவற்றின் கீழான வயல் நிலயங்கள், தமிழர்களின் பூர்வீகக் கிராமங்கள் பலவும் நீரில் மூழ்கும் அபாயம் ஏற்படும் என்பதை மீண்டும் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அந்த வகையில் இராமன்குளம், கொட்டோடைக்குளம், ஒயாமடுக்குளம், வெள்ளாங்குளம், பெரியகட்டுக்குளம், பனிக்கல்மடுக்குளம், சன்னமுற்றமடுக்குளம், கம்மாஞ்சிக்குளம், குறிஞ்சாக்குளம், புலிக்குட்டிக்குளம், திரிவைச்சகுளம் முதலான சிறிய நீர்ப்பாசனக் குளங்களும், வெடிவைத்தகல் குளத்தின் கீழ்வரும் வயல் காணிகள் பகுதியளவிலும், நாவலர்பாம், கல்லாற்றுக்குளம், ஈச்சங்குளம் மற்றும் கூழாங்குள வயற் காணிகளும், வவுனியா வடக்கிலுள்ள பழந்தமிழ்க் கிராமங்களான காட்டுப்பூவசரங்குளம் கிராமம், காஞ்சூரமோட்டைக் கிராமம், மருதோடைக் கிராமத்தின் ஒரு பகுதி உள்ளிட்ட இடங்களும் குறித்த நீர்ப்பாசன அணைக்கட்டின் நீரேந்து பகுதிகளாக மாறும் அபாயம் உள்ளது. தமிழ் மக்களின் பூர்வீகக் குளங்களையும் அவற்றின் கீழான வயல் நிலங்களையும் பழந்தமிழ்க் கிராமங்களையும் அபகரித்து மேற்கொள்ளப்படும் இவ்வாறான திட்டங்கள், கட்டமைக்கப்பட்ட தமிழ் இனவழிப்புச் செயற்பாட்டின் வடிவமாகும். எனவே, இந்த விடயத்தில் கவனம் செலுத்துமாறும் இத்தகைய கட்டமைக்கப்பட்ட தமிழ் இனவழிப்புச் செயற்பாட்டினை உடனடியாக நிறுத்துமாறும் இவ்வுயரிய சபையினைக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வடக்கு, கிழக்கில் உள்ள ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை, காங்கேசன்துறை சீமெந்துத் தொழிற்சாலை, பரந்தன் இரசாயனத் தொழிற்சாலை, வாழைச்சேனை காகிதத் தொழிற்சாலை போன்றவற்றைப் புனரமைப்பதிலும் கவனம் செலுத்துங்கள்! அவற்றைப் புறக்கணிக்காதீர்கள்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, please give me one more minute.

மாண்புமிகு ஜனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்ட உரையிலே தமிழர்களுடைய இனப் பிரச்சினைத் தீர்வு விடயத்திலும் காணாமலாக்கப்பட்டோர் மற்றும் அரசியல் கைதிகள் விடயத்திலும் நம்பிக்கையூட்டும் வகையில் கருத்துகளைத் தெரிவித்திருக்கலாம் என்று நான் எண்ணுகின்றேன். ஏன் எதுவித கருத்தும் தெரிவிக்கவில்லையென்று தெரியவில்லை. இருந்தாலும், எங்களையும் அணைத்துக்கொண்டு செல்லுங்கள்! என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sudath Balagalla. You have ten minutes.

[අ.භා. 12.19]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හරි අපූරු අය වැයක්. අපේ අනුර කුමාර දිසානායක ජනාධිපති සහෝදරයා මුළු විපක්ෂයම එක මිටට අරගෙන පොළොවේ ගහලා තිබෙන්නේ. පුවක්වල්ල පොළොවේ ගැහුවා වාගේ කට්ටියක් ඇඳන් යට. තවත් කට්ටියක් සාලයේ මැද. ඇඳ යටට ගිය එක්කෙනා කියනවා, මේකේ මුකුත් නැහැනේ - ගුරුවරුන්ට මුකුත් නැහැ, දරුවන්ට මුකුත් නැහැ - කියලා. සාලයේ මැදට වැටිච්ච එක්කෙනා කියනවා, බලන්නකෝ, භාණ්ඩාගාරය උතුරලා ගිහිල්ලානේ. අපි හිතුවාට වඩා හොඳයි නේ. බුලත් කඩයක්වත් කරන්න බැහැ කියලා නේ කිව්වේ, කියලා. 2023 රුපියල් බිලියන 2,404ක් හිඟ වෙනකොට, අනුර සහෝදරයාගේ 2026 අය වැය හිඟය රුපියල් බිලියන 1,757යි නේ. ඒක තමයි සාලයේ මැදට විසිවෙච්ච අය කියන කථාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් ප්‍රතිලාභ නොලබපු කවුරු හරි ඉන්නවාද? එහෙම නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් මේ අය වැයට සියලුම ප්‍රජාව වාගේම සත්ව ප්‍රජාවත් අයිතිවෙලා ඉවරයි. කවුරුවත් ඉවත් කරලා නැහැ. මහා මන්දිරයේ ඉන්න මනුස්සයා වාගේම කඳුකරයේ ලැයිම් කාමරයේ ඉන්න අම්මා, තාත්තාත් මේ අය වැයෙන් ප්‍රතිලාභ ලබනවා. ඒ වාගේම පෑවීවියේ ඉන්න මහා සද්දන්තයා අලියා වාගේම මහ පාරේ ඉන්න සුනඛයාත් මේ අය වැයෙන් ප්‍රතිලාභ ලබනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවකයාගේ සිට පෞද්ගලික අංශයේ සේවකයා දක්වාම, භාණ්ඩ ආනයනය සහ අපනයනය කරන මහා ධනවත් ව්‍යාපාරිකයා වාගේම, ගමේ පොඩියට ස්වයං රැකියාවක් කරන වෙළෙන්දා පවා මේ අය වැයෙන් ප්‍රතිලාභ ලබනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේගොල්ලෝ අල්ලා ගත් කෑලි ටිකක් තිබෙනවා. මොනවාද ඒ කෑලි? එකක්, වාහන ගෙන්වන එක. වාහන 1,750ක් ගෙන්වන එක මන්ත්‍රීවරුන්ට ගෙන්වනවා කියලා කියනවා. හරි, මම විපක්ෂ නායකතුමාට අභියෝගයක් කරනවා. විපක්ෂයේ ඉන්න සියලුම මන්ත්‍රීවරු මේ වාහනය ගන්නේ නැහැ කියලා අපට ලියුමක් අත්සන් කරලා දෙන්න, කිසි ප්‍රශ්නයක් නැහැ. ජනතාවට ඔච්චරටම ආදරෙයි නම්, ජනතාවාදී නම්,- *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිහියෙන් ඉන්න අයට පමණයි මේ කථා කරන්නේ. මම අභියෝග කරනවා, පුළුවන් නම් ඔය ඉන්න 60 දෙනාම අත්සන් කරලා ලියුමක් දෙන්න කියලා. අපිත් - 159 දෙනාත් - ප්‍රතික්ෂේප කරන්නම්. මේ වාහන ගේන්නේ රාජ්‍ය සේවකයින්ට. තව එකක් මතක තබාගන්න ඕනෑ. අපි, වාහනවලින් ගිහිල්ලා වැඩ කරපු අය නොවෙයි. අපේ රෝහණ විජේවීර

[ගරු සුදත් බලගල්ල මහතා]

සහෝදරයා කියා තිබෙනවා, අපි හෙලිකොප්ටරයෙන් ගිහිල්ලාත් මේ රට හදනවා, කොළපතෙන් ගිහිල්ලාත් මේ රට හදන්න සූදානම් කියලා. එහෙම මිනිස්සු, අපි. ඔබතුමන්ලා ඒක දැනගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බණ්ඩාරවෙලින් ආපු - නිවටයෙක් කිව්වාට කමක් නැහැ, නිවටයෙක් කියන්නේ පහත් කියන එක නේ - නිවටයෙක් කියනවා, කවට කථාවක්. කවුද ඒ? බණ්ඩාරවෙල ජනතාවගේ පරමාධිපත්‍ය බලය මුදලට වික්ක හාදයා අපට උපදෙස් දෙන්න හදනවා. තව ඕනෑ නම් එයා ගැන කියන්න පුළුවන්. ලැබුණු පරමාධිපත්‍යය බලය සල්ලිවලට විකුණලා අද මෙතැන ඇවිල්ලා අපේ අය වැය ගැන; ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය ගැන කියන්න හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වසරකට කලින් අපි මේ රටේ බලය අත්පත් කර ගත්තාට පස්සේ අපි කරපු වැඩ ගැන කියන්න කලින්, 2026 සඳහා අපි මොනවාද කරන්නේ කියන එක ගැන මම කරුණු කිහිපයක් කියන්නම්. මමත් ඒ කාලයේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්. අපි එදා පාරවල්වල ඇති තරම් බැටන් පොලු පාරවල් කෑවා, කඳුළු ගෑස්වලට මුහුණ දුන්නා, මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කරගන්න. බලයට ඇවිල්ලා මාස අටකට පස්සේ මහපොළ ශිෂ්‍යාධාරය සියයට සියයක්ම වැඩි කළේ කවුද? මේ ආණ්ඩුව. ඒවා පෙනෙන්නේ නැහැ. ඇඳ යටට ගිය අයට ඒවා පෙනෙන්නේ නැහැ. රාජ්‍ය සේවකයාට ගෞරවාන්විත විධියට වැටුපක් වැඩි කරලා දුන්නේ කවුද? මේ අපි - මේ ආණ්ඩුව. 2016දී රාජ්‍ය සේවකයින් බඳවා ගන්නකොටම ඔයගොල්ලන් ඔවුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කරනවා. ඒ සියලුදෙනාටම නැවත විශ්‍රාම වැටුප අරන් දුන්නේ කවුද? මේ ආණ්ඩුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා, අපි දෛනිකව වනඅලි ගැටලුවට මුහුණ දෙන බව. හැබැයි, අපි ඒකට ස්ථිරසාර විසඳුමක් ලබා ගැනීම වෙනුවෙන් හඹාගෙන යනවා. ඔබ ඒක තේරුම් ගන්න. අල-ලූනු ප්‍රශ්න ගැනත් අද කිව්වා නේ. ඔය කියන ඔක්කෝම ප්‍රශ්න ඔබතුමන්ලා අපට ඉතිරි කරලා ගිය ඒවායි. ඒ සමහර ප්‍රශ්නවලට උත්තර තිබෙන්නේ ඈත. අපි අල ප්‍රශ්නයට උත්තරයක් හොයනවා. අපේ රටේ ඒ බීජ නිෂ්පාදනය කරන්න ඕනෑ. ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් හදනවා. මේ දවස්වල සමහර එළවලු ගොවියෝ උද්ඝෝෂණය කරනවා. ඒක ඇත්ත, ඔවුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, ඒකට නායකත්වය දුන්නේ සජබයේ නායකයෝ. ඒ වුණාට 150ක්වත් ගෙන්වා ගන්න බැරි වුණා. අපි ඒ ගොවීන්ගේ ප්‍රශ්නය දන්නවා. ඒ ප්‍රශ්නය හඳුනා ගත් හින්දා තමයි ඔයගොල්ලන් හදපු නැති ශීතාගාර අපි හදන්නේ, ඔයගොල්ලන් හදපු නැති ගබඩා අපි හදන්නේ, ඔයගොල්ලන් ගත්තේ නැති එළවලු ගන්න වැඩ පිළිවෙළක් හදාගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් සත්තු ගැනත් ගොඩක් කථා කරනවා. අපි එකක් කියන්න ඕනෑ. ජාතික ජන බලවේගයේ ඉන්න අපේ මන්ත්‍රී කණ්ඩායම තරම් මානව හිතවාදීන් වෙන කොහේවත් නැහැ. අපි තරම් පරිසරවේදීන් තවත් නැහැ; පරිසරයට ආදරය කරන මිනිස්සු තවත් නැහැ. අපි තරම් දේශ ප්‍රේමීන් තවත් නැහැ. ඇයි, මම එහෙම කියන්නේ?

එක් මන්ත්‍රීතුමෙකු කියපු කථාවකට මෙන්න මෙහෙම උත්තරයක් මම දෙන්න ඕනෑ. අපේ ආණ්ඩුවෙන් ගෙවල් හදන එකේ ප්‍රශ්නයක් ගැන ඒ මන්ත්‍රීතුමා කථා කළා මට මතකයි. රුපියල් මිලියනයකින් -රුපියල් ලක්ෂ 10කින්- ගෙයක් හදන්නේ කොහොමද කියලා ඇහුවා. එන්න මහත්වරුනි, අපි රුපියල් ලක්ෂ 10කින් ගෙයක් හදන හැටි පෙන්වන්නම්. මේ අවුරුද්දේදී රුපියල් ලක්ෂ 10කින් අපි රුපියල් ලක්ෂ 25ක් වටිනා ගෙවල් හැදුවා. අපි ඔබට මෙන්න මෙහෙම යෝජනාවක් කරන්නම්. අපි ගෙවල් හදන විධිය බලන්න, පුළුවන් නම් එක දවසක් ඇවිල්ලා යන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දිස්ත්‍රික්කය බදුල්ල. එක්තරා වෙලාවකදී මන්ත්‍රීවරයෙක් පවසනවා, වතුකරයේ මිනිස්සුන්ට ආණ්ඩුවෙන් සල්ලි දෙන්නේ ඇයි, සමාගම් හරහා ඒ මුදල ගෙවන්න කියලා. ඔබතුමන්ලා දන්නවාද, පාන්දර පින්න කඩාගෙන, කුඩැල්ලෝ ඇඟේ එල්ලෙද්දී, අත්වල කරගැට එනතුරු වැඩ කරලා මේ රටේ මහජනතාවට ඩොලර් හොයලා දුන්නේ ඒ අහිංසක මිනිස්සු කියලා. වසර 200ක ඉතිහාසයක් තුළ ඔබ විසින් පාපිස්සක් ගානට දාපු මිනිස්සු, පාවඩයක් ගානට දාපු මිනිස්සු තමයි අපේ රටට ඩොලර් ගෙනාවේ. මම විශ්ව විද්‍යාලයෙන් pass out වුණාට පසුව 1999දී බදුල්ල දිස්ත්‍රික්කයට යනවා, මැතිවරණයකට. අපේ සෙල්වි මන්ත්‍රීතුමියත්, අපේ සෙල්වරාජ් මන්ත්‍රීතුමාත් ඇතුළු අපි එකට අවුරුදු 25කට කලින් එදා ඒ ලැයිම් කාමරවල වැඩ කළා. හැබැයි අදටත් ඒවා එහෙමමයි. ඔබතුමන්ලා ඉතිරි කරලා ගිය ඒ ජීවිත අදටත් ඒ විධියමයි. ඒ ජීවිත වෙනස් කරන්න තමයි අපි මේ යන්නේ. ඒ තුළ මොකක් හරි මුදල් ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි ඒක බේරමු. මුදල් දෙන ක්‍රමවේදයේ වැරැද්දක් තිබෙනවා නම් අපි ඒ ගැන කථා කරලා මේ පාර්ලිමේන්තුවේදී ඊට අවශ්‍ය නීති සම්මත කරමු. හැබැයි, මේ වතු කම්කරුවන්ට මුදල් දෙන එකට අකුල් හෙළන්න එපා. මේ, 2025 වසරේ අපි කරපු වැඩ.

මගේ දිස්ත්‍රික්කය, බදුල්ල දිස්ත්‍රික්කයයි. ඔබතුමන්ලා 2024දී ගෙවල් 8ක් හදනකොට, අපි රුපියල් ලක්ෂ 550කින් ගෙවල් 55ක් හැදුවා. ඔබතුමන්ලාට මතක ඇති නේ, සුදු ලූනු ටෙන්ඩරයෙන් ගසා කෑවා, පොල් තෙල් වංචාවෙන් ගසා කෑවා, මහ බැංකුව කඩලා හොරා කෑවා, මන්ත්‍රීකම විකුණලා සල්ලි හම්බ කර ගත්තා කියලා. ඔබේ නමින් සුදු ලූනු වංචාවෙන් උපයා ගත් ධනයෙන් අනේ දෙන්න කෝ අපට රුපියල් ලක්ෂ 10ක්, ලක්ෂ 25ක් වටිනා ගෙයක් අපි හදලා දෙන්නම්. අපට ඒක කරන්න පුළුවන්. මහ බැංකුව කඩලා ගත්ත සල්ලිවලින්, හම්බ වුණු කොමිස් එකෙන් අපට යම් මුදලක් දෙන්න, අපි ගෙයක් හදලා දෙන්නම්. අපට ඒක කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන් අපි කියනවා, විපක්ෂයක් විධියට ඔබ මේ ආණ්ඩු පක්ෂය කියවා ගන්න කියලා. මේ ආණ්ඩුව වෙනදාට තිබෙන ආණ්ඩුවක් වාගේ නොවෙයි. මේක හරියට කියවා ගන්න. අපි ඔබව කියවාගෙන තිබෙන්නේ. අපි ඔබව හඳුනාගෙන තිබෙන්නේ. දැන්වත් ඔබ සාම්ප්‍රදායික, ගතානුගතික භූමිකාවෙන් මිදෙන්න. අපේ විපක්ෂ නායකතුමා උදෑසන ඉඳලා කථා කරනවා. මම ශිෂ්‍යත්වයට උගන්වන ගුරුවරුන්ට සාමාන්‍යයෙන් කථා කරනවා. දරුවන්ට යුගල පදයි, සමාන පදයි ඉගෙන ගන්න ඕනෑ නම් ඒ කථාව දාලා දුන්නාම ඇති. එච්චරයි. ඒ කථාවේ වෙන මොකක්වත් නැහැ. කනගාටුයි, මා වාගේ කෙනෙක් එතුමා ගැන එහෙම කියන එකට. නමුත් යුගල පද, සමාන පද හැරෙන්න වෙන මොකක්වත් ඒ කථාවේ නැහැ. එච්චරම තමයි තිබෙන්නේ. එච්චරම තමයි තිබෙන්නේ. ඒ නිසා අපි ඔබට කියනවා, නැවත වාරයක් අපව කියවා ගන්න කියලා. ඔව්, අපි තමයි මිහිපිට විශේෂිතයින්. ඇයි, ඒ? ශ්‍රී ලාංකීය දේශපාලනය අපි කණපිට ගැහුවා. ලාංකීය ඉතිහාසයේ පළමු වතාවට මහා ස්වෙච්ඡා බලකායක් සහිත ආණ්ඩුවක් අපි හැදුවා, මහත්වරුනි. ඒක ඒ අර්ථයෙන් තේරුම් ගත්තේ නැති වුණොත්, ඔය පුටු එකින එක අඩු වෙලා අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඔය පැත්තත් පිරෙනවා. ඒක තේරුම් ගන්න. මේ රට හදන්න අපට සත්‍ය වුවමනාවක් තිබෙනවා; අවංක වුවමනාවක් තිබෙනවා. අපි සියල්ල අත්හැරලා ආ මිනිස්සු; මේ රට ගොඩනැඟීමේ පරම පවිත්‍ර චේතනාවෙන් වැඩ කරන මිනිස්සු. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ රට හදලා මිසක් අපි නතර වෙන්නේ නැහැ.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. **1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Namal Rajapaksa, please. You have 18 minutes.

[අ.භා. 1.00]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දිනක ගරු ජනාධිපතිතුමා දීර්ඝ වශයෙන් කථා කරමින් පාර්ලිමේන්තුවට අය වැය කථාව ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂයේ බොහෝ අය කියනවා, මෙවර අය වැය ඓතිහාසික අයවැයක් කියලා. ඓතිහාසිකයි එතුමා පැය හතරහමාරක් කථා කරපු එක. හැබැයි, මේ අය වැයේ අන්තර්ගතය බැලුවාම මොකක්ද ඓතිහාසික කියන කාරණය පිළිබඳව ඊට වඩා ගැඹුරු විග්‍රහයක් ඔබතුමන්ලා කළොත් හොඳයි. මොකද, මේ අය වැය භූමියේ යථාර්ථයක් බවට පත් කරන්න වෙන්නේ ඔබට. පසුගිය අවුරුද්දේත් අය වැයක් ඉදිරිපත් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අඩුම ගාණේ තමන් ඉදිරිපත් කරපු අය වැයෙන් සියයට 50කවත් ප්‍රගතියක් ලබා නැහැ. පසුගිය අය වැයෙන් සියයට 50කවත් ප්‍රගතියක් ලබා නැති ආණ්ඩුව පැය හතරහමාරක් තිස්සේ දීර්ඝ අය වැයක් ඉදිරිපත් කරලා කියනවා, "මෙන්න තවත් ඓතිහාසික අය වැයක්" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ හිටපු මුදල් අමාත්‍යවරු අය වැය ඉදිරිපත් කරනකොට ඒ අය වැය හැඳින්වූවා නේ එක එක විධියට. "රොබින් හුඩ්" අය වැයක් එක කාලයකදී ඉදිරිපත් කළා. එදා රවී කරුණානායක මන්ත්‍රීතුමන්ලා කිව්වේ, පොහොසත් අයගෙන් අරගෙන දුප්පත් අයට දෙනවා කියලා. හැබැයි, දැන් මේ අය වැයට මොකක්ද කියන්නේ? මේ අය වැයෙන් දුප්පත් අයගෙන් අරගෙන පොහොසත් අයට දෙනවා. දුප්පත් අයගෙන් බදු අරගෙන පොහොසත් අයට සහන දෙනවා. දැන් ව්‍යාපාරවලට උදවු කරන්න, ආයෝජකයෝ ගෙනෙන්න, ව්‍යවසායකයෝ ආරක්ෂා කරන්න එපා කියලා අපි කියන්නේ නැහැ.

ගරු ජනාධිපතිතුමා කියනවා මම අහගෙන හිටියා, ඉඩම් දෙනකොට විරුද්ධ වෙන්න එපා ලු කියලා. අපි නොවෙයි ඒකට විරුද්ධ වුණේ එතුමන්ලා. ගරු ජනාධිපතිතුමාගේ සහ ඔබතුමන්ලාගේ පක්ෂයේ අය පසුගිය අවුරුදු 76දීම පාර්ලිමේන්තුවේදී කරපු කථා ටික හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන් අරගෙන පොතක් අච්චු ගහන්න ඔබතුමන්ලාගේ පක්ෂයට පුළුවන් නම් වැඩේ හරි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ඒ අවුරුදු 76ටම වඩා හාත්පසින්ම වෙනස් කාරණා දැන් කියන්නේ.

එදා අපි අධිවේගී මාර්ග හදනකොට ඔබතුමන්ලා ඒකට විරුද්ධ වුණා. හැබැයි, අද ජනාධිපතිතුමා කියනවා, "අපි මේක හදනවා" කියලා. හොඳයි, හදන්න. එදා ඔබ විරුද්ධ වුණේ නැත්නම් මෙලහකට අධිවේගී මාර්ග පද්ධතිය හදලා ඉවරයි; Marine Drive extension එක Port City එක දක්වා හදලා ඉවරයි. අද කියනවා, "ඒක හදනවා ලු" කියලා. ඒක මහින්ද රාජපක්ෂ මහත්තයා 2010දී යෝජනා කළේ. අවුරුදු 20ක් ගියා, මේ කට්ටියට ඒක තේරුම් ගන්න. අවුරුදු 20කට පස්සේ නැඟිටලා කියනවා, "ඒක හදනවා ලු" කියලා. එදා විරුද්ධ වුණේ නැත්නම් දැන් හදලා ඉවරයි. අපි අවුරුදු 20කට, 30කට, 40කට සැලසුම් කරලා රට සංවර්ධනය කරනකොට එදා විරුද්ධ වෙච්ච අය දැන් කියනවා, "අවුරුදු 20කට කලින් මහින්ද රාජපක්ෂ කියපු එක හරි" කියලා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ඇඹුල් තියල් ගෙනෙන්න කිව්වා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ඔව්, අධිවේගී මාර්ගය හදන්නේ ඇඹුල් තියල් ගෙනෙන්න කිව්වා. වානක මන්ත්‍රීතුමාගේ තාත්තයි, දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමායි තමයි ඒ වැඩේට අහු වුණේ. එහෙම තමයි එදා කිව්වේ. හැබැයි, අපි අදටත් ඒකට ඊර්ෂ්‍යා කරන්නේ, වෛර කරන්නේ, කුහකකම් කරන්නේ නැහැ. අපි කියන්නේ ඒක හදන්න කියායි. ඒක හදන්න ඕනෑ. Port City එක හදනකොට ඔබතුමන්ලා එදා මොකක්ද කිව්වේ? සීගිරියත් කඩන්න වෙයි කිව්වා. නමුත්, ඒක හැදුවා. සීගිරිය තවම තිබෙනවා. හැබැයි, දැන් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන්න ඔබතුමන්ලා සීගිරිය promote කරනවා. සීගිරිය කඩලා Port City එක හැදුවේ නැහැ. සීගිරිය තිබෙනවා. හැබැයි, දැන් අපි ලංකාවේ ආර්ථික කේන්ද්‍රස්ථානය බවට Port City එක පරිවර්තනය කරලා ආයෝජකයෝ ගෙනෙනවා කියනවා. හැබැයි, එදා ඔය කථාව කිව්වා නම් මෙලහකට Port City එකේ වැඩ කටයුතු කරලා අවසන් නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එදා ටිපර් එකක් ගෙනැල්ලා මුල් ගලත් ගලවා ගෙන ගියා. චීන ජනාධිපතිතුමාත්, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ නම තිබෙනවා කියලා තමයි ගලවාගෙන ගියේ. ගලවාගෙන ගියාට පස්සේ තමයි දැක්කේ චීන ජනාධිපතිතුමාගේ නමත් තිබෙනවා කියලා. ඒ තැනට ඔබතුමන්ලා එදා මේ රට වට්ටලා දැම්මා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උපාධිධාරීන්ගේ රැකියා ගැනත් මම කියන්න ඕනෑ. අද ඔබ උපාධිධාරීන්ට තර්ජනය කරනවා, විභාග ලියලා එන්න කියලා. කමක් නැහැ. හැබැයි, ඒකට ඔබ හේතුව හැටියට දක්වන්නේ මොකක්ද? පසුගිය කාලයේ ආණ්ඩු රාජ්‍ය සේවය අසීමිත විධියට පිරෙව්වා ලු. හැබැයි, ඔබට මතක ඇති 2005දී මහින්ද රාජපක්ෂ මහත්තයාව ජනාධිපති කරනකොට ඔබතුමන්ලා දීපු ප්‍රධාන යෝජනාව මොකක්ද කියලා. උපාධිධාරීන් සියලුදෙනාට රැකියා දෙන්න කිව්වා. එදා ඒක හොඳයි නම් අද නරක වෙන්නේ කොහොමද? එහෙම නම් කියන්න, එදාට ඒක ගැළපුනාට අදට ගැළපෙන්නේ නැහැ කියලා. හැබැයි, එහෙම කියන්නේ නැතුව බණිනවා, එදා ගත්ත තීන්දුව වැරදියි කියලා. දැන් කියනවා, "රුපියල් ට්‍රිලියනයක් ගිණුමේ තිබෙනවා ලු" කියලා. ගරු ජනාධිපතිතුමා තමයි එහෙම කියන්නේ. රුපියල් ට්‍රිලියනයක් ගිණුමේ තිබෙනවා නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලූනු ගොවියාගේ ලූනුවලට සහනයක් දෙන්න බැරි ඇයි? අල ගොවියාගේ අල ටිකට සහනයක් දෙන්න බැරි ඇයි? වට්ටක්කා ගොවියාට, එළවලු ගොවියාට, ඉරිඟු ගොවියාට, වී ගොවියාට සහනයක් දෙන්න බැරි ඇයි? රුපියල් ට්‍රිලියනය ගිණුමේ දමාගෙන මොකක්ද කරන්නේ? එහෙන් උක් ගොවීන් ටික අසරණ වෙලා. මෙහෙන් අල ගොවියෝ, ලූනු ගොවියෝ අසරණ වෙලා. වී ගොවියාට සහනය ලැබෙන්නේ නැහැ. ධීවරයාට වෙලාවට සහන ලැබෙන්නේ නැහැ. හැබැයි, මහ ලොකුවට පම්පෝරි ගහනවා, අපේ ගිණුමේ රුපියල් ට්‍රිලියනයක් තිබෙනවා කියලා. ඒ රුපියල් ට්‍රිලියනය තියාගෙන මොකක්ද කරන්නේ?

රටේ අත්‍යවශ්‍ය බෙහෙත් ටික නැහැ. විදුලි බිලට සහන දෙන්න බැහැ. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයා ආරක්ෂා කිරීමට කටයුතු කරන්න බැහැ. වෙලාවට බෙහෙත් ටික ගෙනැත් දෙන්න බැහැ. එහෙම ආණ්ඩුවක් අපට කියනවා, රුපියල් ට්‍රිලියනයක්

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ගිණුමේ තිබෙනවා කියලා. පොලී ගෙවමින් රුපියල් ට්‍රිලියනයක් ගිණුමේ තියාගෙන ඉන්නවා. හැබැයි, අනෙක් පැත්තෙන් මොකක්ද කරන්නේ? VAT එක ගෙවන අවම මාසික ආදායම රුපියල් ලක්ෂ 30කට අඩු කරනවා. දවසකට රුපියල් ලක්ෂයක් ආදායම ලබන කෙනෙක් දැන් VAT ගෙවන්න ඕනෑ. එහෙම කරපු ඔබතුමන්ලා කියනවා, රුපියල් ට්‍රිලියනයක් ගිණුමේ තිබෙනවා ලු. ඒකෙන් හම්බ වෙන්නේ රුපියල් බිලියන 150යි ලු. රුපියල් බිලියන 150ක් දුප්පත් මනුස්සයෙකුගෙන් ගන්න ඔබතුමන්ලා රුපියල් ට්‍රිලියනයක් ගිණුමේ දමාගෙන ඉන්නවාද?

දැන් බෙහෙත් ගේන්න සල්ලි නැහැ. අල ගොවියාට, ලූනු ගොවියාට සලකන්න සල්ලි නැහැ. පොහොර ටික ගේන්න සල්ලි නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, කැබ් 1,775ක් ගේන්න සල්ලි තිබෙනවා. මේවාට හිනා යනවා නේ. අපටත් හිනා යනවා. ඔබතුමන්ලා එදා කියපුවායි, දැන් කරන ඒවායි මතක් වෙනකොට අපටත් හිනා යනවා. කෝච්චියේ යනවා, බස් එකේ එනවා කියලා කිව්වේ. මිද්දෙනිය ටවුන් එකේ හිටගෙන ඉන්නවා බස් එක එනකම්. හැබැයි කැබ් එකේ යන්න පුළුවන් ලබන මාසයේ ඉඳන්. එතකොට ප්‍රශ්නයක් නැහැ. දැන් කැබ්ම 1,700 ගණනක් ගේන්නේ ඇයි? මොන විගණන වාර්තාවේද තිබෙන්නේ රටට කැබ් 1,700 ගණනක් අඩුයි කියලා ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මොන වාර්තාවේද එහෙම තිබෙන්නේ? ඉස්පිරිතාලවල ඇම්බියුලන්ස් නැහැ. ඒක හරි. ඒවා ගේන්න, ප්‍රශ්නයක් නැහැ. ප්‍රාදේශීය සභාවලට ඩෝසර්, බැකෝ ගේන්න, ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කැබ්ම එක්දහස් ගණනක්? සල්ලි නැහැ කියනවා එක වෙලාවකට. අපි අමාරුවෙන් මේ රට ගොඩ දමන්නේ කියනවා. හැබැයි, ආණ්ඩුවට කැබ් ගේන්න සල්ලි තිබෙනවා. ඒ කාලයේ මම දැක්කා, ගෝල්ෆේස් එකේ දාලා වාහන විකුණනවා. අපරාදේ ඒවා විකුණුවේ. පරණ ඒවා විකුණලා අලුත් ඒවා ගේනවා කියලා එහෙම නම් ඒ වෙලාවේ කියන්න තිබුණා නේ. කිව්වේ ඉස්කෝල හදන්න විකුණනවා කියලා. ඉතින් අලුතින් ගෙනෙන මේ කැබ් එක්දහස් ගණන සඳහා වැය වන මුදලින් ඉස්කෝල හදන්නකෝ, ආයේ නිකම් කැබ් ගෙනැල්ලා බෙදන්න ඕනෑ යැ. දැන් ඒ ගැන තිබෙන කථා බලන්න.

මුදල් නියෝජ්‍ය ඇමතිවරයා ඊයේ මාධ්‍යයට කියනවා මම දැක්කා, පසුගිය අවුරුද්දේ ඉතුරු වෙච්ච සල්ලිවලින් කැබ් ගේන්නේ කියලා. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ අය වැයෙන් ගේනවා කියලා. අඩු ගාණේ බොරුවක් කියනවා නම් දෙදෙනා කථා වෙලා එකක් කියන්න එපා යැ. *[බාධා කිරීමක්]* අපේ තුන්දෙනා ගැන අපි බලා ගන්නම්. ඔබතුමන්ලාගේ 159 ගැන ඔබතුමන්ලා බලා ගන්නකෝ. අපි, අපේ ගැන බලා ගන්නම්. අපට තේරෙනවා, අපි තුන්දෙනා ගැන තමයි අමාරුව තිබෙන්නේ කියලා. *[බාධා කිරීමක්]* හරි, හරි. බලා ගනිමුකෝ. ගේන්නකෝ කැබ් ටික. ගෙනාවාට පස්සේ බලා ගනිමුකෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් ට්‍රිලියනයක් එකතු කරගෙන ගිණුමේ දමාගෙන ඉන්න ආණ්ඩුව තමයි මේවා කරන්නේ. *[බාධා කිරීමක්]* මොකද හොරාට කථා කරන්නේ? දැන් වාහන ගෙන්වනවා, ඩොලර් බිලියන 1.3ක් වියදම් කරලා. වාහනවලින් ලොකු ආදායමක් ලැබෙනවා ලු. ඩොලර්වලින් වාහන ගෙනැල්ලා රුපියල්වලින් ලබන ආදායම මහ ලොකුවට කියවනවා. ඩොලර් බිලියන 1.3ක් වියදම් කරලා වාහන ගෙනැල්ලා රුපියල් බිලියන 633ක් ආදායම ලැබුවා ලු.

ආණ්ඩුව ඉදිරිපත් කළේ ඓතිහාසික අය වැයක් කිව්වා නේ. ඓතිහාසික ප්‍රතිපත්ති තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඩොලර් වියදම් කරලා අඩුවෙන් රුපියල් හොයන ආදායම් ක්‍රමයක් තමයි තිබෙන්නේ. එක වෙලාවක කියනවා, විදේශ සංචිත වැඩි වෙනවා කියලා. බිලියන 6ක් තිබෙනවා ලු. මහින්ද රාජපක්ෂ මහත්තයා ආණ්ඩුව භාර දෙනකොට 2015ට කලින් බිලියන 8ක සංචිත තිබුණා. මම දැක්කා එක ඇමතිවරයෙක් කියනවා, තෙල් පෝලිමේ ඉඳලා ලු, ආණ්ඩුව ගත්තේ කියලා. එතුමා පෝලිමේ ඉන්න ඇති ආණ්ඩුව ගන්න අරගළය ඇතුළේ. පෝලිම් තිබිච්ච ආණ්ඩුවක් ලු, ගත්තේ. හොඳයි, ආණ්ඩුවක් ගත්තා කියමුකෝ. එහෙම නම් දැන් වැඩ කරන්නකෝ. ඒක කරන්නේත් නැහැ නේ. ආණ්ඩුව ගත්තාට කමක් නැහැ, වැඩ කරනවා නම්. ඔබතුමන්ලා වැඩ ටික කරන්නේත් නැහැ නේ. ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුද්දක් වෙනවා. නමුත් තවම පසුගිය ඒවා කියව-කියවා ඉන්නවා. පසුගිය අය වැයෙන් පොරොන්දු වෙච්ච කාරණා බලන්න. අපි ප්‍රතිපත්ති ප්‍රකාශනය පැත්තකින් තියමුකෝ. ජනාධිපතිවරණයට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඔබතුමන්ලාට වැඩක් නැහැ නේ, ඒ ගැන දැන් කවුරුවත් කථා කරන්නේ නැහැ නේ. ජනාධිපතිතුමා බලයට ආවේ IMF එක එළවනවා කියලා නේ. නමුත් අපට දමන සද්දයවත් IMF එකට දමන්නේ නැහැ නේ. පාර්ලිමේන්තුවේදී නම් කියනවා, හිට්ලර් වාගේ ලු, වැඩ කරන්නේ. ඒ වුණාට IMF එකට ගිහිල්ලා වාඩි වෙලා පූසා වාගේ ඉන්නවා. IMF එකට කියන්නකෝ, මිනිස්සුන්ට අසාධාරණ විධියට බදු ගහන්න එපා කියලා. IMF එකට කියන්නකෝ, දුප්පත් මිනිස්සුන්ට අසීමිත විධියට බදු ගැහුවාම රටේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා.

දැන් කියනවා ආයෝජකයෝ එනවා කියලා. නමුත් ඒ නමට. කෝ, බිමේ ආයෝජකයෙක් ඉන්නවාද? ඔබතුමන්ලා මේ ආණ්ඩු බලය ගත්තාට පස්සේ අලුතින් ආපු ආයෝජකයෙක් ගැන කියන්න? මේ රට තුළ ආයෝජනය කිරීමට අලුතින් ආපු ආයෝජකයෙක් ඉන්නවා නම්, ඒ ගැන කියන්න. ඒ එක්කෙනෙක් නම් කරන්නකෝ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

එක්කෙනෙක් කිව්වා, සිනොපෙක් එක ආවේ මේ ආණ්ඩුව කාලයේ කියලා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

එතුමන්ලාට ඉතින් හැම එකම මාරු වෙලා අරක ආවා, මේක ආවා කියනවා. පසුගිය ආණ්ඩුව කාලයේ ඒවා මේ ආණ්ඩුවට දමනවා, මේ ආණ්ඩුවේ ඒවා පසුගිය ආණ්ඩුවට දමනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ මොනවා කර ගත්තත් කමක් නැහැ, මිනිස්සුන්ට වැඩ කරනවා නම්, වෙච්ච පොරොන්දු ටික ඉටු කරනවා නම්, රටේ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරනවා නම්, ව්‍යවසායකයා, ව්‍යාපාරිකයා ආරක්ෂා කරන්න තමුන්නාන්සේලාට ආත්ම ශක්තියක් තිබෙනවා නම්.

IMF එකේ regulations වගයක් තිබෙනවා. ඔව්, Guideline එකක් තිබෙනවා. හැබැයි, ආණ්ඩුව පොහොසත් වෙලා මිනිස්සු දුප්පත් වෙලා වැඩක් තිබෙනවාද? ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය තමයි ආණ්ඩුව පොහොසත්, මිනිස්සු දුප්පත්. පොහොසත් රටක් කෙසේ වෙතත් පොහොසත් ආණ්ඩුවක් නම් හැදෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිනිස්සු සතුටින් ඉන්න එක කෙසේ වෙතත් හැම දාම ආණ්ඩුවේ වියදම් ටික දරා ගන්නයි, මේ අයට කැබ් අරගෙන දෙන්නයි, අරවා කරන්නයි, මේවා කරන්නයි මිනිස්සු බදු ගෙවන්න ඕනෑ, ආණ්ඩුවට.

දැන් තේ ගොවියාගේ, වතු කම්කරුවාගේ පඩිය වැඩි කරන එක හොඳයි. ඒක වෙන්න ඕනෑ. හැබැයි, ඔබතුමන්ලාගේ අමුතු න්‍යාය පත්‍රයක් නේ තිබෙන්නේ. වතු කම්කරුවාගේ පඩිය වැඩි

කරන්න ආණ්ඩුවෙන් ගෙවනවා, ව්‍යාපාරිකයාට. ආණ්ඩුව දුප්පත් තේ කඩෙනුත් VAT එක ගන්නවා. අඩු ආදායම්ලාභී හැම පුද්ගලයෙකුගෙන්ම tax එකක් ගන්නවා. ඒ එකතු කරන මුදල් ව්‍යාපාරිකයාට දෙනවා, තමන්ගේ වත්තේ වැඩ කරන අයට පඩි ගෙවන්න. එතකොට මේ රටේ ඉන්න බහුතර කුඩා තේ වතු හිමියන්ට මොකක්ද වෙන්නේ? ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කරන්න ආණ්ඩුවේ සැලැස්ම මොකක්ද? ලූනු ගොවියා, අල ගොවියා, උක් ගොවියා, ධීවරයාගේ ආර්ථිකය ශක්තිමත් කරන සැලැස්ම මොකක්ද? ඒ අය ඔබතුමන්ලා එක්ක එදා සම්බන්ධ වුණත්, අද සම්බන්ධ වෙලා වැඩක් නැති, අනාගතයේ ඡන්දයට පමණක් අවශ්‍ය වන පිරිසක් නිසාද? එහෙම නැත්නම් තමුන්නාන්සේලා තෝරා ගත් පිරිසකට සහන දෙන්න ඕනෑ නිසා මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට ඒ මුදල් ටික දෙනවාද? වතු කම්කරුවාගේ පඩිය වැඩි කරන්න වෙන ක්‍රමයක් හොයා ගන්න. අඩු ගාණේ බදු සහනයක් දෙන්න ඒ ව්‍යාපාරිකයන්ට. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අහිංසක දුප්පත් මිනිස්සුන්ට බදු ගහලා ඒ බදු අරගෙන ගිහිල්ලා තමන්ගේ ව්‍යාපාරිකයන්ට මුදල් දෙන එක සාධාරණ නැහැ. මම දන්නේ නැහැ නීත්‍යානුකූලව ඒක කරන්න පුළුවන්ද කියලා. නීත්‍යානුකූලව, රටේ පවතින නීතියට අනුව කරන්න පුළුවන්ද කියලා.*[බාධා කිරීමක්]* නඩු දාන්න? ඔයගොල්ලෝ දා ගන්නකෝ. ඔයාලාට වෙන වැඩකුත් නැහැ නේ. අපි ඊළඟ පාර පොළොන්නරුවේදී හමු වෙලාම ඒ ගැන කථා කරමු.*[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය නඩු දාන්න ගිහිල්ලා තමයි මේ වරද්දාගෙන තිබෙන්නේ. ඕකත් වැටෙයි පැලවත්ත office එක උඩට. බලාගෙන. පරිස්සමින් කරන්න, කරන එකක්. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහ ගන්න. අපේ අයගෙනුත් පොඩ්ඩක් අහ ගන්න, කරන විධිය. *[බාධා කිරීම්]* මොකද, හිනා වෙන්නේ, හැංගිලා කථා කරන්නේ? කියන්නකෝ, ඉතින්. අර සාම්පූර් බලාගාරයට නඩු දැම්මා මතකයි නේ. නොරොච්චෝලේ බලාගාරයට නඩු දාන්න ගිහිල්ලා වෙච්ච දේ මතකයි නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්තිමට ආපු ආයෝජකයෝ හැරිලා ගියා. එන හැම ආයෝජකයෙකුටම හොරෙක් කියලා නඩුවක් දැම්මා. New Fortress එකට නඩු දැම්මා. ආපු අය හැරිලා ගියා. දැන් ඔබ ඉන්නේ ආණ්ඩුවේ. අමතක කරන්න එපා. දැන් ආණ්ඩුවේ ඉඳගෙන විපක්ෂයේ ඉඳගෙන දාන සෙල්ලම් දාන්න ගිහිල්ලා අමාරුවේ වැටෙන්න එපා. අපි ඒ වාගේ බලු වැඩ කරන විපක්ෂයක් නොවෙයි. හැබැයි, අපි ඔබතුමන්ලාට මතක් කරලා දෙනවා. ඔබතුමන්ලාට අමතක වෙන හැම දේම අපි මතක් කරලා දෙනවා.

මම දැක්කා, අතිගරු ජනාධිපතිතුමා එදා කියනවා, රුසියාවයි, ඇමෙරිකාවයි යාළු වෙච්ච එක ගැන. කවුද රුසියාව, කවුද ඇමෙරිකාව කියලා ඇහුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුසියාව කවුරු වුණත්, ඇමෙරිකාව කවුරු වුණත්, හිට්ලර් කඩාගෙන වැටෙන්න එක ප්‍රධාන හේතුවක් තමයි හිට්ලර්ගේ අධි මානසිකත්වය. ඒ හින්දා අපි අතිගරු ජනාධිපතිතුමාට කියන්නෙත් රුසියාව ගැන හොයන්න යන්නත් එපා, ඇමෙරිකාව ගැන හොයන්න යන්නත් එපා, හිට්ලර්ට හිට්ලර් කර ගත්ත දේ ගැන විතරක් ඔබතුමාගේ අවධානය යොමු කර ගන්න. මොකද, පස්සේ අපට බැණලා වැඩක් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

Digitalization ගැන ජනාධිපතිතුමාගේ මතයට මම එකඟ වෙනවා. මොකද, අපි කරපු යෝජනාවම තමයි එතුමා කරන්නේ. මොකද, ඔය කථාව අපි දෙන්නාටම එක් කෙනෙක් ලියලා දුන්නේ. මම ඉංග්‍රීසියෙන් කළා; එතුමා සිංහලෙන් කළා, අර UDI එක ගැන. හැබැයි, එදා ඒකට එතුමා මේ පැත්තේ ඉඳගෙන විරුද්ධ වුණා. හැබැයි, අද එතුමා ඒ කථාවම සිංහලෙන් කළා. ඒකම තමයි අපේ ආණ්ඩුව කාලයේත් යෝජනා කළේ. කවුරු develop කළත් manage කරන්නේ ලංකාවෙන්. Digitalization වෙන්න ඕනෑ. මම දන්නේ නැහැ, අලුතින් පත් වුණු වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා අද පාර්ලිමේන්තුවේ ඉන්නවාද කියලා. අර Airport එකේ e-gates ටිකේ වැඩ කරන්න පටන් ගන්න. ඒවා ගෙනැල්ලා හයි කරලා තිබෙන්නේ. වානක මැතිතුමා රාජ්‍ය අමාත්‍යවරයා කාලයේ ඒවා ගෙනාවේ. තවම ගොඩගහලා තිබෙනවා. දැන් testingවත් යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. E-gates ටික පටන් ගන්න.

ඔබතුමන්ලා බලයට එන්න කලින් කිව්වා, දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 6ක් අධ්‍යාපනයට දෙනවා කියලා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා අධ්‍යාපනයට දීපු මුදල් ටිකත් කපලා. ඒ, අගමැතිතුමිය අධ්‍යාපන අමාත්‍යවරිය හින්දාද මම දන්නේ නැහැ. එතුමිය නේ, සියයට 6ක් ඉල්ලුවේ. අවසානයේ අධ්‍යාපනයට දෙන මුදල් ටිකත් කප්පාදු කරන්න තමුන්නාන්සේලා පටන්ගෙන තිබෙනවා.

මේ රටට ආයෝජකයෝ ගේන්න ඕනෑ. ඔව්. ඒ ආයෝජකයන්ට සහන දෙන්නත් ඕනෑ. මොකද, Port City එක පෙන්වලා Port City එකයි, Biyagama Zone එකයි, Katunayake Zone එකයි සංසන්දනය කරන්න යන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Port City එක කියන්නේ ආර්ථික කේන්ද්‍රස්ථානයක්. Port City එක compete කරන්න තිබෙන්නේ Biyagama Zone එකයි, Katunayake Zone එකයි එක්ක නොවෙයි, Dubai, Singapore, Shenzhen, ඉන්දියාවේ GIFT City වාගේ ලෝකයේ දැවැන්ත ආර්ථික කේන්ද්‍රස්ථාන එක්ක. ඒවා එක්ක competitiveness එකක් අපි හදාගන්න ඕනෑ. දැන් මාලදිවයිනේත් financial city එකක් හදන්න යනවා. ඊට කලින් අපි ඉස්සර වෙන්න ඕනෑ. ඒ නිසා Port City එක කේන්ද්‍ර කරගෙන ආර්ථිකය හදන්න ඕනෑ නම් ඒක ගැන ලංකාව ඇතුළේ මානසිකත්වයෙන් බලන්න එපා. ගෝලීය මානසිකත්වයෙන් ඒක දිහා බලන්න. ඒකට ආයෝජකයෝ ගේන්න. අපි ආයෝජකයෝ ගේනවාට විරුද්ධ වෙන්නේ නැහැ. ජනාධිපතිතුමා කිව්වා, ඉඩම් දෙනවාට විරුද්ධ වෙනවා කියලා. නැහැ. අපි විරුද්ධ වෙන්නේ නැහැ. හැබැයි හදන්න. ආයෝජකයෝ ගේන්න. ආයෝජකයෝ ගේන්නේ නැතුව, ඉන්න හැම ව්‍යාපාරිකයාටම හොරා කියලා, ඒ හැම ව්‍යාපාරිකයෙක් දිහාම වපර ඇහෙන් බලලා ඒ අයට බැණලා පලක් වෙන්නේ නැහැ.

තමුන්නාන්සේලා මේ අය වැයේදිවත් ප්‍රායෝගික වෙන්න. මොකද, පසුගිය අය වැයෙන් සියයට 50කට අඩුවෙන් ක්‍රියාත්මක වුණේ. දැන් රුපියල් ට්‍රිලියනයක් තිබෙනවා කිව්වාට කොහේ තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතුමන්ලා දන්නේත් නැහැ. ඒ නිසා නේ අලුතින් බදු ගහලා තිබෙන්නේ. තමුන්නාන්සේලා මේ අය වැයෙන් කොච්චර ඉතුරු කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා අපි දන්නේත් නැහැ, ඔබතුමන්ලා දන්නේත් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. මොකද, තමුන්නාන්සේලා එහෙම දෙයක් දන්නවා නම් ගමට ගිහිල්ලා ඇළ වේලි, බෝක්කු හදන්න පොරොන්දු වෙන්නේ නැහැ නේ. දැන් මේ පොරොන්දු වෙලා ඇවිල්ලා ඒවා කරගන්න බැරුව නේ ඉන්නේ. ඒ නිසා කරුණාකරලා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ අඩුම ගණනේ අපි ප්‍රායෝගික වෙමු කියලායි. ගිය පාර අය වැයෙන් සියයට 50ක් කරගන්න බැරි වුණා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අඩුම ගණනේ අපි try එකක් දෙමුකෝ, මේ අය වැයෙන් සියයට 50ක් කරන්න. වෙච්ච

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

පොරොන්දුවලින් සියයට 50ක් ඉටු කරන්න. ඊට පස්සේ අපට පුළුවන්, ඊළඟ අය වැය දිහා බලලා සාකච්ඡා කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ හොඳ දේවල් තිබෙනවා නම් අපි ඒවාට කුහකකම් කරන්න යන්නේ නැහැ. හැබැයි ආණ්ඩුව බොරු කරනවා නම්- *[බාධා කිරීමක්]* එහෙම කළොත් වැඩි කල් ඔතැන ඉන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙනම් හොඳටම කරන්න ඕනෑ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

අපි කුහකකම් කරන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. අපි අඩු පාඩු පෙන්වා දෙන්නම්. ඒවා හදාගන්න එක ඔබතුමන්ලා කරගන්න. මොකද, කුහක දේශපාලනය, වෛරී දේශපාලනය අපි ගාව නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටේ දේශපාලනය කරන්නේ මෙතුමන්ලාගේ න්‍යාය පත්‍රය විධියට නොවෙයි. මෙතුමන්ලා මේ අවුරුදු 5 යනකම් බලන් ඉන්නේ. අපි කුහකකම් කරන්නේ නැහැ. වැරැද්දක් තිබෙනවා නම් අපි පෙන්වලා දෙන්නම්. ඔබතුමන්ලා ඒක හදාගන්න ගරු ඇමතිතුමා. ඔබතුමා පොළොන්නරුවේ. බොහොම හොඳයි. වී ගොවියාට හොඳ සහනයක් දෙන්න, වී ගොවියාට හොඳ මිලක් දෙන්න, ගමේ යන ගමන් දඹුල්ලේ නවත්වන්න, දඹුල්ලේ නවත්වලා අල ගොවියෝ ටික හම්බ වෙන්න, ලූනු ගොවියෝ ටික හම්බ වෙන්න, අන්න ඒ අයගේ ප්‍රශ්නය විසඳන්න. වැඩේ හරි. එතකොට මම මේ පැත්තෙන් නැඟිටලා ඔබතුමාට ස්තුති කරනවා. අපි එහෙමයි.

මම මීට වඩා කාලය ගන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමා මට විනාඩි දෙකයි දුන්නේ. මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මේ අය වැයේදීවත් ඔබතුමන්ලා වෙච්ච පොරොන්දුවලින් වැඩිය ඕනෑ නැහැ, සියයට 50ක් ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියලා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොහොසතාගෙන් අරන් දුප්පතාට දෙන යුගයක් අවසන් කරලා, දුප්පතාගේ පොකැට් එකට ගහලා පොහොසතාට සහන දෙන යුගය කරුණාකරලා නවත්වන්න. ඔබතුමන්ලාගේ න්‍යාය පත්‍රය, මේ අය වැය IMF එක හැදුවාද, අතිගරු ජනාධිපතිතුමා හැදුවාද කියන්න මම දන්නේ නැහැ. මට ඒක වැඩකුත් නැහැ. බැලූ බැල්මටම දුප්පතාගෙන් බද්ද ගහලා පොහොසතාට සහන දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. අනේ! කරුණාකරලා ඒක නවත්වන්න.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Ms.) Lakmali Hemachandra. You have 20 minutes.

Before she starts, will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

Sir, I propose that the Hon. (Prof.) Sena Nanayakkara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
Sir, I rise to a point of Order.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමා point of Order එකක් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ ගරු සභාවත්, රටත් නොමඟ යවන ප්‍රකාශයක් කළා. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකක් තමයි රජයේ බදු මුදල් - *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි නේ. කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
එතුමා මේ ගරු සභාව නොමඟ යවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කථාව ආරම්භ කරන්න.

[අ.භා. 1.21]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අය වැය විවාදයේදී මෙම කථාව කිරීමට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අය වැය සම්බන්ධයෙන් අප පුළුල් වශයෙන් කථා කරන්න ඕනෑ කියලා මම හිතනවා. මේ අපේ ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය. ගරු ජනාධිපතිතුමාත් මේ කාරණය බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා. අපේ ආණ්ඩුවේ පළමුවැනි අවුරුද්ද අපි වැඩිපුරම ගත කළේ, ආර්ථිකයේ ස්ථාවරභාවය ආරක්ෂා කිරීම සඳහායි. මොකද, අප බලයට ආවාට පසුව ජාතික ජන බලවේගය රජය විසින් කුමන ආකාරයේ ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේද යන්න ගැන බොහොම පැහැදිලිව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල ලියා තිබෙන අවස්ථාවක සහ වේදිකාවේදී අපි ඉතා පැහැදිලිව ඒක පැහැදිලි කරලා තිබෙන අවස්ථාවක පවා විපක්ෂය විසින් දිගින් දිගටම දූර්මතයක් ගොඩනැඟුවා, ජාතික ජන බලවේගයේ රජයක් ආවොත් ආර්ථිකය ඉතා කෙටි කාලීනව අර්බුදයකට ලක්වීමට නියමිතයි, කඩා වැටීමකට ලක්වීමට නියමිතයි කියලා. ඒ නිසා රජයක් හැටියට අපට වගකීමක් තිබුණා, ඒ වාගේම දේශපාලන පක්ෂයක් හැටියටත් වගකීමක් තිබුණා අප අතින් කිසිදු වැරැද්දක් නොවී, ආර්ථික ස්ථාවරත්වය අඛණ්ඩ ලෙස පවත්වා ගෙන යෑමට. ඒ වගකීම අනුව තමයි අපි පළමුවැනි අවුරුද්ද තුළ ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා, ආර්ථිකයේ ස්ථාවරභාවය ආරක්ෂා කිරීම සඳහා විශාල වශයෙන් කටයුතු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එය අය වැය කථාවේ ඉතාම පැහැදිලිව පෙන්වා දී තිබෙනවා. පළමුවැනි අවුරුද්දේ අපේ භාණ්ඩ අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 9.1 දක්වා වැඩි වෙලා තිබෙනවා. සේවක ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 4.8 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 5.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. සංචාරක ඉපැයීම් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, ප්‍රාථමික ශේෂය රුපියල් ට්‍රිලියන 0.8 සිට රුපියල් ට්‍රිලියන 1.5 දක්වා වැඩි වෙලා තිබෙනවා. සමස්ත කොටස් වෙළෙඳ පොළ ඉතා ඉහළ අගයක මේ වන විට පවතිනවා. සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 23,000ක් පමණ ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම, අපේ විදේශ විනිමය සැලකිය යුතු ලෙස ස්ථාවර අගයක මේ අවස්ථාවේ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් යම් අභියෝග තිබෙනවා. නමුත්, අපි ඒක බොහොම ස්ථාවරව පවත්වා ගැනීමේ කටයුත්ත කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන් කථා කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ, අපේ ආණ්ඩුවේ පළමුවැනි අවුරුද්දේ අපි මූල්‍ය විනය වෙනුවෙන් කටයුතු කළ ආකාරයයි. එය අපි මුළු රට හැටියට ආඩම්බර වෙන්න ඕනෑ දෙයක්. අපි ආණ්ඩුව හැටියටත් ඒ ගැන ආඩම්බර වෙනවා. මේ අය වැය විවාදය තුළ විපක්ෂය පැත්තෙන් අපට හැම තිස්සේම එන ප්‍රධාන චෝදනාවක් තිබෙනවා. විපක්ෂයේ කථා සියල්ලම වාගේ සාරාංශගත කරලා ගත්තොත්, ඒවායේ සාරය ගත්තොත්, ඒවායේ තිබෙන්නේ මේ කිසිම දෙයක් ගැන, මේ සිද්ධ වෙලා තිබෙන දේවල් ගැන නොසතුටක් නොවෙයි. ඒ කියන්නේ, අපේ රටේ අපනයන ආදායම ඉහළ ගිහින් තිබෙනවා, සංචාරක ආදායම ඉහළ ගිහින් තිබෙනවා, බදු ආදායම් ඉහළ ගිහින් තිබෙනවා, වියදම් කළමනාකරණය ඉතාම හොඳින් සිද්ධ වෙලා තිබෙනවා, අපේ ප්‍රාථමික අය වැය ශේෂය ඉහළ ගිහින් තිබෙනවා. සමස්තයක් ලෙස ගත්තාම, පසුගිය අවුරුද්දේ අපේ රජයේ performance එක බැලුවාම, අප කර තිබෙන දේවල් දිහා බැලුවාම ඒ ගැන කරන්න විවේචනයක් නැහැ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයෙන් පොදුවේ එන විවේචනයක් තිබෙනවා. ඒක විවේචනයකටත් වඩා හිත් රිදීමක් නිසා කරන කථාවක් හැටියට තමයි පෙනෙන්නේ. ඒගොල්ලෝ කියනවා, "අපි කරපු දේවල් තමයි, එහෙම නැත්නම් අපි කරන්න හිටපු දේවල් තමයි රජය මේ අවස්ථාවේදී කරගෙන යන්නේ" කියලා. ඒක බොහොම පැහැදිලිව හැම කථිකයෙකුගෙන්ම වාගේ ප්‍රකාශ වෙනවා. මට මතක හැටියට, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා මීට දවස් කිහිපයකට පෙර එතුමාගේ කථාවේදී කිව්වා, අපි මාක්ස් හා ලෙනින් ගැන කථා කරලා වෙන වැඩක් කරනවා කියලා. එවැනිම අදහසක් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගෙනුත් මතු වුණා. සමගි ජන බලවේගයේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් පාහේ ඒ අදහස මතු වෙනවා. එතුමන්ලා කරන්න හිටපු දේවල් අපි කළා කියන අදහස අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් කිව්වා.

මම පොඩි වෙලාවක් අරගෙන ඒ කාරණය පැහැදිලි කරන්නම්. මොකද, අපි තේරුම් ගන්න ඕනෑ, මොකක්ද මේ තිබෙන හිත් රිදීම කියන එක. මේක මෙතුමන්ලාට තිබෙන එක්තරා ආකාරයක හීන මානයක් - inferiority complex - කියලායි මම හිතන්නේ. එතුමන්ලාට කර ගන්න බැරි වෙච්ච දෙයක් වෙන කවුරු හරි කරද්දී "අපිත් ඒක කරන්නයි හිටියේ. අපි 2010දී ඒක plan කළා. අපි 2015දී ඒක plan කළා. අපිට කර ගන්න බැරි වුණා. දැන් ඔයගොල්ලෝ කරනවා" වාගේ චෝදනාවක් තමයි අපට දැන් මේ ගෙනෙන්නේ. ඒ අය ඒ චෝදනාව ගෙනෙන ගමන් පෙන්වන්න හදනවා, අපි දේශපාලන ව්‍යාපාරයක් ලෙස, දේශපාලන පක්ෂයක් ලෙස කියපු දේ නොවෙයි කරන්නේ කියලා. මෙන්න මේක තේරුම් ගන්නට ඕනෑ කියා මා හිතනවා. කබීර් හෂීම් මහත්මයා කාල් මාක්ස් ගැනයි, ලෙනින් ගැනයි සඳහන් කරපු නිසාම මම ඒ ගැන කියන්න ඕනෑ.

අපි මාක්ස්වාදී ලෙස ඉතිහාසය තේරුම් ගත්තොත්, මාක්ස්වාදය කියන්නේ සමාජ සංවර්ධනය පිළිබඳ දේශපාලන න්‍යායක්. ඒ දේශපාලන න්‍යාය අනුව සමාජය එක තැනක ඉඳන් තව තැනකට ගමන් කිරීමේ එක් එක් අවධි තිබෙනවා. වැඩවසම් අවධියක් තිබෙනවා, ධනේශ්වර අවධි තිබෙනවා. ඉන්පසුව එන සමාජවාදය කියලා අවධියක් කාල් මාක්ස් නම් කරනවා. මේ එක් එක් අවධිය පසු කරමින් තමයි අපි යන්නට ඕනෑ. ධනේශ්වර ආර්ථිකය කියන එක, එහෙම නැත්නම් ධනවාදය කියන එක මාක්ස්වාදය විසින් සම්පූර්ණ ලෙස negative හැටියට පිළිගන්නා දෙයක් නොවෙයි. මාක්ස්වාදය තුළ ධනේශ්වර ආර්ථිකය පෙන්වන්නේ සමාජවාදය සඳහා ගමන් කිරීමේදී අවශ්‍ය එක පියවරක් හැටියටයි. ධනේශ්වර පන්තියට තමයි, ධනේශ්වර ආර්ථිකය සංවර්ධනය කිරීමේ වගකීම තිබෙන්නේ. තම පක්ෂ ධනේශ්වර පන්තියේ පක්ෂ කියලා මේ අයම පිළිගන්නවා නේ. ඒ ආකාරයට නේ මෙතුමන්ලා පෙනී සිටින්නේ. මේ පැමිණිල්ල තුළ තිබෙන කථාව ඒකයි. "අපි කරන්න ඕනෑ වැඩේ ඔයගොල්ලන් කරනවා" වාගේ කථාවක් නේ මෙතුමන්ලා කියන්නේ. අපේ වැඩේ, ඔයගොල්ලන්ගේ වැඩේ කියලා බෙදාගෙන තිබෙන්නේ, මේ ගොල්ලන්ගේ වැඩේ ධනේශ්වර සංවර්ධනය, අපේ වැඩේ වෙන එකක් කියන අදහසින්. අපි ඒක මොහොතකට පිළිගනිමු. එතකොට අපි බලන්නට ඕනෑ, එහෙම නම් ඒ ධනේශ්වර සංවර්ධනය ලංකාවේ සිද්ධ වෙලා නැත්තේ ඇයි කියලායි.

[ගරු නිතිෂා ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

අපි 1948දී නිදහස ලැබුවාට පසුව අවුරුදු 76ක් ගත වුණත් අවසානයේදී -2022 වර්ෂයේදී- අපේ රටට උරුම වුණේ මොකක්ද? එකම පන්නයේ දේශපාලන පක්ෂ වෙලාත්, මේ දේශපාලන පක්ෂ අවුරුදු ගණනාවක් රට පාලනය කරලාත්, අපේ රටට සිද්ධ වුණේ මොකක්ද? ඔවුන් අද වෙනස් මුහුණුවරකින් ඉන්නවා. සමගි ජන බලවේගය කියලා, එක්සත් ජාතික පක්ෂයෙන් ආපු එකක් තිබෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ආපු එකක් තිබෙනවා. නමුත්, මේ එකම දේශපාලන සම්ප්‍රදායයක්. එහෙම නම් ඔවුන් දීර්ඝ කාලයක් මේ රට පාලනය කරලා රට බංකොලොත්භාවයට ගෙනිච්චේ ඇයි? සාර්ථකත්වයට පියවරු 100ක් විතර මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. අපි මූල්‍ය විනය හදාගත්තා කිව්වාම, ආදායම් වැඩි කර ගත්තා කිව්වාම, භාණ්ඩාගාරයේ රුපියල් ට්‍රිලියනයක් තිබෙනවා කිව්වාම, ඒක ගැන තමන්ගේ අදහස කියවන්න, ඒකෙන් මොකක්ද කරන්න ඕනෑ කියලා කියන්න පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ඕනෑ තරම් ඉන්නවා. නමුත් කවුද, අසාර්ථකත්වයේ පියතුමා? අපේ රට 2022දී බංකොලොත්භාවයට පත් වුණේ කාගේ වරදින් ද? එතකොට අපි බලන්න ඕනෑ මොකක්ද? මෙන්න මේ සංවර්ධනයේ අවශ්‍ය පියවරක් අපට තියා ගන්නට බැරි වුණා. අපි පුනරුදය කියලා කථා කළේ අපට අහිමි වෙච්ච අවස්ථාව. අපට අහිමි වෙච්ච අවස්ථාවේ සංවර්ධනයේ කොටසක් තිබෙනවා. ධනේශ්වර පන්තියේ යැයි කියා ගන්නා පක්ෂවලට ඒක කරන්න බැරි නම්, සාමාන්‍ය ජනතාවගෙන් ඇවිල්ලා ඉන්න අපේ ව්‍යාපාරයට ඒක කිරීමට සිද්ධ වෙනවා. ඒක අවශ්‍ය පියවරක්. ඒක නිසා කබීර් හෂීම් මන්ත්‍රීතුමාත්, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඉස්සෙල්ලාම මාක්ස්වාදය කියවලා එන්න ඕනෑ; ලෙනින්වාදය කියවලා එන්න ඕනෑ. ඒ රටවලත් එහෙම තමයි වෙලා තිබෙන්නේ. අදටත් කොමියුනිස්ට් පක්ෂයේ පාලනයක් යටතේ තිබෙන චීනය කියන්නේ නැහැ තමන් ධනවාදී රටක් කියලා. චීනය කියන්නේ තමන් සමාජවාදී රටක් කියලා. චීනයේ තිබෙන පාලන ක්‍රමය මොකක්ද කියලා බලන්න ඕනෑ. එහෙම නොකර විපක්ෂය කිසිම තේරුමක් නැති තැනකට මේ විවාදය අරගෙන එනවා, ලේබල්කරණය හරහා. කුමන දේශපාලන පක්ෂය කුමන ආකාරයෙන් වැඩ කටයුත්තක්ද කරන්නේ කියන එක තීරණය වෙන්නේ අපි දේශපාලන පක්ෂයක් හැටියට සිටින තැන අනුව වාගේම, අද ලංකාවේ සංවර්ධනයේ තත්ත්වය සහ අප මේ වෙලාවේ කරන්න ඕනෑ මොකක්ද කියන එක මතයි. 2010දී මේ අය කරන්න හිටියා, 2015දී අනෙක් අය කරන්න හිටියා කියලා විපක්ෂය දැන් කියනවා නේ. මේගොල්ලන් මොන කතන්දර කිව්වත් මේ වෙලාවේ කරන්න ඕනෑ දේ අපි අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ.

දැන් ගනිමු, digital ID එක ගැන කතන්දරය. Digital ID එක ගැන 2015දීත් යෝජනා කරලා තිබෙනවා. ඊට පස්සේත් යෝජනා කරලා තිබෙනවා. හැබැයි, කරලා නැහැ. මේක තමයි ප්‍රශ්නය. මේක තමයි ප්‍රශ්නය. ඩිජිටල්කරණය කියන එක වැදගත් පියවරක්. නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමේ වැදගත් පියවරක්. නමුත්, ඒ අය ඒක කරලා නැහැ. ඒක නොකර තිබීමේ ප්‍රශ්නය තමයි අපට තිබෙන්නේ. ඔබතුමන්ලා කරන්න ඕනෑ වැඩේ ඔබතුමන්ලා කරලා තිබුණා නම්, අපි මේක කරන්න ඕනෑ නැහැ තමයි. ඒක ඇත්ත. නමුත්, ඔබතුමන්ලා කරන්න ඕනෑ වැඩේ ඔබතුමන්ලා කරලා නැහැ. එතකොට ඒකත් අපට කරන්න සිද්ධ වෙනවා. අපි ඒකත් කරනවා. මොකද, මේ රට ගොඩනැඟීමේ වගකීම තිබෙන්නේ අපටයි. මේ රට ගොඩනැඟීමේ හැකියාව තිබෙන්නේත් අපටයි. අපි ඒක මේ අවුරුද්ද තුළ ඔප්පු කර තිබෙනවා.

මම නැවතත් මූල්‍ය විනය කියන කාරණයට එන්නම්. ලංකාවේ භාණ්ඩාගාරය කියන්නේ, පසුගිය කාලය පුරා හැම අවුරුද්දේම එදිනෙදා මුදල් හොයා ගනිමින් කටයුතු කරපු තැනක්. එය කිසිම ආකාරයකින් මූල්‍ය ස්ථාවරභාවයක්, මූල්‍ය විනයක් practise කරපු තැනක් නොවෙයි. ඒක නිසා තමයි අපේ රට ණය ගැනීම වැඩි වුණේ, පොලී ගෙවීම් වැඩි වුණේ. ඒ සියල්ල සිද්ධ වුණේ භාණ්ඩාගාරයේ තිබුණු ඒ අසංවිධිතභාවය නිසායි.

නමුත් අපේ පාලන කාලයේ පළමුවැනි අවුරුද්ද තුළ අපට පුළුවන් වෙලා තිබෙනවා, රුපියල් ට්‍රිලියන 1.2කට ආසන්න භාණ්ඩාගාර සංචිතයක් - buffer එකක් - හදාගන්න. දැන් මන්ත්‍රීවරු අහනවා, අලවලට සහන දෙන්න බැරි ඇයි, ලූනුවලට සහන දෙන්න බැරි ඇයි, මේ රුපියල් ට්‍රිලියන 1.2ක සංචිතයෙන් මොකක්ද කරන්නේ කියලා. ඇත්තටම මේකෙන් මොකක්ද සිද්ධ වෙන්නේ? අපි මේ සංචිතය හදා ගත්තේ කොහොමද? හදා ගත්තේ හොඳින් ආදායම් එකතු කිරීමෙන්. අපේ ආදායම එකතු කිරීම අපි හොඳින් කරලා තිබෙනවා. ඒ වාගේම අපි වියදම් කළමනාකරණය ඉතාම හොඳින් කරලා තිබෙනවා. ඒ හින්දා තමයි අද වෙනකොට රුපියල් ට්‍රිලියනයක සංචිතයක් අපේ භාණ්ඩාගාරයේ තිබෙන්නේ. මේක හරහා අපට කරන්න පුළුවන් දේ මොකක්ද? මේක ඉතාම වැදගත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රුපියල් ට්‍රිලියනයක සංචිතය හරහා අපට කළ හැකි කාර්යයන් තිබෙනවා. එකක්, අපි දැන් මූල්‍යමය වශයෙන් ස්ථාවරයි. අපි දන්නවා, අපේ ළඟ සල්ලි තිබෙනවා. ලංකාවේ රජය වෙන දා වාගේ අස්ථාවරභාවයක නැහැ. හදිසි අවස්ථාවකට වුණත් මුහුණ දෙන්න ලංකාවේ රජය සතුව buffer එකක් තිබෙනවා.

ඒ වාගේම වැදගත්ම දේ තමයි, අපේ පොලී අනුපාතය. ලංකාවේ ආර්ථික අර්බුදය තිබුණු අවස්ථාවේ -රජයට සල්ලි නැතිම අවස්ථාවේ- රජයට මූල්‍ය සපයා ගැනීමට සියයට 33ක පොලී අනුපාතයකට පවා යන්න සිද්ධ වුණා. අද වෙනකොට ඒ ප්‍රමාණය සියයට 10කට වාගේ වැටිලා තිබෙනවා. එහෙම වැටිලා තිබෙන්නේ ඇයි? මොකද, ණය දෙන අය දන්නවා, රජයට ණය දෙන පිරිසත් දන්නවා, රජය සතුව සංචිතයක් තිබෙනවා, එම නිසා ඕනෑවට වඩා පොලී ප්‍රතිශත quote කරන්නට බැහැ කියලා. ඒ නිසා රජයට ණය ලබා ගැනීමේදී පොලී අනුපාතය පාලනය කර ගැනීමේ හැකියාවක් දැන් රජයට ලැබී තිබෙනවා. ඒක හරහා අපි ලබන අවුරුද්දේ ණය ගැනීමේදී මේ අවුරුද්දේ ගත්තාට වඩා වාසියක් එනවා. මොකද, 2026 අවුරුද්ද සඳහා මහා භාණ්ඩාගාරය විසින් ණය උපායමාර්ගය ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ ඒ Medium-Term Debt Management Strategy එක බැලුවොත්, ඒ ණය උපායමාර්ගය බැලුවොත් අපට බොහොම පැහැදිලිව පෙනෙනවා, ලබන අවුරුද්දේ සියයට 90ක්ම දේශීය ණය මත තමයි අපේ මූල්‍ය සපයා ගැනීම කරන්නට බලාපොරොත්තු වෙන්නේ කියලා. මහා භාණ්ඩාගාරයේ තිබෙන මේ සංචිතය පාවිච්චි කරලා පොලී අනුපාතය පහළ මට්ටමක තබාගෙන යෑම අපේ රටේ මූල්‍ය විනය තවදුරටත් ආරක්ෂා කිරීමට ඉතාම වැදගත්. අපට එහෙම කරන්න බැරි වුණොත්, අපේ පොලී වියදම - ලංකාවේ වැඩිම වියදම වෙන්නේ පොලී වියදම - අනිවාර්යයෙන්ම වැඩි වෙනවා. මෙච්චර කාලයක් අපේ පොලී වියදම වැඩි වෙමින්, වැඩි වෙමින් ගිහිල්ලා තිබෙන්නේ. විදේශීය ණය හිමියන්ට, දේශීය ණය හිමියන්ට දෙන පොලී වියදම වැඩි වෙමින් වැඩි වෙමින් තිබුණු චක්‍රය නවත්වලා, ඒ වෙනුවට අපි පටන් අරගෙන තිබෙනවා පොලී වියදම අඩු කර ගැනීමේ චක්‍රයක්. ඒ අනුව අපි කලින් තිබුණු චක්‍රය reverse කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒක කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ අපේ මූල්‍ය විනය නිසායි. අපි ඒක මතක් කර ගන්නට ඕනෑ. මූල්‍ය විනය නිසාමයි ඒක කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

අපි බැලුවොත්, අපනයන බෝග, ඇඟලුම්, කර්මාන්ත අපනයන, විදේශ ප්‍රේෂණ, සංචාරක කර්මාන්තය වාගේ දේවල් මත තමයි මේ වෙලාවේ අපේ ආර්ථිකය තිබෙන්නේ. අපේ ආර්ථිකය සංකීර්ණ ආර්ථිකයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ තත්ත්වයේ ඉඳගෙන අපට අවශ්‍ය සංවර්ධන ඉලක්කවලට යෑමේ හැකියාවක් නැහැ. ඒක අපි දන්නවා. අපි මේ

ආර්ථිකය කළමනාකරණය කරනවා. අපි බලයට එනකොට තිබුණු ආර්ථිකය කළමනාකරණය කිරීමට අවශ්‍යයි. ඒක අපේ වගකීම. ඒ වාගේම ඒ ආර්ථිකය එතැනින් ඉහළට ඔසවා තැබීමටත් අපට වගකීමක් තිබෙනවා. අපේ සංවර්ධන ඉලක්කවලට අපි යන්නට ඕනෑ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2026 වර්ෂය සඳහා අපට පුරෝකථනය කරලා තිබෙන්නේ සියයට 3.1ක ආර්ථික වර්ධන වේගයක්. 2024ට පෙර හිටපු රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රජය විසින් ගෙනාපු ආර්ථික පරිවර්තන පනත යටතේ පුරෝකථනය කරලා තිබුණේ සියයට 5ක ආර්ථික වර්ධන වේගයක්. මධ්‍ය කාලීනව සියයට 7ක ආර්ථික වර්ධන වේගයක් අවශ්‍යයි කියන එක අපි පිළිගන්නවා. අපි ඒක ප්‍රතිපත්තියක් හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. මේක තමයි වෙනස. විපක්ෂයේ මන්ත්‍රීවරු අය වැය කියවන්න පුරුදු වෙන්න ඕනෑ. කවදාවත් නැති growth target එකක් දැක්කාම පොඩ්ඩක් හිතන්න පුරුදු වෙන්න ඕනෑ, මොකක්ද මේ කියලා. IMF එකෙන් දීලා තිබෙන growth target එකට නම් අපි යන්නේ, රනිල් වික්‍රමසිංහ හදපු growth target එකට නම් අපි යන්නේ, එහෙම නම් අපේ අය වැයෙන් සියයට 7ක ආර්ථික වර්ධනයක් ගැන කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. සියයට 7ක් තමයි අපේ target එක. අපි හිතනවා, මධ්‍ය කාලීනව අඩුම ගණනේ මේ සියයට 7ක අගය එන්නට අවශ්‍යයි කියලා. ඒ සඳහා තමයි අපි උපායමාර්ග ඉදිරිපත් කරලා තිබෙන්නේ. ණය තිරසරකරණය, ඩිජිටල්කරණය, අපනයන ආර්ථිකය ගොඩනැඟීම, ග්‍රාමීය සංවර්ධනය, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම යන කාරණා ඇතුළත් අපේ උපායමාර්ගය එන්නේ මෙන්න මේ සියයට 7ක target එකට යන්නයි. එහෙම නැතුව IMF එකේ target එකට යන්නවත්, රනිල් වික්‍රමසිංහගේ target එකට යන්නවත් නොවෙයි. මේක නිශ්චිත උපායමාර්ගයක්. ඒ උපායමාර්ගය විවේචනය කරන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා තමන්ට හිතෙන හිතෙන දේවල් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි දැන් ගොඩක් අය කියනවා, අපි එනකොට රට ස්ථාවරව තිබුණා, රට ගොඩ දාලා තිබුණා කියලා. එහෙම නැහැ. රටේ යම් කිසි ස්ථාවරභාවයක් ඇති වෙලා තිබුණා. 2022දී ආර්ථිකය කඩාගෙන වැටුණු නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකතු වෙලා අපි රටේ යම් ස්ථාවරත්වයක් ඇතිකර ගත්තා. ඔවුන් අපට රට ස්ථායි කිරීමට සහායක් ලබා දුන්නා. ඒ ක්‍රියාමාර්ග අරගෙන රට ස්ථාවර කරගෙන අපි හිටියා. ඔව්, ඒක ඇත්ත. නමුත් අපි ආර්ථික පදනමින් විනාශ වෙච්ච රටක්. අපේ රටේ ආර්ථික පදනම විනාශ කරලා තිබෙන්නේ, නිෂ්පාදන හැකියාව විනාශ කරලා තිබෙන්නේ. කෘෂිකර්මයද, ධීවර කර්මාන්තයද, කර්මාන්තද, සේවා ආර්ථිකයද යන හැම තැනම පදනම විනාශ කරපු රටක්, මේක. පදනම විනාශ කරපු රටක් හදන්න නම් අපි පදනම ගොඩ නඟන්නට අවශ්‍යයි. අපි ඒකටයි මේ උපාය මාර්ගය ගෙනැල්ලා තිබෙන්නේ. ඒක නිසා තමයි අපේ අය වැය තුළ වැඩි ඉඩක් SME sector එක develop කරන්න ලබා දීලා තිබෙන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා වැඩි ඉඩක් ලබා දීලා තිබෙන්නේ.

ඒ වාගේම ඩිජිටල් ආර්ථිකය කියන එක අපි සුලුකොට සලකන්න හොඳ නැහැ කියලායි මම හිතන්නේ. අවුරුදු ගණනක් තිස්සේ මේ ගැන කියනවා. ඒක හරි. ඩිජිටල්, ඩිජිටල් කියලා කිය කියා ඉන්නවා තමයි. නමුත් කරලා නැහැ. ඩිජිටල් කරලා නැහැ. ආර්ථිකයේ ඉදිරි පිම් ගන්නා, තාක්ෂණයේ නිවෝත්පාදන තිබෙනවා නේ. මේවා ආර්ථිකය සමස්තයක් ලෙස ඔසවා තබනවා. Steam engine එක හැදීම, electricity සොයා ගැනීම, ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ හැදීම, Internet එක සොයා ගැනීම වැනි තාක්ෂණික කටයුතුවලින් සමස්ත ආර්ථිකයම ඔසවා තබනවා. Digital economy කියන්නේත් ඒ වාගේ දෙයක්. මේක සමස්ත ආර්ථිකයේ ඵලදායිතාව ඉහළ දමන්න ඕනෑ කරන දෙයක්. අපි ඒ වෙනුවෙන් මොන තරම් යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවාද? අපි ඒක බොහොම නිශ්චිතව පෙන්වා දී තිබෙනවා. මේ අය වැය තුළ ඩිජිටල් ආර්ථිකයක් සඳහා වන රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 25ක් වෙනවා. ඒ රුපියල් බිලියන 25 තුළ තිබෙනවා,- digital ID එක වෙනුවෙන් වෙන් කරන ප්‍රතිපාදන. අපි පළමු digital ID එක 2026 තුන්වැනි කාර්තුවේදී නිකුත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ ගැන ගොඩක් අය කථා කළා තමයි. ගොඩක් අය මේ කරුණ ඉදිරිපත් කළා වෙන්න පුළුවන්. නමුත් අපි ඒක කරනවා.

ඒ වාගේම අපි රුපියල් බිලියන තුනක් වෙන් කරලා තිබෙනවා, ඩිජිටල් යටිතල පහසුකම් සකස් කිරීම සඳහා. Data centres කියන්නේ අලුත්ම අදහසක්. ලෝකයේ අනෙක් රටවල සමහර නගරවල data centres හැටියට ආර්ථික කලාප සංවර්ධනය කරනවා. ගොඩක් දුරට චීනයේ ඒක තිබෙනවා. Data centre එකක් හදන්න නම් අපට ඒකට නීතිමය රාමුවක් අවශ්‍යයි. ඒ නීතිමය රාමුව වාගේම රජය විසින් ඒකට ලබා දෙන මූල්‍ය සහ ප්‍රතිපත්තිමය සහායත් අවශ්‍යයි. මූල්‍ය සහාය ලබා දීමට, හරිත බලශක්ති සහාය ලබා දීමට, incentives ලබා දීමට, විදුලි සහන ලබා දීමට අපි වෙනම මුදල් මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා. ආරම්භයක් වශයෙන් ඒ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. මොකද, මේක ආරම්භක වර්ෂය නිසා. ඒ වාගේම සන්නිවේදන කුලුනු වැනි යටිතල පහසුකම්වලට, - මෙය ඩිජිටල් ආර්ථිකයකට අවශ්‍යම දෙයක් - එවැනි යටිතල පහසුකම්වලට ආයෝජන කැඳවීම සඳහා අපි අවුරුදු පහක tax concession එකක් ලබා දෙනවා. ඩිජිටල් ආර්ථිකයේදී මේ කොටස ගන්නේ ව්‍යාපාරිකයන්ට සහන ලබා දෙන්න නොවෙයි. මම කිව්වේ ඒකයි. ඩිජිටල්කරණයට අපට ආයෝජන අවශ්‍යයි. මේ පහසුකම් ලංකාවේ ඇති වෙන්නට අවශ්‍යයි. ඒකට රාජ්‍ය ආයෝජනයකුත් තිබෙනවා. රුපියල් බිලියන 25ක රාජ්‍ය ආයෝජනයක් තිබෙනවා. නමුත් අපි මේකට පෞද්ගලික අංශයේ ආයෝජනත් කැඳවන්නට ඕනෑ. පෞද්ගලික අංශයේ ආයෝජන කැඳවලා අපේ සමස්ත ආර්ථිකය මේ තිබෙන මට්ටමින් ඉහළට ඔසවන්න ඕනෑ. අපි මේක හරියට කළොත් ආර්ථිකයේ විප්ලවීය වෙනසක් ඇති වෙනවා. ඒ නිසා අපි ඒක හරියට කරන්නට ඕනෑ.

අනෙක් කාරණය මේකයි. දැන් දිගටම කියනවා අපි කරන්නේ අරගොල්ලන් කරපු එකමයි, මේගොල්ලන් කරපු එකමයි කියලා. අවසාන වශයෙන් ඒ ගැන එක කාරණයක් සඳහන් කරන්නම්. අපේයි, මේගොල්ලන්ගෙයි තිබෙන ප්‍රධාන වෙනස මේකයි. 2016 ඉදිරිපත් කළ අය වැය කථාව බැලුවොත් ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා, නිදහස් වෙළෙඳ පොළ බලවේග මත විශ්වාස කරන ආර්ථික ප්‍රතිපත්තියක් තමයි ඒගොල්ලන් ඉදිරිපත් කරන්නේ කියලා. නමුත් අපේ ආර්ථික ප්‍රතිපත්තිය ඒක නොවෙයි. අපේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය ආයෝජන ගැන මේ තරම් වැදගත්කමක් පෙන්වන්නේ, රජය විසින් ප්‍රතිපත්ති සකස් කිරීම, යටිතල පහසුකම් සකස් කිරීම වෙනුවෙන් විතරක් නොවෙයි, රජය මූලික නායකත්වය අරගෙන රටක ආර්ථිකය ගොඩ නැඟීමේ වුවමනාවක් තිබෙනවා කියන එක අපි පැහැදිලි කරගෙන තිබෙන නිසායි. මේගොල්ලන් රාජ්‍යය කියන එක අවුල් කරලා තිබෙන්නේ. ඕනෑ තැන්වලට ආයෝජනය කරලා නැහැ. කුඩා, කුඩා ගොඩනැඟිලි රට වටේම හදන්නට මුදල් නාස්ති කරලා තිබෙනවා. සමහර තැන්වල ඒවා හරියට හදලාත් නැහැ. ඒවායේ ඉදිකිරීම් කටයුතු ඉවර කරලා නැහැ. අවශ්‍ය තැන්වලට අවශ්‍ය ප්‍රමාණයට රජයේ සේවකයන් යොදවලා නැහැ. සමහර තැන්වල රජයට අවශ්‍ය ප්‍රමාණයට සම්පත් නැහැ. නමුත් මැති ඇමතිවරුන්ගේ ඔෆිස් නම් හදලා තිබෙනවා. ඒක අපි දන්නවා. මැති ඇමතිවරුන්ගේ ඔෆිස් සාගර වාගේ හදලා තිබෙනවා. එහෙම හදලා තිබියදී තමයි ප්‍රාදේශීය ලේකම්වරයෙකුට කැබ් එකක් දෙන එක ගැන මෙතැන ඇවිල්ලා බොරුවට කථා කරන්නේ, මන්ත්‍රීවරුවරුන්ට දෙන කැබ් එකක් ගැන කිය කියා.

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]මහතා]

රාජ්‍යය කඩා දාලා තිබෙන්නේ. කඩපු රාජ්‍යය අපි හදන්න ඕනෑ. අපේ උපකරණය පෞද්ගලික සම්බන්ධතාවත්, අපේ උපකරණය ව්‍යාපාරිකයන්ගේ හොඳ හිතවත් නොවෙයි. අපේ උපකරණය රාජ්‍යයයි. අපි ආර්ථිකය මෙහෙයවන්නේ රාජ්‍යය හරහා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ රාජ්‍යය ගොඩනැඟීමට අපට වගකීමක් තිබෙනවා. රාජ්‍යයට ඒ කරලා තිබෙන අකටයුතුකම් අවසන් කිරීමට අපි මේ අවුරුද්දේ රාජ්‍ය සේවයට 75,000ක් නැවත recruit කරනවා. රජයේ දේපළ තාර්කිකරණය කිරීම සඳහා අපි සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා. State Asset Management Act එකක් ඉදිරිපත් කිරීමට අපි සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොලී සහනයක් ලබා දීම සඳහා භාවිත කරපු රුපියල් බිලියන 25ත් අපට තමයි ගෙවන්න සිදු වෙලා තිබෙන්නේ. අපි ඒකත් ගෙවනවා. මොකද ඒවා නිරවුල් කරන්න ඕනෑ. රජයට අයත් ආයතන 10ක ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීමට අපි මේ අය වැය යටතේ මුදල් වෙන් කරලා තිබෙනවා. අපි අපේ සමස්ත උපාය මාර්ගය තේරුම් ගන්නට ඕනෑ. එහෙම නැතුව තැනින් තැනින් කියවලා මේක තේරුම් ගන්නට අපහසුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට අමතර විනාඩි දෙකක් ලැබෙනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon.(Ms.)Lakmali Hemachandra, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි බලන්න ඕනෑ, මම මේ කියපු කාරණය. ඩිජිටල් ආර්ථිකය empower කරන්න ඕනෑ. ඒක කරන්නේ නිකම් නොවෙයි, රජයේ සහභාගිත්වය යටතේ; රාජ්‍ය නායකත්වය යටතේ. SME sector එකත් එහෙමයි. ඒ අයට ලබා දෙන ණය පහසුකම් සඳහා අය වැයෙන් රුපියල් බිලියන 80ක් වෙන් කරලා තිබෙනවා. අපි මේ හදන්නේ අපේ ආර්ථිකයේ පදනම. ආර්ථිකයේ පදනම හැදීම තමයි අපට ඊළඟ අවුරුද්දේ කරන්න වෙලා තිබෙන්නේ. ඒ වාගේම බලශක්ති ක්ෂේත්‍රය - energy sector එක - සඳහා ආයෝජන කැඳවීමට, බලශක්ති ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට රජය වෙනම ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවා. Energy Transition Act එක අපි ලබන අවුරුද්දේ ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ හරහා බලශක්තිය, ප්‍රවාහනය සහ ඩිජිටල් ආර්ථිකය ඒකාබද්ධ කරමින් ආර්ථික උපාය මාර්ගයක් අපි ඉදිරිපත් කරනවා. මේ කාරණය මේ බරින් අරගෙන කථා කරන්න අවශ්‍යයි. මේ කාරණා බරින් අරගෙන කථා කරන්න බැරිව, අනවශ්‍ය ලෙස ඕනෑ නැති විහිළු කරන්නයි, අපහාස කරන්නයි ඕනෑ නැහැ. මේක අය වැය විවාදයක් නේ.

වතු කම්කරුවන්ගේ වැටුප් සම්බන්ධයෙන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉතාම වැරැදි කථාවක් කිව්වා. මගේ සහෝදර මන්ත්‍රීතුමා ඒකට උත්තරයක් දෙන්නත් ගියා. මම ඒක ගැනත් කියලා කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම මේ කියන කථාව බලන්නකෝ. බදු සහනයක් දෙන්න තිබුණා ලු, වැටුපට දායකත්වය දරන්නේ නැතුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික ආයතනවලට බදු සහනයක් දුන්නාම ඒක අනිවාර්යයෙන්ම වැටුපට දායකත්වයක් ලබා දෙනවා කියලා රජයට තහවුරු කර ගැනීමේ හැකියාවක් නැහැ. වැටුප් වැඩි කිරීමේ හැකියාව තිබෙන්නේත් ඒ ආයතනවලට තමයි. ඒක තමයි ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව කළේ. ඔහේ බදු සහන ලබා දුන්නා. ඒවා යන්නේ කොහේටද, ලැබෙන්නේ කාටද, ඒවායේ අවසාන ඵලදායිත්වය මොකක්ද කියලා බලන්නේ නැතුව, ඔහේ බදු සහන දුන්නා. අපේ බදු ආදායම අඩු වෙලා අපි අවසානයේ බංකොලොත්භාවයට ගියේ, ඒ ප්‍රතිපත්තිය නිසායි. අපි ඒ ප්‍රතිපත්තියේ ඉන්නේ නැහැ. අපි ක්‍රියාත්මක කරන්නේ targeted policies. එතකොට අපි නිශ්චිත වශයෙන් වතු කම්කරුවන්ට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* මේ අපේ වෙලාව නේ ගන්නේ.

අපි නිශ්චිත වශයෙන් වතු කම්කරුවන්ට රුපියල් 200ක ආධාරයක් ලබා දෙනවා. ඒක, targeted; ඒක අනිවාර්යයෙන් යන්නේ කම්කරුවාට. ඒක වෙන කාටවත් යන්නේ නැහැ. ඒක කම්කරුවා නිශ්චිත කරගෙන ලබා දෙන subsidy එකක්. ඒක බදු සහනයක් වාගේ නොවෙයි. මේ අය වැය පුරාම තිබෙන සහන - tax concessions වේවා, අනෙකුත් සෑම සහනයක්ම වේවා - නිශ්චිත කරලා, කාටද ලැබෙන්නේ කියලා හොයලා බලලා දෙන සහන පමණයි. ඒක අපේ සමස්ත උපාය මාර්ගයට සම්බන්ධ කරලා තමයි අපි ලබා දීලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට මේ කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිළිණ තාරුක සමරකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.44]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலின சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට උගන්වපු විශ්වවිද්‍යාල ආචාර්යවරයකු වන ඔබතුමා මූලාසනයේ සිටියදී, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට 2026 වර්ෂයට අදාළ අය වැය විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මේ අවස්ථාවේදී ඇත්තටම සතුටු වෙනවා. අද උදේ අපි දැක්කා, විපක්ෂ නායකතුමාත්, නාමල්

රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාත්, විපක්ෂයේ තවත් මන්ත්‍රීවරු කිහිපදෙනෙකුත් මේ සභාවට ඇවිල්ලා, මේ අය වැයට අදාළව යම් අදහස් ප්‍රමාණයක් ඉදිරිපත් කළා. ඇත්තටම මට කලින් කථා කළ අපේ සහෝදර මන්ත්‍රීවරියත් එතුමන්ලාගේ අදහස් පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. ඒකට මගේ පැත්තෙනුත් යමක් එකතු කරන්නට ඕනෑ කියලා මම අදහස් කරනවා. මොකද, එතුමන්ලා බලාපොරොත්තු වුණාට වඩා අපි සාර්ථක වෙලා තිබෙනවා. එතුමන්ලා හිතුවාට වඩා අද වන විට අපි සාර්ථක වෙලා තිබෙනවා. රාජ්‍ය මූල්‍යකරණය යටතේ, රාජ්‍ය මූල්‍ය පාලනය යටතේ සාර්ව ආර්ථිකයට අදාළ සාධක ඉතාම හොඳට කළමනාකරණය කරමින්, අපි යම් ඉලක්කයන් කරා ළඟා වෙමින් තිබෙනවා. ඒ ඉලක්ක මත පදනම් වෙලා තමයි අපි 2026 වර්ෂයට ප්‍රවිෂ්ට වෙන්නේ. ඇත්තටම අපි ඩොලරයේ අගය යම් කිසි මට්ටමකින් ස්ථාවර කර ගනිමින්, අපනයන ආදායම ඉහළ නංවා ගනිමින්, අපේක්ෂිත බදු ආදායම් ඉලක්ක කරා ළඟා වෙමින් සිටිනවා. මේ අපේක්ෂිත බදු ආදායම ගැන කියනකොට මේ ගැනත් සඳහන් කරන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බදු අනුපාතය වැඩි නොකර, පදනම වෙනස් කරලා, tax base එක වෙනස් කරලා තමයි අපි ඇත්තටම මේ ආදායමට ළඟා වෙලා තිබෙන්නේ.

ඒ වාගේම සංචාරක කර්මාන්තය ශීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි කොටස් වෙළෙඳ පොළ. රාජ්‍ය භාණ්ඩාගාරය සතු සංචිත යම් කිසි විධියකට ඉහළ නංවා ගනිමින් අපි කටයුතු කරමින් ඉන්නවා. ඩොලර් සංචිතය බිලියන 7කට ආසන්න වෙලා තිබෙනවා. ඇත්තටම වාහන ආනයනය නොකළා නම්, ඩොලර් බිලියන 8කට එහා අගයකට යන්න අපට අවස්ථාව තිබුණා. ඔන්න ඔය විධියට ගත්තාම රටක් විධියට සාර්ව ආර්ථික උපකරණ ටික හොඳම විධියට කළමනාකරණය කරමින් තමයි අපි අද මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඇත්තටම මේක ඓතිහාසික අය වැයක්. නාමල් රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඇහුවා, "මේ අය වැය ඓතිහාසිකයි, ඓතිහාසිකයි කියනවා. කොහොමද ඓතිහාසිකයි කියන්නේ" කියලා. ඇත්තටම මේක ඉතාම ඓතිහාසික අය වැයක්. මේක රටේ සියලු ක්ෂේත්‍ර ආවරණය වෙච්ච අය වැයක්.

ගරු විපක්ෂ නායකතුමා අදහස් ප්‍රකාශ කරද්දී උද්ධමනය ගැන කථා කළා. අපි ගිය අවුරුද්ද තුළ ජනතාවට දුන් සහන මොනවාද කියලා ප්‍රශ්න කළා. මොන භාණ්ඩවල මිලද අඩු වුණේ කියලා එතුමා ප්‍රශ්න කළා. ඇත්තටම එතුමාට මතක් කරන්න ඕනෑ, අපි බලයට පත් වුණාට පසුව මේ වනකොට පෙට්‍රල් ලීටරය රුපියල් 38කින් අඩු කරලා තිබෙන බව. ඒ වාගේම ඩීසල් ලීටරය රුපියල් 30කින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය මිනිස්සු පරිභෝජනය කරන බිත්තර, කුකුළු මස්, නාඩු සහල්, කැකුළු සහල් යනාදියේ මිල යම් කිසි තැනකට ගෙනෙන්න අපට හැකියාවක් ලැබී තිබෙනවා. ඔන්න ඔය විධියට ගත්තාම සාර්ව ආර්ථිකයට අදාළ කාරණා යම් කිසි හොඳ විධියකට කළමනාකරණය කරලා, 2026 වර්ෂය සඳහා අය වැය ඉදිරිපත් කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා. මෙන්න මේ විධියට යම් කිසි පදනමක් මත ඉඳලා තමයි අපි 2026 වර්ෂයට අදාළව මේ අය වැය ඉදිරිපත් කළේ. 2026 වර්ෂයේදී ආර්ථිකය සියයට 4කින් 5කින් වර්ධනය වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.4කට එහා අගයකට යයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20.5ක මට්ටමක පවත්වා ගන්න අපි උත්සාහ කරනවා. රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක මට්ටමක පවත්වා ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා. මෙන්න මේ විධියට ගත්තාට පස්සේ රටේ සමස්ත ක්‍රියාවලිය යම් base එකක් මත තබාගෙන ඉදිරියට ගොඩනඟන්න බලාපොරොත්තු වෙමින් තමයි අපි මේ සියලු කටයුතු කරන්නේ.

මේ අය වැය ඇතුළේ තිබෙන කාරණා ගත්තාම, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අපි මොනවාද කරන්න බලාපොරොත්තු වෙන්නේ කියන දේ පිළිබඳවත් කථා කරන්න ඕනෑ. මේ අය වැය ඓතිහාසික අය වැයක් වෙන්නේ කොහොමද කියන එක අන්න ඒ තුළින් ඔප්පු වෙනවා. අපි අවුරුද්දක් ඇතුළත විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ මහපොළ දීමනාව දෙගුණ කරන්න සමත් වෙලා තිබෙනවා. ඒ අනුව රුපියල් 5,000ට තිබුණු දීමනාව රුපියල් 10,000 දක්වා වැඩි කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ එක්කම වතු ආශ්‍රිත පාසල් සඳහා පහසුකම් සැලසීමට සහ සුහුරු පන්ති කාමර සැපයීමට අදාළ කටයුතු සඳහා රුපියල් බිලියන 1.9ක් අපි අධ්‍යාපනය ඇතුළේ වෙන් කරලා තිබෙනවා. ස්වයං රැකියා ප්‍රවර්ධනයටත්, වෘත්තීය අධ්‍යාපන ප්‍රවේශය සඳහාත් ව්‍යාපාර ආරම්භ කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 300ක් අපි මේ අය වැය ඇතුළේ වෙන් කරලා තිබෙනවා. මේ අය වැය ඓතිහාසික වන තවත් කාරණයක් මම මතක් කරන්නම්. පුනර්ජනනීය බලශක්තිය සඳහා පුහුණු කේන්ද්‍රයක් නිර්මාණය කිරීම සඳහා රුපියල් මිලියන 260ක් මෙවර අපි වෙන් කරලා තිබෙනවා. දුෂ්කර පාසල්වල දරුවන්ට පාවහන් මිලදී ගන්න, ලිපිද්‍රව්‍ය මිලදී ගන්න රුපියල් බිලියන 11.5ක් වියදම් කරන්න මේ අය වැය ඇතුළේ අපට හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය අංශයේ වැටුප් හා විශ්‍රාම වැටුප් පිළිබඳවත් පුංචි මතක් කිරීමක් කරන්නට අවශ්‍යයි. වැටුප් හා විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා කොමිෂන් සභාවක් නිර්මාණය කර, 2016න් පසු රාජ්‍ය සේවයට සම්බන්ධ වෙච්ච සියලුදෙනාටම පුරුදු විශ්‍රාම වැටුප තිබෙන රාජ්‍ය සේවයකට අනුයුක්ත වීමේ අවස්ථාවක් අපි හදලා තිබෙනවා. ඒ වාගේම 2020ට පෙර විශ්‍රාම ගිය අයගේ විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කිරීමේ අවස්ථාවත් අපි හදලා තිබෙනවා.

මේ අය වැය ඇතුළේ කියන්නට ඕනෑ තවත් වැදගත්ම කාරණයක් තිබෙනවා. ආර්ථිකය පිළිබඳව විශේෂඥතාවක් දක්වන අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමා -ඒ, මම ගරු කරන මන්ත්‍රීතුමෙක්. ඒ, එතුමාට සමහර කාරණා සම්බන්ධව තිබෙන දැනුම නිසා- යම් කාරණයක් මතු කළා, රාජ්‍ය සේවකයන්ට ලබා දෙන නිවාස හා දේපළ ණය සම්බන්ධව. ඒ සඳහා ආණ්ඩුව රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ඇත්තටම රජය විසින් මේ රුපියල් මිලියන 500ක මුදල වෙන් කර තිබෙන්නේ, ඔවුන්ට යම්කිසි සහනදායී පොලී අනුපාතයක් යටතේ ඔවුන්ගේ ණය අවශ්‍යතාව සපුරාගන්නයි. මොකද බැංකුව පැත්තෙන් යම් ණය මුදලක් නිදහස් කරනකොට, ආණ්ඩුව පැත්තෙන් ලබා දෙන්න සූදානම් වන්නේ ඇත්තටම ගනුදෙනුකරු විධියට, එහෙම නැත්නම් රාජ්‍ය සේවකයා විධියට බැංකුවට ගෙවන්න ඕනෑ පොලියට යම්කිසි සහනාධාරයක්. Interest subsidies කියලා ක්‍රමයක් තිබෙනවා, බැංකු ඇතුළේ. බැංකුවක වැඩ කරපු පුද්ගලයෙකු විධියට මගේ වෘත්තීය අත්දැකීම් ඇතුළේ එහෙම කාරණා තිබෙන බව මා දන්නවා. හැබැයි, ආර්ථිකය ගැන සඳහන් කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා යම්කිසි ඉලක්කම් ප්‍රමාණයක් කියලා, මෙච්චර රාජ්‍ය සේවකයන් පිරිසකට තමයි මේ ණය මුදල දෙන්න පුළුවන් වෙන්නේ කියලා ප්‍රකාශ කළා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. ඇත්තටම රුපියල් මිලියන 500ක් -රුපියල් ලක්ෂ 5,000ක්- වෙන් කර තිබෙනවා, රාජ්‍ය සේවකයන්ගේ ණය සඳහා, එහෙම නැත්නම් රාජ්‍ය සේවකයන් නිවසක් ඉදිකර ගැනීම සඳහා ලබා ගන්නා ණය වෙනුවෙන් පොලී සහනාධාරයක් ලබා දීමට. අඩු පොලියට බැංකුවෙන් ණය මුදල් දෙනකොට ඒකෙන් සිද්ධ වන අවාසිය සම්පූර්ණ කර ගැනීම සඳහා රජය විධියට අපි යම්කිසි මුදලක් ඒ බැංකුව වෙත ලබා දෙනවා. ඒ ගෙවීම් බැංකුවලට කරන්නේ දෛනිකව නොවෙයි. ආණ්ඩුව විධියට මාස 6කට වතාවක්, එහෙම නැත්නම් කාර්තුවකට වතාවක් තමයි ඒ ගෙවීම් කරන්නේ. ඒ කාරණා සලකා බැලුවාම ඇත්තටම සැලකිය යුතු රාජ්‍ය සේවකයන් පිරිසකට මේ ණය මුදල් ලබා දෙන්න මේ තුළින් අපට හැකියාව ලැබෙනවා.

[ගරු තිළිණ සමරකෝන් මහතා]

ඒ වාගේම ඊයේ මාධ්‍ය තුළින් මම දැක්කා, වතු සේවකයන්ගේ වැටුප් ප්‍රශ්නය යම්කිසි තැනකදී සාකච්ඡාවට ලක් වුණු ආකාරය. එහිදී සාකච්ඡාවට ලක් වුණා, රුපියල් 1,350ක්ව තිබුණු වතු සමාගම්වලින් ගෙවන දෛනික වැටුපට අපේ අය වැය තීරණයක් එක්ක වතු සමාගම් රුපියල් 200ක් වැඩිපුර ගෙවනකොට, යෝජනා කළ ඉතිරි රුපියල් 200 ආණ්ඩුව කොහොමද ගෙවන්නේ කියලා. ඒ පිළිබඳ ප්‍රශ්නයක් මතු කරනවා, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු. අපේ රටේ දුක් විඳින ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ තැනකට ගෙනෙන්නේ කොහොමද කියන එකට මැදිහත් වෙමින් තමයි එතුමන්ලා මේ ගැන කථා කරන්නේ. හැබැයි, ඒ වැටුපට ආණ්ඩුව පැත්තෙන් තවත් රුපියල් 200ක මුදලක් ගෙවීම නීත්‍යනුකූලද, නැද්ද කියලා අහනවා. ඒක නතර කරන්න තමයි ඔවුන්ගේ උත්සාහය තිබෙන්නේ. ඊයේ ඒ මාධ්‍ය සාකච්ඡාව ඇතුළේ අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ ගැන ප්‍රශ්න කළා, "මම අහනවා මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගෙන්, කොහොමද මේවා ගෙවන්නේ කියලා" යනුවෙන්. ඊට අමතරව තවත් මන්ත්‍රීවරයෙකුත් මේ සම්බන්ධව යම් අදහස් ප්‍රමාණයක් ප්‍රකාශ කර තිබෙනවා. ඇත්තටම වතු සේවකයන්ට අපි මේ අය වැය තුළින් යෝජනා කරපු මුදල ලබා දීම ක්‍රියාත්මක කරවන්න තමයි මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන් විධියට අපිත්, විපක්ෂයේ මන්ත්‍රීවරුත් යම් මැදිහත් වීමක් කරන්නට ඕනෑ, ඒකට උදවු කරන්නට ඕනෑ. එහි නීතිමය ගැටලුවක් තිබෙනවා නම් ඒක විසඳන්න අවශ්‍ය බලපෑමක් තමයි ඔවුන්ගේ පැත්තෙන් කරලා දෙන්න ඕනෑ. හැබැයි එහෙම කරනවා වෙනුවට මේ වැඩේ අනන්න, මේ වැඩේ ආපස්සට තල්ලු කරන්න තමයි මේ අය උත්සාහ කරන්නේ. ඇත්තටම මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් හරියට සොයා බලා තමයි මේ තීන්දු තීරණ අරගෙන තිබෙන්නේ. එම නිසා කිසි ගැටලුවක් නැතිව අපට පුළුවන්, වතු සේවකයන්ට රුපියල් 1,750ක මුදල වැටුප විධියට ඉදිරියේදී ලබා දෙන්න. ඊට අමතරව ඒ මන්ත්‍රීතුමා කියනවා, පැමිණීමේ දීමනාව ලබා ගන්න දින 25ක් සේවයට යන්න ඕනෑ කියලා. දින 25ක් නොවෙයි, පැමිණෙන හැම දවසකටම රුපියල් 200ක පැමිණීමේ දීමනාව එක් කරන්නට දැන් කටයුතු කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலின சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මට තව විනාඩියක් දෙන්න, පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

කැබ් රථ ගෙන්වීම පිළිබඳවත් ලොකු කතිකාවක් සමාජය තුළ මතු කර තිබෙනවා. ඇත්තටම මේ ගෙන්වන කැබ් රථවලින් යම් කිසි ප්‍රමාණයක් රජයේ ආයතන වෙත ලබා දෙන ගමන්, මන්ත්‍රීවරුන් 150කට, 160කට ආසන්න පිරිසකට අයිතිය හුවමාරු නොවන විධියට ඒ අදාළ කාල සීමාවේදී භාවිත කරලා නැවත භාර දෙන විධියට තමයි ඒවා දෙන්නේ. එතකොට මේ කාරණය සමාජයේ හරියට මතු කර ගන්න ඕනෑ; සමාජයට නිවැරදි තොරතුරු දෙන්න ඕනෑ. කුමන රාජ්‍ය ආයතනවලටද වාහන අඩු කියලා අහනවා. අපි එන්න කියනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට. එන්න, වනජීවී කාර්යාලවලට යමු, පශු වෛද්‍ය කාර්යාලවලට යමු, වන සංරක්ෂණ කාර්යාලවලට යමු, ප්‍රාදේශීය ලේකම්වරුන් මුණ ගැහෙමු, මහවැලි අධිකාරිය යටතේ පවතින ආයතනවලට යමු. එම ආයතනවල කොයි තරම් වාහන ප්‍රමාණයක් තිබෙනවාද, ඔවුන්ට කොයි තරම් ප්‍රමාණයක වාහන අවශ්‍යතාවක් තිබෙනවාද කියලා එතකොට හොයා බලන්න පුළුවන්. ඒ විධියට ගත්තාට පස්සේ මේ අය වැය ඇතුළේ මිනිස්සු වෙනුවෙන්, රජයේ සේවකයන් වෙනුවෙන්, ඒ වාගේම වනඅලි වාගේ සතුන්ගෙන් අපට දැඩි ගැටලුවක් වෙලා තිබුණු ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීම වෙනුවෙනුත් සැලකිය යුතු මුදල් ප්‍රමාණයන් වෙන් කරමින් සාර්ථක අය වැයක් බවට මෙවර අය වැය පත් කර තිබෙනවා. ඒක ක්‍රියාවට නැංවීම සඳහා ඔබ සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.55]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කරපු අය වැය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා අය වැය යෝජනාවලිය ඉදිරිපත් කළා. මම බොහොම වුවමනාවෙන් එතුමාගේ අය වැය යෝජනාවලියට ඇහුම්කන් දුන්නා, පැය හතරහමාරක්. මන්ත්‍රීවරු, ඇමතිවරු ඇතුළු ආණ්ඩුවේ ඉන්න 159දෙනා 83 වතාවක් අත්පුඩි ගැහුවා. එහෙම අත්පුඩි ගැහුවේ මොකද? මේ අය වැය යෝජනාවලිය තුළ යම් යම් සංවර්ධන කටයුතු වෙනුවෙන්, අනෙකුත් සමාජයීය කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 500ක්, රුපියල් බිලියන 2ක් වෙන් කළා කියනකොට මේ අය 83 වතාවක් අත්පුඩි ගැහුවා. අපිත් ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඉඳගෙන -අවුරුදු 25ක් තිස්සේ මම පාර්ලිමේන්තුවේ ඉන්නවා. මේ කථා කරන්නේ 25වැනි අය වැයට- අපේ ජනාධිපතිවරු කථා කරනකොට මේසයට තට්ටු කළා. මේසයට තට්ටු කළා විතරක් නොවෙයි, සමහර වෙලාවට අත්පුඩිත් ගැහුවා. එහෙමත් ගහලා අපිත් හිටියා හරි ගැම්මට. එහෙම ඉඳලා රෑ නිදාගත්තා. උදේ වෙනකල් දන්නේ නැහැ, එළි වෙනකොට අපේ ගෙවලුත් ගිනි තියලා. එහෙම දේවලුත් වුණා. මම මේ කියන්නේ, අපි නොහිතන දේවල් සිද්ධ වනවා කියලා. අපි හිතාගෙන ඉන්නවා, ගස්වල ගෙඩි එනවා, මල් පිපෙනවා, විල්ලුද පලස් තිබෙනවා කියලා. නමුත් හැම දෙයක්ම වෙන්නේ එහෙම නොවෙයි, අපි මේ ගැන අවබෝධයෙන් කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ එක්කම කියන්න ඕනෑ, බලය ලබා ගැනීමට තිබෙන හොඳම, තියුණුම ආයුධය බොරුව බව. හැබැයි, ලබා ගත් බලය ඉදිරියට පවත්වාගෙන යන්න ඒ ආයුධය පාවිච්චි කරන්න බැහැ. ඒ ආයුධය මිනිස්සු විශ්වාස කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සෙනසුරාදා ඉඳලා අද වන විට අපි දවස් තුනක් මේ විවාදය පැවැත්වූවා. එතකොට මේ විවාදයේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දැඩි ලෙස එල්ල වෙච්ච චෝදනාව මොකක්ද? විපක්ෂ නායකතුමාත් අද කිව්වා, 2025 වර්ෂයේ අය වැය ලේඛනයේ ඉදිරිපත් කරපු යෝජනාවලට අදාළ වියදම්වලින් සියයට 50කටවත් කිව්වු වෙලා නැහැ කියලා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මේකට හේතුව හොයන්න. සමහර විට

ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා විශ්වාස කරනවා නම්, විපක්ෂයෙනුත් මේ අය වැය ලේඛනයේ සඳහන් යෝජනා ඔක්කෝම හොඳයි කියාවි කියලා, ඒක එහෙම වෙන්නේ නැහැ. මොකද, මෙතැන ඉන්න බහුතරයක් තමුන්නාන්සේලා නියෝජනය කරන්නේ. මේ තමුන්නාන්සේලාගේ දෙවෙනි අය වැය. ඒ නිසා තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නවා, මේකේ තිබෙන ඔක්කෝම දේවල් හරි කියලා අපි ඔක්කෝම කියාවි කියලා. එහෙම හරියි කිව්වොත් ආණ්ඩුව වැරදි හදාගන්නේ නැහැ. ඒ නිසා අපි මේකේ තිබෙන වැරදි පෙන්වන්න ඕනෑ.

මතක තබා ගන්න, රාජ්‍ය සේවකයෝ දාහත් ලක්ෂයක් මේ රටේ ඉන්නවා කියන එක. මතක තබා ගන්න, මේ දාහත් ලක්ෂය වෙනුවෙන් 2026 වර්ෂයට රුපියල් බිලියන ගණනාවක් වෙන් කරලා තිබුණත්, 2026 දෙසැම්බර් 31වැනි දා වනකොට මේකෙන් සියයට 50ක්වත් ප්‍රතිශතයක් හැටියට ගන්න වෙන්නේ නැහැ කියලා. මොකක්ද හේතුව? නිලධාරින් භය කරලා තිබෙන්නේ. ඒ නිසා නිලධාරින් තීන්දු ගන්නේ නැහැ. ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඳන් ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා වූ ආයතනවල නිලධාරින් බලනවා, වැරදි අත්සනක් යොදා සද්භාවයෙන් වැඩේ කළත් යම් වෙලාවක අපි මොකකට හෝ අහු වුණාම අප බේරා ගන්න කවුරුවත් නැහැ කියලා. එම නිසා තමයි 2025 වර්ෂයට වෙන් කළ මුදල් ටික ඉතුරු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් පසුගිය අය වැයෙන් වාගේම ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ජනතාවට ලබා දුන් පොරොන්දු තිබුණා. විශේෂයෙන්ම අපි බැලුවා, ඒ පොරොන්දු ඉටු කිරීම ගැන. තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුව ජනප්‍රියභාවයෙන් ඉහළටම ගිය ආණ්ඩුවක්; වැඩිම ඡන්ද ප්‍රමාණයක් ගත්ත ආණ්ඩුවක්. අවුරුද්දයි, මාස දෙකකට ආසන්න කාලයක් ගත වනකොට කවුද මේ ආණ්ඩුවට විරුද්ධව යන්නේ? ඊයේ පෙරේදා වනකොට ගොවි ජනතාව පාරට බැහැලා. ලූනු ගොවියා, වී ගොවියා, අල ගොවියා හා උක් ගොවියා කියන ඔක්කෝම පාරට බහිනවා. ඒ ඔක්කෝම කවුද? ඒ අල ගොවියෝ කවුද? ගිහිල්ලා ගෙඩිය පිටින් මාලිමාවට ඡන්දය දීපු අය. ඒ ලූනු ගොවියෝ කවුද? ගෙඩි පිටින් මාලිමාවට කතිරය ගහපු අය. උක් ගොවියෝ කවුද? මොනරාගල පැත්තෙන් ගෙඩි පිටින් මාලිමාවට ඡන්ද පුරෝලා දීපු අය. ඒ ඡන්දය දීපු අය ඇයි ඔබට විරුද්ධව යන්නේ? ඔවුන් ඔබට විරුද්ධව යන්නේ ඇයි කියන එක තමයි ඔබ දැනගන්න ඕනෑ. මේ පැත්තේ විවේචන අහගෙන ඉන්න කියලා මම කියන්නේ ඒකයි. ඒක තමයි සමහර විට ඇත්ත. හැබැයි, ඒක තමයි තිත්ත. හැබැයි, ඒවා අහගෙන ඉන්න පුරුදු වෙන්න ඕනෑ. ඒකෙන් තමයි වැරැද්ද හදා ගන්න පුළුවන් වෙන්නේ. ගොවි ජනතාව ආණ්ඩුවට විරුද්ධව පාරට බහිනවා. වෙන කවුද පාරට බහින්නේ? ගුරුවරු, විදුහල්පතිවරු, උපාධිධාරින් සහ ධීවර ජනතාව. ඒ ඔක්කෝම කවුද? ඒ ඔක්කෝම මාලිමා ආණ්ඩුවක් බලයට ගෙනෙන්න වැඩ කළ මිනිස්සු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් ඒ අයගේ ප්‍රශ්නය මොකක්ද කියලා අපි අහන්න ඕනෑ.

ඊළඟට, ත්‍රිරෝද රථ රියදුරන් ගනිමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නම් කියන්නේ ලංකාවේ හොඳටම මැතිවරණ ප්‍රචාරණය කරන මිනිසුන් ඒගොල්ලන් කියන එකයි. පසුගිය මැතිවරණයට ඉස්සෙල්ලා ත්‍රී වීලරයකට කවුරු හෝ නැහලා, රූං රූං ගගා යන ගමන්, කොහොමද ආණ්ඩුව කියලා ඇහුවාම මොකක්ද කිව්වේ? අපෝ ඉවරයි. අපි තෙල් පෝලිමේ තැබුවා. මේ අය රට කෑවා. ඉවර කරනවා කියලා තමයි කිව්වේ. එහෙම කියලා මුළු රටම මාලිමාවට කිව්වා; "අපි ඔක්කෝම මාලිමාවට" කියලා තමයි කිව්වේ. එහෙම නේද මන්ත්‍රීතුමා කිව්වේ? ඔව් එහෙමයි කිව්වේ. ඒ ගැන මතක් කරලා බලන්නකෝ. හැම three-wheeler park එකකම තිබුණු හැම ත්‍රී වීලර් එකකම එහෙම ගහලා තිබුණා. දැන් ත්‍රී වීලරයකට නඟින්න. තමුන්නාන්සේලාට ත්‍රී වීලරයකට නැහලා යන්න පුළුවන්. මොකද, ඒ අය තමුන්නාන්සේලාව වැඩිය හඳුනන්නේ නැහැ. අපි තමයි හඳුනන්නේ. දැන් ත්‍රී වීලරයකට නැහලා පොඩ්ඩක් අහන්න, කොහොමද තත්ත්වය කියලා. පොඩ්ඩක් අහලා බලන්න, තත්ත්වය කොහොමද කියලා. පොළොවේ තත්ත්වය මොකක්ද කියලා බලන්නකෝ. දැන් කියනවා, මුළු රටම මාලිමාවට බණිනවා කියලා. එහෙමයි කියන්නේ. දැන් රටම එක මිටට මාලිමාවට බණිනවා. ඉතින් අපි දැන් කියන්නේ, මේ මිනිසුන්ට ඇහුම්කන් දෙන්න කියායි. හැම කෙනෙක්ම මේ විවේචනවලට මුල් වෙලා තිබෙනවා. එම විවේචන ගැන තමුන්නාන්සේලා තර්කානුකූලව බලන්න. මොකද, ඔබේ ආණ්ඩුවේ ජනප්‍රියභාවය ආරක්ෂා කිරීමේ වගකීම ඔබට තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා කල්පනා කරන්න වෙනවා, ඔබතුමන්ලාගේ ජනප්‍රියභාවය අඩු වෙලා කියලා මොන කෝඩුවෙන්ද මැන ගන්නේ කියලා. සමාජ තලයට බැහැලා, පොළොවට බැහැලා එය මිනිසුන්ගෙන් මැන ගන්න ඕනෑ. තමුන්නාන්සේලා හමු වෙන්න එන කෙනෙක් නම් කවදාවත් කියන්නේ නැහැ, "පිස්සු ද, තමුන්නාන්සේලාට බණිනවාද?" කියලා. මොකද, ඒ අය ඔබතුමන්ලාට කියලා මොකක් හෝ වැඩක් කර ගන්න නේ එන්නේ. ඒ හින්දා කියනවා, "අනේ ඔව්. මිනිස්සු හරි සතුටින් ඉන්නවා" කියලා. හැබැයි, ඒ ගමන්ම මොකද වෙන්නේ? අවුරුද්දයි මාස ගණනක් රට පාලනය කරලා, මෙච්චර හොඳ අය වැයක් ගෙනැල්ලා, දැන් සිද්ධ වෙලා තිබෙන දේ බලන්න.

ජීවත් වීමට වියදම් අධික රටවල් අතරින් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ දෙවන ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. මේ, 2025 ඔක්තෝබර් 31වැනි දා "ද ඩේලි මිරර්" පත්තරේ පළ වූ ලිපියක්. ජීවත් වීමට වැඩිම වියදම් දරන රටවල් අතරින් දකුණු ආසියාවේ දෙවැනියාට ඉන්නේ ලංකාව. අර කියපු විධියට මිනිසුන්ට හොඳක් වෙලා තිබුණා නම් මෙහෙම වනවාද? එහෙම වෙන්නේ නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හොඳ නම් එහෙම වෙන්නේ නැහැ නේ. මේක අපි ලියපු ලියවිල්ලක් නොවෙයි නේ. එම නිසා මේ ගැන බලන්න සිද්ධ වනවා.

මට මතකයි, පසුගිය කාලය. අපට වෙච්ච දේවල් මේ කියන්නේ. මතකද, අප නැති කරන්න මුලින්ම පටන් ගත්තේ කොතැනින්ද කියලා? ඒ සමුපකාර ඡන්දයෙන්. අපට මිනිසුන් දීගෙන දීගෙන ගියේ, අප මුලින්ම පැරැද්දුවේ සමුපකාර ඡන්දයෙන්; තිබෙන පුංචිම ඡන්දයෙන්. ගමේ පණිවුඩය එන තැනින් අප පැරැද්දුවා; සමුපකාර ඡන්දයෙන් පැරැද්දුවා.

ඉස්සෙල්ලාම සිල්ලරට පැරැද්දුවා. ඊට පස්සේ තොගයට පැරැද්දුවා. එහෙම පරද්දලා අන්තිමට ආණ්ඩුවත් නැහැ, ජනාධිපතිත් නැහැ, ගෙවලුත් නැහැ, මොකුත් නැතුව ඉවර කරලාම දැම්මා. දැන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? පසුගිය දිනවල පැවති සමුපකාර ඡන්දවලින් ආණ්ඩුව පැරදුණේ මොන සමුපකාරවල ඡන්දයද? උඩුනුවර, නිවිතිගල, ගලගෙදර, බද්දේගම, ලියනගේමුල්ල, ගම්පොල පැරදුණා. ඊයේ පෙරේදා බෙරලපනාතර පැරදුණා, මේ සමුපකාර ඡන්දයෙන්. මේක එච්චර හොඳ නැහැ නේ. මේ පණිවුඩය සුබවාදී පණිවුඩයක් නොවෙයි. මේක හරියට පෙරහැර එනකොට කසකාරයා මුලින් එනවා වාගේ තමයි. එතකොට දන්නවා, පෙරහැර එනවා කියලා. ඒ නිසා මේ සමුපකාර ඡන්ද පරදින එක ගැන පොඩ්ඩක් හිතන්න. එහෙම හිතුවේ නැත්නම් තමුන්නාන්සේලාට කල්පනා කරන්න වෙයි, අපි මිනිස්සුන්ට ඇහුම්කන් දුන්නේ නැති නිසා තමයි මේ තත්ත්වය ඇති වුණේ කියලා. ඔබතුමන්ලා වාගේම අපි දන්නවා, සමහර ප්‍රාදේශීය සභාවල විපක්ෂයේ මන්ත්‍රීන් සංඛ්‍යාව වැඩියි, ආණ්ඩුවේ මන්ත්‍රීන්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

සංඛ්‍යාව අඩුයි කියලා. විපක්ෂයෙන් කවුරු හරි අරගෙන සභා හැදුවා. ඒක කොළොන්නෙන් පටන් ගත්තා; කොළොන්න පරාජය වුණා. දැන් ඒකත් පෝලිමට යයි. ඒක හින්දා දැන්ම ඔය මන්ත්‍රීවරු ටික අල්ලාගෙන, සභා ටික ආරක්ෂා කර ගන්න. මොකද, ඒ පරාද වන එක ආණ්ඩුවට හොඳ නැහැ. පොඩි තැනට වදිනකොට තමයි ලොකු තැනට දැනෙන්නේ. ඒ ගැන කල්පනා කරන්න කියලා තමුන්නාන්සේලාට අපි යෝජනා කරනවා. මේ හැම දෙයක්ම යෝජනා. ඒ වාගේම ජනාධිපතිතුමා මේ රට සංවර්ධනය කරන්න යෝජනා කරන ඒ හැම දෙයකටම අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. ජනාධිපතිතුමා එදා අය වැය කථාව ඉදිරිපත් කරමින් කිව්වා, කොළඹ තිබෙන මාර්ග තදබදය අවම කිරීම වෙනුවෙන් ගෝල්ෆේස් හෝටලය ළඟ ඉඳලා මුහුදෙන් පාරක් හදාගෙන යනවා කියලා. ඒක මේ ලියවිල්ලේත් තිබෙනවා. ඒක වෙන්න ඕනෑ දෙයක්. මොකද, ගාලු පාරේ, Marine Drive එක දාලාත් මහ තදබදයක් තිබෙනවා. ඒ පාර යන්නේ කොහොමද? ගෝල්ෆේස් හෝටලය ළඟ ඉඳන් මුහුදෙන්, කණු මතින් හෝ එහෙම නැත්නම් වෙන යම් විධියකට.

මට මතකයි, මම මහාමාර්ග ඇමතිවරයා හැටියට ඉන්නකොට වරාය මැදින් කුලුනු මත එන මාර්ගය ගෝල්ෆේස් එක ළඟට ඇවිල්ලා, එතැනින් පල්ලෙහාට අරගෙන ගෝල්ෆේස් එක යටින් ටියුබ් එකක් වාගේ තමයි යන්න තීන්දු කරලා තිබුණේ. දැන් මේ යෝජනාව ක්‍රියාත්මක වෙන එක හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව වෙනුවෙන් අපි විපක්ෂයේ ඉඳගෙන අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. එදා වරාය භාර ඇමතිවරයා විධියට මමත්, ජනාධිපතිවරයා විධියට මහින්ද රාජපක්ෂ මැතිතුමාත් චීන ජනාධිපතිවරයා සමඟ ඇවිල්ලා, Colombo Port City එක ආරම්භ කරන්න මුල්ගල තැබුවා. Colombo Port City එක ආරම්භ කරන්න මුල්ගල තියනකොට එදා මොකක්ද කිව්වේ? ඒ හඬ පට තිබෙනවා. දැන් ඒවා කියන්න ඕනෑ නැහැ. "අක්කර 575ක් ගොඩ කරනවා. අක්කර 575ක් ගොඩ කරනකොට පතුල අක්කර 1,000ක්වත් තියෙන්න ඕනෑ. පතුල අක්කර 1,000ක් ගොඩ කරන්න ගල් කියුබ් කෝටි 12ක් ඕනෑ. මේකට ගල් කඩලා කඩලා අන්තිමට සීගිරි ගලත් කඩන්න වෙනවා" කියලා තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා එදා කිව්වා. මම ඒකයි කියන්නේ ආණ්ඩුවේ ඉන්නකොටත්, විපක්ෂයේ ඉන්නකොටත් අපි කියන දේ එකක් වෙන්න ඕනෑ කියලා. මොකද, ඉස්සර වාගේ නොවෙයි දැන් තාක්ෂණය දියුණුයි, ඔක්කෝම නැවත බලන්න පුළුවන් නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් Colombo Port City එක හදලා ඉවරයි. නමුත්, සීගිරි ගලට තට්ටු වෙලා නැහැ. හෙලිකොප්ටර් එකකින් යනකොට පේනවා, ලංකාවේ අහස උසට ගල් කඳු තව ඕනෑ තරම් තිබෙන බව. හැබැයි, මම මේක කිව්වේ ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ගරු ජනාධිපතිතුමා මේ සභාවේදී කිව්වා, "අපි 2026ට ආයෝජන ගේනවා. ඇමෙරිකාවෙන් US Dollars 1.2 billion ගේනවා. අපි ඒ ආයෝජන ගේන්නේ Colombo Port City එකට" කියලා. මේවා ගැන තමයි කථා කළේ. ඒකයි මම කියන්නේ. අපි අද, එදා ඔබ විපක්ෂයේ ඉඳගෙන කරපු දේ කරන්නේ නැහැ. ඔබතුමන්ලා කරපු විධියට අපි සංවර්ධනයට බාධා කරන්නේ නැහැ. ඒවා විවේචනය කරන්නේ නැහැ. දැන් හෝ තමුන්නාන්සේලා හොඳ දෙයක් කරනවා නම් ඒකට අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.

අපි දැන් පළාත් සභා ඡන්දය ගැන බලමු. එදා අය වැය යෝජනාවලිය ඉදිරිපත් කරනකොටම පළාත් සභා ඡන්දය නම් තියන්නේ නැහැ කියලා මට නම් තේරුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තියන්නේ නැහැ. අපට මේ පාර්ලිමේන්තුවෙන් මැතිවරණ සෙල්ලම් දාපු විධිය හොඳට පුරුදුයි. පළාත් සභා ඡන්දය තියන්නේ නැති විධියට තමයි එදා ජනාධිපතිතුමා කථා කළේ, මේ පැත්තට විහිළුවකුත් කරලා. 2017දී පැවතියේ යහ පාලන ආණ්ඩුව. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා. එදා අපි මේ පැත්තේ - විපක්ෂයේ. එදා යහ පාලන ආණ්ඩුව රු. 10.00 විතර වෙනකම් පුදුම දූකක් විඳලා, හෙලිකොප්ටර් යවලා මන්ත්‍රීවරු ගෙන්වලා පළාත් සභා ඡන්දය හැංගුවා. හැංගුවා කියන්නේ, ඒක දැන් ගල් ගුහාවකට දමලා වහලා තිබෙනවා වාගේයි. ඒක අරින්න බැහැ, ඇමතිතුමා. දැන් ඒක ගල් ගුහාවකට දමලා වහලා. හැබැයි, පළාත් සභා ඡන්දය මේ රටින් සම්පූර්ණයෙන්ම අයින් කරන්න, අදටත් එම ඡන්දය නැති කරන්න හේතු වුණේ කවුරු, කවුරුන්ද? මුල් වුණේ යහ පාලන ආණ්ඩුව. ඒකට ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ සහයෝගය ලැබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් තව විනාඩි 2ක් ලබා දෙන්න, අර ලක්මාලි මන්ත්‍රීතුමියට දුන්නා වාගේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් ලබා දෙන්නම්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
විනාඩි 2ක් ලබා දෙන්න. පව් නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 2ක් ලබා දෙන්න අමාරුයි. විනාඩියක කාලයක් ලබා දෙන්නම්, ඔබතුමාට.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
හොඳයි, thank you. *[බාධා කිරීමක්]* මම බැලුවේ ඉතින් කාන්තාවකට වේලාව ලබා දුන් නිසා -*[බාධා කිරීමක්]* Ladies firstනේ. මට විනාඩි එකහමාරක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටියේ පළාත් සභා ඡන්දය හංගපු විධිය. දැන් ගරු ජනාධිපතිතුමා කියනවා, විපක්ෂය එක්කාසු වෙනවා කියලා. එතකොට එදා මොකද කළේ? එදා පැවැති අපේ ආණ්ඩුව පෙරළා දමන්න මේ ඔක්කෝම එක්කාසු වුණා. අපේ මහලේකම් අරගෙන නේ, ආණ්ඩුව පෙරළා ගත්තේ. මෛත්‍රීපාල සිරිසේන අරගෙන නේ. එතුමා අරගෙන රනිල් වික්‍රමසිංහ මැතිතුමායි, ජනතා විමුක්ති පෙරමුණයි ඔක්කෝම එකතු වෙලා තමයි අපේ ආණ්ඩුව පෙරළා ගත්තේ. එහෙම තමයි, ආණ්ඩුවක් කරගෙන යනකොට විපක්ෂය එකතු වෙනවා. හැබැයි, එතකොට ආණ්ඩුව කරන්න ඕනෑ මොකක්ද? තමන්ගේ ආණ්ඩුවේ ශක්තිමත්භාවය ඉදිරියට අරගෙන යන්න ඕනෑ. මම හිතන විධියට ඒක තමයි අනිවාර්යයෙන්ම කළ යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු මොන විධියට කිව්වත්, එදා -2005ත් 2015ත් අතර කාල වකවානුව තුළ- මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කළ වැඩ කොටස බලන්න. ඉතිහාසයේ මේ රටේ සිටි ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල, ආර්. ප්‍රේමදාස, ජේ.ආර්. ජයවර්ධන කියන නායකයන් ඔක්කෝම වැඩ කර තිබෙනවා. වැඩ නොකර සිටියේ නැහැ. ඒ හැම කෙනෙක්ම වැඩ කර තිබෙනවා. හැබැයි, අපට දැන් අමතක වුණාට, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටේ පැවැති යුද්ධයකුත් අවසන් කරලා, අද බැණ බැණ යන්න හරි අධිවේගී මාර්ගත් හැදුවා, විකුණා ගෙන කන්න හරි වරායවල් හැදුවා, විදුලි බලාගාර හැදුවා. ඒ වාගේ නොයෙක් දේවල් එතුමාගේ පාලන කාලය තුළ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කියන්න කැමැතියි, මේ අය වැය හොඳට යනවා නම්, අපේ පූර්ණ සහයෝගය ලබා දෙන බව. හැබැයි, ඔබට කල්පනාවෙන් වැඩ කරන්න වෙයි. මොකද, කල්පනාවෙන් වැඩ නොකළොත් අපට වාගේම අනෙක් පැත්ත හැරිලා ගෙදර යන්නත් වෙයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) ක්‍රිශාන්ත අබේසේන අමාත්‍යතුමා. ඔතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

**ගරු (මහාචාර්ය) ක්‍රිශාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන්නේ අපේ ආණ්ඩුවේ දෙවැනි අය වැය. අපි මේ ආණ්ඩුව ගනිද්දී අපේ රටේ ඩොලර් තිබුණේ නැහැ. ඩොලර් හිඟයක් තිබුණේ. රුපියල් තිබුණේත් නැහැ. ඒ වාගේම මේ රටට පැමිණි ආයෝජකයෝ රට තුළ ආයෝජන නොකර ආපසු හැරී ගියා. ඒ කියන්නේ අපිට භාර ගන්න වුණේ නැවතුණු රටක්. අන්න එහෙම රටක් භාරගෙන තමයි මේ වෙනකොට අපේ භාණ්ඩාගාරය අපි පුරවා තිබෙන්නේ.

අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු අපේ රට දේශපාලන වශයෙන් ස්ථාවරභාවයට පත් වුණා. අවුරුදු ගණනක් එහෙම නැතුව සිටියේ. මේ වෙනකොට අපේ රට යම් මට්ටමකට ආර්ථික වශයෙනුත් ස්ථාවරභාවයට පත් වෙලා තිබෙනවා. අද වෙනකොට ඩොලර් බිලියන 6කට වැඩි සංචිතයක් තිබෙනවා; රුපියල් ට්‍රිලියනයකට වඩා තිබෙනවා. දැන් අහනවා, මේවාට මොකද කරන්නේ කියලා. හැබැයි, ඊට කලින් අපි අහන්න ඕනෑ, දැන් පවතින්නේ අපේ ආණ්ඩුව නොවෙයි නම්, මොකක්ද වෙන්නේ කියලා. අද තිබෙන්නේ අපේ ආණ්ඩුවක් නොවෙයි නම්, මේ විධියට මේ මුදල් තියේවිද? තියෙන්නේ නැහැ. අපි නාස්ති කරන්නේ නැහැ. අපි හොරා කන්නේ නැහැ. අපි ගජමිතුරන්ට බදු සහන දෙන්නේ නැහැ. අපි අපේ උපරිම කාර්යක්ෂමතාවෙන් වැඩ කරනවා. බදු නොගෙවන්නන්ගෙන් බදු එකතු කරනවා. අද වනවිට ලක්ෂ 3කට වඩා අලුතින් බදු ගෙවන්නන් එකතු වෙලා ඉන්නවා. අන්න එහෙම කාර්යක්ෂම වෙලා තමයි අපි භාණ්ඩාගාරය පුරවා තිබෙන්නේ.

හැබැයි, භාණ්ඩාගාරය පුරවලා විතරක් මදි. අපිට ඉස්සරහට ගමනක් යන්න තිබෙනවා. අපි ආර්ථිකයට හොඳ අත්තිවාරමක් දමා තිබෙනවා. ගොඩනැඟිල්ලක වුණත් හොඳ අත්තිවාරමක් නැතුව උඩ තට්ටුවක් හදන්න ගියොත්, ඒක කඩාගෙන වැටෙනවා. අපේ රටේ රාජ්‍ය සේවකයෝ ඉන්නවා, ගොවීන් ඉන්නවා, ජනතාව ඉන්නවා. ජනතාවට සහනාධාර දෙන්න ඕනෑ. නමුත් ජනතාවට සහනාධාර දෙන්න නම්, වෘත්තිකයින්ට පහසුකම් දෙන්න නම්, හොඳ ආර්ථිකයක් තිබෙන්න ඕනෑ. අන්න ඒ ආර්ථික ස්ථාවරභාවය තමයි අපි හදාගෙන තිබෙන්නේ. කොහොමද ඒ? අපට හොඳ මූල්‍ය විනයක් තිබුණා. අපේ කාර්යක්ෂමතාව හොඳටම හොඳයි. අපි මේ තත්ත්වය තව ඉස්සරහට ගෙනියන්න ඕනෑ. අපි දැන් මේ ක්‍රමය හොඳ රේල් පාරකට දමාගෙන තිබෙනවා. අපිට හොඳ එන්ජින් එකක් තිබෙනවා. මේ ගමන හරි දිශාවට යන්න නම්, තව තවත් අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න වෙනවා. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ අපේ දේශීය ආර්ථිකය වර්ධනය කරන්න ඕනෑ කියලා.

දේශීය ආර්ථිකය ගැන කථා කරනකොට, මා සඳහන් කරන්න කැමැතියි, පර්යේෂණ වාණිජකරණය කිරීම සඳහා අපි බිලියන 1.2ක් වෙන් කර තිබෙන බව. අපි පර්යේෂණ කළාට වැඩක් නැහැ, ඒවා වාණිජකරණය වෙන්නේ නැත්නම්. ඒ වාගේම විද්‍යා සම්පත් මධ්‍යස්ථාන හරහා විද්‍යා වැඩ පිළිවෙළට වැඩි මුදල් ප්‍රමාණයක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ විද්‍යා වැඩ පිළිවෙළේ මුදල් වැය කරන්නේ, ගමට තාක්ෂණය ලබා දීලා ගමේ ඉන්න සුළු කර්මාන්තකරුවන් ඉහළ නංවන්න. එතැනින් තමයි අපේ රට ළඟා කර ගත් ආර්ථික වර්ධනය ගමට ගෙනියන්නේ.

ඒ වාගේම අද අපේ රට ආයෝජනවලට හොඳ තෝතැන්නක් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව යටතේ ආයෝජන වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම කර්මාන්ත කලාප ඇති කරලා තිබෙනවා. කර්මාන්ත කලාපවලට රුපියල් මිලියන 5,000කට වඩා මෙවර අය වැයෙන් වෙන් වෙලා තිබෙනවා. තොරතුරු තාක්ෂණය වෙනුවෙනුත් වැඩිපුර මුදලක් වෙන් කරලා තිබෙනවා. මෙහෙම තමයි අපි ආර්ථිකය හදන්නේ. නමුත්, අපේ ආණ්ඩුවක් තිබුණේ නැත්නම් මොනවා වේවිද? මොකක්ද ඉස්සර කළේ? අපේ රටේ සම්පත් කුණු කොල්ලයට විකුණලා ඒවායෙන් කකා හිටියා. ඒ විතරක් නොවෙයි. ඩීල් දමලා, හොරකම් කරලා දේශපාලනඥයන් තමයි පොහොසත් වෙලා හිටියේ. අද මෙතැන ඉන්න අපේ කවුරුවත් පොහොසත් නැහැ. ඒ අයට සල්ලි තිබෙන එක ඇත්ත. නමුත්, හොරා කාලා පොහොසත් වෙලා නැහැ. එහෙම සංස්කෘතියක් අපි හදලා තිබෙනවා.

අපට අවශ්‍ය වෙනවා, නිෂ්පාදන ආර්ථිකය වර්ධනය කරන්න. නිෂ්පාදන ආර්ථිකය වර්ධනය කරලා විතරක් මදි. අපට අවශ්‍ය වෙනවා, අර කිව්වා වාගේ අපේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න කාර්යක්ෂම රාජ්‍ය සේවයක්. ඒ නිසා තමයි අපි බඳවා ගැනීම් සිදු කරන්නේ. අපේ රටේ ආර්ථික තත්ත්වයත් එක්ක රාජ්‍ය සේවයට නිලධාරින් බඳවා ගත්තේ නැහැ. ඒක නවත්වලා තිබුණා. නමුත් දැන් අපි බඳවා ගන්න පටන් ගෙන තිබෙනවා. අපි දැනටමත් 75,000කට අධික සංඛ්‍යාවක් රාජ්‍ය සේවකයන් හැටියට බඳවා ගැනීමට කටයුතු කරමින් තිබෙනවා. අනවශ්‍ය විධියට රාජ්‍ය සේවයට නිලධාරින් බඳවා ගන්න අවශ්‍ය නැහැ. අනවශ්‍ය විධියට රාජ්‍ය සේවයට බඳවා ගැනීම් කළොත් අය වැය balance නැතිවෙලා නැවත රට කඩා වැටෙන්න පුළුවන්. ඒ නිසා ක්‍රමානුකූලව තමයි අපට රාජ්‍ය සේවයට බඳවා ගන්න වෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩි කළ යුතුයි. ඒ නිසා තමයි ගියවර අය වැයෙන් වැඩි මුදලක් රාජ්‍ය සේවකයන්ගේ පඩි නඩි වෙනුවෙන් වැය කළේ. 2025 අය වැය

[ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

මගින් පඩි වැඩි කළා. වෘත්තිකයන් කවුරුවත් පඩි වැඩි කරන්න කියලා ඉල්ලීම් කළේ නැහැ. ඒ කවුරුවත් කෑ ගැහුවේ නැහැ. නමුත් අපි පඩි වැඩි කළා. ඇයි ඒ? අපට අවශ්‍යයි, රාජ්‍ය සේවය කාර්යක්ෂම කරන්න. රාජ්‍ය සේවකයා තෘප්තිමත් නැත්නම් හරියට වැඩක් කෙරෙන්නේ නැහැ. අපි දන්නේ නැහැ, දැන් රාජ්‍ය සේවයේ කොයිතරම් දුරට වැඩ වෙනවාද කියලා. පැය දෙකක් වැඩ කරපු කෙනා දැන් පැය හයක්, අටක් වැඩ කරනවාද කියලා අපි දන්නේ නැහැ. මම කියන්නේ නැහැ, පඩි වැඩි කරපු පළියට එහෙම වෙලා කියලා. තවම ප්‍රශ්න තිබෙනවා. නමුත්, අපේ උත්සාහය තිබුණේ පඩි වැඩි කරන්න. අපි පඩි වැඩි කළා. අපි 2025 අප්‍රේල්වල පඩි වැඩි කරපු වෙලාවේ කිව්වා, අපි නැවත 2026 ජනවාරිවල පඩි වැඩි කරනවා කියලා. මෙවර අය වැයෙනුත් රුපියල් බිලියන 110ක් වෙන්කරලා තිබෙනවා, රාජ්‍ය සේවකයාගේ පඩි ගෙවන්න. සියයට 30කින් නැවත පඩි වැඩි වෙනවා. අපි ගියවර සියයට 30ක් වැඩි කළා. ඉතුරු සියයට 70 දෙකට බෙදලා, 2026 ජනවාරි සහ 2027 ජනවාරිවල පඩි වැඩි කරන්න තමයි අපි කටයුතු කළේ. ඉතින්, අපි රාජ්‍ය සේවකයාට සලකලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි ගියපාර extra duty, OTවල අනුපාතය අඩු කළාට, අපි ඒ අනුපාතය ගණන් බැලුවේ 2027 ලැබෙන පඩියට. නමුත් ගියපාර අය වැයෙන් පස්සේ මොකද වුණේ? විපක්ෂයේ සමහර අය රාජ්‍ය සේවකයන් social media හරහා ඇවිස්සුවා. මේක වැඩි වෙන්නේ නැහැ, මේක විජ්ජාවක් කිව්වා. හැබැයි, රාජ්‍ය සේවකයන් දැන ගත්තා, අප්‍රේල් මාසය අවසානයේ පඩිය ගනිද්දී ඒගොල්ලන්ගේ පඩිය වැඩිවෙලා කියලා. ඒ විධියටම ජනවාරි මාසයේ පඩිය ගන්නකොටත් රාජ්‍ය සේවකයාගේ පඩිය වැඩිවෙලා තිබෙනවාමයි.

ඒ විතරක් නොවෙයි. අපි තවත් ගොඩක් දේවල් කළා. අපි ගියපාර අය වැයෙන් මූලික වැටුප වැඩි කළා විතරක් නොවෙයි, වාර්ෂික වැටුප් වර්ධකය සියයට 80කින් වැඩි කළා. ඒ වාගේ ගියපාර අය වැයෙන් කරපු දේවල් ගොඩක් තිබෙනවා. හැබැයි අපේ ආණ්ඩුවක් තිබුණේ නැත්නම් මෙහෙම පඩි වැඩි කරයිද? මෙහෙම පඩි වැඩි වෙන්නේ නැහැ. ඒගොල්ලන්ට පඩි වැඩි කරන්න plan එකක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි රට කඩාගෙන වැටුණේ. අද විපක්ෂයේ මන්ත්‍රීවරු දූප්පත්කම ගැන කථා කරනවා. දූප්පත්කම ඇති කළේ කවුද? රට හිඟන තත්ත්වයට පත් කළේ කවුද? ඒ නිසා තමයි අපි කිව්වේ, අපේ macroeconomy එක ඉස්සෙල්ලාම හදා ගන්න ඕනෑ කියලා. ඒක හදලා තමයි ගමට ආර්ථික ප්‍රතිලාභ ගෙනියන්න ඕනෑ. දැන් අපි කරමින් ඉන්නේ ඒක. ඒ නිසා තමයි අපේ නොයෙකුත් ග්‍රාමීය ව්‍යාපෘතිවලට, - "ග්‍රාම ශක්ති" වැඩසටහන ඇතුළු ගොඩක් ව්‍යාපෘතිවලට - මුදල් වියදම් කරන්න අපි දැන් තීරණය කරලා තිබෙන්නේ.

ඒ වාගේම තවත් දෙයක් කියන්න ඕනෑ. දැන් සමහර අය කියනවා, අපි වාහන මිල දී ගන්න මිලියන 12,500ක් වියදම් කරනවා කියලා. ඇයි අපි වාහන මිල දී ගන්නේ? වාහන මිල දී ගන්නේ අද වනකොට අපේ රාජ්‍ය ආයතනවල වාහන නැති නිසා. වාරිමාර්ග ක්ෂේත්‍රය ගත්තොත්, ඒවාට අදාළ වැඩ කරන්න අවශ්‍ය යන්ත්‍රෝපකරණ නැහැ. අර කිව්වා වාගේ පරිසර අමාත්‍යාංශය, වනජීවී අමාත්‍යාංශය, අපේ අමාත්‍යාංශය ඇතුළු හැම අමාත්‍යාංශයකම පාහේ වාහන නැහැ. වාහන නැත්නම් කොහොමද වැඩ කරන්නේ? රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩි කරන්න ඒවා අවශ්‍යයි.

විපක්ෂය දැන් කියනවා, අපි ව්‍යාපෘති කරලා අඩුයි කියලා. ව්‍යාපෘතිවලින් කරපු ප්‍රතිශතය අඩු වෙන්න පුළුවන්. හැබැයි, ඒක විතරක් මදි. අපි ව්‍යාපෘතිවලට කොච්චර මුදලක් වැය කළාද කියලාත් කියන්න වෙනවා. ව්‍යාපෘතියක් සඳහා පොඩි ගණනක් වැය කළොත් ඒකෙන් සියයට 99ක් වියදම් කරන්නත් පුළුවන්. අනෙක් අතට, අපට ඒ වැඩ කරන්න තිබුණේ මාස අටයි. මොකද, 2025 අය වැය සම්මත කළේ මාර්තු මාසයේ. පළාත් පාලන ඡන්දයටත් මාස දෙකක් විතර ගියා. එතැනදීත් වැඩ කටයුතු නැවතුණා. එහෙම ගත්තොත්, වැඩ කරන්න තිබුණේ මාස 6යි. මාස 6 ප්‍රගතිය තමයි මේ. ඉතිහාසය ගත්තොත්, මීට වඩා අඩු ප්‍රතිශත වියදම් කරපු වර්ෂ තිබෙනවා.

මා කථා කරමින් හිටියේ වාහන ගැන. විපක්ෂය දැන් ප්‍රචාරයක් යවනවා, ඒ වාහන ගන්න යන්නේ මන්ත්‍රීවරුන්ට කියලා. ඒ වාහන මන්ත්‍රීවරුන්ට නොවෙයි. අපි V8 ගන්න කථා කළේ නැහැ. අපි කිව්වේ කැබ් රථ දෙනවා කියලා. ඇයි, කැබ් රථ දෙන්නේ? කැබ් රථ දෙන්නේ මන්ත්‍රීවරු 225ටම නොවෙයි. අපේ ඉන්නවා, නියෝජ්‍ය ඇමතිවරුන් සහ ඇමතිවරුන් 50දෙනෙක් විතර. ඒ අයට වාහන අවශ්‍යතාවක් නැහැ. ඒවා අවශ්‍ය සාමාන්‍ය මන්ත්‍රීවරුන්ට. අපේ මන්ත්‍රීවරු පඩි ගන්නේ නැතිවයි වැඩ කරන්නේ. දැන් ප්‍රාදේශීය සභා සභාපති කෙනෙකුටත් වාහනයක් තිබෙනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඇයි, පඩි ගන්නේ නැත්තේ?

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
ඒක අපේ වැඩක් නේ. ඒක ඔබතුමන්ලාට වැඩක් නැහැ නේ. *[බාධා කිරීම්]* ඒක අපේ සංස්කෘතිය. අපි හොරා කන්නේත් නැහැ. *[බාධා කිරීම්]* කවුද, හොරා කෑවේ? හොරා කාපු සංස්කෘතියක නේ ඔය ඉන්නේ. *[බාධා කිරීම්]* හොරා කාලා- *[බාධා කිරීම්]* වාහන කීයක් පාවිච්චි කළාද ඔබතුමන්ලා? *[බාධා කිරීම්]* ඔබතුමන්ලා වාහන කීයක් පාවිච්චි කළාද? *[බාධා කිරීම්]* පෙට්‍රල් ලීටර් කීයක් ගත්තාද? එක්කෙනාටද, ගත්තේ? මුළු පවුල් පිටින් වාහන ගත්තේ. පවුල් පිටින් රජයේ මුදල් අවභාවිත කළේ. ඔබතුමන්ලා එහෙමයි. අපි බොහොම අහිංසක විධියට, බොහොම සරල විධියට අපේ ජීවිත ගත කරන්නේ. *[බාධා කිරීමක්]* මම ඒක සාධාරණීකරණය කරන්නේ නැහැ. නමුත්, බොරු කරන්න එපා. අපි වාහන ගන්නේ,- *[බාධා කිරීමක්]* ඔබතුමා ඉන්නකෝ. අපට කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමා ඉන්නකෝ. *[බාධා කිරීම්]* ඒ වාහන ගන්නේ පෞද්ගලික පාවිච්චියට නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මහාචාර්යතුමා වාඩි වෙන්න *[බාධා කිරීම්]*

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
මන්ත්‍රී කෙනෙක් වුණාම වැඩ කරන්න තිබෙනවා. [බාධා කිරීම්] රාජකාරි කටයුතුවලට නේ වාහන ගන්නේ. [බාධා කිරීම්]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඇත්ත කියන්න.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)

අපි දන්නවා, අපේ රටේ සමහර නිලධාරින්ට වාහන දෙනවා. හැබැයි, ඒ නිලධාරින් වාහන ගන්න අතරතුර vehicle permit එකත් ගන්නවා. එහෙම කාලයකුත් තිබුණා. *[බාධා කිරීමක්]* උදාහරණයකට මම දැන් වෛද්‍ය ක්ෂේත්‍රය අරගෙන කථා කරන්නම්. වෛද්‍ය ක්ෂේත්‍රය කියන්නේත් transport allowance එක දිය යුතු කාණ්ඩයක්. අපේ 22/99 චක්‍රලේඛය තිබෙනවා. ඒ තුළ සඳහන් වෙලා තිබෙනවා, වෛද්‍ය ක්ෂේත්‍රයේ අයටත්,- *[බාධා කිරීමක්]* ඒ අය එකම තලයේ ඉන්නේ. නමුත්, වෛද්‍ය ක්ෂේත්‍රයේ අයට ලැබුණේ නැහැ. ඒ නිසා තමයි DAT දීමනාව - *[බාධා කිරීමක්]* ඒ කියන්නේ Disturbance, Availability and Transport Allowance. ඒක allowance එකක්. ඒක අන්තිමට දුන්නේ 2015දී. *[බාධා කිරීමක්]* දැන් දෙන්නේ රුපියල් 35,000යි. දැනට රුපියල් 35,000ක් දෙනවා. *[බාධා කිරීමක්]* අපි ඒ ගැන දන්නවා. අපි අපේ රාජ්‍ය සේවකයන් ගැන සංවේදියි, sensitive. අපි ඒක කියන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ඇයා, ඒ කියපු ගාණයි vehicle permit එකයි සමානද?

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)

Vehicle permit එක ගැන අපි පස්සේ කථා කරමු. Vehicle permit එක ගැන නොවෙයි නේ කථා කරමින් හිටියේ. ඇයි, vehicle permit එක ඉල්ලන්නේ? විකුණන්නද? *[බාධා කිරීමක්]* Vehicle permit එක ඉල්ලන්නේ කාටහරි විකුණන්නද? ඒක විකුණුවාම කාටද සල්ලි යන්නේ? බිස්නස් කරන අයටයි ඒ සල්ලි යන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Doctorsලාට vehicle permit එක දෙන්න බැරි ඇයි කියලායි අහන්නේ.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)

Doctorsලා විතරක් නොවෙයි, ලංකාවේ එවැනි ගොඩක් දෙනෙක් ඉන්නවා. *[බාධා කිරීමක්]* රාජ්‍ය සේවකයෝ ගොඩක් ඉන්නවා. Vehicle permits දෙන්න පටන් ගත්තේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ. ඒවා දුන්නේ එක්තරා පිරිසකට රාජ්‍ය සේවකයන්ගෙන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Doctorsලා කියන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)

වෛද්‍යවරුන් ගැන විතරක් නොවෙයි, මේ රටේ ඉන්න සියලු නිලධාරින් ගැන අපි බලනවා. මොකද, අපේ නිලධාරින්, වෘත්තිකයෝ රට හැර යනවා. ඒ අය හැමෝම ගැන අපි සංවේදියි. අපි ඒ කිසිම දෙයක් අඩු කරන්නේ නැහැ. මම කලිනුත් කිව්වා වාගේ ඉස්සෙල්ලාම ආර්ථිකය හදන්න ඕනෑ. ආර්ථිකය හදන්නේ නැතුව හැමෝටම සල්ලි බෙදන්න ගියොත් හරිද? එහෙම නොවෙයි, අපි. හැමටම සුබසාධනය කියලා කෑම බෙද බෙදා, බඩු බෙද බෙදා යන එක නොවෙයි අපේ දේශපාලනය. අපට ප්‍රතිපත්ති තිබෙනවා. ඒ නිසා අපි නැවත වතාවක් කියන්නේ මේකයි. සියලු රාජ්‍ය සේවකයන් ගැන අපි සංවේදියි. අපි අහන්න කැමැතියි, ඒ ගොල්ලන්ගේ දුක. අපි යන විධියක් තිබෙනවා. අපි මුලින්ම ආර්ථිකය හැදුවා. ඊළඟට, ආර්ථික ප්‍රතිලාභ ගමට යන විධිය ගැන තමයි අපි දැන් කථා කළේ.

බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 වර්ෂය සඳහා ජාතික ජන බලවේගය ආණ්ඩුව ඉදිරිපත් කරන අය වැය දෙවනවර කියවීමේ විවාදයට සම්බන්ධ වීමට ලැබීම භාග්‍යයක් කියලායි මා හිතන්නේ.

රටක අය වැය කියන්නේ විශේෂයෙන්ම ඒ රටේ අනාගතය තීරණය කරන, රටේ ඉදිරි දිශානතිය තීරණය කරන සංවර්ධනයේ කැඩපතයි. අපි දැක්කා, අපේ ගරු ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමාට ඉස්සෙල්ලා කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා අපි ගහපු අත්පුඩි ගාණ ගණන් කරන තැනට වැටිලා තිබුණු හැටි. එතුමන්ලාට වෙන කරන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයෙන් අපට ආපු ප්‍රධාන චෝදනාවක් තමයි 2025 වර්ෂයේ වෙන් කරපු ප්‍රතිපාදනවලින් සියයට 50ක ප්‍රමාණයක්වත් වියදම් වෙලා නැහැ කියන එක. ඒකට පිළිතුරක් දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අවුරුද්ද අවසන් වෙන්න තවත් මාස දෙකකට ආසන්න කාලයක් තිබෙනවා. දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල පසුගිය ඔක්තෝබර් මාසයේ ප්‍රගතියත් සමාලෝචනය කරලා නැහැ, මේ අය වැයත් එක්ක. සියයට 100කටම යන්න බැරි වුණත්, අපේ ඉලක්කය වී තිබෙන්නේ අප වෙන් කරපු මුදල් ප්‍රමාණයෙන් සියයට 85, 90 මට්ටමට ඉදිරියේදී, විශේෂයෙන් මේ නොවැම්බර් මාසය අවසන් වන කොට වියදම් කරන්නයි. මා හිතන්නේ ඉදිරියේදී එන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලින් පසුව මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න අපට පුළුවන්. මේ අය වැය විවාදය දෙසැම්බර් 05වන දා වනකල් තිබෙනවා නේ. ඉදිරියේදී අපි උත්තර දෙන්නම්, විපක්ෂයේ ඒ ප්‍රශ්නවලට.

විපක්ෂය පැත්තෙන් තවත් චෝදනාවක් ආවා, නිලධාරින් තීන්දු ගන්නේ නැහැ කියලා. නිලධාරින් තීන්දු ගන්නවා. ඒ ගන්නා තීන්දු නිසා තමයි අපේ ආර්ථිකය මේ වන විට ස්ථාවර වෙලා තිබෙන්නේ. අපි එක අමාත්‍යාංශයක් උදාහරණයක් විධියට ගනිමු. විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය ගත්තොත්, රුපියල් ට්‍රිලියනයක මුදලක් ඉතිරි කරන්න පුළුවන් වුණේ, ඒ නිලධාරින් තීන්දු ගත්තු නිසා. විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු අදහස් කරනවා ඇති නිලධාරින් වැඩ කරන්නේ නැතුව තියන්න. නමුත් නිලධාරින්

[ගරු සුජීව දිසානායක මහතා]

අප මේ කරන ක්‍රියාවලියට, එනම් පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ගොඩ නැගීමේ ක්‍රියාවලියට දායක වෙනවා; සක්‍රිය වෙනවා. ඒ වෙනුවෙන් දිවා රෑ නොබලා වැඩ කරනවා. මා හිතන්නේ, ඔවුන් නිවැරදි තීන්දු තීරණ ගන්නවා. ඒ නිසා තමයි අපේ රටේ ආර්ථිකය මේ වන විට ස්ථාවර වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන් කථා කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. 2026 අපේ ආදායම් ඉලක්කය රුපියල් බිලියන 5,300යි; වියදම් ඉලක්කය බිලියන 7,057යි. අය වැය පරතරය හෙවත් අය වැය හිඟය රුපියල් බිලියන 1,757යි. අපි දැක්කා, 2024 අවුරුද්දේ අය වැය හිඟය බිලියන 2,800කට මඳක් වැඩියෙන් තිබුණු බව. නමුත් 2025 වසරට අදාළ - තවම මේ වසර ගෙවිලා නැහැ- අය වැය පරතරය හෙවත් අය වැය හිඟය රුපියල් බිලියන 2,200 දක්වා අඩු කළා. ඒ වාගේම 2026 අවුරුද්දට අපි අය වැය පරතරය හෙවත් අයවැය හිඟය රුපියල් බිලියන 1,757 දක්වා අඩු කරලා තිබෙනවා. අපි ආදායම් උපයනවා; ආදායම් වැඩි කර ගන්නවා; වියදම අඩු කර ගන්නවා; රටේ මුදල් ඉතිරි කර ගන්නවා. අපි අනාගතය වෙනුවෙන් ආයෝජනය කරන්න පුළුවන් ශක්තිමත් ආර්ථික ක්‍රියාවලියක් සඳහා පදනම දාලා තිබෙනවා. අපි මේ හැම දේම කරන්නේ රටේ යහපතට.

අවුරුදු 5කට ආසන්න කාලයක් වාහන ආනයනය කර තිබුණේ නැහැ. ඒ වෙනුවෙන් අපි ඩොලර් වියදම් කළා. කෘෂි රසායන ද්‍රව්‍ය වෙන්න පුළුවන්, පොහොර වෙන්න පුළුවන්, කෘමිනාශක වෙන්න පුළුවන්, ඛනිජ තෙල් වෙන්න පුළුවන්, ඖෂධ වෙන්න පුළුවන් ඒ බොහෝ දේවල් මේ රටට අවශ්‍ය ප්‍රමාණයට ගෙන්වන්න පසුගිය ආණ්ඩු අසමත් වුණා. පසුගිය පාලකයෝ අඩු ගණනේ අපේ රටේ අවශ්‍යතාවට ගැළපෙන ආකාරයට ලූණු ටිකවත් හදලා තිබුණේ නැහැ, බී ලූනු ටික හදලා තිබුණේ නැහැ. සමහර වෙලාවට අපට සිදු වුණා, එවැනි දේවල් පවා ආනයනය කරන්න. ඒ, මිල පාලනය කරන්නයි. ඒ සියලු දේ කරගෙන තමයි මේ දැවැන්ත ආර්ථික ක්‍රියාවලිය තුළ විශේෂයෙන් භාණ්ඩාගාරය සතුව විශාල මුදලක් ඉතිරි කරගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක්, ජන සන්නිවේදනය විෂයය පිළිබඳ. අපි වෙන් කරලා තිබෙනවා, අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 704ක්; සෞඛ්‍යය වෙනුවෙන් බිලියන 654ක්; ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනුවෙන් බිලියන 456ක්; ජාතික ආරක්ෂාව වෙනුවෙන් බිලියන 407ක්; රාජ්‍ය සේවය වෙනුවෙන් බිලියන 411ක්. ප්‍රධාන ක්ෂේත්‍ර 5කට බිලියන 400කට එහා ගිය දැවැන්ත මුදලක් වෙන් කරලා තිබෙනවා, මේ රටේ ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න.

අපි මේ රටේ රාජ්‍ය සේවය සක්‍රිය කරන්න ඕනෑ, ශක්තිමත් කරන්න ඕනෑ. විපක්ෂය හිතනවා නම් රාජ්‍ය සේවය දුර්වලයි කියලා, වැඩ කරන්නේ නැහැ කියලා, නැහැ, ඔවුන් වැඩ කරනවා. ඔවුන් තවත් දිරිගන්වන්න තමයි අපි රාජ්‍ය සේවය ක්‍රමවත් කරන්නේ. අපි රාජ්‍ය සේවකයන් සියලුදෙනාගේම වැටුප් අදියර 3කින් වැඩි කළා. ඔවුන්ගේ රැකියා ස්ථාවර කළා. 2016දී දායක විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ සේවයට බඳවාගත්ත සේවකයන් නැවත විශ්‍රාම වැටුප් ක්‍රමයට සම්බන්ධ කරන්න අවශ්‍ය යෝජනා මේ 2026 අය වැය තුළ අපි ඉදිරිපත් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් රාජ්‍ය සේවය තුළ ඉන්න ඕනෑ ප්‍රමාණය ගත්තොත්, ඒ ලක්ෂ 13කට ආසන්න ප්‍රමාණයක්. නමුත් මේ වෙනකොට සේවය කරන්නේ එකොළොස් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක්. ඒ නිසා අපි 2026 අවුරුද්දේ මේ අය වැය යෝජනාවලිය තුළින් යෝජනා කරලා තිබෙනවා, නිසි ක්‍රම යටතේ විභාග තියලා ඒකෙන් සමත් වුණාම සම්මුඛ පරීක්ෂණ තියලා නිසි ක්‍රම යටතේ රාජ්‍ය සේවයට කට්ටිය බඳවාගන්න. විශේෂයෙන් ගත්තොත්, දේශපාලකයා රස්සා දෙන "චිට්" ක්‍රමය නතර කරලා, හරි දැනුම, හරි අවබෝධය සහිත අය විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් හරහා රාජ්‍ය සේවයට -75,000කට ආසන්න ප්‍රමාණයක්- බඳවා ගන්න අපි මේ අය වැය තුළින් යෝජනා කරලා තිබෙනවා. ඒ නිසා අපි රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න අවශ්‍ය සියලු වැඩ කටයුතු සකස් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ රාජ්‍ය සේවය හා සම්බන්ධ දත්ත පද්ධතිය ගත්තොත්, දැනට රාජ්‍ය සේවය තුළ සේවය කරනවා, ජ්‍යෙෂ්ඨ නිලධාරින් 43,427කට ආසන්න ප්‍රමාණයක්. මධ්‍යම රජයේ වෙන්න පුළුවන්, පළාත් සභාවේ වෙන්න පුළුවන්, දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, සහකාර ප්‍රාදේශීය ලේකම්වරු, පළාත් සභා ලේකම්වරු, සෞඛ්‍ය අධ්‍යක්ෂවරු, පළාත් සභා සෞඛ්‍ය අධ්‍යක්ෂවරු, අධ්‍යාපන අධ්‍යක්ෂවරු වැනි විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ නිලධාරින් අපේ රටේ රාජ්‍ය සේවයත් එක්ක සම්බන්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය සේවය ශක්තිමත් කිරීම සඳහා මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා, රුපියල් මිලියන 12,500ක මුදලක්. විශේෂයෙන්ම ඒ වාහන ආනයනය කරන්න. වාහන ආනයනය කරන්නේ මේ පාර්ලිමේන්තුව තුළ ඉන්න මන්ත්‍රීවරු පමණක් නොවෙයි. ඇමතිවරුන්ට ඒ වාගේම නියෝජ්‍ය ඇමතිවරුන්ට වාහන ලැබෙන්නේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ටත් ඒ වාහන ලැබෙනවා. විශේෂයෙන්ම මේ රටේ රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම, ඔවුන්ගේ සේවය උපරිම ආකාරයෙන් ලබා ගැනීම වෙනුවෙන් තමයි අපි මේ රුපියල් මිලියන 12,500ක මුදලක් වෙන් කරලා තිබෙන්නේ, සමස්ත රාජ්‍ය සේවය ශක්තිමත් කිරීම සඳහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන වාරියපොල මැතිවරණ බල ප්‍රදේශය අපි උදාහරණයට ගනිමු. අපේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 2ක් තිබෙනවා. ඒ, බමුණාකොටුව සහ වාරියපොල. වාරියපොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අපේ ප්‍රාදේශීය ලේකම්තුමියට, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියට - ඒ දෙදෙනාටම - තිබෙන්නේ එක වාහනයයි. ඒකත් අර පරණ එක්දහස් නවසිය අසූගණන්වල හදපු ඩබල් කැබ් රථයක්. ඒක දවසක් දිව්වොත් දවස් දෙකක් ගැරේජ් එකේ දාන්න ඕනෑ. එතකොට රාජ්‍ය සේවයක් කාර්යක්ෂම වෙනවාද? ඒ රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම සඳහා තමයි අපි මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ. අනෙක් පැත්තෙන් ගත්තොත්, ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ආසනයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය වෙනුවෙන් ඩබල් කැබ් දෙකක් තිබෙනවා. ඒ ඩබල් කැබ් දෙකෙන් එක ඩබල් කැබ් එකක 1984 තමයි නිෂ්පාදිත වර්ෂය. හිතන්න, කොච්චර කාලයක්ද කියලා. අවුරුදු 40කට ආසන්න ප්‍රමාණයක්. රාජ්‍ය සේවය අකාර්යක්ෂම වෙනවා මෙන්න මේ වාගේ තත්ත්ව නිසා. ඒ නිසා ඒ රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම තමයි මේ ක්‍රියාවලියේ බලාපොරොත්තුව. නැතුව මන්ත්‍රීවරුන්ට වාහන ගන්න එක නොවෙයි බලාපොරොත්තුව.

අනුරාධපුරය, පොළොන්නරුව වාගේ දිස්ත්‍රික්කවල වන අලි ප්‍රහාර එල්ල වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම විදුලි වැට ශක්තිමත් කරන්න මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අහනවා, ඒ විදුලි වැට සකස් කරනකොට ඒ හා සම්බන්ධ නිලධාරින්ට ඒ අයගේ කාර්යභාරය කරන්න කැලේ මැද්දේ යන්න වෙන්නේ push bicycle එකෙන්ද කියලා. විශේෂයෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් වාහන 294ක් මේ අය වැයෙන් අනුමත කරලා දෙන්න කියලා අපි ඉල්ලලා තිබෙනවා. ඒ, ඔවුන්ගේ කාර්යය ශක්තිමත් කරන්නයි, ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය ඉතිහාසයේ අපි දැක්කා, මේ ගරු සභාවට තේරී පත් වෙච්ච ඇතැම් මන්ත්‍රීවරු සති දෙකක් යන්න මත්තෙන් වාහන බලපත්‍ර ගන්නවා. "නවක මන්ත්‍රී රත්නප්‍රියට තීරුබදු රහිත වාහනයක්" කියලා 2020.02.14වැනි දා "ලංකාදීප" පත්තරය වාර්තා කරනවා. "රත්නප්‍රිය මහතාට හිමි වෙන තීරුබදු රහිත වාහන බලපත්‍රයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 65,000කි" යනුවෙනුත් එහි සඳහන් වෙනවා. එය 2020ට ආසන්න කාලයේ ශ්‍රී ලංකා මුදලින් රුපියල් 12,000,000ක්. ඒ, වාහන බලපත්‍ර ලබාගත්තු හැටි.

දැනට සිරගත වෙලා ඉන්නවා, හිටපු ක්‍රීඩා අමාත්‍යවරයකු වන මහින්දානන්ද අලුත්ගමගේ මහත්මයා. වාහන බලපත්‍රය විකිණීමෙන් ලබා ගත් රුපියල් මිලියන 26ක මුදලක් සම්බන්ධව ඔහුට යම් චෝදනාවක් එල්ල වෙලා තිබුණා, අධිකරණය තුළ. පසුගිය කාලයේ මේ සභාව නියෝජනය කරපු සමහර මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් තමන්ට ලැබුණු වාහන බලපත්‍රය වික්කා. රුපියල් ලක්ෂ 259කට වාහන බලපත්‍ර විකුණලා රුපියල් ලක්ෂ 180කට හෝකන්දර පැත්තේ ගෙවල් ගත්ත මන්ත්‍රීවරු මේ සභාව නියෝජනය කළා. අපි හිතනවා, දැනටත් මේ කෑ ගහන්නේ, අරගළ කරන්නේ අන්න ඒ වාහන බලපත්‍රය ලබා ගැනීමට කියලා. විශේෂයෙන්ම මේ වෙනකොට රුපියල් ලක්ෂ 480ට, 500ට මේ වාහන බලපත්‍ර විකුණන්න පුළුවන්.

මේ උත්සාහ කරන්නේ ඒකට. අපි මේ උත්සාහ කරන්නේ රාජ්‍ය සේවය ශක්තිමත් කරලා හොඳ පොහොසත් රටක් නිර්මාණය කරන්නයි. මෙවර ඉදිරිපත් කළ අය වැය තුන්වන වර කියවන ක්‍රියාවලිය ඉදිරියේ දී එනවා. අපි මේක අනුමත කරනවා. එක මිටට අරගෙන මේ රට ඉදිරියට ගෙන යනවා කියන බලාපොරොත්තුව අපේ රජයට ඇති බව ප්‍රකාශ කරමින් මම සමු ගන්නවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මුලින්ම මම මතක් කරන්න අවශ්‍යයි ඊයේ ඉන්දියාවේ දිල්ලි නගරයේ රතු බලකොටුව අසළ සිදු වූ මිලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරය. අපි එය හෙළා දකිනවා. ඒ මිය ගිය ප්‍රමාණය 10ක් කිව්වා. හැබැයි, වාර්තා වුණා 13ක් කියලා. මම හිතන විදියට, මිය ගිය ප්‍රමාණය ඊට වඩා වැඩි වෙන්නත් පුළුවන්. ඒ අය වෙනුවෙන් අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ කථාව ආරම්භ කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ඉඳලා මම මෙතැන වාඩි වෙලා හිටියා මගේ කථාව කරන්න අවශ්‍ය නිසා. අද ගොඩක් දෙනෙක් කථා කළා. අපි ගිය සිකුරාදා ජනාධිපතිවරයාගේ කථාව පැය හතරහමාරක් පුරා බලාගෙන හිටියා. ඒක උත්කර්ෂයට නඟලා තිබෙනවාත් අපි දැක්කා, පැය හතරහමාරක් හිටගෙන කථා කරන්න තිබෙන හයිය කොහොමද කියලා. ඒකත් අපි ඉතා ගෞරවයෙන් අගය කරනවා. ඒකත් එක්තරා ආකාරයක දක්ෂතාවක් තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා හිනා වෙනවා. අර්ච්චුනා මන්ත්‍රීතුමාට නින්ද ගියා වාගේම, උඩ බැලුවා නම් පෙනෙනවා තානාපතිවරුත් හිටියා පැය ගණන් නිදි කිරා වැටි වැටී. ඒ අයගෙන් භාගයක් යන්නත් ගියා, තේ මේසයට හිටියේත් නැහැ. මම උඩ බලද්දී ඒ අයගෙන් භාගයක් විතර නිදි. අනෙක් පැත්තේ අයත් එහෙමයි. අපි විතරක් නොවෙයි, කවුරුවත් ඒක අහගෙන හිටියේ නැහැ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ පැය හතරහමාරක් නොවෙයි, පැය දාහතරහමාරක් කියෙව්වත් මොකක්ද ඒක ඇතුළේ තිබුණේ කියන එකයි. ඒ ගැන මම කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. පැය හතරහමාරක් කියන එක අපට ප්‍රශ්නයක් නැහැ. අසූතුන් පාරක් අත්පුඩි ගහපු එකත් අපට ප්‍රශ්නයක් නැහැ. මොකද, අත් රිදෙන්නේ ඔබතුමන්ලාගේ මිස අපේ නොවෙයි.

ජනාධිපතිවරයා එතුමාගේ කථාවේදී කියනවා ඇහුණා වාගේම, විසර්ජන පනත් කෙටුම්පත - Appropriation Bill එක - ඉදිරිපත් කළ අවස්ථාවේදීත් අපි දැක්ක දෙයක් තමයි ජනාධිපතිවරයාගේ වියදම් ටික නම් වැඩි කරගෙන තිබෙන බව. ඉතාම පැහැදිලිව, ප්‍රාග්ධන වියදම් සියයට 35ක් වැඩි කරගෙන තිබෙනවා. ඒ මුදල රුපියල් මිලියන 2,258කින් වැඩි කරගෙන තිබෙනවා. ගරු අගමැතිතුමියට වැඩි වෙලා තිබෙන්නේ ලක්ෂ 50යි. ජනාධිපතිතුමාට රුපියල් මිලියන 2,258ක් වැඩි වෙද්දී අගමැතිතුමියට ලක්ෂ 50ක් වැඩි කර දීලා තිබෙනවා. ගරු අගමැතිතුමියට සලකන ආකාරය ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. අගමැති කාර්යාලයේ පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 200කිනුත් අඩු කර තිබෙනවා. මේ ගණන් හිලව් ටික අපි දැක්කා. ගරු අගමැතිතුමිය ලෝකයේ ඉන්න වැඩක් නැති, කාර්යය අඩුම අගමැතිතුමිය හැටියට පත් කරන්න හදනවාද කොහේද. එතුමියට attendance තිබුණා. පාර්ලිමේන්තුව රැස් වෙන වෙලාවේ 65ක් තිබෙන්න ඕනෑ එකට එතුමියට 64ක් තිබුණා. මම හිතන හැටියට එතුමිය මෙතැනටම එවලා මෙතැනම වාඩි කරවලා තියන්නයි හදන්නේ. හැබැයි, ජනාධිපතිතුමාගේ මුදල සියයට 35කින් වැඩිවීම ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. බලයට ආවේ කොහොමද කියලාත් වැඩිපුර කථා කරන්නේ නැහැ. ජනාධිපතිතුමාට රුපියල් මිලියන 2,258ක් වැඩි කරගෙන තිබෙනවාය කියන එක මම මතක් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කියපු කථා ඇතුළේ ඉතාම ලස්සනට කිව්වා රාජ්‍ය ව්‍යවසායයන් කාර්යක්ෂම කිරීමට පියවර ගෙන තිබෙනවා කියලා. මම කියන්න දෙයක් නැහැ රාජ්‍ය ව්‍යවසායයන්වලට අදාළ ඒ report එක ඇවිල්ලා තිබෙනවා. හැමෝම අතේ ඒක තිබෙනවා. වසර මැද මූල්‍ය වාර්තාව කියවන්නේ නැතිවද ජනාධිපතිවරයා ඒ කථාව මෙතැනදී කිව්වේ? ඒක මේ අය වැය කථාවේ කියලා තිබෙනවා. මුළු ලාභය රුපියල් බිලියන 227ක් වුණාම, 2024 වර්ෂයේම රුපියල් බිලියන 280ක් රාජ්‍ය ව්‍යවසායයන් ලාබ ලබලා තිබෙනවා. රුපියල් බිලියන 52ක් විතර අඩු වුණාට පස්සේ මෙතැනට ඇවිල්ලා කියනවා රාජ්‍ය ව්‍යවසායයන් කාර්යක්ෂම කිරීමට අපි කටයුතු කරලා තිබෙනවා කියලා. මම කියවන්න ඕනෑ නැහැ නේ, top loss-making SOEs පිළිබඳව. Ceylon Electricity Board එකේ පාඩුව Rs. 13.2 billion; SriLankan Airlines එකේ පාඩුව Rs. 10 billion; Lanka Sugar Company එකේ පාඩුව Rs. 2.6 billion; Ceylon Fertilizer Company, Rs. 1.1 billion වශයෙන් list එකක් තිබෙනවා. ලාභය අඩු වෙලා. ලාභය අඩුවෙලා තිබියදී අපට කියනවා රාජ්‍ය ව්‍යවසායයන් කාර්යක්ෂම කිරීමට පියවර තබනවා කියලා. පැය හතරහමාරක් කියවපු ටික ගැන තමයි මම මේ කියන්නේ. මේවා බලන්නේ නැතිව, වසර මැද මූල්‍ය වාර්තාව කියවන්නේවත් නැතිව තමයි අය වැය හදපු කට්ටිය ඒක හදලා දීලා තිබෙන්නේ. ඒ විදියට තමයි අපි ඒක දැක්කේ.

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

ඊළඟට මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ කාරණයත්. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැනත් අපේ අවධානය යොමු වුණා, ඒ සඳහා මෙවර අය වැයෙන් මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන්. එතුමා මෙතැනට ඇවිල්ලා කියපු දේ මම කියන්නම්. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට කටයුතු කරනවාය කිව්වා. මම එක දෙයක් කියන්නම් ස්වාධීනත්වය ගැන. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ගැන කථා කරන්න කලින් එහි සභාපතිවරයා ස්වාධීන ද කියලා බලන්න වෙනවා. එතුමා පසුගිය ඡන්දවලට කලින් කොහේද හිටියේ කියලා ලංකාවම දන්නවා. ස්වාධීන කථාවක් කියන්න කලින්, අඩුම තරමින් ස්වාධීන මිනිහෙක් එතැනට දාන්න ඕනෑය කියන එක අපි යෝජනා කළා. දැන් ඉතින්, ඒක වෙලා ඉවරයි නේ. දැන් ඉතින් එයාගෙන් වැඩත් ගන්නවා නේ. ඒක නිසා කමක් නැහැ, ස්වාධීනයි කියලා කියනවා නම්. හැබැයි මතක තියාගන්න, අල්ලස් කොමිසමේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 380ක් - සියයට 92ක්- කප්පාදු කරලා. *[බාධා කිරීමක්]* ඒක තමයි. රුපියල් මිලියන 380ක් -සියයට 92ක්- කප්පාදු කරලා. ඊට පසුව මෙතැනට ඇවිල්ලා කියනවා, අල්ලස් කොමිසම සහ කාර්ය මණ්ඩලය ස්වාධීන කරනවා කියලා. ඇත්තටම මේ කියන කථාව නොවෙයි ක්‍රියාවෙන් ඔප්පු කරලා පෙන්වන්නේ. ඒක කියන්නයි මට අවශ්‍ය වුණේ. අල්ලස් කොමිසම නැත්නම් අද ආණ්ඩුව නැහැ. ආණ්ඩුව වෙනුවෙන් අද ප්‍රධාන වශයෙන්ම වැඩ කරගෙන යන්නේ අල්ලස් කොමිසම. ඒකෙන් තමයි සන්දර්ශන දමන්නේ. ඒකේ මුදලින් සියයට 92ක් කප්පාදු කරලා තිබෙනවා. ඒ කාරණයත් මම මතක් කරන්න කැමැතියි.

ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරමින් පැය හතරහමාරක් කථා කරපු එක ගැනත්, අත් කැඩෙනකම් 83 වරක් අත්පුඩි ගහපු එක ගැනත් කියන්න ඕනෑ. පළාත් සභා මැතිවරණය ගැන එතුමා මොකක්ද කිව්වේ? රුපියල් බිලියන 10ක් වෙන් කරලා තිබෙනවා, අපට ඒකට අවශ්‍ය නීතියක් හදලා දෙන්න කිව්වා. අපි නීතියක් හදලා දෙන්න අවශ්‍ය නැහැ. අපි ඉඳලාද නීති හදන්නේ? අපි ඉඳලාද මේක ඇතුළේ අනෙක් වැඩ ටිකත් කරගත්තේ? තමුන්නාන්සේලාට 159දෙනෙක් ඉන්නවා නේ. අපි අහවල් එකටද? ඒ නිසා ඒ කථාව අපට කියන්න එපා. නීතියක් හදන්න ඕනෑ නම් හදලා, හෙට අනිද්දාම ඒක කරගන්න ඔබතුමන්ලාට හැකියාව තිබෙනවා. රුපියල් බිලියන 10ක් පළාත් සභා මැතිවරණයට වෙන් කරලා තිබෙනවා කියලා කී පාරක් කිව්වාද? මම දැක්ක විධියට පස් පාරකට, හය පාරකට වඩා කිව්වා. මට පෙන්වන්න, කොහේද රුපියල් බිලියන 10ක් වෙන් කරලා තිබෙන්නේ කියලා. රුපියල් බිලියන 10ක් වෙන් කරලා නැහැ. 2025දී රුපියල් මිලියන 21,000ක් වෙන් කරලා තිබුණු එක 2026 රුපියල් මිලියන 6,488ට අඩු කරලා තිබෙනවා, සියයට 70කින්. ඊළඟට, ප්‍රාග්ධන වියදම් 2025දී රුපියල් මිලියන 209යි. 2026දී ඒක රුපියල් මිලියන 53කින් අඩු කරලා තිබෙනවා. ඒ කියන්නේ, සියයට 25කින්. එහෙම අඩු කරලා අපට ඇවිල්ලා මෙතැනදී කියනවා, රුපියල් බිලියන 10ක් වෙන් කරලා තිබෙනවා, ඡන්දෙ තියන්න පුළුවන්, සල්ලිත් තිබෙනවා කියලා.

මේවාට තමයි අත්පුඩි ගැහුවේ. මේවා තමයි අර විදේශිකයන් ඇවිල්ලා, තානාපතිවරු ඇවිල්ලා අපරාදේ නිදි කිරා ගෙන, ඇනුම් අර ඇර බලාගෙන හිටියේ. ඒක අපරාධයක් කියලා මම හිතනවා. ඔය කථා ටික අයින් කරගත්තා නම් අය වැය කථාව පැය දෙකකින් විතර ඉවර කරන්න තිබුණා. පළාත් සභා මැතිවරණය පවත්වන්න පුංචි හෝ අදහසක් තිබෙනවා නම්, ඒක නොම්මරවලින් පෙන්වන්න ඕනෑ. හැබැයි, ඒක සිද්ධ වුණේ නැහැ. කථාවේදී සල්ලි වෙන් කරන්න පුළුවන්. අපි ඒක දන්නවා. In his Budget Speech presenting the Appropriation Bill, he can propose allocation of money. That, we know. ඇමුණුම III බලන්න, ඒ මුදල් වෙන් කර තිබෙනවාද කියලා? අය වැය කථාවේ අවසානයේ ඇමුණුම III තිබෙනවා. ඒක ගැන එහි සඳහන් වෙලාවත් නැහැ. ඒක නිසා ඒ කියපු දේවල් බොරු කියන එක මම කියන්න කැමැතියි.

ඊළඟට, මේ පොදු සාකච්ඡාවේදී සෞඛ්‍ය ඇමතිතුමා කියපු කථාවක් මට මතක් වුණා. මහරගම ඉස්පිරිතාලෙකට ගිහින් කිව්වා, තිස්තුන් කෝටියක් දෙව්වරු දෙනවාට වඩා මේ ආණ්ඩුවෙන් සෞඛ්‍යයට සල්ලි දෙනවා කියලා. එහෙම තමයි එතුමා කිව්වේ. හැබැයි, පසුගිය අවුරුද්දේ දුන්න සල්ලිවලට වඩා රුපියල් බිලියන 50කුත් අඩු කරලා තිබෙනවා. පසුගිය අය වැය කථාවේදී ජනාධිපතිතුමා කිව්වා, ගුණාත්මක ඖෂධ සහ වෛද්‍ය සැපයුම් කිසිදු බාධාවකින් තොරව ප්‍රසම්පාදනය හා බෙදා හැරීම සහතික කිරීමටත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රශස්ත කරන අතරම නාස්තිය අවම කිරීමටත්, අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිත කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබනවා කියලා. හැබැයි, පසුගිය සැප්තැම්බර් මාසයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඒ අදාළ නිලධාරින් ආවාට පසුව වෛද්‍ය සැපයුම් සම්බන්ධයෙන් මොකක්ද තිබෙන තත්ත්වය කියලා අපි හොයලා බැලුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 වසරේ වෛද්‍ය සැපයුම් සම්බන්ධයෙන් -කාර්තු දෙකක් ඇතුළත- බිලියන 55ක් වියදම් වෙද්දී මේ අවුරුද්දට බිලියන 52යි. අමාරුයි කියපු අවුරුදුවල වෛද්‍ය සැපයුම්වලට මීට වඩා වෙන්කරලා තිබෙද්දී, මේ අවුරුද්දේ බිලියන 52යි. ඒ කාරණයත් මම මතක් කරනවා. මේ කියන කතන්දර සිද්ධ වෙන්නේ නැහැ කියන එක පෙන්වන්න තමයි මට අවශ්‍ය වුණේ.

ඒ වාගේම තවත් ආංශික අධීක්ෂණ කාරක සභාවකදී හෙළි වුණා, කෘෂිකර්මාන්තය සහ එම කර්මාන්ත ආශ්‍රිතව තරුණ ව්‍යවසායකයන් 50,000ක් -පොඩි ගණනක් නොවෙයි, පනස්දාහක් - සංවර්ධනය කිරීමට, ණය ලබා දීමට රුපියල් මිලියන 500ක්. මේවා තමයි කියන කථා. කටින් කෙළ හැළෙනවා වාගේ ගණන් කියනවා. 50,000ක් කියනවා, තරුණයෝ කියනවා, මිලියන 500ක් කියනවා. හැබැයි පසුගිය ඔක්තෝබර් මාසයේ ඒ නිලධාරින් ටික එම ආංශික අධීක්ෂණ කාරක සභාවට කැඳවලා ඇහුවාම 50,000න් 28දෙනායි මේකට එකතු කරගෙන තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා පුදුම වෙයි. මේවා, මම කියන ඒවා නොවෙයි. ඒ ඒ අමාත්‍යාංශවල නිලධාරින් අපට ලබා දීපු දත්ත. ඒ නිසා පැය 4ක් නොවෙයි, පැය දහහතරහමාරක් හරි ඕනෑම කෙනෙකුට කියවන්න පුළුවන්. ඒක තමයි මට ඔප්පු කරන්න අවශ්‍ය වුණේ. 50,000න් එකතු කරගෙන තිබෙන්නේ 28 දෙනායි. ඒ කාරක සභාවේදී මම මේ ප්‍රශ්නය ඇහුවා. එතකොට කිව්වා, ඉදිරි අවුරුදු පහේදී ඉතිරි ටික complete කරගන්නවා කියලා. ඒ කියන්නේ, ඉදිරි අවුරුදු හතර තුළ හතළිස් නවදහස් ගණනක් සම්බන්ධයෙන් කටයුතු කරන්න සිද්ධ වෙනවා. මේ මුදල් වියදම් වෙලා නැහැ, ඒක තමයි වෙලා තිබෙන්නේ. මේ කියන සල්ලි ඇත්තටම වියදම් වෙනවාද කියන එකයි ප්‍රශ්නය.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා "හොඳයි" කියපු කාරණයක් අල්ලා ගෙන, එදා සියලු ඇමතිවරුන්ට නත්තල් වාගේ වුණා. මොකද, අපේ පැත්තේ ඉන්න ආර්ථික විශේෂඥයා මේක හොඳයි කිව්වා කියලා. මොකක්ද, හොඳයි කිව්වා කියන්නේ? හොඳයි කිව්වා තමයි. ආදායම් ටික එකතු කරගෙන තිබෙනවා තමයි. දැන් ඒක නැහැ කිව්වේ කවුද? අපට ඒක නැහැ කියන්න පුළුවන්ද? බැලුවාම ගණන් ටික පොතේ තිබෙනවා නේ. ඒ නිසා අපට එහෙම "නැහැ" කියන්න අවශ්‍ය නැහැ. ඒක හොඳයි තමයි.

ඒකේ ප්‍රශ්නයක් නැහැ. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න නේද ආවේ? එතකොට අපි මේක හොඳයි කියන්න එපාද? අපි හොඳයි කියන්න ඕනෑ තමයි. අපි ඒකට ලජ්ජාත් නැහැ, අපි ඒකට හයත් නැහැ. හැබැයි, මේකත් මතක තබා ගන්න. එහෙම නම් ඒකේ අඩු පාඩු ටික කියද්දීත් ඒ වාගේම පිළිගන්න. අඩු පාඩුත් තිබෙනවා නේ. සාර්ව ආර්ථික අංක ටික ස්ථාවර වුණාට, වර්ධනයක් තිබෙනවාද? දැන් මෙතැන අමාත්‍යවරු කථා කළා, ඩොලරයේ අගයවත් දන්නේ නැහැ. අද වන විට ඩොලරයේ අගය කීයද කියලාවත් දන්නේ නැහැ. ඒ නිසා ස්ථාවරභාවය තිබෙනවා කියන එක විතරක් නොවෙයි, වර්ධනය කියන එකත් මෙහි එක කොටසක්.

අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ෆොටෝ ගත්තේ අතැන ඉඳගෙනයි. ඔන්න ඔතැන ඉඳගෙන ගත්තේ. අද ඒ තත්ත්වයට ගෙනැවිත් තිබෙනවා. අපි අහනවා, දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්නේ එහෙමද කියලා. බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමාට වැසිකිළියකට යන්න හම්බවුණේ නැහැ. *[බාධා කිරීමක්]* නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමාට. ඒක තමයි සංස්කෘතිය. ඒ නිසා ෆොටෝ ගන්න තිබුණේ, අර්චුනා මන්ත්‍රීතුමාගේ නොවෙයි. පැය හතරක් ගැලරියේ ඉඳගෙන අහගෙන හිටපු තානාපතිවරුන්ගේ ෆොටෝ ගන්නයි තිබුණේ. හොඳ වෙලාවට ඒ කාලයේම මාලිමාවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරිය මත් ද්‍රව්‍යවලට සම්බන්ධ වෙලා ප්‍රශ්නයක් ඇති වුණේ. එහෙම නොවුණා නම්, අපට බැණ බැණ පැය හතක් විතර කථා කරනවා. තානාපතිතුමන්ලාට රට කන්න බත් බැඳගෙනයි එන්න වෙන්නේ. ඒ නිසා එහෙම පැය හතර හමාරකින් නවත්වපු එක ගැන මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා රේගුවේ අපේක්ෂිත ආදායම ඉක්මවා ගියේ, මේ අවුරුද්දේ විතරක් නොවෙයි. මම ඒක පෙන්වන්නම්. ඒකට මට යම් වේලාවක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2020 වර්ෂයේ ශ්‍රී ලංකා රේගුවේ අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 717යි, ලැබුණේ රුපියල් බිලියන 654යි. බොහොම ළඟට ඇවිල්ලා තිබෙනවා. 2021 වර්ෂයේ රුපියල් බිලියන 679ක් අපේක්ෂිත ආදායම වෙද්දී, රුපියල් බිලියන 646ක් වාගේ ආසන්න ගණනකට ඇවිල්ලා තිබෙනවා. 2022දී රුපියල් බිලියන 730ක් අපේක්ෂිත ආදායම වෙද්දී, රුපියල් බිලියන 708ක් වාගේ ආසන්න ගණනකට ඇවිල්ලා තිබෙනවා. මේක හොඳට අහගන්න. 2023දී අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 893ක් වෙද්දී, රුපියල් බිලියන 972ක් ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ 2023දීත් අපේක්ෂිත ආදායම ඉක්මවා ගිහිල්ලා ශ්‍රී ලංකා රේගුවේ ආදායම අරගෙන තිබෙනවා. ඒ නිසා මේක පළමුවැනි වතාවට වෙච්ච දෙයක් නොවෙයි. ඒ වාගේම, 2024 අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 1,533ක් වෙද්දි රුපියල් බිලියන 1,535ක් ආදායම අරගෙන තිබෙනවා. මේවා ඉලක්කම්වලින් තිබෙනවා නේ. ඒ නිසා මට කියන්න තිබෙන්නේ, අපි කියපු දෙයට සමාව ඉල්ලන්න දෙයක් නැහැ කියන එක. ආණ්ඩුවේ පුද්ගලයෝ තමයි සමාව ඉල්ලන්න ඕනෑ හරියට පුරෝකථනය කර ගන්න බැරි වුණා නම්. වාහන මාර්කට් එක විවෘත කරන්න හිතාගෙන ඉන්නවා නම්, මේ පුරෝකථනය කරපු ගණන් හරිද? නිලධාරීන් ඉන්නවා, දත්ත ටික තිබෙනවා. එතකොට සමාව ඉල්ලන්න ඕනෑ ආණ්ඩුවයි, "සමාවෙන්න, අපට පුරෝකථනය වැරදුණා, ඒකයි මෙච්චර gap එකක් තිබෙන්නේ" කියලා. මේ ඉලක්කම් තිබෙනවා නේ. අපි හොඳ දෙයට හොඳයි කියනවා, වැරදි දෙයට වැරදියි කියනවා. අපට ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ අණපනත් සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයක සාර්ථකත්වය පෙන්වන එකක් තමයි, law reforms කියන එක. කොච්චර අණපනත් ගෙනැල්ලා තිබෙනවාද, කොච්චර නීති වෙනස් කරලා තිබෙනවාද කියන එක. මේ අය වැයේදී කියපු එකක්, දෙකක් තිබෙනවා, රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත් කෙටුම්පත, රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත හා විද්‍යා පර්යේෂණ සංවර්ධන පනත් කෙටුම්පත වාගේ. හැබැයි, ගිය අවුරුද්දේ කියපු ඒවා එකොළහක් තිබුණා. ඒ එකොළහෙන් එකක්වත් කළේ නැහැ. ඒ එකොළහෙන් එකක්වත් කළේ නැහැ නේ. කළේ වෙනම දහයක්. ඒ දහය ඇතුළෙත් තනිකර දේශපාලන අවශ්‍යතාව වෙනුවෙන් කරපු බහුතරයක් තිබෙන්නේ. ඒ වාගේම, IMF එකේ ව්‍යවමනාවකට කරපු බහුතරයක් ඒ තිබෙන්නේ. එහෙම නම් මේ කියපු ඒවාත් කරන්න එපායැ. ඒක නිසා කියනවා වාගේ නොවෙයි මේවා කරන්න ගියාම කියන එකත් අපි කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න කැමැතියි. සාමාන්‍යයෙන් Appropriation Bill එක ඉදිරිපත් කළාට පස්සේ, අය වැය කථාවේදී මුදල් අමාත්‍යවරයෙකුට තවත් මුදල් එකතු කරන්න පුළුවන්. ඒක ලෝකයේ රටවල තිබෙන practice එක. හැබැයි, ඒ විධියට වැඩි කරන යම් ප්‍රමාණයක් තිබෙනවා. ඒක සියයට 10කුත්, සියයට 30කුත් අතර වෙන්න පුළුවන්. ඒ මොනවත් පුරෝකථනය නොකරන වියදම්වලට, එහෙම නැත්නම් මැතිවරණයක වියදම්වලට. මේ ප්‍රජා ශක්ති වැඩසටහනට පනත් කෙටුම්පතෙන් වෙන් කරලා තිබෙන්නේ, රුපියල් මිලියන 4,250යි. හැබැයි, මෙතැනට ඇවිල්ලා ඒකට තව රුපියල් මිලියන 20,000ක් - රුපියල් බිලියන 20ක් - එකතු කරනවා. ඔක්කොම රුපියල් බිලියන 25ක්. That is not the best international practice. මේ විධියට ලෝකයේ වෙලා තිබෙන දේවල් දිහා ඔබතුමන්ලා බැලුවොත් පෙනේවි, අය වැය කථාවකදී එක පාරටම මුදල් එකතු කරපු හැම වෙලාවකම වාගේ වෙලා තිබෙන්නේ මුදල් අවභාවිතයක් කියලා. "ප්‍රජාශක්ති" වැඩසටහන යටතේ මේ කරන්න යන්නේ ගමේ දේශපාලනය කරන්න යන එක කියලා අපට තේරෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මම තව තත්පර 30කින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම ආණ්ඩු පක්ෂයෙන් අහනවා, ඔබතුමන්ලාගේත්, බැසිල් රාජපක්ෂගේත් අතර තිබෙන වෙනස මොකක්ද කියලා. මේකම නොවෙයි ද කළේ "දිවි නැගුම" කියලා? ඒ නිසා මෙහෙම ලොකු ගානකින් මේක වෙනස් වුණේ ඇයි කියන එකට උත්තරයක් ලබාදේවි කියලා මම හිතනවා. මේ ආණ්ඩුවේ ආර්ථික විශේෂඥයන් ඉන්නවා නේ. ඒ අයගෙන් මම මේ ගැන අහන්න කැමැතියි. ලෝකයේ අනෙක් රටවල් දිහා බලලා මේවා කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

[ගරු නිහිඳු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව තත්පර 10කින් මම කථාව අවසන් කරන්නම්. මම මේ ආණ්ඩුවටත්, ජනාධිපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, මෙවර අය වැයෙන් වැඩිම මුදල් වැඩි කිරීම කර තිබෙන්නේ අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාටයි. ඒ වැඩ ටික කරගෙන යන්න එතුමාට මගේ සුබපැතුම් එකතු කරනවා. හැබැයි, අවසාන වශයෙන් මම මේකත් කියන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, පක්ෂය එකතු කරන මුදල්වලින්වත්, පක්ෂ කාර්යාල ටික හදාගන්නත් කීයක් හරි ඉල්ලා ගන්න. නැත්නම් ඔබතුමාගේ ලේකම්වරයා සිමෙන්ති කර්මාන්තශාලාවල ඉන්න අයට කරදර කරනවා. ඒ නිසා ඒකත් නවත්වා ගන්න. පක්ෂයෙන් ඒ සඳහාත් ඔබතුමා වැඩිපුර මුදලක් ඉල්ලා ගන්න කියා සඳහන් කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.50]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය දෙවනවර කියවීමේ අවස්ථාවේදී මට මතක් වෙනවා, පණ්ඩිත් අමරදේව මහත්මයා විසින් ගායනා කළ ගීතයක මුල් පද පේළි කිහිපයක්. එහි පළමු පේළියේ තිබෙන්නේ, "පිලේ පැදුර හේනට අරගෙන යනවා" කියලා. ඒ කවි පේළිය අවසන් වන්නේ "හිතේ දුකට එතකොට කවි කියවෙනවා" කියලායි. පසුගිය දවස්වල විපක්ෂයේ මන්ත්‍රීවරු කළ කථා ඇහුවාට පස්සේ අපට පෙනෙන දේ තමයි, විපක්ෂය, එහෙම නැත්නම් ආණ්ඩු බලය ගන්න බලාපොරොත්තු වෙලා ඉන්න අය හිතේ දුකට ද මේ දේවල් කියන්නේ කියලා. එතුමන්ලා පසුගිය ජනාධිපතිවරණයට කලින් අපි ගැන කියපු දේවල් ගැන ටිකක් කල්පනා කර බලන්න. මේ පොළොවේ පැළ කරන්න බැරි මහා බේගල් ටිකක් ඒ දවස්වල අපි ගැන කිව්වා.

ඊළඟට, ජනාධිපතිවරයා පත් වෙලා පාර්ලිමේන්තු මැතිවරණය එනකොට විපක්ෂයෙන් කිව්වා, මේ ආණ්ඩුව මාස 6න් වැටෙනවා කියලා. ඒ වාගේම ඩොලර් පිළිබඳවත් විවිධ කථා කිව්වා. ඒ වාගේ විවිධ දේවල් එදා පාර්ලිමේන්තු මැතිවරණයට කලින් විපක්ෂය කිව්වා. ඒකෙන් අපට තීරණය කරන්න පුළුවන් දේ තමයි, ඒ කියපු ටික වුණා නම් දැන් එතුමන්ලා කියනවා වාගේ මේ ආණ්ඩුව වැටිලා. එහෙම වුණා නම් මේ අය වැය කියවන්න හිටියේ මුදල් ඇමතිවරයා ලෙස වත්මන් විපක්ෂ නායකතුමා හෝ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඒ කවුරු හරි තමයි මෙතැන ඉඳන් අය වැය කියවන්න ලෑස්ති වෙලා හිටියේ. ඒ විදියට තමයි අපි ගැන පසුගිය කාලයේ මේ අය කිව්වේ. ඒ වාගේම මේ අය ඡායා කැබිනට් මණ්ඩලයකුත් නම් කර තිබුණා. ජනාධිපතිවරයා නම් කළාට, හැබැයි අගමැතිවරයා නම් කළේ නැහැ. විපක්ෂ නායකතුමා අගමැතිවරයා නම් කළේ නැහැ. අනෙක් අය නම් කළා. කෘෂිකර්ම ඇමති වෙන්නත් සමහරු බලාගෙන හිටියා. ක්‍රීඩා ඇමති වෙන්නත් සමහරු බලාගෙන හිටියා. විදුලිබල ඇමති වෙන්නත් සමහරු බලාගෙන හිටියා. එහෙම තමයි මේ අය හිටියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්, 2024 අගෝස්තු මාසයේ අපි බලය ගන්නකොට මේ රටේ ඉන්ධන මිල ගණන් තිබුණු ආකාරය පිළිබඳව. එදා ඔක්ටේන් 92 වර්ගයේ පෙට්‍රල් ලීටරයක් තිබුණේ රුපියල් 332කට. අද ඒ පෙට්‍රල් ලීටරය රුපියල් 294යි. රුපියල් 38කින් අඩු වෙලා තිබෙනවා. එදා ඔක්ටේන් 95 වර්ගයේ පෙට්‍රල් ලීටරයක් තිබුණේ රුපියල් 377කට. අද වෙනකොට ඒ පෙට්‍රල් ලීටරයක් රුපියල් 335යි. රුපියල් 42කින් අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම එදා රුපියල් 307ට තිබුණු ඩීසල් ලීටරය අද රුපියල් 277 දක්වා රුපියල් 30කින් අඩු වෙලා තිබෙනවා. සුපිරි ඩීසල් ලීටරය රුපියල් 352 සිට රුපියල් 318 දක්වා රුපියල් 34කින් අඩුවෙලා තිබෙනවා. ලාම්පුතෙල් ලීටරය රුපියල් 202 සිට රුපියල් 180 දක්වා රුපියල් 22කින් අඩුවෙලා තිබෙනවා. නමුත්, මේ උදවිය බලාගෙන හිටියේ අපේ ආණ්ඩුව ආවාට පස්සේ තෙල් පෝලිම් හැදෙනකල්. නමුත්, අපේ ආණ්ඩුව මේ වෙනකොට සෑම ඉන්ධන වර්ගයකම මිල පහත දමා තිබෙනවා.

ඒ වාගේම මෙතුමන්ලා පසුගිය කාලයේ විදුලිය ගැනත් කථා කළා. අපි ඇවිල්ලා සියයට 30කින්, 40කින් විදුලි බිල වැඩි කළා වාගේ තමයි කථා කළේ. 2024 සැප්තැම්බර් මාසයේ ඒකක 90ක් පාවිච්චි කරපු කෙනෙකුගේ විදුලි බිල, රුපියල් 1,824යි. හැබැයි, 2025 සැප්තැම්බර් මාසයේ ඉඳලා මේ වෙනකොට ඒකක 90ක් පාවිච්චි කරන කෙනෙකුගේ විදුලි බිල රුපියල් 1,720යි. කියපු තරම් ප්‍රමාණයකින් බැරි වුණත්, යම් ප්‍රමාණයකින් විදුලි බිල අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම කිව්වා, අපි ඩොලරය පිළිබඳව දන්නේ නැහැ කියලා. අපේ ආණ්ඩුව බලයට එන වෙලාවේ ඩොලරය රුපියල් 600 දක්වා වැඩි වන එකක් ගැන තමයි මේ අය කථා කළේ. හැබැයි අපි දන්නවා, 2024 සැප්තැම්බර් 21 ජනාධිපතිවරණය පවත්වන දවසේ ඩොලරයේ මධ්‍ය අගය රුපියල් 301යි ශත 49යි කියලා. ඊයේ වෙනකොට එය රුපියල් 303යි ශත 99යි. ලොකු වෙනසක් වෙලා නැහැ. නමුත් කිව්වේ මොකක්ද? ඩොලරය රුපියල් 600 දක්වා යනවා, මේ රට වැටෙනවා කියලා. එහෙම තමයි කිව්වේ.

ඒ වාගේම පසුගිය කාලයේ මේ රටේ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල කොහොමද තිබුණේ කියලා අපි මතක් කරන්න ඕනෑ. මොකද, අත්‍යවශ්‍ය භාණ්ඩ නැතුව, කන්න නැතුව ජනතාවට පෝලිම්වල ඉන්න වෙයි කියලා තමයි කිව්වේ. අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක අද පවතින මිල මම කියන්නම්. එදා හාල් කිලෝවක මිල තිබුණේ රුපියල් 200යි, 220යි අතර. අදත් ඒ මිල වෙනස් වෙලා නැහැ. අල කිලෝ එකක් එදා තිබුණේ රුපියල් 280ක සාමාන්‍ය අගයක. අද එය රුපියල් 220 දක්වා අඩුවෙලා තිබෙනවා. එදා පරිප්පු කිලෝවක මිල තිබුණේ රුපියල් 380යි, 420යි අතර. අද රුපියල් 250 මිලට ඇවිල්ලා තිබෙනවා. බී ලූනු කිලෝ එකක් එදා රුපියල් 220යි, 260යි අතර තිබුණේ, අද එය රුපියල් 175 දක්වා ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම කුකුළු මස් කිලෝ එකක මිල එදා තිබුණේ රුපියල් 1,050ත්, 1,200ත් අතර. අද එය රුපියල් 1,000ට ඇවිල්ලා තිබෙනවා. එදා බිත්තරයක මිල තිබුණේ රුපියල් 55ත්, 60ත් අතර. අද රුපියල් 30ට තිබෙනවා. පාන් ගෙඩියක් තිබුණේ රුපියල් 160ට. අද එය රුපියල් 120යි, 130යි අතරට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම කිව්වා, කන්න නැතුව ජනතාව පෝලිම්වල ඉන්නවා කියලා. මේවා මතක් කරලා දෙන්න ඕනෑ වෙන මොනවත් නිසා නොවෙයි, කිසිම දෙයක් නොකරපු කණ්ඩායමක් හැටියට අප හැඳින්වූ නිසායි.

විශේෂයෙන්ම ඊයේ පැවති විවාදය ඇතුළේ නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා වතු කම්කරු ජනතාවට ආණ්ඩුවෙන් ලබා දෙන්න යන රුපියල් 200 පිළිබඳව ඉතාම කනගාටුදායක ප්‍රකාශයක් කළා. අපි දන්නවා, ලක්ෂයක් පමණ වතු කම්කරු ජනතාව අවුරුදු 130ක වාගේ කාලයක ඉඳලා වැඩ කරනවා කියලා.

සාමාන්‍යයෙන් දවස් 22ක්, 25ක් වාගේ තමයි ඔවුන්ට වැඩ කරන්න ලැබෙන්නේ. එහෙම බැලුවාම ඔවුන්ට වැටුප විධියට මාසයකට ලැබෙන්නේ රුපියල් 29,700යි. මේ ආණ්ඩුව වතු හාම්පුතුන් සමඟ සාකච්ඡා කළේ වතු කම්කරු ජනතාවට වැඩි කරන ප්‍රමාණය සමඟ රුපියල් 10,000ක් හෝ 20,000ක් අතර ප්‍රමාණයක තබන්නයි. අපි දන්නවා, වතු කම්කරුවන්ට උපරිමය විධියට ලැබෙන රුපියල් 10,000 කියන්නේත් ඉතා විශාල මුදලක් බව. එම නිසා අපි කනගාටු වෙනවා, විපක්ෂය වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම ගැන මෙලෙස කථා කිරීම ගැන. එවැනි තත්ත්වයක් ඇතුළේයි අපි මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. අපි දන්නවා, වතු කම්කරු ජනතාව ගත කරන්නේ ඉතාම දුක්ඛිත ජීවිත කියලා. ඒ ජනතාවට ලැබෙන වැටුප ජීවත් වෙන්න ප්‍රමාණවත් නැහැ. ඒ නිසා තමයි ආණ්ඩුවක් හැටියට අපි ඔවුන්ට වැඩි වැටුපක් ලබා දෙන්න උත්සාහ කරන්නේ. අපි දැක්කා, විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් ඒකට නොයෙක් දේවල් කියනවා. අපි හිතන්නේ ඔවුන් වතු හාම්පුතුන් වෙනුවෙන් කටයුතු කරනවා කියායි.

ඊයේ එක මන්ත්‍රීවරයෙක් අපට සමාජවාදයයි, ලිබරල්වාදයයි උගන්වන්න හැදුවා. මම හිතන්නේ, එතැනදි එතුමා පටලවා ගත්තා. ඒ නිසා ලිබරල්වාදයයි, සමාජවාදයයි ගැන කියන්නේ නැතුව, පන්තිවල ළමයින්ට කථා කරනවා වාගේ එතුමා ඔහේ කථා කරගෙන ගියා. මම එතුමාට කියනවා, හොඳට පොත පත කියවලා ඇවිල්ලා ඔය ටික කථා කළා නම් වඩාත් හොඳයි කියලා.මේ විපක්ෂය නොයෙක් අවස්ථාවල නඟන නොයෙක් අවලාද මැද්දේ තමයි අපි මේ අය වැය විවාදය තුළ කථා කරන්නේ.

2026 අය වැය ඇතුළේ ප්‍රධාන උපායමාර්ගික අරමුණු 6ක් එක්කයි අපි කටයුතු කරමින් ඉන්නේ. ඒ අතරින් තිරසර සහ සෑමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් ඇති කිරීම තමයි අපේ ප්‍රධාන අරමුණ. ඒක තමයි අපේ ඉලක්කය. අපේ ඊළඟ අරමුණ වන්නේ, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක් ලබා ගැනීම. මේ වසරේ ඉදිරි කාලවලදී අපනයන විවිධාංගීකරණය තුළින් විශේෂයෙන්ම මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න අපි බලාපොරොත්තු වෙනවා. ණය තිරසරභාවය සහතික කිරීම අපේ ඊළඟ අරමුණ වනවා. ඒ පිළිබඳව කථා කළොත්, අපි දන්නවා දැන් අපට ගෙවන්න තිබෙන්නේත් ඉතිහාසයේ ගත්ත මහා ණය කන්දක් කියලා. අපි මේ අවුරුද්දේත් ඩොලර් මිලියන 2,200ක වාගේ ප්‍රමාණයක ණය මුදලක් ගෙවමින් යනවා. ඒ වාගේම නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම අපගේ තවත් අරමුණක් වනවා. අපි දන්නවා, නිෂ්පාදන ආර්ථිකයේදී සමහර සාම්ප්‍රදායික කර්මාන්ත අලුතින් ආරම්භ කරනවා වාගේම, අලුත් නිෂ්පාදන කර්මාන්තත් ආරම්භ කරන්න ඕනෑ බව. ඒ හරහා ග්‍රාමීය දිළිඳු බව නැති කරන්නත් ඕනෑ. ඒ නිසා තමයි අපි අය වැයෙන් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා තිබෙන්නේ. අපි ඩිජිටල් ආර්ථිකයකට යන්න ඕනෑ. ඒ හරහා දැන් ලෝකය දියුණු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ රටත් දියුණු කරන්න ඕනෑ. ඒ නිසා තමයි ඩිජිටල් ආර්ථිකය අපේ ප්‍රධාන ප්‍රතිපත්තියක් බවට පත් වෙන්නේ. ඒ නිසා ඒ ඩිජිටල් ආර්ථිකය හරහා යන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි මේ වැඩ කටයුතු කරද්දී, අපේ රාජ්‍ය සේවය ඇතුළේ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙන බව අප දන්නවා. ඒ නිසා අපි මේ අය වැයෙන් නිලධාරින් 70,000ක පමණ ප්‍රමාණයක් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. අපි මේ කටයුතු කරගෙන යද්දී පේනවා, තාක්ෂණ නිලධාරින්ගේ, ඉංජිනේරුවරුන්ගේ හිඟයක් තිබෙන බව. අපට ඒ තනතුරු ඉක්මනින් පුරවා ගන්න ඕනෑ. මේ ප්‍රශ්නය නිසා තමයි අය වැය ප්‍රගතිය සියයට 50 කියලා ගිය අවුරුද්දේ අය වැය පිළිබඳව කථා කරන්නේ. මේ අවුරුද්දේ තවත් මාසයක්, දෙකක් ඉදිරියට යන්න තිබෙනවා. අපි සංවර්ධන කටයුතු ඇතුළේ නාස්තිය, හොරකම, දූෂණය අඩු කරලා තිබෙනවා. අපට ඒ සඳහා හොඳ උදාහරණ තිබෙනවා. වෙන දා ටෙන්ඩර් එකක් නිශ්චිත මුදලට ගත්තා නම්, අද ඒක විශාල ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා. අද ඒවායින් කරන කාර්යභාරය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන් කියන්න ඕනෑ, මේ අය වැය තුළ මේ ආර්ථිකය හදන්න විශේෂ සැලසුම් ප්‍රමාණයක් තිබෙන බව. ඉදිරියේදී මේ පිළිබඳව සාකච්ඡා කරලා, මේ රට නිවැරදි මාවතකට ගේන්න, නිවැරදි වෙනසක් කරන්න මේ ආණ්ඩුව කටයුතු කරනවා කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සාගරිකා අතාවුද මහත්මියගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සාගරිකා අතාවුද මහත්මිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 3.01]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතාම ඉක්මනින් සුවපත් වන ආර්ථික, සමාජයීය වටපිටාවක යථාර්ථවාදීවූත්, ප්‍රායෝගිකවූත්, දාර්ශනික වැඩ පිළිවෙළක් සහිතවූත් අය වැයක් ගැන කථා කරන්න මට අවස්ථාව ලැබීම භාග්‍යයක් කියලා මා සලකනවා. ඒ වාගේම මුදල් ඇමතිවරයා විධියට ගරු ජනාධිපතිතුමා විසින් හෙළි කරන ලද සාර්ථක උපාය මාර්ගික සැලසුම් ඔස්සේ ලබා ගත් ආර්ථික ජයග්‍රහණ, සමාජයීය ජයග්‍රහණ බවට පෙරළා පරිවර්තනය කිරීමේ කාර්යයේදී පංගුකාරයන් වශයෙන් මේ අය වැය විවාදයට සහභාගි වීමට ලැබීමත් භාග්‍යයක්. අපි මේ ලබා ගනිමින් තිබෙන ආර්ථික ජයග්‍රහණ හුදෙක් පරිභෝජනවාදී මනෝභාවයකින් යුතුව පරිභෝජනය කරනු වෙනුවට, මේ ලබා ගත් ආර්ථික ජයග්‍රහණ පෙරළා මේ බිමේ

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

ආයෝජනය කරලා, වඩවඩාත් තියුණු සහ වඩවඩාත් දියුණු ජයග්‍රහණ බවට අනාගතයේ පරිවර්තනය කරන්න අපි හැමදෙනාටම වගකීමක් තිබෙනවා. ඒ නිසා මේ ලබා ගත් ආර්ථික ජයග්‍රහණ හුදෙක් පරිභෝජනවාදයක් ඇතුළේ ගිල්වලා දමන්න අපි රජයක් විධියට සූදානම් නැහැ.

ඒ අනුව මේ අය වැය හුදෙක් ආණ්ඩුවේ ලබන වසර සඳහා අය සහ වැය අතර වූ ඉලක්කම් සන්දර්ශනයක් නොවෙයි. මේක අපේ රටේ ඉතිහාසය ලිවීමේදී වැදගත් වන අපේ රටේ අනාගතය පිළිබඳව වූ තීරණාත්මක සන්ධිස්ථානයක්. අපි සුවපත් සමාජයක් හා නීරෝගී දිවි පැවැත්මක් කියන කාරණය ගත්තාම, මේ අය වැයෙන් ඉතා විශාල මුදලක් - දළ වශයෙන් ගත්තොත් රුපියල් බිලියන 543.1ක් - ඒ සඳහා වෙන් කරලා තිබෙනවා. එයින් රුපියල් බිලියන 516.7ක් කෙළින්ම සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව ඊයේත්, අදත් කථා කරලා තිබුණා. සෞඛ්‍යය සේවාව කියන්නේ, හුදෙක් ලෙඩ, ලෙඩවීම සහ ඒවාට ප්‍රතිකාර කිරීම කියලා අපි පිළිගන්නේ නැහැ. සෞඛ්‍යය කියන්නේ ඉතාම පුළුල් විෂයයක්.

සෞඛ්‍ය සම්බන්ධයෙන් රජයක් විධියට අපි බලාපොරොත්තු වෙන්නේ well-being කියන එක. සුවපත්භාවය කියන එක අපේ රටේ ජනතාවට ළඟා කර දීම. සුවපත්භාවය කියන එකට කායික සුවපත්භාවයත්, මානසික සුවපත්භාවයත්, සමාජයීය වාගේම ආර්ථික සුවපත්භාවයත් ඇතුළත් වෙනවා. මෙන්න මේ පුළුල් අර්ථයෙන් තමයි අපි සෞඛ්‍ය කියන එක සලකන්නේ. ඒ වාගේම ලෝකයේ කථා වෙනවා, සෞඛ්‍ය තීරණය කරන නිර්ණායක ගැන. සෞඛ්‍ය තීරණය කරන සමාජ නිර්ණායක - social determinants - තිබෙනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශයට ඒවා සෘජුවම අයිති නොවුණත්, ඒවා මේ රටේ ජනතාවගේ සෞඛ්‍ය තීරණය කිරීම සඳහා අතිවිශාල බලපෑමක් එල්ල කරනවා. ජලය හා සනීපාරක්ෂාව, මහාමාර්ග, ප්‍රවාහනය, අධ්‍යාපනය, පරිසරය කියන මේ සියල්ල සෞඛ්‍ය කියන කාරණයත් එක්ක බැඳෙනවා. අපි දකිනවා, මේ අය වැය තුළින් මේ සියලු කාරණා සඳහා සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා වාගේම, ඒ මුදල වියදම් කිරීමේ උපාය මාර්ග සහ විද්‍යාත්මක වූ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවාය කියලා.

අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිපත්තිමය වෙනස්වීම්, ව්‍යුහාත්මක වෙනස්වීම් වාගේම ක්‍රියාකාරිත්වයේ වූ වෙනස්වීම් කළ යුතු අවුරුද්දක් බවට ලබන අවුරුද්ද පත් වෙනවා. ඒ සඳහා වූ උපාය මාර්ග සැලසුම් ඇතුළේ තමයි සෞඛ්‍ය සඳහා වියදම් අපි පෙළගස්වලා තිබෙන්නේ. විශේෂයෙන්ම මෙවර අය වැයෙන් අපි සෞඛ්‍ය සම්බන්ධව ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ කථා කරනවා. එකක් තමයි, ආකර්ෂණීය රෝහලක් කියන එක. එහෙම නැත්නම් ආකර්ෂණීය සෞඛ්‍ය ආයතනය කියන එක. ඒ එක්කම, තෘප්තිමත් සෞඛ්‍ය සේවකයන් කියන එක වාගේම සුවපත් ශ්‍රී ලාංකික ජනතාවක් කියන එක.

අපි ආකර්ෂණීය රෝහලක් බවට අපේ රෝහල් පත් කළ යුත්තේ ඇයි? අපේ රටේ ජනතාව යන්න අකැමැතිම ස්ථාන කිහිපයකින් එකක් තමයි රෝහල. ඔවුන් පොලීසියට යන්නේත් කැමැත්තකින් නොවෙයි. යන්න ඕනෑම වුණොත් යනවා. රෝහලකට යන්නේ කැමැත්තකින් නොවෙයි. යන්නම ඕනෑ වුණොත් යනවා. ඒ වාගේම රජයේ කන්තෝරුවකට යන්නේ කැමැත්තකින් නොවෙයි. යන්නම ඕනෑ වුණොත් යනවා. ඒ නිසා ජනතාවට වඩාත් සුවදායක විධියට, ජනතාවට වඩාත් හිතකාමී රෝහල් පද්ධතියක් බවට මේ රෝහල් පද්ධතිය පත් කිරීමේ කාර්යය අපි මේ අය වැය තුළින් කරගෙන යනවා. අපි පසුගිය අය වැය තුළින් ඒක පටන් ගත්තා. දැන් අපි ඒක ඉදිරියට කරගෙන යනවා. රෝහල්වල භාගෙට ඉදිකරලා තිබුණු සියලු ගොඩනැඟිලි ඉදිකිරීම් නිම කිරීම සඳහා වූ මුදල් අපි මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ඉතාම විශාල මුදලක් ඒ සඳහා වෙන් කරලා තිබෙනවා.

අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සහ අනෙකුත් නඩත්තු කටයුතු සඳහා සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම රෝහල් ඩිජිටල්කරණය, ඒ දත්ත පද්ධති පවත්වාගෙන යෑම වාගේම අලුතින් දත්ත පද්ධති නිර්මාණය කිරීම සඳහාත් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. මේ සියලු කාරණා ගත්තාම රෝහල් පද්ධතිය ඇතුළේ වඩාත් කැපී පෙනෙන වෙනසක් කිරීම සඳහා වූ ක්‍රියාදාමය අපි අරගෙන තිබෙනවා.

ඒ වාගේම රෝහල් ගැන කථා කරනකොට කියන එකක් තමයි, ඖෂධ නැහැ කියන කාරණය. ඒ ඖෂධ නැති වෙන්න හේතු කාරණා ගොඩක් බලපාලා තිබුණා. 2024 අවුරුද්දේ ඖෂධ සඳහා වූ මුළු වියදම රුපියල් බිලියන 39 ගණනක්. දළ වශයෙන් රුපියල් බිලියන 40කට ආසන්න ගණනක් තමයි ඖෂධ සඳහා වියදම් කරලා තිබුණේ. නමුත් 2025 වසරේ අපි රුපියල් බිලියන 130කට වැඩි මුදලක් මේ වෙනකොට වියදම් කරලා තිබෙනවා. ඒ කියන්නේ, 2024 වර්ෂය වාගේ තුන් ගුණයකටත් වැඩි මුදලක් අපි ඒ සඳහා මෙවර වියදම් කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද අග වනවිට මේක රුපියල් බිලියන 160 දක්වා විතර ප්‍රමාණයකට යයි කියලා. ඒ කියන්නේ අපි ගිය සැරේ වෙන් කරපු රුපියල් බිලියන 185න් සෑහෙන මුදලක් අපි ඒ සඳහා පාවිච්චි කරලා තිබෙනවා.

සමහර මන්ත්‍රීවරු ඊයේ කථා කරනකොට කියනවා, "සියයට මෙච්චරයි, බොහොම පොඩි ගණන් තමයි ගිය සැරේ වෙන් කරපු මුදල්වලින් පාවිච්චි වෙලා තිබෙන්නේ" කියලා. ඒ තොරතුරු අරගෙන තිබෙන්නේ මේ අවුරුද්දේ ජූනිවල තිබුණු සංඛ්‍යාලේඛනවලින්. අපි ප්‍රායෝගිකව දන්නවා, අප්‍රේල් මාසයේ සම්මත කළ අය වැයකින් ජූනි මාසයේ කරපු වියදම් සන්සන්දනය කරලා ගිය සැරේ ඒ අය වැය ගැන එහෙම කථා කිරීම එච්චර සාධාරණ නැහැ කියලා. මොකද, දැන් තමයි ඒ bills ගොඩක් එන්නේ.

ඒ වාගේම ඊයේ ගරු මන්ත්‍රීතුමියක් ඖෂධ ගැන කිව්වා. එතුමියට හැමදාම ගණන් වරදිනවා. එතුමිය කිව්වා, බෙහෙත් වර්ග 300 ගණනක්ද කොහේද නැහැ කියලා. ඇත්තටම අද වෙනකොට අපට බෙහෙත් වර්ග 60 ගණනක අඩුවක් තිබෙනවා. නමුත් ඒ බෙහෙත් පෞද්ගලික අංශයෙන් මිලදී ගැනීම සඳහා අපි රෝහල්වලට මුදල් දීලා තිබෙනවා. ඒ මුදල් ලබා දීම කොච්චරද කිව්වොත්, 2024 අවුරුද්දේ ඖෂධ සඳහා රුපියල් බිලියන 39ක් වියදම් කරනකොට අපි මෙවර ඒ අඩු ඖෂධ ලබා ගැනීම සඳහා පමණක් රෝහල් පද්ධතියට රුපියල් බිලියන 34ක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ, 2024 අවුරුද්දේ ඖෂධ සඳහා ගිය මුළු budget එකට සමාන ගණනක් අපි ප්‍රාදේශීය මිලදී ගැනීම් සඳහා පමණක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේමයි උපකරණ. පසුගිය අවුරුදු කිහිපය තුළ උපකරණ මිලදී ගැනීමක් සිදු වෙලා තිබුණේ නැහැ. MRI යන්ත්‍ර, CT scan යන්ත්‍ර වැනි නොයෙකුත් ආකාරයේ high-end machines ගත්තාම අවුරුදු 20ක් හෝ ඊට වඩා පැරණි machines තමයි තිබුණේ. අපි ඒ පිළිබඳව සොයා බලා, ඒ අවශ්‍ය machines මිලදී ගැනීම සඳහා 2025 අය වැයෙන් මුදල් වෙන් කළා වාගේම, 2026 අය වැයෙනුත් සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා. නව උපකරණ මිලදී ගැනීම සඳහා අපි රුපියල් බිලියන 13.6ක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම ඒ උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා අපි තවත් රුපියල් බිලියන අටයි දශම ගණනක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තිබෙන උපකරණවල අලුත්වැඩියා කටයුතු සඳහා, විශේෂිත වූ අලුත්වැඩියා කටයුතු සඳහාත් අපි මුදල් වෙන් කර තිබෙනවා. පසුගිය දවස්වල අපට පෙනී ගිය තවත් දෙයක් තමයි, ඒ උපකරණ කැඩුණාම ඒවා හදන්න යම් කිසි කාලයක් ගත වෙන බව. ඒකට හේතුව මොකක්ද? ඒ හැම උපකරණයකටම යම් service agreement එකක් sign කරන්න ඕනෑ. ඒක හරියට අපි වාහනයක් insure කරනවා වාගේ වැඩක්. නමුත් පසුගිය අවුරුදුවල ඒ උපකරණවලට අදාළ service agreements sign කරලා තිබුණේ නැහැ. ඒකේ ප්‍රතිඵලය වුණේ මොකක්ද? ඒ උපකරණවල යම් යම් කොටස් නැවත ප්‍රතිස්ථාපනය කිරීමේදී විශාල කාලයක් ගත වීම. ඒ නිසා අපි මේ වතාවේ service agreements sign කරන්නම සෑහෙන මුදලක්, රුපියල් මිලියන 100ක පමණ මුදලක් වෙන් කරලා තිබෙනවා.

සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම සෞඛ්‍ය සේවකයන් කියන්නේ ඉතාම වැදගත් පිරිසක්. ඒ සෞඛ්‍ය සේවකයන්ට අවශ්‍ය වැටුප්, දීමනා සියල්ල අපි ගිය වර අය වැයෙන් යම් කොටසක් වැඩි කළා. මෙවර අය වැයෙන් තවත් කොටසක් වැඩි වෙනවා. ඉතුරු කොටස ලබන අය වැයෙන් වැඩි වෙනවා. ඒ වාගේම සමහර අවස්ථා තිබුණා, සෞඛ්‍ය සේවකයන් වැඩ කළාට, අතිකාල සේවා කළාට දීමනා ගෙව්වේ නැති. නමුත් අපි ඒ ගෙවීම් සියල්ල නිසි පරිදි කරගෙන යනවා. ඒ වාගේම ඔවුන්ට තිබෙන වරප්‍රසාද කිසිම දෙයක් අපි නැති කරන්නේ නැහැ. ඒ වරප්‍රසාද මේ රටේ ආර්ථිකයේ ප්‍රතිලාභ ලැබීමට සාපේක්ෂව අපි ඔවුන්ට ලබා දීමට ක්‍රියා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

පොදුවේ ගත්තාම කියන්න තිබෙන්නේ, අපි මේ අය වැය තුළින් යම් විධියකට මේ රටේ ජනතාවගේ ජීවත් වීමේ අයිතිය, සෞඛ්‍යය නිසි ලෙස පවත්වාගෙන යෑම සඳහා වූ අයිතිය -ඒක ජනතාවගේ මූලික අයිතියක්- තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන බවයි. ඒ නිසා රජයේ මේ ක්‍රියාදාමයත් එක්ක එකතු වෙලා සුබදායී ගමනක් යමු කියලා අපි සියලුදෙනාට ආරාධනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.13]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் அண்மையில் ஆரம்பித்திருக்கின்ற போதைக்கு எதிரான நடவடிக்கையை இலங்கையன் என்ற வகையிலே நான் இந்தச் சபையிலே பாராட்ட விரும்புகிறேன். அதனை நாடளாவிய ரீதியில் பலரும் பாராட்டுவதையும் அவதானித்திருக்கின்றேன். அம்பாறை மாவட்டத்தின் அநேகமான பிரதேச செயலாளர் பிரிவுகளில், குறிப்பாக அட்டாளைச்சேனை, அக்கரைப்பற்று, பொத்துவில் உட்பட பல பிரதேசங்களில் இந்த எதிர்ப்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றன. அக்கரைப்பற்று பிரதேச செயலாளர் பிரிவிலே விசேட அறிவூட்டும் நிகழ்வொன்றினை "Rangeview இலங்கை அமைப்பு" நடத்தியது. 2006ஆம் ஆண்டின் 05ஆம் இலக்க, பணம் தூய்தாக்கல் தடைச் சட்டத்தைத் திருத்தி சிறப்பு ஆணைக்குழுவை அமைக்க வேண்டும் என்ற அடிப்படையிலே இந்த நிகழ்வு இடம்பெற்றது. மூன்று விடயங்களை மேற்கொள்ள இந்த அமைப்பு எதிர்பார்க்கின்றது. ஒன்று: மாணவர்கள், இளைஞர்கள், பெற்றோர் மற்றும் சமூகத்தை மையப்படுத்திய விழிப்புணர்வு நடவடிக்கைகள்மூலம் போதைப்பொருள் பழக்கத்தைத் தடுக்கும் முயற்சி; இரண்டு: போதைக்கு அடிமையானவர்களுக்குச் சமூக, மருத்துவ ஆதரவு வழங்கி மீளச் சமூக வாழ்வுக்குக் கொண்டுவருதல்; மூன்று: அரச துறை, சமூகப் பாதுகாப்பு மற்றும் தன்னார்வ அமைப்புகள் செயற்படு மையமாக இணைந்திருந்து தடுப்பு மற்றும் மீட்பு நடவடிக்கைகளைத் தொடராக மேற்கொள்ளல். இதைத் தலைமைதாங்கி நடாத்திய கலாநிதி எஸ்.எம். தல்ஹா மற்றும் டொக்டர் எம். ஜே. நௌபல், சட்டத்தரணி கே. சமீம், எப் குத்தூஸ், எம்.சீ. கால்தீன், நகர பிதா யூ.எல். உவைஸ், பிரதேச செயலாளர் டீ. எம். அன்சார், சட்டத்தரணி சாதீர், சட்டத்தரணி பைஸால் மொஹைடீன், நகர சபை உறுப்பினர் தவம் உட்பட இந்த விடயங்களில் செயற்பட்ட அனைவரையும் நான் இந்தச் சபையிலே பாராட்ட விரும்புகிறேன்.

2006ஆம் ஆண்டின் 05ஆம் இலக்க, பணம் தூய்தாக்கல் தடைச் சட்டம் - Prevention of Money Laundering Act, No.5 of 2006 - திருத்தப்பட்டு, சிறப்பு ஆணைக்குழுவொன்று ஏற்படுத்தப்படல் வேண்டுமென இந்தச் சபையைக் கேட்க விரும்புகிறேன். இந்தச் சட்டம் திருத்தப்பட்டு நடைமுறைப்படுத்தப்படுவது போதைப்பொருள் வலையமைப்புகளை நிதியளவில் தடுக்கவும் நாட்டில் சட்டம், ஒழுங்கு மற்றும் சமூக நலனை ஒழுங்குபடுத்தவும் முக்கிய பங்கு வகிக்கும் என்று நம்புகிறேன். மேலும், இத்துடன் இணைந்ததாக நாட்டுக்கு ஒருபுறமாக வருமானத்தை ஈட்டித்தருகின்ற சாராய barகளையும் மூடுவதற்கு அரசு நடவடிக்கை எடுத்தால், நிச்சயமாக மாண்புமிகு ஜனாதிபதி எடுக்கின்ற இந்த முயற்சி முழுப் பயனையும் தரும் என்று நான் எதிர்பார்க்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டிலே 1994ஆம் ஆண்டு கபடி விளையாட்டானது ஆரம்பிக்கப்பட்டபோது, இளைஞர் சேவைகள் மன்றம் மூலமான போட்டிகளில் 1997ஆம், 1998ஆம் ஆண்டுகளில் மாவட்ட ரீதியில் நிந்தவூர் மதீனா விளையாட்டுக் கழகம் மூன்றாம் இடத்தைப் பெற்றது. தொடர்ந்து 2000ஆம் ஆண்டு முதல் பாடசாலை ரீதியாக அல்-மதீனா தேசியப் பாடசாலை, அல்-அஷ்ரக் தேசிய பாடசாலை ஆகியன பல வெற்றிகளைப் பெற்றன. மேலும், பாடசாலை மட்டத் தேசியப் போட்டிகளில் இவ்விரண்டு பாடசாலைகளின் கபடி அணிகளும் பல வெற்றிகளைப் பெற்றுள்ளன. 2022ஆம் ஆண்டில் 17 வயதுப் பிரிவின்கீழ் அல்-மதீனா தேசியப் பாடசாலை மற்றும் அல்-அஷ்ரக் தேசியப் பாடசாலை அணியினர் வெற்றிபெற்றனர். குறிப்பாக இந்த ஆண்டிலே பாடசாலை மட்டத் தேசியப் போட்டி நிந்தவூரிலே நடத்தப்பட்டபோது, 17 வயதுப் பிரிவின்கீழ் அல்-மதீனா தேசியப் பாடசாலையும், 20 வயதுப் பிரிவின்கீழ் அல்-அஷ்ரக் தேசியப் பாடசாலையும் தெரிவு செய்யப்பட்டது. மேலும், இளைஞர் சேவைகள் மன்றப் போட்டிகளிலும் மூன்று வருட காலமாக championஆகத்

[ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා]

தெரிவுசெய்யப்பட்டதுடன், 20 ஆண்டுகளுக்கும் மேலாக அம்பாறை மாவட்ட championஆகவும் உள்ளனர். உள்ளகக் கபடிப் போட்டிகளில் தொடர்ந்தும் மூன்று வருட காலமாக இரண்டாம், மூன்றாம் இடங்களைப் பெற்றதுடன், 2022, 2023ஆம் ஆண்டுகளில் கபடி சங்கத்தினால் நடாத்தப்பட்ட போட்டிகளில் championஆகவும் தெரிவு செய்யப் பட்டிருக்கின்றார்கள்.

மேலும், 2016ஆம் ஆண்டிலே சர்வதேச இளையோர் ஆசிய கபடிப் போட்டிக்கு எம்.டீ. அஸ்லம் சஜா தெரிவுசெய்யப்பட்டு நமது நாட்டுக்கு மூன்றாம் இடத்தைப் பெற்றுக் கொடுத்தார். 2018ஆம் ஆண்டில் நாட்டின் junior அணிக்கு ஏ.எம்.எம். ஹாலிஸ், எஸ்.எம். சபிஹான் ஆகியோர் தெரிவு செய்யப்பட்டு உலகக் கிண்ணப் போட்டியில் பங்குபற்றினார்கள். 2021இல் ஏ. எம். எம். காலித் நமது நாட்டு கபடி அணிக்காகத் தெரிவு செய்யப்பட்டார். 2022இல் எஸ். எம். எம். சபிஹான் நமது நாட்டுக் கபடி அணிக்காகத் தெரிவு செய்யப்பட்டார். இவர்கள் 2023இல் பங்கா பந்து போட்டிக்காகத் தெரிவுசெய்யப்பட்டு சிறப்பாகச் செயற்பட்டனர். 2018இல் எம்.டீ. அஸ்லம் சஜா ஆசிய கிண்ணப் போட்டிக்கான தேசிய அணிக்குத் தெரிவு செய்யப்பட்டு, இலங்கை கடற்படை கபடி அணியில் இடம்பிடித்து, 2020, 2021, 2022, 2023ஆம் ஆண்டுகளில் பங்கா பந்து போட்டியில் கலந்து கொண்டார்; 2022இல் உப தலைவராகவும் 2023இல் தலைவராகவும் செயற்பட்டிருக்கிறார். ஆர்.எம். நபீஸ் என்பவரும் இவருடன் நாட்டு அணிக்காக விளையாடி இருக்கின்றார். அஸ்லம் சஜா, 2023, 2024இல் இந்தியாவில் நடைபெற்ற 'புரோகபடி' League போட்டிகளில் "Bengal Warriors" அணியைப் பிரதிநிதித்துவப்படுத்தித் தேர்வானார். மேலும், லண்டனில் நடைபெற்ற British League போட்டிகளிலும் பங்குகொண்டார். மூன்றாவது இளைஞர்கள் ஆசிய கபடிப் போட்டியில் நாட்டு அணியைப் பிரதிநிதித்துவப்படுத்திய அல்-மதீனா விளையாட்டுக்கழகத்தின் ஸைனி, சம்ரி, மில்ஹான், மாஹீ போன்றவர்கள் தமது திறமைகளை வெளிக்காட்டி, நிந்தவூருக்கும் எமது மாவட்டத்துக்கும் எமது நாட்டுக்கும் நற்பெயரைப் பெற்றுத் தந்திருக்கின்றார்கள். முப்படைகளைப் பிரதிநிதித்துவப்படுத்திய Navy அணிக்காக ஹாலிஸ், ரிஸ்னி, அப்லல் ஷரீப், அன்ஷாப் ஆகியோரும் Army அணிக்காக ஹமால், மொஹமட், இஸ்மாயில் ஆகியோரும் விளையாடிக் கொண்டிருக்கின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த விடயங்களை நான் இங்கு தெரிவிப்பதன் நோக்கம், இவ்வாறான வீரர்களைக் கொண்டிருக்கின்ற நிந்தவூர் பிரதேச செயலகப் பிரிவில் ஒரு கபடி விளையாட்டு மைதானம் அமைக்கப்பட வேண்டும் என்பதாகும். எனவே, விரைவாக நிந்தவூர் பிரதேச செயலகப் பிரிவில் கபடி விளையாட்டுக்காக தேசிய ரீதியான மைதானம் ஒன்றை அமைத்துக் கொடுக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த உயரிய சபையைக் கேட்டுக் கொள்கின்றேன். மேலும், இந்தக் கபடி அணியைச் சிறப்பாக வழிநடாத்திக் கொண்டு செல்கின்ற அல்-மதீனா வித்தியாலய அதிபர் றபீஹூ அவர்களுக்கும் அல்-அஷ்ரக் தேசிய பாடசாலையின் அதிபர் கபூர் அவர்களுக்கும் இந்த வேளையில் எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அடுத்து, பொலிஸ் பரிசோதகர் பதவியிலிருந்து பிரதான பொலிஸ் பரிசோதகராகப் பதவி உயர்வு வழங்கும்போது, விசேட அதிரடிப் படையினர் எதிர்நோக்குகின்ற அநீதியான விடயத்தை இந்தச் சபைக்குக் கொண்டுவர விரும்புகின்றேன். இந்த நாட்டில் நடைபெற்ற கொடிய யுத்தத்தை முடிவுக்கு கொண்டுவந்து, 30 ஆண்டுகளின் பின்னர் மூவின மக்களுக்கும் சமாதானத்தை வழிவகுத்ததில் STFஇன் பங்களிப்பு மிகையானது. விசேட அதிரடிப் படையினர் 2005.07.24, 2007.03.25இல் ஆரம்பக் கட்டப் பயிற்சிகளைப் பெற்று, 18 வருட சேவைக் காலத்தைப் பூர்த்தி செய்திருந்தாலும், இதுவரைக்கும் பொலிஸ் பரிசோதகர் சேவையில் 10 வருடங்களைக் கடந்துள்ள 62 பேரில் 10 பேருக்கு மட்டுமே பிரதான பொலிஸ் பரிசோதகர் பதவி வழங்கப்பட்டிருக்கின்றது; மீதமாக 52 பேர் இருக்கின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொலிஸ் சேவையில் 10 வருட காலமாகத் தமது சேவையைச் சிறப்பாக ஆற்றிய பலருக்கு, 159ஆவது பொலிஸ் தினத்தில் சிரேஷ்டத்துவ அடிப்படையில் பதவி உயர்வு வழங்கப்பட்டுள்ளதைச் சந்தோஷத்துடன் குறிப்பிட விரும்புகின்றேன். இவ்வாறான நிலைமைகள் STF சேவையில் உருவாக்கப்படவில்லை என்பது எமக்குக் கவலையளிப்பதுடன், நாட்டுக்காகப் பாடுபட்ட STF வகுதியினரும் கவலை கொண்டுள்ளார்கள். STFஇல் இருந்த 16 பிரதான பொலிஸ் பரிசோதகர் வெற்றிடங்களில் 10 பேருக்கு மட்டுமே பதவி உயர்வு வழங்கப்பட்டுள்ளது. அதுமட்டுமன்றி, பொலிஸ் சமாந்தரமான சேவைகளில் காணப்பட்ட மொத்தம் 323 வெற்றிடங்களுக்காக 153 பேருக்குப் பதவி உயர்வுகள் வழங்கப்பட்டிருப்பதாக அறிகின்றேன். இதில் STFஐத் தவிர, 10 வருட சேவையைப் பூர்த்திசெய்து, 10 வருடங்களுக்கான incrementஐப் பெற்ற ஏனைய சேவைகளைச் சார்ந்தவர்கள் காணப்படுகின்றார்கள். பொலிஸ் பரிசோதகர் பதவிக்குப் பல்வேறு அடிப்படையில் பதவி உயர்வு வழங்கப்படுவதுடன், 10 வருடங்கள் சேவையாற்றியவர்கள் என்ற நிலைமையைக் கவனத்தில் கொள்ளும்போது ஏன் STFக்கு இது பொருத்தமற்றதாக இருக்கின்றது? STF தவிரவும், பொலிஸ் திணைக்களத்தில் காணப்படுகின்ற அனைத்துத் தர வெற்றிடங்களின் எண்ணிக்கையான 323 இல் 153 வெற்றிடங்கள் நிரப்பப்பட்டுள்ளதால், மிகுதி வெற்றிடங்கள் 170 ஆக இருக்கின்றது. STF பிரிவில் 10 பதவி வெற்றிடங்கள் நிரப்பப்பட்டு, மிகுதி வெற்றிடங்கள் இருக்கின்றன. இது ஒரு சிரேஷ்ட துறைக்கு இழைக்கின்ற அநியாயமாகும். அந்த வகையில், பொலிஸ் சேவையிலும் STFஇலும் இருக்கின்ற மொத்த வெற்றிடங்களுக்கும், 10 வருட சேவையையும் 10 வருட சம்பள உயர்ச்சியையும் பெற்றவர்களைப் பிரதான பொலிஸ் பரிசோதகர் பதவிக்கும் ஏனையவர்களைச் சாதாரண பொலிஸ் உத்தியோகத்தர்களாகவும் நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

தற்போது நாட்டில் 73 STF camps இருக்கிறது. இதில் 58 camps கொழும்பில் இருக்கின்றது. இந்த 58 campsஇல் 19இல் மாத்திரமே 'அணதென' எனும் சிரேஷ்ட பொலிஸ் பரிசோதகர்கள் கடமை புரிகின்றார்கள். 10 வருட சேவைக் காலத்தையும் 10 வருட சம்பள உயர்வையும் பெற்றிருக்கின்ற பொலிஸ், STF அனைத்து உத்தியோகத்தர்களையும் பதவி உயர்வுக்குப் பின்னர் ஏற்படும் வெற்றிடத்துக்கு, திறமை மற்றும் எழுத்துப் பரீட்சை அடிப்படையில் நியமனம் செய்வது பொருத்தமாக இருக்குமென்று கருத வேண்டியிருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2025.09.03ஆம் திகதியில் பொலிஸ் பரிசோதகர் பதவியில் 10 வருடத்தைப் பூர்த்தி செய்துள்ள, 10 வருட சம்பள ஏற்றங்களைப் பெற்றுள்ள பொலிஸ் பரிசோதகர்களை, பிரதான பொலிஸ் பரிசோதகர் பதவிக்கு உயர்வு வழங்கியதன் அடிப்படையில், STF பொலிஸ் பரிசோதகர்களை பிரதான பொலிஸ் பரிசோதகர்களாக நியமிக்க நடவடிக்கை எடுக்க முடியுமா? என்பதை இந்தச் சபை ஆலோசித்து, சிறந்த

தீர்மானத்தை எடுத்து, இந்த நாட்டின் 30 வருட கொடிய யுத்தத்தை முடிவுக்கு கொண்டுவர உதவிய STFக்கும் சம அந்தஸ்து வழங்க வேண்டுமென இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அடுத்து, நாடளாவிய ரீதியில் கடமை புரிகின்ற பொது முகாமைத்துவ சேவை உத்தியோகத்தர்கள் சங்கமான, 'மாகாண முகாமைத்துவ சேவைகள் சங்கம்' விடுத்துள்ள ஒரு கோரிக்கையை இந்தச் சபையில் எடுத்துக்கூற விரும்புகின்றேன். நானும் அந்த சேவையில் கடமைபுரிந்து ஓய்வு பெற்றவன். குறித்த சங்கம் சுமார் 3,000 அங்கத்தவர்களைக் கொண்டு இயங்கி வருகின்றது. அதுமட்டுமன்றி, அவர்கள் சங்கத்தின் உரிமைகளைக் கேட்டுப் பெறவேண்டுமென்று துடித்துக் கொண்டிருக்கின்றார்கள். நாடளாவிய ரீதியில் உள்ள சிரேஷ்டத்துவமான பல அரச சேவைகளில் தரம் IIIஇல் உள்ள உத்தியோகத்தர்கள், 6 வருட சேவைக் காலத்தைப் பூர்த்திசெய்து, 6 சம்பளப் படி நிலைகளைப் பெற்றுக்கொண்டால் தரம் IIக்கும், அதில் 6 வருட சேவையையும் 6 வருட சம்பள உயர்வையும் பெற்றுக்கொண்ட அனைத்து உத்தியோகத்தர்களுக்குத் தரம் Iக்கும் பதவி உயர்வு கிடைக்கின்றது. அதுபோல், சுகாதார சேவையில் 5 வருட சேவையை முடித்து, 5 சம்பள உயர்வுகளைப் பெற்றுக்கொண்டால், தரம் IIIஇலிருந்து தரம் IIக்கும், சில பதவியினருக்கு 7 ஆண்டுகள் சேவையைப் பூர்த்திசெய்து, 7 வருட சம்பள உயர்வினையும் பெற்றால், தரம் IIஇலிருந்து தரம் Iக்கும் பதவி உயர்வு வழங்கப்படுகின்றது. ஆனால், முகாமைத்துவ சேவை உத்தியோகத்தர்களுக்கு இவ்வாறான ஏற்பாடுகள் இல்லை என்பது கவலையளிக்கின்றது. எனவே, வழமையான நடைமுறையிலுள்ள சுற்றுநிருபத்தின் பிரகாரம், 20 ஆண்டுகளின் பின் தரம்-Iக்குப் பதவி உயர்த்தப்படும் நிலைமையைத் தவிர்த்து, 12 ஆண்டுகள் பரிபூரண சேவையைப் பூர்த்திசெய்து, 12 வருடாந்தச் சம்பள உயர்ச்சியைப் பெற்ற உத்தியோகத்தர்களைத் தரம்-Iக்கு நிலுவைகள் ஏதுமின்றிப் பதவியுயர்த்த நடவடிக்கை எடுக்க வேண்டும் என்பதுடன், இது செயற்படுத்தப்படும் திகதி 2013.04.02ஆக இருக்க நடவடிக்கை எடுக்க வேண்டும் எனவும் கேட்டுக் கொள்கின்றேன்.

அதுபோல், இணைந்த சேவைகள் பணிப்பாளர் நாயகத்தினால் சிபாரிசு செய்யப்பட்டிருக்கின்ற சம்பளப் படிநிலையை MN-3ஆக்க விரைவாக நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்வதோடு, 1971/14977- 9ஆம் இலக்க சேவைக் குறிப்பின் பிரகாரம், அதிவிசேட வர்த்தமானியின்படி பதவியுயர்வுப் பரீட்சை முறையை மீண்டும் நடைமுறைப்படுத்த நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். முகாமைத்துவ உத்தியோகத்தர் நியமனம் பெற்ற பட்டதாரிகளுக்கு அவர்களுடைய பட்டத்திற்கு ஏற்றாற்போல் சம்பளத்தையும் சம்பளப் படிநிலையையும் ஏற்படுத்திக் கொடுக்க வேண்டும் என்று இந்தச் சபையைக் கேட்பதுடன், இதற்காக உழைக்கின்ற தலைவர் பிரசன்ன தியூனுகே அவர்களுக்கும், கிழக்கு மாகாண இணைப்பாளர் A.L.Kiyasdeen அவர்களுக்கும் எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டிலே கடமை புரிகின்ற முன்பள்ளி ஆசிரியர்களை ஆசிரியர் சேவைக்குள் உள்ளீர்த்து, அவர்களுக்கும் நிரந்தரமான ஒரு நியமனத்தை வழங்க அரசு நடவடிக்கைகளை எடுக்க வேண்டும். தற்போது வழங்கப்படும் 6,000 ரூபாய் கொடுப்பனவு என்பது எதற்குமே பயன்படாத ஒரு தொகையாக இருக்கின்றது என்பதையும் ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

மேலும், பத்திரிகையாளர்களுக்கான உபகரணங்கள், 'கமரா'க்கள் மற்றும் தேவைப்படும் பொருட்களை கடனாக அல்லது மானியமாக வழங்க அரசு நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டும் எனவும் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට විනාඩියක් දෙන්න.

பிரதேச செயலகங்களிலே கடமை புரிகின்ற - துண்டு அடிப்படையில் கொடுப்பனவு பெறும் - கணினித் தட்டெழுத்தாளர்களைக் கவனத்தில் எடுத்து, தகுதி அடிப்படையில் நிரந்தர நியமனம் வழங்க அல்லது அதற்குச் சமமான ஒரு சேவையில் அவர்களைப் பதிலீடாக ஆட்சேர்ப்புச் செய்ய நடவடிக்கை எடுக்க வேண்டும் என்றும் இந்தச் சபையைக் கேட்க விரும்புகின்றேன்.

யானை - மனித மோதலைக் கட்டுப்படுத்த, அம்பாறை மாவட்டத்திலும், குறிப்பாக பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் எல்லைக் கிராமங்களான கோமாரி, கனகர் கிராமம், ஹிதாயபுரம், செங்காமம், ஆத்திமுனை, அல் - ஹுதா, களப்புக்கட்டு RM நகர் போன்ற இடங்களில் யானை வேலிகளை அமைக்க வேண்டும் என்பதுடன், எல்லைக் கிராமங்களிலே இருக்கின்ற அனைத்துப் பாடசாலைகளுக்கும் யானை வேலிகள் அமைத்துத் தரப்பட வேண்டும் எனவும் இந்த வேளையிலே கேட்டுக்கொண்டு, விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලාල් කාන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.26]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டி. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මුලින්ම පොඩි උදාහරණයක් කියන්නම්. ලංකාවේ දේශපාලනය උස පැනීමේ ක්‍රීඩාවට මොහොතකට සමාන කළොත්, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව උස පැනීමේදී මිනුම ගන්න bar එකේ උස ගොඩක් ඉහළට ගෙන තිබෙනවා. ඒ කියන්නේ, අපි ලංකාවේ දේශපාලන සංස්කෘතිය ඉහළට ගෙනැල්ලා තිබෙනවා; විශාල ප්‍රමාණයකින් ඉහළට ගෙනැල්ලා තිබෙනවා. ඒක ජනතාව ඉල්ලන දෙයක්. හැබැයි, අපට පෙනෙනවා, පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න විපක්ෂයත්, පාර්ලිමේන්තුවෙන් පිට ඉන්න විපක්ෂයත් ජාතික ජන බලවේගය ආණ්ඩුව ඒ bar එක ගෙනැල්ලා තිබෙන උස පහු කරලා පැන ගන්න බැරිව ඒ bar එකේ වදිමින්, ඒ bar එක යටින් රිංගමින් මේ අය වැය පිළිබඳ සාකච්ඡාවට සම්බන්ධ වන බවක්. රටේ දේශපාලනය උස පැනීමේ bar එක වාගෙයි. සමාජය ඉල්ලන මට්ටමට ඔසවා

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

තිබෙන ප්‍රමාණයට සරිලන විධියට උස පැනීමක් විපක්ෂය කරන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ අය ඊට යටින් ඉඳන් තමයි මේ දේශපාලන සාකච්ඡාව අරගෙන යන්නේ. ඉස්සෙල්ලාම ඒක කියන්න ඕනෑ. ඒ නිසා මම විපක්ෂයට යෝජනාවක් කරන්න කැමැතියි, රටේ දේශපාලනය ඔසවා තිබෙන තැනට සරිලන විධියට මේ සාකච්ඡාවලට එළියේදීත්, ඇතුළේදීත් සම්බන්ධ වෙන්න කියලා. මා ඒ බව විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගොඩක් කථා වෙච්ච මාතෘකාවක් හින්දා අල, ලූනු ප්‍රශ්නයට අප දෙන විසඳුම ගැන මම ඉස්සෙල්ලාම කියන්නම්. මම මුලින්ම ගොවි ජනතාවට ස්තුතිවන්ත වෙනවා, අරගළයක් කරගෙන යන එක සම්බන්ධයෙන්. ඒ අය පාරට බැහැලා යම් උද්ඝෝෂණයක් කරන එක හොඳ දෙයක්. ඒක වටිනා දෙයක්. මොකද, එතකොට අපට මේ ප්‍රශ්නය ගැන, මේ ගැටලුව ගැන ගැඹුරින් සාකච්ඡාවක් කරලා උත්තරයත් සොයා දෙන්න පුළුවන්. ඒක හොඳයි. එය හැමෝගේම අවධානයටත් හොඳයි. එය විපක්ෂයටත්, පාරිභෝගිකයාටත්, ගොවි ජනතාවටත් හොඳයි. ඒ සියලුදෙනාටම හොඳයි.

අනෙක් අතට, මේ උද්ඝෝෂණයට සම්බන්ධ නොවුණු අල, ලූනු ගොවියෝ ඉන්නවා. ඒ ගොල්ලන් මේකට සම්බන්ධ වෙච්ච නැති එකත් හොඳයි. ඒ වෙන මොකවත් නිසා නොවෙයි, ඒ ගොල්ලන්ට විශ්වාසයක් තිබෙනවා, ඒ ගොල්ලන් මේ උද්ඝෝෂණවලට සම්බන්ධ නොවුණත් ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ ප්‍රශ්නයට උත්තර සොයා දෙනවා කියලා. ඒ විශ්වාසය තබපු ඒ ගොල්ලන්ටත් ස්තුතියි. ඒ වාගේම, මේ උද්ඝෝෂණයට සම්බන්ධ වෙලා සමාජයේ අවධානයක් ගන්න සහ මේ ප්‍රශ්නයට උත්තර සොයන්න ආණ්ඩුව කටයුතු කරන්නේ කොහොමද කියන එක ගැන දැන ගන්න කරන ඒ මැදිහත්වීමත් හොඳයි. ඒ අයටත් ස්තුතියි.

මේකෙන් කියැවෙන එක දෙයක් තිබෙනවා. අපේ රටේ බී ලූනු නිෂ්පාදනය කඩා වැටිලා තිබුණා; අල නිෂ්පාදනය කඩා වැටිලා තිබුණා. දැන් යම් නිෂ්පාදනයක් තිබෙනවා කියලා කියන කොට, එහෙම සාකච්ඡාවක් එනකොට කෘෂි කර්මාන්තය පැත්තෙන් අප යම් පියවරක් ඉස්සරහට තබා තිබෙනවාය කියන අදහසක් ඒකෙන් ගන්න පුළුවන්. බී ලූනු නිෂ්පාදනය උඩට ඇවිල්ලා තිබෙනවා. එහෙම ගත්තාම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සාර්ථකයි; කෘෂිකර්ම ඇමතිත් සාර්ථකයි, කෘෂි නිෂ්පාදනයක් ගෙනැල්ලා තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් මැදිහත් වෙලා, ගොවි ජනතාවත් මැදිහත් වෙලා, කෘෂිකර්ම ඇමතිවරයාත් මැදිහත් වෙලා ගොවි ජනතාවගේ අස්වැන්න විකුණා ගැනීමේ ප්‍රශ්නයක් එන තරමටම බී ලූනු නිෂ්පාදනය පිළිබඳ කථාවක් මෙතැන නිර්මාණය වෙලා තිබෙනවා. ඒක එක පැත්තක්.

එහෙම නම් අනෙක් පැත්තෙන් එනවා, මිල පිළිබඳ ප්‍රශ්නය. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ඇමති අපේ ගරු වසන්ත සමරසිංහ මැතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා.

එහෙම නම්, මේ මිලදී ගැනීම පිළිබඳව වෙළෙඳ අමාත්‍යාංශය පැත්තෙන්ද ප්‍රශ්නය තිබෙන්නේ කියලා දැන් ඇහුවොත්, එතුමාත් - පාරිභෝගික කටයුතු ඇමතිතුමාත්- දැන් සමත් වෙලා ඉන්නේ. මොකද, බී ලූනු මිල සම්බන්ධයෙන් පාරිභෝගිකයාට ප්‍රශ්නයක් නැහැ. ලංකාවේ පාරිභෝගිකයාට බී ලූනු මිල සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. අල මිල සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශයයි, ගොවියෝයි සම්බන්ධ වෙලා වචලා තිබෙනවා. ඒකත් හරි. වෙළෙඳ ඇමතිතුමා පාරිභෝගිකයන්ගේ පැත්තත් බේරලා තිබෙනවා. ඒකත් හරි. හැබැයි, ගොවි ජනතාවට ප්‍රශ්නයක් ඉතුරු වෙලාත් තිබෙනවා. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නයට උත්තරය මම ගොවි ජනතාවටත්, මේ සභාවටත් කියන්නම්. එකක්, මේ වනකොට සතොස බී ලූනු මිලදී ගන්නවා, රුපියල් 145ට. අද වනකොට වෙළෙඳ පොළේ බී ලූනු කිලෝ එකක මිල රුපියල් 160, 165යි. මේ වනකොට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ බී ලූනු කිලෝ එකක මිල රුපියල් 165යි, 170යි. අපි බී ලූනු මිලදී ගන්න පටන් ගත්තේ රුපියල් 130න්. ඒ කියන්නේ, රජයේ මැදිහත් වීමක් තිබෙනවා. රජය අහක බලාගෙන ඉඳලා නැහැ. පිට රටින් ගෙනෙන බී ලූනුවලට බද්ද තිබ්බේ රුපියල් 10යි. ඒකට තව රුපියල් 40ක් එකතු කරලා රුපියල් 50ක බද්දකුත් ගැහුවා. ඒත් ගොවි ජනතාව වෙනුවෙන්. අපි මිලදී ගැනීමේ වැඩ පිළිවෙළකුත් ගෙනාවා. ඒත් ගොවි ජනතාව වෙනුවෙන්. නමුත් ඇත්ත ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳිලා නැහැ. අපි මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳීමට අදාළ කරන වැඩ පිළිවෙළකත් ඉන්නවා. දැනට වෙළෙඳ පොළේ තිබෙන ප්‍රශ්නයට, මම අර කලින් කියපු මිල ගණන් අනුව, සතොස ගන්නා මිල ගණන් අනුව යම් උත්තරයක් සැකසෙමින් තිබෙනවා. රුපියල් 170ක් කියන්නේ ප්‍රමාණවත් මිලක්. හැබැයි, ඒ මිලම සමහර වෙලාවට ගොවි මහත්වරුන්ට ලැබෙන්නේ නැහැ. මොකද, සමහර වෙලාවට ගොවීන්ගෙන් මිලදී ගන්නේ අතරමැදි වෙළෙන්දෝ සම්බන්ධ වෙලා. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. අපි ඒවා විසඳනවා.

අපි ගොවි ජනතාවටත්, විශේෂයෙන් බී ලූනු වගා කරන, අල වගා කරන ගොවි ජනතාවටත්, අපේ විපක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ටත්, රටේ ජනතාවටත් කියන්න ඕනෑ, අපි නාඩු වීවලට රුපියල් 120ක් කියලා ස්ථිර මිලක් නියම කළ බව. ගොවි ජනතාව ඒ බලාපොරොත්තුවෙන් වගා කළා. අපි කොළඹ වාගේ දිස්ත්‍රික්කයක් ගත්තත් දැන් අහුමුලුවල තිබෙන හැම කුඹුරක්ම වගා කරලා තිබෙන්නේ. ඒ, හොඳ මිලක් දුන්න නිසා. අපි හොඳ මිලක් කිව්වා. නමුත්, අපි බී ලූනුවලට මිලක් කියලා නැහැ නේ. අපි බී ලූනුවලටත් මිලක් කියනවා. අපි ඊළඟ කන්නයේ ඉඳලා ඒ මිලට ගන්නවා. අපි ගණනය කරලා තිබෙනවා. අපි බී ලූනුවලට ස්ථිරවම රුපියල් 150ක මිලක් ඊළඟ කන්නයේදී ගොවි ජනතාවට ලබා දෙනවා. හැබැයි, ගොවියා රකින්න මැදිහත් වෙන්න පාරිභෝගික ජනයාටත් වගකීමක් තිබෙනවා. ඒ නිසා පාරිභෝගික ජනතාව සහ විපක්ෂයේ මන්ත්‍රීවරුත් ලෑස්ති වෙන්න ඕනෑ බී ලූනු කිලෝ එකක් වෙළෙඳ පොළෙන් රුපියල් 200කටවත් මිලදී ගන්න. දැනට තිබෙන්නේ රුපියල් 180ට. අඩුම වශයෙන් රුපියල් 200ටවත් බී ලූනු කිලෝ එකක් මිලදී ගන්න සූදානම් වෙන්නත් ඕනෑ. නිකම් කයිවාරු ගැහුවාට විතරක් බැහැ නේ. එහෙම නම් ඒකටත් ලෑස්ති වෙන්න ඕනෑ. මොකද, අපි රුපියල් 150ට බී ලූනු කිලෝ එකක් ගන්නවා නම්, වෙළෙඳ පොළේ බී ලූනු කිලෝවක මිල රුපියල් 200ක් වත් වෙයි කියලා අපට අනිවාර්යයෙන්ම බලාපොරොත්තු වෙන්න සිද්ධ වනවා. හැමෝටම අපි කියනවා. අපි ඒ කැපවීම කරමු.

අල සම්බන්ධ ප්‍රශ්නය ගත්තත්, ඒත් කථාවක් තිබෙනවා. මොකක්ද? අපි අල කිලෝ එකක් ගන්නම් රුපියල් 220ට. ඒ ආසන්න ගණනකට ගන්නම්. එතකොට අල කිලෝ එකක් වෙළෙඳ පොළෙන් ගන්න සූදානම් වෙන්න වනවා, රුපියල් 240කට, රුපියල් 250කට වාගේ; රුපියල් 220 - 250 අතර මිලකට ගන්න සූදානම් වෙන්න වනවා. එහෙම වනකොට අපට පුළුවන් ස්ථිරවම ඒ ප්‍රශ්නය විසඳන්න. අල කන්න ලෑස්ති වෙන්න වනවා පාරිභෝගිකයාට රුපියල් 300ට. වගා කරන අයගෙන් අපි රුපියල් 220 - 240 අතර මිලකට ඊළඟ වාරය එනකොට ගන්නවා. දැනටත් මිලදී ගැනීම් තිබෙනවා. ප්‍රශ්නය විසඳීගෙන යන්නේ. අල, ලූනු මිල පිළිබඳව කොහොමත් ප්‍රශ්න එනවා. ඒවාට කියන්නේ, "කන්න" ප්‍රශ්න කියලා. කන්නයට අනුව එන ප්‍රශ්න. වැස්සත් ප්‍රශ්න එනවා, පැච්චත් ප්‍රශ්න එනවා, ජාත්‍යන්තර තත්ත්ව එක්කත්

ප්‍රශ්න එනවා. එහෙම තමයි මේ කෘෂි කර්මාන්තයට බැඳිච්ච ප්‍රශ්න. ඒවා ගාමන්ට් එකේ ප්‍රශ්න වාගේ නොවෙයි. ඊට වඩා වෙනස්. ඔය එකක්. ඒ, දැනට මේ තිබෙන තත්ත්වයට කියන කථාව. හැබැයි, ඒ ඒ විසඳුම් එනකොට කෙඳිරි ගාන්නත් එපා කවුරුත්. ඒක තමයි ඇත්තටම කියන්න තිබෙන්නේ. වෙළඳ ඇමතිතුමා කියනවා කෙඳිරි ගාන්න ලැහැස්ති වෙන්න එපා කියලා. ඇත්තටම ජනතාවට ප්‍රශ්න ගොඩක් තිබෙනවා. අල, ලූනු ප්‍රශ්නය, ඇත්ත. ප්‍රවාහන ප්‍රශ්නය ගන්න. ඒකත් ඇත්ත. සෞඛ්‍ය ප්‍රශ්න, ඇත්ත. මාර්ග ප්‍රශ්නත් තිබෙනවා. ඉතින්, මේ ඔක්කොම ප්‍රශ්න. ප්‍රශ්න, ප්‍රශ්න, ප්‍රශ්න. ඒවා ඇත්ත.

කඩා වැටිච්ච රටක් අලුතින් ගොඩනඟනකොට යම් ගොඩනැඟීමකුත් තිබෙනවා, යම් සංවර්ධනයකුත් තිබෙනවා, ප්‍රශ්නත් තිබෙනවා. හැබැයි, මේ ප්‍රශ්නවල සෑහෙන කොටසක් විසඳෙනවා අපි රාජ්‍ය සේවයේ ප්‍රශ්න ශක්තිමත්ව විසඳුවොත්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න විසඳන්න ඕනෑ ගොවියාගේ ප්‍රශ්න විසඳෙන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කියනවා නම්, නිලධාරින් මදි, වාහන මදි, යන්න විධියක් නැහැ, මේ මේ දේවල් අඩුපාඩුකම් තිබෙනවා කියලා, අපට ඕනෑ වෙනවා තෘප්තිමත් රාජ්‍ය සේවයක්. තෘප්තිමත් රාජ්‍ය සේවයක් නැතුව මේ ගොවියාගේ ගැටලුවලට විසඳුම් සොයන්න බැහැ, අනික් අයගේ ගැටලුවලටත් විසඳුම් සොයන්න බැහැ. ඒක අපට පිළිගන්න වෙනවා, අනිවාර්යයෙන්ම. එතකොට රාජ්‍ය සේවය ගොඩනඟන්න ඕනෑ. කෘපනිස මහත්මයාගේ ප්‍රශ්න විසඳෙන්න ඕනෑ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න විසඳෙන්න ඕනෑ. අපේ රාජ්‍ය සේවය තෘප්තිමත් නැහැ, සේවකයෝ තෘප්තිමත් නැහැ. මොකක්ද හේතුව? ඒ තමයි පසුගිය කාලයේ කඩා වැටිච්ච කඩා වැටිල්ල. ඒ නිසා ඒක ශක්තිමත් කරන්නේ නැතුව ගොවියාගේ වාගේම, අනෙක් ක්ෂේත්‍රවලත් තිබෙන ප්‍රශ්නත් නිසියාකාරව විසඳන්න ලැබෙන්නේ නැහැ. අය වැයෙන් මේ ඔක්කොම සලකා තමයි රාජ්‍ය සේවයේ වැටුප්වලට විසඳුමක් ගෙනැල්ලා තිබෙන්නේ. ගියවර අය වැයෙනුත් ගෙනාවා. රාජ්‍ය සේවකයන්ට දැන් සතුටුයි, ටිකක් තෘප්තිමත් කලින්ට වඩා. මේ පාරත් අය වැයෙන් රුපියල් කෝටි 11,000ක් වැටුප් වැඩි කිරීමට වෙන් කරලා තිබෙනවා. ඒ මුදල අලුතින් වෙන් කරලා තිබෙනවා, තෘප්තිමත් රාජ්‍ය සේවයක් ගොඩනඟා ගැනීම සඳහා. ඒකත් ගොවියාට අවශ්‍යයි. ගොවි ජනතාවත් තේරුම් ගන්න ඕනෑ දැනට රාජ්‍ය සේවයේ තිබෙන තත්ත්වය. ඒ අය තෘප්තිමත් නැහැ. ඒක එකක්. ඒ අය තෘප්තිමත් කිරීම සඳහා මේ අය වැයෙන් සැලකිය යුතු මැදිහත් වීමක් සිදු කර තිබෙන බව කවුරුත් දන්නවා මේ වෙනකොට. මම ඒක මතක් කරන්න ඕනෑ ඇමති කෙනෙක් නිසා නොවෙයි, වෘත්තීය සමිති නායකයෙක් වන නිසා.

රාජ්‍ය සේවයේ ඊළඟට තිබුණු ප්‍රධානම ගැටලුව, ප්‍රධානම ප්‍රශ්නය තමයි පුරප්පාඩු. අපි වැඩ කරන්න යනකොට නිලධාරින් කියනවා මේ අය නැහැ, මේ අය නැහැ, මේ අය නැහැ කියලා. ඒවා පුරප්පාඩුයි. පුරප්පාඩු විශාල ප්‍රමාණයක් රාජ්‍ය සේවයේ තිබෙනවා. ඒකට හේතුව, පසුගිය පාලන සමයන්හිදී නිසි පරිදි රාජ්‍ය සේවයට බඳවා ගැනීම් කළේ නැතිකම. රාජ්‍ය සේවය අත් හැර දැම්මා. රාජ්‍ය සේවය හැකුළුවා. විශ්‍රාම වැටුප් කැපුවා. පත්වීම් ලිපියෙන් කිව්වා දැන් විශ්‍රාම වැටුපක් හිමි වෙන්නේ නැහැ, ලැහැස්ති වෙන්න දායක විශ්‍රාම වැටුපකට කියලා. රාජ්‍ය සේවය එහෙම දුර්වල කළා. රාජ්‍ය සේවය එසේ දුර්වල කිරීමේ ප්‍රතිඵලයක් විධියට අද සෑම ක්ෂේත්‍රයකම අත්‍යවශ්‍ය රාජ්‍ය නිලධාරින් විශාල ප්‍රමාණයක් හිඟයි. ඒ නිසා තමයි මේ අය වැයෙන් යෝජනා කරන්නේ -මේක සම්මත වෙන අය වැයක්- 75,000ක් රාජ්‍ය සේවයට බඳවා ගන්නවා කියලා. මේක ගොවියාගේ ප්‍රශ්නයට අදාළයි, ප්‍රවාහන ප්‍රශ්නයට අදාළයි, සෞඛ්‍ය ප්‍රශ්නයට අදාළයි. සමස්ත වශයෙන් රටේ ඇති වෙලා තිබෙන අනෙකුත් ප්‍රශ්න, ගැටලු විසඳීමේදී අත්‍යවශ්‍යම කාරණයක් තමයි රාජ්‍ය සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කරන එක. ඒ කියන්නේ, දැන් අපි ඒ සඳහා අඩිතාලම දමනවා හරි විධියට. ජනාධිපතිතුමා යෝජනා කරපු හැම වචනයක් වචනයක් පාසාම ප්‍රතිපත්තිමය වශයෙන් මේ රට ගොඩනඟන්නත්, ප්‍රායෝගික වශයෙන් රටේ ප්‍රශ්න විසඳන්නත් අත්‍යවශ්‍ය වන විධියට තමයි මේ අය වැය ඉදිරිපත් කළේ. ඒ නිසා තමයි අපි රාජ්‍ය සේවයට 75,000ක් බඳවාගන්නේ. මේ වෙනකොටත් අපේ අමාත්‍යාංශයට අදාළ එක ආයතනයකට, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට පසුගිය දවස්වල මිනින්දෝරුවන් 107දෙනෙක් බඳවා ගත්තා. මමමයි ඒ පත්වීම් දුන්නේ. හැම තැනම තිබෙනවා, ඉඩම් ප්‍රශ්නය, ගොවීන්ගේ ප්‍රශ්නය, ඔප්පු ලබා දීමේ ප්‍රශ්නය. ඒ ගැන කිව්වාම කියන්නේ මිනින්දෝරුවෝ නැහැ කියලා. එහෙම නම් මිනින්දෝරුවෝ අවශ්‍යයි. ඒ අනුව, අපි මිනින්දෝරුවන් 107දෙනෙකුට පත්වීම් දුන්නා. සිතියම් තාක්ෂණ නිලධාරීන් 47ක් බඳවා ගත්තා. ඒ කියන්නේ මේවා දැන් අපි සම්පූර්ණ කරගෙන, කරගෙන යනවා. අලුතින් 75,000ක් බඳවා ගන්නකොට සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම මීට වඩා කාර්යක්ෂමව මැදිහත් වෙන රාජ්‍ය සේවයක් ගොඩ නඟා ගැනීමේ හැකියාවක් එනවා. ඒත් මදි. අපි ඒක තවත් වැඩි කර ගන්න ඕනෑ.

මේ ආයතනවල තිබෙන ඊළඟ ප්‍රශ්නය මොකක්ද? දැන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට මහවැලි සහ කුරුඳු කියන විෂයන් දෙකත් ඇවිල්ලා තිබෙනවා. මේ වෙනකොට ඒ ආයතන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේ හැම ආයතනයකම තිබෙන ප්‍රශ්නය මොකක්ද? අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවම ගනිමු. ගොවිපොළේ කම්කරුවෝ ඉන්නවා, වැඩ කරන සේවකයෝ ඉන්නවා, ස්ථිර නැහැ. අපි හම්බ වෙන්න ගියාම අඬනවා, මුහුණු මැලවිලා. ඒ අය ස්ථිර කරලා නැහැ. අවුරුදු 8, 10, 12, 15 ස්ථිර නොකළ අය ඉන්නවා. ඒ මිනිස්සුන්ගේ ජීවිතවල කිසි තෘප්තියක් නැහැ. ඉතින් අපි කොහොමද හොඳ ඵලදාවක් ගන්නේ, හොඳ සේවයක් ගන්නේ? ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳෙන්නේ කොහොමද, බීජ ගොවිපොළවල වැඩ කරන්නේ කොහොමද? අලුතින් කෙනෙක් එන්නේත් නැහැ. එහෙම නම් ඒ ප්‍රශ්නයට උත්තරයක් ඕනෑ. අන්න ඒ ප්‍රශ්නයට උත්තරයක් සොයන්න තමයි ගණන් හදලා බලලා රටේ සියලු ආයතනවල සිටින එවැනි සේවකයන් 9,800කට ස්ථිර පත්වීම් දෙන්නේ. මෙච්චර කල් අවුරුදු ගණන්, අවුරුදු 10, 12,15 දිගට දිගට ස්ථිරත්වයක් නැතිව, බලාපොරොත්තුවක් නැතිව වැඩ කරපු ජනතාවකට දැන් බලාපොරොත්තුවක් දීලා තිබෙනවා. ඒවා අවශ්‍යයි, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න. ඒ අනුව 9,800ක් දෙනා ස්ථිර කරනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඔබතුමාගේ අමාත්‍යාංශයේද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
රටේම, පොදුවේ ස්ථිර කරනවා.

ඇත්තටම ගෙවුණු අවුරුද්දට දහ වතාවක් විතර මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා ඒ සේවක මහත්ම මහත්මීන් මා හම්බ වුණා. ඒ එන හැම දවසකම මූණු කළු වෙලා, මූණු මැලවිලා තිබුණේ ජීවිතයේ කිසි ස්ථාවරත්වයක් නැතිව. මේ අය වැයෙන් පස්සේ ඒ අය ඊයේත් ආවා මගේ අමාත්‍යාංශයට. මගේ පෞද්ගලික ලේකම් කිව්වා, මෙහෙම කට්ටියක් ඇවිල්ලා ඉන්නවා කියලා. මම ඇහුවා මොකටද කියලා. "ඔබතුමාට ස්තුති කරලා යන්න ලු" කිව්වා. මම කිව්වා, "අපට ස්තුති කරන්න දෙයක් නැහැ, දැන් වැඩේ හරිනේ. ඒ ගොල්ලන්ට රස්තියාදු නොවී යන්න කියන්න" කියලා. *[බාධා කිරීමක්]* එහෙමද? අත්දැකීම් තිබෙනවා

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

නේ? *[බාධා කිරීමක්]* හරි, හරි. හොඳටම අත්දැකීම් තිබෙන බව මුහුණෙන් පේනවා, දැනුත් හිනා වෙලානේ ඉන්නේ. කාලය අඩු නිසා වැඩි කථා බැහැ.

ඒ ගොල්ලන් අමාත්‍යාංශයට ආවා. ඔබතුමන්ලා කිව්වාම පිළිගන්න, අර වෙන දා එනකොට තිබුණු මැලවිලා තිබුණු මුහුණු හිනාවෙන් පිරිලා, ඒ අයගේ ජීවිත සතුටින්. ස්තුති කරන්න ඇවිල්ලා වඳින්න හදනවා. මම කිව්වා, "වඳින්න එපා. ආයුබෝවන් කියන්න, ඒ හොඳටම ඇති" කියලා. ඒ ගොල්ලන් ඉස්සර ආවාම මෙහෙම කථාවක් කිව්වා. මොකක්ද දන්නවාද? ඒ ගොල්ලන් කිව්වා, "ඇමතිතුමා වෘත්තීය සමිති නායකයෙක් නිසා අපට දැන් වැඩ වර්ජන කරන්නත් බැහැ, උද්ඝෝෂණ කරන්නත් බැහැ" කියලා. මම කිව්වා, "කමක් නැහැ කරන්න, ඒකේ ප්‍රශ්නයක් නැහැ" කියලා. "නැහැ, අපි මේක කථා කරලාම බේරා ගන්නයි හදන්නේ. ඔබතුමා Cabinet Paper එකක් දාන්න" කිව්වා. මම මාසයකට කලින් Cabinet Paper එකක් දැම්මා, මේ අය ස්ථිර කරන්න ඕනෑ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
අපි ටිකක් උත්සාහ කරලා බලමුද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් වේලාව ටිකක් ගන්න. අපි මූලාසනයට ගරු කරලා නේ කථා කරන්නේ. එක පාරම, "මම කථා කරගෙන යන්නම්, තව විනාඩියක්" කියලා එහෙම කියන්නේ නැහැ. මූලාසනයට ගරු කරලා තමයි යන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එතුමාට තව විනාඩි 5ක් ලබා දෙන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
Cabinet Paper එකක් දැම්මා, ඒක සම්මත වුණා. ඇත්තටම මම Cabinet Paper එක දැම්මේ මගේ අමාත්‍යාංශය පදනම් කරගෙන. නමුත් කැබිනට් එක පොදුවේ සම්මත කළා. දැන් වෙනකොට මේ අය වැය යෝජනාවල ජනාධිපතිතුමා ඒක ඉදිරිපත් කරලා තිබෙනවා. ජනවාරිවලින් පස්සේ ඒ අය ස්ථිරයි. ඒ කියන්නේ අපි ප්‍රශ්න විසඳාගෙන යනවා. කොටින්ම කියනවා නම් රාජ්‍ය සේවය සම්පූර්ණ කරන්නේ නැතිව ජනතාවට හොඳ සේවයක් දෙන්න බැහැ. ඒ නිසා අපි දැන් ස්ථිර කිරීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා, දැන් ඒ ප්‍රශ්නයත් ඉවරයි.

රාජ්‍ය සේවයේ තවත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. නිල නිවාස කඩා වැටිලා, දුර්වල වෙලා, පහසුකම් නැහැ. ඒවා පුස් ගඳයි. ඒක තමයි රාජ්‍ය සේවයට වෙලා තිබෙන තත්ත්වය. රාජ්‍ය සේවකයාට ගෞරවයක්, තෘප්තියක් ඇතිව ජීවත් වෙන්න ක්‍රමයක් හැදුවොත් තමයි ඒ මහත්ම මහත්මීන් ගොවි ජනතාව ළඟට සතුටින් යන්නේ. ගොල්ලන්ට යන්න ඒ ආයතනවල වාහන නැහැ. ඒ නිසා තමයි මේ අය වැයෙන් වාහන ගෙන්වීමට මුදල් වෙන් කර තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමා වාහනයක් ගන්නේ නැද්ද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මට ගන්න දෙයක් නැහැ. මට අමාත්‍යාංශයේ වාහන 2ක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒගොල්ලන්ට දෙනවා. ඔබතුමන්ලාට දෙන එකම දෙනවා. ඔබතුමන්ලාට කැබ් එකක් දෙනවා නේ. ඔබතුමන්ලා පර්මිට් එකක් ඉල්ලුවා නේ. හැබැයි, මේ රටේ ජනතාව තවම දේශපාලනඥයන්ට පර්මිට් දෙනවාට කැමැති නැහැ. අපි රට මීට වඩා එහා තැනකට ගෙන ගියාට පසු, රට ගොඩනැගුවාට පසු සලකා බලමු, පර්මිට් එකකුත් දෙන්න පුළුවන් ද කියලා. දැනට කැබ් එක පාවිච්චි කරන්න. යනකොට ඒක දීලා යන්න. ඒ, දැනට. පසුව බලමු. මේ රට දැනට තිබෙන තත්ත්වය අනුව නේ, මේ තීරණ ගන්නේ. එහෙම නැතුව මේවා හැමදාටම අදාළ වන සංකල්ප නොවෙයි නේ. දැනට තිබෙන තත්ත්වයට සාපේක්ෂවයි මේ තීරණ ගන්නේ.

ඔබතුමන්ලාට ඕනෑ කරන්නේ ඉස්සර වාගේම පර්මිට් අරගෙන තම තමන්ට ඕනෑ සයිස් එකේ වාහන ගන්නයි. ඒකට කැමැත්ත දෙන්න රටේ ජනතාව තුළ තවම කැමැත්තක් නැහැ. අපි ජනතාවගේ නියෝජිතයන් විධියට ඒගොල්ලන්ගේ මතය සැලකිල්ලට ගෙන තමයි මේ යෝජනා හදලා තිබෙන්නේ. අපි මහජනයාගේ නියෝජිතයන් මිසක්, ඊට උඩින් සිටින අය නොවෙයි. ඉස්සර හිටපු කට්ටිය මහජනයාගේ නියෝජිතයන් නොවෙයි නේ. ඔවුන් මහජනයාගේ පාලකයෝ. දැන් මහජනයාගේ පාලකයෝ නැහැ. දැන් ඉන්නේ මහජනයාගේ නියෝජිතයෝ. ඒ නිසා මහජනයාගේ හඬ සහ ඒ අයගේ ඕනෑකම්, එකඟතා මත තමයි කැබ් එකක් හෝ දෙන්න තීරණය කළේ.

එතැනදී අපි විපක්ෂය ගැනත් පොඩ්ඩක් හිතනවා. මොකද, දැන් අපි ඒ අය ගැන හිතුවේ නැත්නම්, විපක්ෂය ගොඩ නඟන්නත් බැහැ. ඇත්ත කථාව ඒකයි. *[බාධා කිරීමක්]* මම කලින් කිව්වානේ, bar එකක් ගැන. දේශපාලනය කියන්නේ උස පැනීමේ ක්‍රීඩාවට සම්බන්ධ bar එක වාගේයි කිව්වා. අපිට පෙනෙන්නේ නැහැ, විපක්ෂයට ඒ bar එක පන්නන්න පුළුවන් කියලා. අපේ ජනාධිපතිතුමා දිගටම කියා තිබෙනවා, අපට වඩා හොඳ විපක්ෂයක් වෙන්න කියලා. එතකොට අපව පහු කරන්න පුළුවන්. එහෙම නැතුව බැහැ.

ඊළඟට, විපක්ෂය තමන්ට බේරෙන්න ගෙනෙන සටන් පාඨවලට ජනතාව ගෙනෙන්න බැහැ. අපි බලයට ආවේ නිකම් නොවෙයි. ජනතාව නියෝජනය කරලා, ජනතාවත් එක්ක අරගළ කරලා, ජනතාවගේ සටන් පාඨ ගෙනැල්ලා අපි බලයට ආවේ. ජනතාවගේ ප්‍රශ්න තමයි අපි දේශපාලනයට ගෙනාවේ. එහෙම ගෙනැල්ලා තමයි මේ ආණ්ඩුව හැදුවේ. නැතිව නිකම් නොවෙයි. පුළුවන් නම් දැන් විපක්ෂයට තිබෙන ජනතාවගේ සටන් පාඨයක් කියන්න කෝ. ජනතාව නියෝජනය කරලා කරන අරගළයක් කියන්න කෝ. එහෙම නේ විපක්ෂය තිබෙන්න ඕනෑ. විපක්ෂයක් පවත්වා ගෙන යන්න ඕනෑ නිසා තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මෙවර අය වැයෙන් රුපියල් මිලියන 10ක් දෙන්න තීරණය කළේ. විපක්ෂයකුත් තිබෙන්න ඕනෑ, නැත්නම් ආණ්ඩු පක්ෂයක් විතරක් තිබිලා මේ system එක ගෙනියන්න බැහැ. විපක්ෂයකුත් අවශ්‍යයි. ඒ නිසා තමයි විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට රුපියල් මිලියන 10ක් බැගින් දෙන්න අපි තීරණය කළේ. ඒ, ඔයගොල්ලන් මහජන නියෝජිතයෝ කියලා හිතලාම නොවෙයි. ඔයගොල්ලන්ට ආණ්ඩුවක් හදන්න ඡන්දය දුන්නා. නමුත් ඒක කරන්න බැරි වුණා. ඉතින් එහෙම වුණාම විපක්ෂයට ඔහොම තමයි ඉන්න වෙන්නේ.

වෙන ක්‍රමයක් නැහැ. ආණ්ඩුව තීරණය කරලා තමයි, විමධ්‍යගත අරමුදලින් රුපියල් කෝටියක් ලබා දෙන්නේ. ඒ ගැන සතුටු වෙන්න. ඒ කෝටියක මුදල තමුන්නාන්සේලාගේ යෝජනාවලටම පාවිච්චි කරන්න, එම මුදල තුළට වෙන කාගේවත් යෝජනා ගන්නේ නැතුව. නැත්නම් විපක්ෂයට මොකුත් කරන්න දෙයක් නැහැ නේ. ජනතාවගේ සටන් පාඨයකුත් නැහැ, එහෙම දමලාත් නැහැ, කරන්න දේකුත් නැහැ. යම්තම් පණ ගැට ගහගන්න තමයි ඒ මුදල දෙන්නේ, විපක්ෂය යම්තම් නඩත්තු කරලා ඉස්සරහට ගෙනියන්න ඕනෑ නිසා. මොකද, දැන් තිබෙන තත්ත්වය අනුව බැලුවාම ආණ්ඩුවට තමයි විපක්ෂය ගොඩනගන්න වෙලා තිබෙන්නේ.

ඊළඟට, මේ රටේ තව ප්‍රශ්නයක් තිබෙනවා. නිල නිවාස, වාහන, දීමනා කියන මේවා රාජ්‍ය සේවකයන්ට තිබෙන ප්‍රශ්න. අනිවාර්යයෙන්ම ඒ ප්‍රශ්න ඔක්කෝම විසඳනවා. මොකද, රාජ්‍ය සේවය තෘප්තිමත්ව, කාර්යක්ෂමව, ඵලදායිතාවකින් යුතුව ඉදිරියට ගෙන යන්න බැහැ, රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කරන්නේ නැතුව. ඒ වෙනුවෙන් ආණ්ඩුව මූලික අඩිතාලම දමා තිබෙනවා. එහෙම කළා කියලා ප්‍රශ්න විසඳෙනවාද? ඒත් නැහැ. විශ්‍රාම වැටුප් ප්‍රශ්න තිබෙනවා. ඊළඟට, වැටුප් හා දීමනා පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ඊළඟට, වැටුප් විෂමතා පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. මේ අය වැය තුළ ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව යෝජනා කරනවා, වැටුප් කොමිෂන් එකක් මඟින් ඉතුරු ප්‍රශ්න ටිකත් විසඳා ගන්න. වැටුප් කොමිෂන් එකක් ස්ථාපිත කළාම රාජ්‍ය සේවයේ තිබෙන සේවා ව්‍යවස්ථා පිළිබඳ ප්‍රශ්න, වැටුප් පිළිබඳව තවදුරටත් තිබෙන ගැටලු, විශ්‍රාමිකයන්ගේ තව මොනවා හෝ ගැටලු ඉතුරු වෙලා තිබෙනවා නම් ඒ සියලු දේවල් විසඳා ගන්න පුළුවන්කම ලැබෙනවා.

දැන් තිබෙන තත්ත්වයට සාපේක්ෂව අය වැයකින් මීට වඩා දෙයක් දෙන්න බැහැ. රාජ්‍ය සේවය තුළ සිටින පිරිස දැනටමත් තෘප්තිමත්භාවයකට පැමිණ තිබෙනවා. ඒගොල්ලන්ට විශ්වාසයක් තිබෙනවා, මේ ආණ්ඩුව අය වැයෙන් අය වැයට ප්‍රශ්න විසඳනවා කියලා. ඒ පැත්ත ශක්තිමත් කිරීමෙන් තමයි ගොවි ජනතාවගේ ප්‍රශ්නත් විසඳන්න වෙන්නේ. එහෙම නැත්නම් ඒවා විසඳන්නත් බැහැ. ඒ නිසා තමයි දැන් වනවිට අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා සිවිල් ආරක්ෂක බලකායේ විශාල ප්‍රමාණයක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බඳවා ගන්නේ. ඒ අනුව ඒ නිලධාරීන් 5,000ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බඳවා ගන්නවා. මේ අය වැය සකස් කරලාම තිබෙන්නේ මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න. එහෙම නැතිව වෙන මොකකටවත් නොවෙයි. හැබැයි, ඒ ලබා දෙන සහනත් ජනතාවට ප්‍රමාණවත් නැති බව අපි දන්නවා. හැබැයි, එක දෙයක් තිබෙනවා. පාලකයා සහ ජනතාව ඉන්නේ එකම බෝට්ටුවේ. පාලකයන්ට ගන්න කියලා දෙයක් නැහැ. දෙගොල්ලන්ම එකම බෝට්ටුවේ ඉන්නේ. ඉස්සර එහෙම නොවෙයිනේ තිබුණේ. පාලකයෝ නැවේ ඉන්නවා, ජනතාව ඔරුවේ ඉන්නවා. එහෙම තමයි ඉස්සර තිබුණේ. අපට ප්‍රතිපත්තියක් තිබෙනවා, ජනතාව භුක්ති විඳින්නේ නැති කිසිවක් දේශපාලනඥයන් භුක්ති විඳින්න ඕනෑ නැහැ, පාලකයන් භුක්ති විඳින්න ඕනෑ නැහැ කියලා.

රාජ්‍ය සේවකයන්ට දේපළ ණය හැටියට රුපියල් ලක්ෂ 50ක් අඩු පොලියට ලබා දෙන වැඩ පිළිවෙළක් අපි ගෙනැල්ලා තිබෙනවා.

මට ලැබුණු වෙලාව ඉවර නිසා මම කථාව නතර කරන්නම්. මේ අය වැය ගෙනැල්ලා තිබෙන්නේ, දැනට රට තිබෙන තැන බලලා, ඒ ගැන හරි විග්‍රහයක් කරගෙන, එතැනින් ඉදිරියට යන්න ප්‍රායෝගික විසඳුම්, යෝජනා ඉදිරිපත් කරමින්. ඒ නිසා මේ අය වැය ගැන දේශපාලනයේ උසස් තැනකට ඇවිල්ලා සාකච්ඡා කරන්න කියලා, එළියේ ඉන්න විපක්ෂයෙනුයි ඇතුළේ ඉන්න විපක්ෂයෙනුයි ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඒ.එච්.එම්.එච්. අබයරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair*

[අ.භා. 3.53]

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැයට අදාළව මේ විධියට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි දවස් තුනක් තිස්සේ මේ අය වැයට අදාළව ඉදිරිපත් කළ විවිධ අදහස් දැක්වීම්වලට අහුම්කන් දුන්නා. එතැනදී විපක්ෂය පැත්තෙන් ඉතාම හොඳ පැහැදිලි කිරීමක් මම තේරුම් ගත්තේ ගරු චාමර සම්පත් දසනායක මැතිතුමාගේ කථාවෙන්. එතුමා කිව්වා, "ඔයගොල්ලෝ 159දෙනාම මේකේ හොඳ කියනකොට අපිත් හොඳම කියලා හරි යන්නේ නැහැ, මොනවා හරි නරක දෙයක් කියන්නත් වෙනවා" කියලා. විපක්ෂයේ ඇත්ත ස්වභාවය එතුමාගේ ප්‍රකාශයෙන් පෙනුණා, අපේ හිතවත් අනෙක් මන්ත්‍රීවරු මොන විධියේ වචනවලින් කරුණු ඉදිරිපත් කළත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රට භාරගෙන දැනට අවුරුද්දයි. මේ අවුරුද්ද ඇතුළත අපි ආර්ථිකය ස්ථාවර කිරීමේ දිශාවට ඉතාම සාර්ථක ලෙස ගමන් කරලා තිබෙනවා. මම කැමැතියි, ඒකට නිදසුනක් කියන්න. අපේ රජය සමත්වෙලා තිබෙනවා, රුපියල ස්ථාවර කර ගන්න. අපි දන්නවා, ඩොලරයක් වෙනුවෙන් රුපියල් 363.11ක් ගෙවපු යුගයකුත් තිබුණා කියලා. නමුත් මේ වෙනකොට අපි රුපියල් තුන්සියය ආසන්නයේ - ඊටමඳක් අඩුවෙන්න පුළුවන්, වැඩිවෙන්න පුළුවන්- ඩොලරයේ අගය ස්ථාවරව පවත්වාගෙන යනවා. ඒ වාගේම කොටස් වෙළඳ

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

පොළ මේ අවුරුද්ද ඇතුළත දිගටම වර්ධනයක් පෙන්නුම් කළා. හැමදාම වාර්තා වෙන්නේ, ඉතිහාසයේ තිබුණාට වඩා අද දවසේ කොටස් වෙළඳ පොළේ වර්ධනයක් සිද්ධ වුණා කියන එක. මේ සාධක දෙක පමණක් ගත්තත් ප්‍රමාණවත්, අපේ රජය ආර්ථික ස්ථාවරභාවය ගොඩනැඟීම සඳහා සාධනීය වශයෙන් මැදිහත් වෙලා තිබෙන බව ප්‍රකාශ කරන්න. ඒ ආර්ථික ස්ථාවරභාවය ගොඩනැඟීමෙන් තමයි සමාජ ස්ථාවරභාවය, දේශපාලන ස්ථාවරභාවය ඇතුළු අනෙකුත් සියලු සාධනීය කරුණු වර්ධනය කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල වාහන මිලදී ගැනීමේ ප්‍රශ්නය ගැන දිගින් දිගටම සාකච්ඡා වුණා. ගරු මන්ත්‍රීතුමන්ලාට කැබ් රථ ලබා දීම සඳහා රුපියල් මිලියන 12,500ක් වෙන් කර තිබුණා කියන කාරණය තමයි එහිදී වැඩිපුර සාකච්ඡා වුණේ. නැහැ, ඒක එහෙම නොවෙයි. මේ කැබ් රථ මිලදී ගන්නේ රජයේ ආයතනවලට සහ වෙනත් අවශ්‍යතා පදනම් කරගෙන. විශේෂයෙන්ම දිස්ත්‍රික්කවලට යනකොට අපි දකිනවා, ප්‍රාදේශීය ලේකම්වරු පාවිච්චි කරන කැබ් රථය හෝ වෙනත් වාහනයක් වෙන්න පුළුවන් එය අවම පහසුකම් සහිත, බොහෝ පරණ, අබලන් වාහනයක් බව. ඒ වාගේම තමයි පශු වෛද්‍ය සේවයේ ඉන්න නිලධාරිනුත්, ගොවිජන සේවා ඇතුළු ක්ෂේත්‍ර රාජකාරිවල යෙදෙන බොහොමයක් නිලධාරිනුත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත් අවම පහසුකම් සහිත, පරණ වාහන තමයි පාවිච්චි කරන්නේ. ගරු ලාල් කාන්ත ඇමතිතුමා සඳහන් කළා වාගේම ජනතාවට ගුණාත්මක, කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා මේ වාහන ලබා දීමේ අවශ්‍යතාව තිබුණා. දිස්ත්‍රික්කවලට යනකොට අපට ගොවි ජනතාව, කිරි නිෂ්පාදකයෝ කියනවා, මොනවා හරි ප්‍රශ්නයක් වෙලා අදාළ ආයතනයට කථා කළාම ඒ නිලධාරින් කියන්නේ, ඔවුන්ට එන්න වාහනයක් නැහැ, ඒ නිසා එන්න විධියක් නැහැ කියලා බව. අලියෙක් ගැහුවත්, අලි ඇවිල්ලා ගෙවල් දොරවල් විනාශ කළත් එම නිලධාරින්ට එන්න වාහන නැහැ. සමහර තැන්වල ජනතාව අතින් සල්ලි ගෙවලා තමයි ඒ නිලධාරින් තමන්ට අවශ්‍ය කටයුත්ත කර ගැනීම සඳහා ගෙන්වා ගන්නේ. මේ වාහන ලබා දීම සඳහා යොදවන මුදල සත්‍ය වශයෙන්ම මේ රටේ මහ ජනතාවට සැපයිය යුතු සේවා වඩාත් කාර්යක්ෂමව, වඩාත් විධිමත්ව, වඩාත් හොඳින් සැලසීම සඳහා යොදවන එකක්.

ඒ වාගේම මේ වාහන මිලදී ගැනීමේ ක්‍රියාවලිය ඇතුළේ අපි දකිනවා, විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවලට අවශ්‍ය වාහන මිලදී ගැනීම සිදු වන බව. සමහර පළාත් පාලන ආයතනවලට අන්තිමට වාහන මිලදී අරගෙන තිබෙන්නේ 2015දී. මේ වෙනකොට අවුරුදු 10කට වැඩියි. ඒ වාහන නඩත්තු කිරීමේ ගැටලු තිබෙනවා. ඒ වාගේම උසස් තත්ත්වයේ වාහන නොවෙයි මිලදී අරගෙන තිබෙන්නේ. එම නිසා ඒ වාහන සැබැවින්ම මේ ආයතනවලට දැන් බරක් වෙලා තිබෙනවා. එම නිසා අපි රජය හැටියට මේ ආයතනවලට අවශ්‍ය motor graders, බැකෝ යන්ත්‍ර, ගලි බවුසර්, ජල බවුසර්, ට්‍රැක්ටර් ඇතුළු යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදනත් වෙන් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ යන්ත්‍රෝපකරණ මිලදී ගත් පසු පළාත් පාලන ආයතනවලින් මහ ජනතාවට ලබා දෙන සේවය වඩාත් උසස් මට්ටමකට පත් කරන්න පුළුවන් කියලා.

මම උදාහරණයක්, දෙකක් කියන්න කැමැතියි. 2007.11.30වැනි දා ට්‍රැක්ටර් 20ක් දීලා තිබෙනවා. තව ට්‍රැක්ටර් 34ක් දීලා තිබෙනවා, 2009.10.16වැනි දා. තව ට්‍රැක්ටර් 100ක් දීලා තිබෙනවා, 2013දී. ඒ කියන්නේ මේ සියලු වාහනවලට අවුරුදු 10කට වැඩියි. Gully bowser, compactor machines, dump trucks, backhoe loaders කියන මේ ඔක්කෝම 2015ට කලින් මිලදී ගත් වාහන. එම නිසා පළාත් පාලන ආයතනවල දැන් ඉන්න සභාපතිවරුන්, ඒ වාගේම සභාපතිවරුන් පත් වෙන්න කලින් හිටපු ලේකම්වරුන් දිගින් දිගටම අපට ඉදිරිපත් කරපු කාරණයක් තමයි, ඒ පළාත් පාලන ආයතනයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා දෙන්න කියන එක. එතකොට මේ ප්‍රතිපාදන වෙන් කර තිබෙන්නේ මේ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ ක්‍රියාවලියටත් එක්ක. ඒ නිසා මහජනතාවට වඩාත් යහපත් සේවයක් ලබා දීම සඳහා වාගේම, මේ පළාත් පාලන ආයතනවලට ආදායම් උත්පාදනය කර ගැනීමේ මාර්ග විවර කර දීමකුත් මේ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ මෙහෙයුම අතර තිබෙනවා. මම කියන්න කැමැතියි, 2023 වර්ෂයේදී මේ පළාත් පාලන ආයතනවල යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම සඳහා පමණක් රුපියල් මිලියන 3,315ක් වියදම් වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වියදම් වුණු මුදල අවුරුදු තුනක් එකතු කළා නම්, අලුත්ම යන්ත්‍රෝපකරණ මේ ආයතනවලට මිලදී ගන්න, සපයන්න පුළුවන්කම තිබුණා.

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, මේ වෙනකොට රාජ්‍ය සේවය කඩා වැටෙමින් තිබෙනවා, අකාර්යක්ෂම වෙලා තිබෙනවා, සේවකයෝ, නිලධාරින් වැඩ කරන්න භයයි කියලා. මම හිතන විධියට, ඒකට පිළිතුර ලැබුණා, ගරු ලාල් කාන්ත ඇමතිතුමාගෙන්. නිලධාරින් වැඩ කරන්න භය නොවෙයි, ඇත්තටම විශාල වශයෙන් නිලධාරි හිඟයක් මේ ආයතනවල තිබෙනවා. අපි හැම තැනකටම වාගේ ගියාම පෙනෙනවා, ඉංජිනේරු මහත්වරු නැහැ, තාක්ෂණ නිලධාරින් නැහැ කියලා. ඇස්තමේන්තුවක් හදා ගන්න අවශ්‍ය වුණාම ඒ අවශ්‍ය කරන නිලධාරින්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ නිසා අපි රජය හැටියට ඒ ආයතනවලට අවශ්‍ය කරන නිලධාරින් බඳවා ගැනීම සඳහා මේ වෙනකොට විධිමත්ව වැඩකටයුතු කරමින් ඉන්නවා.

උදාහරණයක් හැටියට මම සඳහන් කරන්නට කැමැතියි, ශ්‍රී ලංකා පරිපාලන සේවයට අපි 2021 අවුරුද්දෙන් පසුව නිලධාරින් බඳවා ගෙන නැහැ කියන එක. මේ වෙනකොට විවෘත පදනමින් 151කුත්, කුසලතා මත 42කුත් හැටියට 193දෙනෙක් අපි බඳවාගෙන තිබෙනවා. ශ්‍රී ලංකා පරිපාලන සේවයට තව 130දෙනෙක් බඳවා ගැනීමට අනුමැතිය අරගෙන තිබෙනවා. පරිපාලන සේවයේ මේ නිලධාරි හිඟය තියාගෙන අපට ජනතාවට යහපත් සේවයක් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ. රාජ්‍ය සේවය බිඳ වැට්ටවීමේ ක්‍රියාකාරකමක් ආරම්භ වෙලා තිබුණා; මෙහෙයුමක් ආරම්භ වෙලා තිබුණා. ඒක දැනුවත්වද, නොදැනුවත්වද කියන එක වෙනම කාරණයක්. නමුත් ඒ බිඳ වට්ටමින් තිබුණු රාජ්‍ය සේවය විධිමත් කිරීම සඳහා අපි ශ්‍රී ලංකා පරිපාලන සේවයට මේ වෙනකොටත් 193දෙනෙක් බඳවාගෙන, තව 130ක් බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. තව පිරිසක් බඳවා ගන්න අවශ්‍යයි.

ඒ වාගේම දීප ව්‍යාප්ත සේවාවක් වන ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවාවට මේ වෙනකොට අපි 146දෙනෙක් විවෘත සහ සීමිත කියන පදනම් දෙකෙන්ම බඳවා ගෙන තිබෙනවා. තව 37දෙනෙක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබිලා තිබෙනවා. මේ දීප ව්‍යාප්ත සේවාවල නිලධාරින් නැතුව රාජකාරි කරන්න බැහැ. නිලධාරින් වැඩ නොකරනවා කියන කාරණයට මම එකඟ වෙන්නේ නැහැ. ඇත්තටම වැඩ කරන්න නිලධාරින් හිටියේ නැහැ. හිටපු සමහර නිලධාරින්ට ආයතන දෙකක, තුනක වැඩ කරන්න සිද්ධ වුණා. එක ආයතනයක වැඩ කරන ගමන් තව තැනක වැඩ බලන්න, සමහර වෙලාවට තුන්වන ස්ථානයකත් වැඩ බලන්න සිද්ධ වෙලා තිබුණා. ඔවුන්ට කිසිම විවේකයක් නැතුව එක දිගට වැඩ කරන්න

සිද්ධ වෙලා තිබුණා. ඒ නිසා අතපසුවීම්, අඩුපාඩු ගොඩක් තිබුණා. ඒවා වැළැක්වීම සඳහා තමයි අපි මේ පියවර ගත්තේ. මේ ඔක්කෝම පසුගිය අය වැයෙන් අපි වෙන් කරපු ප්‍රතිපාදනවලින් කරපු කටයුතු. ඔබ දන්නවා, 30,000ක් බඳවා ගන්න ගිය අය වැයෙන් අපි තීරණය කළ බව. මේ වෙනකොට අපි ඊට වැඩිය බඳවා ගෙන තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට අපි මේ වෙනකොට 257ක් බඳවා ගෙන තිබෙනවා; තව 211ක් බඳවා ගැනීමට නියමිතයි. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවට 191ක් බඳවා ගෙන තිබෙනවා; තව 100ක් බඳවා ගැනීමට නියමිතයි. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවාවට 86ක් බඳවා ගෙන තිබෙනවා; තව 118ක් බඳවා ගන්න කටයුතු කරමින් ඉන්නවා. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවාවට 13දෙනෙක් බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් තිබෙනවා. මේ සියලු කටයුතු අපට කරන්න පුළුවන් වුණේ රාජ්‍ය සේවාව විධිමත් කරලා, ජනතාවට අවශ්‍ය කරන සේවා වඩාත් හොඳින් සැපයීමේ අරමුණ පෙරදැරි කරගෙනයි. ඒ නිසා නිලධාරින් භයයි නොවෙයි, වැඩ කරන්න නිලධාරින් හිටියේ නැහැ. අපි වැඩ කරන්න අවශ්‍ය කරන නිලධාරින් බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, මෙවර අය වැයෙන් මහපොළ හා ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 2,500කින් වැඩි කළ බව. අපි විශ්වවිද්‍යාලයේ හිටපු කාලයේ merit පදනම මත දුන් දීමනාව රුපියල් 400යි. සාමාන්‍ය මහපොළ දීමනාව රුපියල් 350යි. 1980 ගණන්වල මහපොළ ආරම්භ කරපු අවස්ථාවේ ඉඳලා 1991 අවුරුද්ද අවසානය වෙනකම් මහපොළ දීමනාව වැඩි වුණේ නැහැ. නමුත් අවුරුද්දක් ඇතුළත අපට පුළුවන්කම ලැබුණා, සියයට සියයකින් මහපොළ දීමනාව හා ශිෂ්‍යාධාර දීමනාව වැඩි කරන්නට. ඒ වාගේම විද්‍යාපීඨ ගුරු සිසුන්ට "නිපුණතා සිසු දිරිය දීමනාව" යන මේ සියල්ල වැඩි කරලා මේ අධ්‍යාපනය ලබන දරුවන්ට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න අපි රජයක් හැටියට කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා අපේ දිස්ත්‍රික්කයේ හිතවතා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට විශාල වශයෙන් මුදල් වෙන් කර තිබෙන බව එතුමා කිව්වා. ඒක ඇත්ත. වැඩි වුණු විශ්‍රාම වැටුප්, වෙනත් දීමනා විශාල වශයෙන් ගෙවීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන අපේ අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළාත් සභා ගත්තොත්, පළාත් සභාවලට අදාළව ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, පාසල් පෝෂණ වැඩසටහන සඳහා සිසුන් මිලියන 1.5කට ආහාර සැපයීමට රුපියල් මිලියන 33,500ක් වෙන් කරලා තිබෙනවා, මේ රජය ඉතුරු කරගත්ත මුදල් නාස්ති කරන්නේ නැතුව; මහජන මුදල් ඉතුරු කරගෙන.

නඩත්තු කටයුතු සහ වෙනත් මෙහෙයුම් වියදම් සඳහා, අධ්‍යාපනයට, සෞඛ්‍යයට, මාර්ග සහ වාරිමාර්ග සඳහා පළාත් සභාවලට රුපියල් මිලියන 32,500ක් වෙන් කරලා තිබෙනවා. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 70,000ක් වෙන් කරලා තිබෙනවා. මේ සියලු කටයුතුවලින් මහජනතාව අතරට ප්‍රතිපාදන ගලාගෙන යාමට, ඔවුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා.

විරුද්ධ පක්ෂය පැත්තෙන් කලින් කියැවුණා, අපි වියදම් කරලා තිබෙන මූල්‍ය පරිචය බොහොම සීමිතයි කියලා. නැහැ, එහෙම නැහැ. තව මාස 2ක් තිබෙනවා. අපි මේ වෙනකොට පළාත් සභාවලට ගිහිල්ලා නිරීක්ෂණය කරලා තිබෙනවා. ඒගොල්ලන් පොරොන්දු වෙලා තිබෙනවා, දෙසැම්බර් වෙනකොට අවම මූල්‍ය ප්‍රගතිය සියයට 90 දක්වාවත් ගේනවා කියලා. උතුරු පළාත අපිට එකඟ වුණා, සියයට සියයක්ම මූල්‍ය ප්‍රගතිය පෙන්වනවා කියලා. ඒ නිසා මේ ප්‍රතිපාදනවලින් අපි මේ රටට අවශ්‍ය කරන සියලු පහසුකම් ලබා දීලා, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා කටයුතු කරන බව සඳහන් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 වසර සඳහා ඉදිරිපත් කර තිබෙන අය වැය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මම හිතන විධියට, මේ අය වැය ගැන කථා කරනවා නම් 2025 අවුරුද්දේ මුල් කාර්තු කිහිපය තුළ ඉදිරිපත් කරපු අය වැය ගැනත් කථා කරලා තමයි මේ අය වැයට එන්න වෙන්නේ. මොකද, අපි දන්නා තරමින් ජනාධිපතිතුමා මේ අය වැය හා සමානව නොයෙකුත් ආකාරයේ අදහස්-උදහස් වාගේම යෝජනා රාශියක් ඒ මුල් අය වැයේත් ඉදිරිපත් කරන්න කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපි කවුරුත් දන්නවා, ඒ අය වැය වාර්තාවේ ඉදිරිපත් කරපු යෝජනාවලින් සියයට 40ක්වත් මේ වෙනකොට මේ ආණ්ඩුවට කරගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ කියලා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, විශේෂයෙන්ම සංවර්ධනය පැත්තෙන් ගත්තත්, ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කරපු මුදල්වලින් සියයට 40ක් තමයි තමුන්නාන්සේලා මේ වෙනකොට වියදම් කරන්න කටයුතු කරලා තිබෙන්නේ කියලා. මෙවැනි තත්ත්වයක් නොවෙයි අපි හුඟක් වෙලාවට බලාපොරොත්තු වුණේ. මොකද, තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවට උගතුන්, බුද්ධිමතුන්, වැඩ කරන්න පුළුවන්, විශේෂයෙන්ම දක්ෂතාවෙන් හෙබි පුද්ගලයෝ පත් කරන්න කියලා තමයි ජනතාවගෙන් එදා ඉල්ලා හිටියේ. ඇමතිවරු මීට වඩා කාර්යක්ෂම ලෙස වැඩ කටයුතු කරයි, පාර්ලිමේන්තුවේ කරන්න තිබෙන වැඩ කටයුතු කරලා මේ රටේ ජනතාවට ප්‍රගතියක් අත්පත් කරලා දෙයි කියලා තමයි මේ රටේ ජනතාව විශ්වාස කළේ. නමුත් මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. තමුන්නාන්සේලා මේ 2026 අය වැයෙනුත් බොහොම සාධනීය කරුණු රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම, සංවර්ධන පැත්ත වෙනුවෙනුත් විශාල මුදලක් වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා. 2025 වර්ෂයේ මුල් කාර්තුවේ ඉදිරිපත් කරපු අය වැය වාගේ නැතුව, 2026 වසර සඳහා තමුන්නාන්සේලා ඉදිරිපත් කරපු යෝජනා ටික, සංවර්ධන යෝජනා ක්‍රම ටික අඩුම තරමින්

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

ජනතාවගේ සුබසිද්ධිය සහ අභිවෘද්ධිය තකා, මේ රටේ අභිවෘද්ධිය තකා ක්‍රියාත්මක කරයි කියලා තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.

විශේෂයෙන්ම ජනාධිපතිතුමා අය වැය කථාව ආරම්භ කරනකොටත් මේ කාරණය කියනවා අපි දැක්කා. ඒ වාගේම, මේ අය වැය විවාදයට සම්බන්ධ වෙච්ච මැති, ඇමතිවරු ගණනාවක්ම කිව්වේ මොකක්ද? බංකොලොත් වෙච්ච, අර්බුදවලින් හෙබි, ඉන්ධන පෝලිම් තිබුණු, ගෑස් නැති, විදුලිය නැති රටක් භාර ගත්ත හැටියට තමයි මේ රටේ ජනතාවට තමුන්නාන්සේලා හුවා දක්වන්න උත්සාහ කළේ. නමුත් මේ රටේ ජනතාව දන්නවා, එවකට හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ අවුරුදු දෙකක කාල සීමාව තුළදී එදා තිබුණු තෙල් පෝලිම් නැති කරලා, ඉන්ධන මිල ප්‍රශ්නය, ගෑස් ප්‍රශ්නය, විදුලිය ප්‍රශ්නය විසඳලා, භාණ්ඩාගාරයේත් ඩොලර් බිලියන 6කට අධික සංචිත ප්‍රමාණයක් තමුන්නාන්සේලාට ලබා දීලා තමයි මේ ආණ්ඩුව භාර දුන්නේ කියලා. නමුත් මෙතැනදී තමුන්නාන්සේලා හැම වෙලාවේදීම ප්‍රකාශ කරන්නේ "අපි භාර ගත්තේ බොහොම බංකොලොත් රටක්" කියන එකයි. ඒ වාගේම, විදුලිය සහ ඉන්ධන නැති, පෝලිම් යුගයක් තිබුණු රටක් තමයි තමුන්නාන්සේලා භාර ගත්තේ කියන එකයි හැම වෙලාවේදීම ප්‍රකාශ කරන්න හැදුවේ. මම තමුන්නාන්සේලාට කියනවා, මැති ඇමතිවරු දිගින් දිගටම මේක ප්‍රකාශ කරලා ජනතාව රවට්ටන්න පුළුවන්කමක් නැති බව. මොකද, මේ රටේ ජනතාව දන්නවා, එවකට හිටපු ජනාධිපතිතුමා හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි මේ කටයුතු අවසන් කරලා, ප්‍රශ්න නැති රටක් හැටියට මේ රට තමුන්නාන්සේලාට භාර දුන්නේ කියලා. අද තමුන්නාන්සේලා ඒ අඩිතාලම - foundation එක - තුළ තමයි ඇත්තවශයෙන්ම මේ සංවර්ධන කටයුත්ත කරන්න ආරම්භ කරලා තිබෙන්නේ, මේ ගමන යන්න ආරම්භ කරලා තිබෙන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියනවා, ඔය දේවල් කියන්නේ නැතිව ඔබතුමන්ලා අඩුම තරමේ මේ අවුරුද්දේවත් අපේ රටට, ජනතාවට සංවර්ධනය පැත්තෙන් යම්කිසි වැඩ පිළිවෙළක් කරන්න කියලා.

අපිට මතකයි, බලයට එන්න ඉස්සෙල්ලා වර්තමාන ජනාධිපතිතුමාත්, මැති ඇමතිවරුත් ඒ කාලයේ මේ රටේ ජනතාවට දීපු පොරොන්දු. ඒ පොරොන්දු ගැන මේ අය වැයේ කිසිම තැනක සඳහන් කරලා නැහැ. ඒවා සම්බන්ධව කථා කරන්නේ නැහැ. ඒ දුන් පොරොන්දු අනුව කොයි ආකාරයටද වැඩකටයුතු කරන්නේ කියන එක ගැන මේ අය වැයේ කොයිම තැනකවත් සඳහනක් කරලා නැහැ. ජනතාවට සහනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් නැහැ. VAT සහන ලබා දීලා රටේ ජීවන වියදම අඩු කරන්න, කෘෂිකර්ම ක්ෂේත්‍රය නඟා සිටුවන්න, අධ්‍යාපන ක්ෂේත්‍රය නඟා සිටුවන්න කියමින් නොයෙකුත් ආකාරයෙන් ඒ කාලයේ කථා කළා තමුන්නාන්සේලාට මතක ඇති. එදා ජනතාවගේ පැත්තේ ඉඳගෙන කථා කළා. නමුත්, මේ අය වැය වාර්තාවලින්වත්, එහෙම නැත්නම් අනෙකුත් දේවල්වලදීවත් ඔබමන්ලා ඒ සම්බන්ධව කථා කරලා විසඳුම් ලබා දෙන්න කටයුතු කරලා නැහැ කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපිට මතකයි, විශේෂයෙන්ම අධ්‍යාපනය ගැන කථා කළා. ගුරු වෘත්තීය සමිති වාගේම අනෙකුත් වෘත්තීය සමිති ඒක රාශි කරගෙන අධ්‍යාපනය නඟා සිටුවීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් කථා කළා. ඔබතුමාටත් මතක ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම මට මතකයි, නොයෙකුත් ආකාරයේ වැඩවර්ජන කළා. පාසල්වල විදුහල්පතිවරු, ගුරුවරු පාරට බැස්සා. ශිෂ්‍යයෝ පාරට බැස්සා. "මේ ආණ්ඩු අධ්‍යාපනයට ලබා දෙන සැලකිල්ල ප්‍රමාණවත් නැහැ" කිව්වා. ඒ වාගේම අධ්‍යාපනයට සියයට 6ක මුදලක් වෙන් කරන්න කියලා මට මතකයි ඒ කාලයේ උද්ඝෝෂණත් කළා. මට මතකයි, අපේ ගරු හරිනි අමරසූරිය අගමැතිතුමිය ටී-ෂර්ට් එකක් ඇඳලා ඇවිත් තමයි ඒ උද්ඝෝෂණවලට, එහෙම නැත්නම් ඒ වැඩසටහන්වලට සහභාගී වුණේ. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද මේ අය වැය ගැන කොයි තරම් කථා කළත්, අනිවාර්යයෙන්ම දළ දේශීය නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා සියයට 6ක් වෙන් කරන්න ඕනෑ කියලා කථා කරපු උදවිය අද සියයට එකක්වත් අධ්‍යාපනය සඳහා වෙන් කරන්න කටයුතු කරලා නැහැ. අද අධ්‍යාපනය පැත්තෙන් ගත්තත් යම් කිසි අර්බුදයකට දවසින් දවස ගමන් කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තොත්, මට මතකයි වර්තමාන ආණ්ඩුවේ අය එදා කෘෂිකර්ම ක්ෂේත්‍රය ගැන කථා කළේ හැම දාම ගොවියාගේ පැත්තේ ඉඳගෙනයි. "ගොවි ජනතාව නඟා සිටුවන්න ඕනෑ. රට සහලින් ස්වයංපෝෂිත කරන්න ඕනෑ. කෘෂිකර්මය පැත්තෙන් මේ රට ඉදිරියට ගමන් කරන්න ඕනෑ" කියලා හැම අවස්ථාවකදීම කථා කළා. ඒ කාලයේ යම් කිසි උද්ඝෝෂණයක් තිබුණා නම්, ගොවීන්ට ප්‍රශ්නයක් තිබුණා නම් අපිට මතකයි මේ හිටපු මැති ඇමතිවරු තමයි මුලින්ම ගිහිල්ලා හිටියේ. ඒ උද්ඝෝෂණවලට නායකත්වය ලබා දුන්නේ මේගොල්ලෝ. දැන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? කෘෂිකර්මය පැත්තෙන් ගත්තොත්, හැමතැනම මැසිවිලි තිබෙන්නේ.

අපි දැක්කා ඊයේ පෙරේදා නුවරඑළිය, කැප්පෙටිපොළ ප්‍රදේශවල අල ගොවීන් උද්ඝෝෂණය කළ ආකාරය. වෙළෙඳ මධ්‍යස්ථාන වහලා, මිලදී ගැනීම් මධ්‍යස්ථාන වහලා මේ උද්ඝෝෂණය කරන්න කටයුතු කළා. ඒ වාගේම දඹුල්ල පැත්තේ ලූනු ගොවීන්ට අත් වෙලා තිබෙන ඉරණම ගැන, ඔවුන් පත් වෙලා තිබෙන අසරණභාවය අපි දැක්කා. නොයෙකුත් ආකාරයේ උද්ඝෝෂණ කළා තමුන්නාන්සේලා දකින්න ඇති. මේ තත්ත්වයන්ට විසඳුමක් ලබා දෙන්න මේ ආණ්ඩුව කටයුතු කළේ නැහැ. අපි දැක්කා ගරු ලාල් කාන්ත ඇමතිවරයා ඒවා සම්බන්ධයෙන් විසඳුම් දෙන හැටි කිව්වා. ඒ වාගේම එතුමන්ලා දැන් විසඳුම් දෙන්න කථා කරනවා. එතුමා මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. අපට අස්වැන්න ලැබෙන ආකාරය ගැන; අලවලින් මෙච්චර ප්‍රමාණයක් අපේ දේශීය ගොවියා නිෂ්පාදනය කරලා දෙනවා, ඒ වාගේම ලූනු ගොවියා මෙච්චර ප්‍රමාණයක් ලබා දෙනවා කියන එක ගැන සැලැස්මක් කෘෂිකර්ම ඇමතිවරයා හැටියට එතුමාට තිබුණා නම්, ඒ වාගේම මෙච්චර ප්‍රමාණයක් වෙළෙඳ පොළට ලැබෙනවා කියලා තමුන්නාන්සේලාට යම්කිසි තක්සේරුවක් තිබුණා නම් ඒ සම්බන්ධව විසඳුමක් ලබා දෙන්න තිබුණා. නමුත්, එහෙම එකක් තිබුණේ නැහැ. අල ගොවියෝ අල ටික ගලවන්න හදනකොට, බී ලූනු ටික ගලවන්න හදනකොට තමයි මේගොල්ලන්ට බද්ද දමන්න මතක් වුණේ. ඒ විදේශවලින් ගෙන්වන ඒවාට බදු දමන්න, ගැසට් නිවේදන නිකුත් කරන්න කටයුතු කළේ ප්‍රමාද වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා කලට වේලාවට හරියට පුරෝකථනය කරලා ඒ බදු ටික, එහෙම නැත්නම් ඒ ගැසට් නිවේදනය මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා නිකුත් කළා නම් මේ අර්බුදය පැන නඟින්නේ නැහැ. එහෙම වුණා නම් ඒ ගොවීන්ටත් අඩුම ගණනේ හොඳ මුදලක්, හොඳ මිලක් ලබා ගන්න අවස්ථාව තිබුණා කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ඒ වාගේම හැම කෙනකුම කථා කළා වැවිලි කර්මාන්තය පිළිබඳව. වතු කම්කරුවන් පිළිබඳවත් කථා කළා. මම හිතන විදියට, මේක මැති ඇමතිවරු ගණනාවක් බොහොම සංවේදීව කථා කරපු කාරණාවක්. මම එකක් කියන්න ඕනෑ විශේෂයෙන්ම

කුඩා තේ වතු හිමියන් ගැන. දැන් මෙතුමන්ලා කිව්වේ මොකක්ද? මට මතකයි, රාජාසන කථාවේදීත් කිව්වා, කුඩා තේ වතු හිමියන් නඟා සිටුවන්න ඕනෑය කියලා. සාමාන්‍යයෙන් දැනට නිෂ්පාදනය වෙන්නේ, තේ කිලෝග්‍රෑම් මිලියන 280ත්, 300ත් අතර ප්‍රමාණයක්. මේගොල්ලන් කිව්වා, තේ කිලෝග්‍රෑම් මිලියන 400 දක්වා ඒක ගෙනියන්න ඕනෑ කියලා. මම හිතන විධියට, මෙතැනත් යෝජනා වෙලා තිබෙනවා, තේ කිලෝග්‍රෑම් මිලියන 400ක් දක්වා නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑය කියලා. ඉතින්, ඒ ප්‍රමාණය වැඩි කරන්න මොකක්ද තමුන්නාන්සේලා දීලා තිබෙන යෝජනාව? මේ සම්බන්ධයෙන් කථා කරලා තිබෙන්නේ මොකක්ද? මේක වැඩි කරන්නේ මොන ආකාරයෙන්ද කියන එක ගැන මේ අය වැයේ තිබෙන යෝජනාව මොකක්ද? කිසිම යෝජනාවක් කරලා නැහැ. ඒ සම්බන්ධයෙන් මුදල් වෙන් කිරීමක් කරලාත් නැහැ. මේ සඳහා කළ යුතු පළමුවෙනි කාරණය තමයි පොහොර සහනාධාරය ලබා දීම. අනිවාර්යයෙන්ම ඒ වැඩකටයුත්ත කෙරෙන්න ඕනෑ. ඒ වාගේම පළිබෝධ නාශක සඳහා තිබෙන VAT එක අඩු කරන්න ඕනෑ. අනෙකුත් නිෂ්පාදන යෙදවුම්වලට තිබෙන VAT එක අඩු කරන්න ඕනෑ. එහෙම කළොත් අඩුම ගාණේ ගොවි ජනතාවට, කුඩා තේ වතු හිමියන්ට යම්කිසි සහනයක් ලබා ගන්න පුළුවන්. ඉතින්, එහෙම වැඩ පිළිවෙළකට ඔබතුමන්ලා ගිහිල්ලා නැහැ.

දැන් QR කේතයක් හඳුන්වා දී තිබෙනවා. ඒක එච්චර සාර්ථක වැඩක් නොවෙයි. ඒකෙන් හම්බවෙන්නේ, එක application එකක් විතරයි. කුඩා තේ වතු හිමියන් ඇතුළු අපි කවුරුත් දන්නවා, එක application එකක් වසරකට දමා තේ කර්මාන්තය නඟා සිටුවන්න බැහැ කියලා. අස්වැන්න වැඩි කරන්න පුළුවන්කමක් නැහැ. අඩුම ගාණේ හතරපාරක්වත් ඒ පොහොර ටික ලබා දෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන් වෙන්නේ. ඉතින්, මේ වාගේ වැඩ පිළිවෙළක් ගැන මේගොල්ලන් සඳහන් කරලා නැහැ. ඔබතුමන්ලාගේ යෝජනාවල මේවා ගැන සඳහන් වෙලා නැත්නම්, මුදලක් වෙන් කර නැත්නම්, පොහොර සහනාධාරය ලබා දෙන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැත්නම් කවදාවත් කුඩා තේ වතු කර්මාන්තයේ අර වාගේ ඉලක්කයකට යන්න පුළුවන්කමක් නැහැ. මේක විශාල විදේශ විනිමයක් ලබා ගන්න පුළුවන් දෙයක්. තමුන්නාන්සේලා හැම වෙලාවේම කථා කරනවා නේ විදේශ විනිමය ලබා ගන්න තිබෙන මාර්ග ගැන. ඉතින් මේකට ඇයි ප්‍රමුඛතාව ලබා දෙන්නේ නැත්තේ? ඉතාම කනගාටුයි, ඒ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් නොවීම ගැන.

ඊළඟ කාරණය තමයි, වතු කම්කරුවන්ගේ වැටුප පිළිබඳ කාරණය. වතු කම්කරුවන්ගේ වැටුප පිළිබඳව මෙතුමන්ලා මහා ලොකුවට කථා කරනවා. රුපියල් 1,350ක දෛනික වැටුපක් වතු කම්කරුවෙකුට මෙතෙක් කල් ලැබුණා. දැන් මෙතුමන්ලා වැඩි කර තිබෙන්නේ, රුපියල් 200යි. සමහර මන්ත්‍රීවරු කිව්වා, අනුර කුමාර දිසානායක මහත්තයා "දෙයියෝ" කියලා. දෙයියෝ වාගේ ඇවිල්ලා වතු කම්කරුවන්ට රුපියල් 10,000ක් වෙන්න වැඩි කළාය කිව්වා. කොහේද වැඩි කරලා තිබෙන්නේ, රුපියල් 10,000ක්? තමුන්නාන්සේලා වැඩි කර තිබෙනවා, රුපියල් 1,550 දක්වා. මම දන්නේ නැහැ ඒකත් කොතෙක් දුරට සාර්ථකද කියලා. විශේෂයෙන්ම මම වතු සමාගම් කිහිපයක් එක්ක කථා කළා. ඒ සමාගම්වල ඉන්න විධායක නිලධාරින් කිව්වා, ඒගොල්ලන් එක්ක මේ පිළිබඳව සාකච්ඡා කළේ නැහැයි කියලා. හැබැයි ජනාධිපතිතුමා ඇවිල්ලා මේ සම්බන්ධයෙන් කෙළින්ම ප්‍රකාශයක් කර තිබෙනවා, අය වැය වාර්තාව ඉදිරිපත් කරමින් රුපියල් 1,550ක් දක්වා යනවා කියලා. ඒ කියන්නේ, රුපියල් 200ක වැඩිවීමක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියයි මම කථා කරන්නේ.

අනෙක් පැත්තෙන් ගත්තාම, තව රුපියල් 200ක් රජයෙන් දෙනවා ලු; පැමිණීමේ දීමනාව වශයෙන් රුපියල් 200ක් රජයෙන් දෙනවා ලු. ඒ කියන්නේ, දින 25ක් වැඩ කළොත් රුපියල් 200යි. එහෙම තමයි තමුන්නාන්සේලා රුපියල් 1,750 ගළපන්න හදන්නේ. තමුන්නාන්සේලාගේ මැතිවරණ පොරොන්දුවට අනුව වතු කම්කරු ජනතාව රවට්ටන්න කියනවා, "අපි කොයි ආකාරයෙන් හරි ඒ රුපියල් 1,750 දුන්නා" කියලා. මෙතැන වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ මැති ඇමතිවරු ඉන්නවා නම් හොයලා බලන්න, කාටද දවස් 25ක් වැඩ කරන්න පුළුවන් කියලා. කාටද පුළුවන්? රබර් කර්මාන්තයේ යෙදෙන කෙනෙකුට දින 25ක් වැඩ කරන්න පුළුවන්ද, වර්ෂාවත් එක්ක? ඒ වාගේම තමයි තේ වතුවල වැඩ කරන කම්කරුවන්. වතු කම්කරුවන් යන්නේ නැහැ, දවස් 25ක් වැඩ කරන්න. දවස් 25ක් වැඩ කරන්න කොම්පැනිකරුවන් ඉඩ දෙන්නෙත් නැහැ. තමුන්නාන්සේලා මේ රුපියල් 200 වැඩි කළොත්, වතු කම්කරුවන් හූරා කෑමට ලක් වනවා. පසුගිය වර රුපියල් 1,350ක් කළාම මොකක්ද කළේ? රුපියල් 1,350ක වැටුප ගන්න ඕනෑ නම් රබර් ගස් 275ක් කපාපු කෙනාට රබර් ගස් 325ක ඉලක්කයක් වතු සමාගම් දුන්නා. සාමාන්‍යයෙන් තේ කිලෝ 18ක් ගෙනාපු අයට කිලෝ 22ක් ගේන්න කිව්වා. අන්න එහෙමයි වතු සමාගම් වැඩකටයුතු කෙරුවේ. මෙතනදීත් වෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා නම් කියයි කොම්පැනිකරුවන්ට අනිවාර්යයෙන්ම රුපියල් 200ක් වැඩි කරන්න කියලා. වැඩි කරපු ගමන් මොකක්ද කරන්නේ? ඔවුන් වතු කම්කරුවන්ගේ බෙල්ල මිරිකනවා. එවැනි වැඩ පිළිවෙළක් නැතුව, ඒ අසරණ වතු කම්කරුවන් රවට්ටන්නේ නැතුව මේ සම්බන්ධයෙන් වතු සමාගම් එක්ක සාකච්ඡා කරලා ක්‍රමවත් වැඩ පිළිවෙළකට අනුව මේ වැටුප් වැඩිවීම ලබා දෙන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම නැතුව වතු කම්කරුවන් බොරුවට රවට්ටන්න මේ වාගේ යෝජනා නම් ගේන්න එපා. ඒක ලොකු ප්‍රශ්නයක් වෙලායි තිබෙන්නේ. මට කථා කරන්න තවත් කාරණා තිබෙනවා. වේලාව නැහැ. මේ වතු කම්කරුවන් තවදුරටත් රවට්ටන්න එපා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.20]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றக் கிடைத்தமைக்கு முதலில் நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இது இலங்கையின் 80வது வரவு செலவுத்திட்டமாக அமைந்திருப்பதோடு, எமது தேசிய மக்கள் சக்தி அரசாங்கத்தினால் முன்வைக்கப்பட்ட இரண்டாவது

[ගරු කන්දසාමි ප්‍රභූ මහතා]

வரவு செலவுத்திட்டமாகவும் காணப்படுகின்றது. அதற்கு முன்னர் 78 வரவு செலவுத்திட்டங்கள் இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டு, அதனூடாகப் பல்வேறு விடயங்கள் இடம்பெற்றிருந்தன. அந்த வரவு செலவுத்திட்டங்களைத் தயாரித்தவர்கள், பேராசிரியர்களாகவும் புத்திஜீவிகளாகவும் பொருளாதார வல்லுனராகவும் அதைத்தாண்டி ஏழு மூளைகளைக் கொண்டவர்களாகவும்தான் இருந்திருக்கிறார்கள். ஆனால், அவர்களால் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்டங்களின் ஊடாக வங்குரோத்து அடைந்த நிலையில்தான் இந்த நாடு இறுதியாக எங்களுக்குக் கிடைக்கப் பெற்றது. கடந்தகால ஆட்சியாளர்களால் சமர்ப்பிக்கப்பட்ட அந்த வரவு செலவுத்திட்டங்கள், தங்களது கட்சி சார்ந்தவர்களின் நலனுக்காகவும் அல்லது அமைச்சர்களது பொருளாதாரத் தேவைகளுக்காகவும் அல்லது தாங்கள் உழைத்துக்கொள்கின்ற வழிவகையை ஏற்படுத்துகின்ற வகையிலும்தான் அமைந்திருந்தது. அதனூடாக எமது நாட்டு மக்களுக்கு எந்தவொரு நன்மையும் அந்தக் காலகட்டங்களில் கிடைக்கப் பெறவில்லை.

மாறாக, கடந்த காலங்களில் பல மோசடிகள் இடம்பெற்றிருந்தது. மத்திய வங்கிப் பிணைமுறி வழங்கலிலும்கூட பல மோசடிகள் இடம்பெற்றதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருந்தது. நாட்டு மக்களின் பொருளாதாரம் மிகவும் மோசமானதொரு நிலைக்குத் தள்ளப்பட்டும் வங்குரோத்து அடைந்த நிலையிலும்தான் இந்த நாடு எங்களுக்கு கிடைக்கப் பெற்றிருந்தது. பொருளாதார ரீதியான நெருக்கடியினால் நாங்கள் வரிசை யுகத்தை நோக்கி நகர்ந்திருந்தோம். பொருளாதாரத்திலே மிகவும் பின்னடைந்த நாடாக இந்த இலங்கை மாற்றப்பட்டிருந்தது. இருந்தபோதும் எமது அரசாங்கம் இந்த நாட்டைப் பொறுப்பேற்றதன் பின்னர், ஊழல் மோசடிகளை இல்லாதொழித்து வருகின்றோம். அதன் நிமித்தம் எங்களுடைய அரசாங்கத்தின்மீது இவர்களால் முன்வைக்கப்பட்ட விமர்சனம் "L" board அரசாங்கம் என்பதாகும். நாங்கள் 'L' board அரசாங்கமாக இருந்தாலும், முதலாவது வரவு செலவுத்திட்ட அமுலாக்கத்தின்பேரில் 1.2 ரில்லியன் தொகையினை திறைசேரியின் கையிருப்பிலே கொண்டுவந்து சேர்த்திருக்கிறோம். அனைத்துச் செலவுகளையும் கட்டுப்படுத்தி, அதனூடாக இந்த நாட்டின் வரிப் பணத்தைச் சேமித்து, மக்களிடையே கொண்டுசேர்க்கின்ற ஓர் அரசாங்கமாக இன்றைக்குத் தேசிய மக்கள் சக்தி அரசாங்கம் அமைந்திருக்கின்றது.

எமது அரசாங்கத்தின் வெளிப்படைத் தன்மையின் காரணமாக, கடந்த காலங்களில் உதவிகளை வழங்காது இந்த நாட்டை விட்டுச் சென்ற யப்பான் போன்ற நாடுகள், அவர்களால் கைவிடப்பட்ட திட்டங்களை மீண்டும் ஆரம்பிப்பதற்கான சந்தர்ப்பம் இன்று ஏற்படுத்தப்பட்டிருக்கின்றது. இந்த நாட்டில் எங்களது அரசாங்கம் ஒரு வெளிப்படைத் தன்மையோடும், சிறப்பான வெளிவிவகாரக் கொள்கையோடும் பயணித்துக்கொண்டு இருக்கின்றது என்பதற்கு இது ஒரு சிறந்த எடுத்துக்காட்டாக அமைந்திருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்களின் வெளிவிவகாரக் கொள்கை சிறப்பாக அமைந்திருப்பதன் காரணமாக, ஏனைய வெளிநாடுகள் ஒப்பீட்டளவில் எமது நாட்டின்மீது சிறந்த நன்மதிப்பைக் கொண்டிருக்கின்றன. அதன் காரணமாகத்தான் இன்று வெளிநாட்டு முதலீடுகள் எமது நாட்டுக்கு அதிகமாகக் கிடைக்கப்பெற்றுக் கொண்டிருக்கின்றது. அத்துடன், வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் அதிகமாக இந்த நாட்டை நோக்கிப் பயணித்துக் கொண்டிருக்கின்றார்கள். அதிகளவான சுற்றுலாப் பயணிகள் வருகைதந்த ஒரு நாடாக இன்றைக்கு எங்களது நாடு அமைந்திருக்கின்றது; மிகவும் குறுகிய காலத்துக்குள்ளே அந்த நிகழ்வு இடம்பெற்றிருக்கின்றது.

அதேபோன்று, அரசாங்கத்தின் வருவாய்த் துறையில் பிரதான பங்கு வகிப்பது சுங்கம் மற்றும் இறைவரித் திணைக்களம் என்பனவாகும். 2025ஆம் ஆண்டு காலப்பகுதிக்குள்ளே அதிகூடிய வருமானத்தை ஈட்டுகின்ற அரச இயந்திரங்களாக இந்த இரண்டும் காணப்படுகின்றன. ஊழல், மோசடிகள் மற்றும் அரசியல் தலையீடு இல்லாமல் சுயாதீனமாக அவை இயங்குவதனால், எங்களது அரச சேவைகூட இன்று சரியான முறையில் இயங்குவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. கடந்த காலங்களில் ஊழல், மோசடி மற்றும் அதிகாரத் துஷ்பிரயோகங்களைச் செய்து இந்த நாட்டின் பொருளாதாரத்தைச் சீர்குலைத்துவிட்டுத் தாம் செல்வந்தர்களாக மாறியுள்ள அரசியல்வாதிகள் பலர் இன்று இலஞ்ச, ஊழல் ஆணைக்குழுவின் முன்னால் விசாரணை செய்யப்பட்டு, நீதிமன்றம் வரைக்கும் சென்று, சிறைகளிலே அடைக்கப்பட்டிருப்பதை எங்களால் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. அதேநேரம், நாட்டு மக்களும் அந்த விடயத்தில் அவதானம் செலுத்திக் கொண்டிருக்கின்றார்கள். ஆகவே, இந்த நாடு இன்று ஒரு வெளிப்படைத் தன்மையுடன் நீதியையும் நியாயத்தையும் சட்ட ஒழுங்கையும் நிலைநாட்டுகின்ற ஒரு நாடாக இருக்கின்றது. அதனூடாகச் சர்வதேச மதிப்புமிக்க ஒரு நாடாக இந்த இலங்கைத் தேசம் இன்று மாறியிருக்கின்ற விடயத்தையும் நாங்கள் குறிப்பிட வேண்டியிருக்கின்றது.

அடுத்து, 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்ட நிதியொதுக்கீட்டில் எமது மட்டக்களப்பு மாவட்டத்திலே இடம்பெறுகின்ற அபிவிருத்தித் திட்டங்களின் 75 - 80 சதவீதமான வேலைத்திட்டங்கள் இப்போது நிறைவடைந்திருக்கின்றன. இந்த வருடத்தில் இன்னும் சில கால அவகாசம் எங்களுக்கு இருக்கின்றபடியினால் அவற்றை 100 சதவீதம் எட்டக்கூடிய சந்தர்ப்பம் அமையக் கூடும். இங்கேயுள்ள எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் பலர், "இன்னும் அரசாங்கம் 50 சதவீத செயற்றிட்டங்களைக்கூட எட்டவில்லை" எனக் கூறிக்கொண்டிருந்தாலும், நாங்கள் குறித்த காலத்திற்குள்ளே அவற்றை நிறைவு செய்திருக்கின்றோம் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் ஞாபகமூட்டிக்கொள்ள விரும்புகின்றேன்.

அதைப்போன்று, 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டிலும்கூட மட்டக்களப்பு மாவட்டத்தின் மிகவும் அவசியமான நீர்ப்பாசனத் திட்டமான கித்துள் - றூகத்தை இணைக்கின்ற முந்தனை ஆற்றுத் திட்டத்தின் முதற்கட்ட வேலைகளை ஆரம்பிப்பதற்காக ஜனாதிபதி அவர்கள் 50 மில்லியன் ரூபாயை ஒதுக்கியிருப்பதை நாங்கள் விசேடமாகத் தெரிவித்துக்கொள்ள வேண்டியிருக்கின்றது. அதனைப்போன்று, பொண்டுகள்சேனை, கிரான் பால நிர்மாணத்துக்கான ஆரம்பக்கட்ட ஆய்வுப் பணியை மேற்கொள்வதற்காக 500 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருப்பதையும் இந்த நேரத்தில் ஞாபகமூட்ட விரும்புகின்றேன். இந்த இரண்டு திட்டங்களும் பின்தங்கிய பிரதேசங்களில் மேற்கொள்ளப்படவிருக்கின்றது. எங்களது மாவட்டத்தில் விவசாயம், மீன்பிடி சார்ந்த விடயங்கள் கூடுதலாக இடம்பெறுவதன் காரணமாக இந்த நீர்ப்பாசனத் திட்டத்தினூடாக எங்களது மக்களின் பொருளாதாரத்தை வளர்த்துக்கொள்வதற்கான ஒரு சந்தர்ப்பம் அமையும் என்பதனையும் நான் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

அதனைப்போல, மீன்பிடித்துறை சம்பந்தமாக எடுத்துக்கொண்டால், அங்கே இருக்கின்ற ஒரேயொரு துறைமுகமான வாழைச்சேனைத் துறைமுகத்தில் தங்களது படகுகளை நிறுத்துவதற்கும் மீன்பிடித் தொழிலை மேற்கொள்வதற்கும் இடப்பற்றாக்குறை இருப்பதாக மீன்பிடியாளர்கள் பலர் தெரிவித்துள்ளார்கள். அதன் காரணமாக இந்த வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின் ஊடாக 350 மில்லியன் ரூபாயை இந்த மீன்பிடித் துறைமுகத்தை மேம்படுத்துவதற்காக ஒதுக்கியிருப்பதையும் நான் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

அதனைப்போன்று, எங்களது பிரதேசத்தில் யானை-மனித மோதல் தொடர்ந்தும் இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. நேற்றைய தினம்கூட இந்த யானை-மனித மோதலைத் தடுப்பது சம்பந்தமாக அவதானத்தைச் செலுத்துமாறு கிரான், ஈரளக்குளப் பிரதேச மக்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருந்தார்கள். யானை-மனித மோதலைத் தீர்ப்பது சம்பந்தமான விடயங்களுக்காக இந்த வரவு செலவுத்திட்டத்தில் 10 மில்லியன் ரூபாயை நாங்கள் ஒதுக்கீடு செய்திருக்கிறோம் என்ற விடயத்தையும் நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதுபோல், யுத்தத்தால் இறந்த தரப்பினரை நினைவுகூருகின்ற மாதமாக இந்தக் கார்த்திகை மாதம் அமைந்திருக்கின்றது. இதற்காக தாண்டியடி மாவீரர் துயிலும் இல்லத்தினை விடுவிப்பதற்காக நாங்கள் அரசாங்கத்திடம் கோரிக்கை முன்வைத்திருக்கின்றோம். வெகுவிரைவில் இந்த தாண்டியடி மாவீரர் துயிலும் இல்லத்தில் மக்கள் அஞ்சலி செலுத்த முடியும். எனக்கு இந்தச் சந்தர்ப்பத்தை வழங்கியமைக்கு மீண்டும் நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස පුරාම මේ අය වැය විවාදයේදී විපක්ෂය පැත්තෙන් මතු කරන්න උත්සාහ කළේ, නව බදු වර්ග හඳුන්වා දීලා, රටේ පොදු ජනතාව විශාල සූරාකෑමකට ලක් කරනවා කියන එක. බදු ආදායම වශයෙන් විශාල ආදායමක් උපයනවා කියනවා. හැබැයි, එතුමන්ලා අසමත් වුණා ඒ බදු වර්ග මොනවාද කියලා වෙන් වෙන්ව කියන්න. බදු අය කරනවා කිව්වාට, මෙන්න මේ බද්දෙන් තමයි පොදු ජනතාව පීඩාවට ලක් කරලා තිබෙන්නේ කියලා වෙන් වෙන් වශයෙන් කියන්න අසමත් වුණා. එහෙම කිසිදු බද්දක් මේ අය වැයෙන් පනවලා නැහැ. ආණ්ඩුව බදු ආදායම වැඩි කර ගෙන තිබෙන්නේ, බදු අය කරන සීමාව පුළුල් කරලා. සීමාව පුළුල් කරලා බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා.

මීට කලින් කළේ මොකක්ද? අහිංසක, දුප්පත් මිනිස්සුන්ට බදු ගැහුවා. ව්‍යාපාරිකයෝ ඒ බදු ටික එකතු කර ගත්තා. ව්‍යාපාරිකයෝ කියන්නේ, ඒ බොහෝ අය ආණ්ඩු පක්ෂයේ හිටපු මන්ත්‍රීවරු. ඒ අය කොමිස් ගැහුවා, හොරකම් කළා, වංචා කළා, ආණ්ඩුවේ භාණ්ඩාගාරයට මුදල් ටික ගියේ නැහැ. දැන් මේ ආණ්ඩුව රටේ පොදු ජනතාවගෙන් එකතු කර ගන්නා, ඒ අහිංසක මිනිස්සුගෙන් එකතු කර ගන්නා බදු මුදල් ටික වංචා කරන්න දෙන්නේ නැහැ. බදු හොරකම් කරන්නේ නැහැ, කොමිස් ගහන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුවට බදු වැඩියෙන් එකතු වෙනවා. ඒ මුදල් තමයි මේ එකතු වෙලා තිබෙන්නේ. එහෙම නැතුව අලුතින් බදු ගහලා නොවෙයි මේ මුදල් එකතු කරලා තිබෙන්නේ. වෙන දා එකතු කරපු නැති මුදල් දැන් එකතු වෙනවා. දැන් වෙන දා වාගේ ශ්‍රී ලංකා රේගුවෙන් මුදල් හොරකම් කරන්න බැහැ, හරියට එකතු වෙනවා. ඉතින්, බදු ආදායම වැඩි වෙනවා. ඒක හුවා දක්වන්න හදනවා, මේ අහිංසක මිනිස්සුන්ට බදු ගහලා කියලා. ඒ එකතු කර ගත්ත මුදල්වලින් අපි ගිය අය වැය ලේඛනයෙන් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ නිවසක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියනය ගණනේ -ලක්ෂ 10- වෙන් කරලා තිබෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඇහුවා රුපියල් ලක්ෂ 10න් ගෙයක් හදන්නේ කොහොමද කියලා. හදපු ගෙවල් 3,000කට ආසන්නව ලේඛනගත කරලා තිබෙනවා. සෑම දිස්ත්‍රික්කයකම ඒවා ලේඛනගත කරලා තිබෙනවා. ඒවා දීපු අයගේ නම තිබෙනවා,ඒ ඇඩ්‍රස් එක තිබෙනවා. ඒ ඕනෑම දෙයක් සොයා බලන්න පුළුවන්. හැම ගෙයකටම අපි රුපියල් ලක්ෂ 10ක් දීලා ඒ ගෙවල් හදලා තිබෙනවා. හැබැයි, ඒ ලක්ෂ 10ක් දුන්නු ගෙවල් හදන්න රුපියල් ලක්ෂ 15, 20 වියදම් කරලා තිබෙනවා. එහෙම වියදම් කරලා තිබෙන්නේ, ඒකට උදවු කරපු අය ඉන්න නිසා. ඊට ගමේ පොදු ජනතාව ගිහිල්ලා උදවු කරලා තිබෙනවා. තව ව්‍යාපාරිකයෝ උදවු කරලා තිබෙනවා. ගමක අසරණ පවුලකට ගෙයක් ලැබුණාම, මුළු ගමක් ප්‍රබෝධමත් වුණා. ඒ ප්‍රබෝධමත්භාවය මත, ගමේ අයත් උදවු කරලා, රටේ අයත් උදවු කරලා, ව්‍යාපාරිකයෝ උදවු කරලා, වෙනත් රාජ්‍ය ආයතනත් උදවු කරලා තමයි ඒ ගෙවල් ටික හැදුවේ. අද ගෙවල් හදන එක ජාතික ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා. ඒකට මිනිස්සු උදවු කරනවා. අන්න එහෙම තමයි අපි ගෙවල් 3,000ක් හැදුවේ.

හැබැයි, 2015-2019 ආණ්ඩුවෙන්, ඔය කයිවාරු ගහන මහත්මයාගේ ආණ්ඩුවෙන් ගම්මාන 2,562ක ගෙවල් 64,407ක් හදනවා කිව්වා. නමුත් හදලා තිබෙන්නේ ගෙවල් 16,747යි. ඒවායේ පදිංචි වෙලා ඉන්නේ සියයට 20කටත් වඩා අඩු ප්‍රමාණයක්. අනෙක් ගෙවල්වල පදිංචි වෙලා නැහැ. අලි ගහන කැලෑ ඇතුළේ ඒ ගෙවල් හැදුවේ. අලි වැටටත් ඇතුළෙන් වනජීවී කලාප ඇතුළේ ගෙවල් හදලා තිබෙනවා. ඒවායේ මිනිස්සුන්ට ජීවත් වෙන්න බැහැ.

ඒවාට වතුර ටික නැහැ, පාර නැහැ. වනාන්තර ඇතුළේ ගෙවල් හැදුවා. ඒවායේ සියයට 20ක පදිංචි වෙලා නැහැ. එහෙම කරලා තමයි ලංකාවේ ලොකුම සැලසුම් ශිල්පියා වාගේ, කළමනාකරණ ශිල්පියා වාගේ, ලංකාවේ මහා බුද්ධිමතා වාගේ කථා කරන්නේ. හැම දිස්ත්‍රික්කයක් ඇතුළේම ඔය කාලසීමාව තුළ හදපු ගෙවල් පිළිබඳව වාර්තාවක් අපට දෙන්න පුළුවන්. ගිහිල්ලා පෙන්වන්නත් පුළුවන්. හැම ගමකටම ගියොත් බලාගන්න පුළුවන්, ඔය හදපු ගොඩක් ගෙවල්වල මිනිස්සු පදිංචි වෙලා නැහැ. *[බාධා කිරීමක්]* ඇහේ තරමට මොළය තිබුණා නම් ඔබතුමාට ඔය

[ගරු ටී.බී. සරත් මහතා]

වැඩේ වෙන්නේ නැහැ. ඔබතුමා, බදුල්ලේ මිනිස්සුන්ට වැරදිලා පාර්ලිමේන්තුවට එවපු කෙනෙක්. ඇගේ තරමට මොළේ තිබුණා නම් ඒක වෙන්නේ නැහැ, නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෙවල් 7,000ක් හදන්න අපි මේ අවුරුද්දේ මුදල් වෙන් කරලා තිබෙනවා. මේ ගෙවල් 7,000 හදන්න රුපියල් ලක්ෂ 10 බැගින් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේ විවිධ වැඩසටහන් හැදුවා. වතු ජනතාව සඳහා නිවාස ඒකක 2,500ක් හදන්න බිලියන 5.6ක් වෙන් කරලා තිබෙනවා. කොළඹ නගරයේ තදාසන්න ප්‍රදේශවල ජනාවාස ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉදිරි අවුරුදු 3 ඇතුළත ගෙවල් 50,000ක් ඉදිකරන්න යෝජනා කර තිබෙනවා. මේ අවුරුද්දේ ගෙවල් 3,000ක් ප්‍රතිස්ථානගත කිරීම සඳහා රුපියල් බිලියන 15ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, කොළඹ ඇතුළු විවිධ තදාසන්න ප්‍රදේශවල ජීවත් වන අඩු ආදායම්ලාභී පුද්ගලයන්ට දැරිය හැකි පිරිවැයකට නිවාසයක් ලබා දීම සඳහා රුපියල් බිලියන 6.5ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ගැටුම්වලින් පීඩාවට පත් වෙච්ච අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමන්ලාගේ උතුරු-නැඟෙනහිර පළාත්වල ගෙවල් 2,445ක් හදන්න රුපියල් බිලියන 3.8ක් කර තිබෙනවා. එහිදී ගෙදරකට රුපියල් ලක්ෂ 15ක් දෙනවා. අනෙකුත් ප්‍රදේශවල නිවසක් සෑදීමට රුපියල් ලක්ෂ 10ක් දුන්නාට, උතුරු-නැඟෙනහිර නිවසක් සෑදීමට රුපියල් ලක්ෂ 15ක් අපි දෙනවා. හේතුව තමයි, උතුරු-නැඟෙනහිර වියදම වැඩි වීම. ඒ නිසා උතුරු-නැඟෙනහිර නිවසක් සෑදීමට අපි රුපියල් ලක්ෂ 15 ගාණේ ගෙවනවා.

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, උතුරු-නැඟෙනහිර විතරක් 2015-2019 කාලසීමාව තුළ ගෙවල් 5,000කට ආසන්න ප්‍රමාණයකින් මිනිස්සු ඉවත් කරලා, ඒ මිනිසුන්ට ටකරන් මඩු ගහලා දීලා, අත්තිවාරම විතරක් දාලා තිබෙනවා ගෙවල් 4,800කට ආසන්න ප්‍රමාණයකට. අද ඒ මිනිස්සු අන්ත අසරණව දුක් විඳිනවා. අද ඒ මිනිසුන්ට ඉන්න ගෙයක් නැහැ. දරුවෙක් හදාගන්න බැහැ. මම යාපනය අර්ධද්වීපයේ ගෙවල් සිය ගණනක ඇවිද්දා. ළමයෙකුට ගෙයක් ඇතුළේ ජීවත් වෙන්න බැහැ. අන්න එහෙම තත්ත්වයක් තිබුණේ. 2015-2019 කාලසීමාව තුළ ගෙවල් 5,000කට ආසන්න ප්‍රමාණයකට ඒ විධියේ විනාශයක් කරලා තිබෙනවා. ඒ ගෙවල් ඔක්කෝම හදන්න ඕනෑ. ගෙවල් 1,900 ගණනක් අපි පහුගිය අවුරුද්දේ හදලා තිබෙනවා. යාපනය, වව්නියාව, මන්නාරම වැනි ප්‍රදේශවල අපි එවැනි නිවාස හදලා තිබෙනවා. මේ අය වැයෙන් අපි ගෙවල් 2,445ක් හදන්න යෝජනා කරලා තිබෙනවා. අවතැන් වෙච්ච මිනිසුන් වෙනුවෙන් අපි ගෙවල් හදලා දෙනවා. ඒ විතරක් නොවෙයි, අපි මේ අවුරුදු 3, 4 සම්පූර්ණ කරනකොට යාපන අර්ධද්වීපයේ අවතැන් වෙච්ච සෑම මනුස්සයෙකුටම, සෑම පවුලකටම ගෙවල් හදලා අවසන් කරන්න කටයුතු කරනවා. ඒ නිසා සෑම දිස්ත්‍රික්කයකම, සෑම ජන කොටසකම පීඩාවට පත් වෙච්ච ජන කොටස්වල සුවිශේෂීභාවය පාදක කරගෙන තමයි ගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද පැරණි නිවාස යෝජනා ක්‍රමවල ගොඩනැඟිලිවල පොදු පහසුකම් හදන්න අප කටයුතු කරනවා. ඒ කියන්නේ අවුරුදු 30ක්, 40ක් වන, ඒ හදපු පැරණි නිවාසවල පොදු පහසුකම් හදන්නත් රුපියල් මිලියන 680ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ අනුව මේ අය වැය තුළින් සම්පූර්ණයෙන්ම ගත්තොත් ගෙවල් 27,000කට වැඩි ප්‍රමාණයක් ඉදිකිරීම වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් පසුගිය කාලය ගත්තොත්, අවුරුදු 5ක වාගේ කාලපරිච්ඡේදය තුළ ගෙවල් 20,000ක් හදලා නැහැ. අපි අවුරුද්දකට ගෙවල් 27,000කට ආසන්න ප්‍රමාණයක් හදන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව, මේ අය වැය ලේඛනය තුළින් පොදු ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් මුදල් වෙන් කරන්න කටයුතු කර තිබෙනවා.

විපක්ෂය හුවා දක්වන්න හැදුවා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සියයට 35කින් වැඩි කරලා තිබෙනවා කියලා. හැබැයි, ඉදිරි අවුරුදු හතර තුළ ක්‍රියාත්මක කරන මේ ආණ්ඩුවේ ප්‍රධාන ව්‍යාපෘති තුනක් පිළිබඳව අපි සාකච්ඡා කරනවා. එකක් තමයි Clean Sri Lanka වැඩසටහන. ඊළඟට, ඩිජිටල් ආර්ථිකය. ඊළඟට, ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නැංවීමේ "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ. එයින් ප්‍රධානම එකක් තමයි Clean Sri Lanka වැඩසටහන. ඒකට අතිගරු ජනාධිපති කියන විශේෂ වියදම් ඒකකයෙන් තමයි මුදල් වියදම් වෙන්නේ. ඒකයි වැඩිපුර මුදලක් පෙන්වා තිබෙන්නේ.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේ අය වැය පොදු ජනතාව වෙනුවෙන් සකස් කරන ලද, ග්‍රාමීය ජනයාගේ ආර්ථිකය නැංවීම සඳහා සකස් කරන ලද අය වැයක් බවයි. ඒ නිසා තමයි අද විපක්ෂයට හාන්සි වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ; තර්කයක් ගොඩ නඟන්න බැරි වෙලා තිබෙන්නේ. විපක්ෂය හාන්සි වෙලා තිබෙන්නේ ඕක නිසායි. මේ අය වැය ක්‍රියාත්මක කරනකම් පොඩ්ඩක් ඉන්න. ඊළඟ අය වැය වෙනකොට විපක්ෂයට හාන්සිවෙන්න නොවෙයි වෙන්නේ. ඊළඟ අය වැය වෙනකොට විපක්ෂයට රෝද පුටුවේත් නොවෙයි, ගිලන් ඇඳක තමයි එන්න වෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම සඳහන් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම මම ස්තුතිවන්ත වෙනවා, ටී.බී. සරත් අයියාට. මම අද මේ ගැන කථා කළා. ගෙවල් 2,445ක් දෙනවා කිව්වා. ඇත්තටම මට සතුටුයි. අපි කැන්ටිමට ගිහින් කථා කළා. ඔබතුමා මේක දුන්නාට අපේ ධීවර ඇමති - DCC Chairman - මේක හරියටම කරන්න ඕනෑ. මම අවුරුද්දක් ඔයගොල්ලන් එක්ක රණ්ඩු වෙනවා, මේ නිසා. අනිවාර්යයෙන් රණ්ඩු වෙනවා. ඒ ගෙවල් 2,445 හැදුවොත්, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, අර්ච්චුනා මන්ත්‍රීතුමා. මේක අදහස් පළ කරන්න වෙලාවක් නොවෙයි.

මීළඟට, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.40]

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2026 වසර සඳහා වන අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී අද දින මට අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. මීට ඉස්සෙල්ලා කථා කළ නියෝජ්‍ය ඇමතිවරයා කිව්වා, විපක්ෂය හාන්සි කරවනවා කියලා. ගිලන් ඇඳේ යවනවා කිව්වා. එතුමාට මතක් වෙලා වෙන්න ඇති, 1988-89 කාලයේ කරපු දේවල් ටික ආපහු කරනවා කියලා. හැබැයි, දැන් බය නැහැ. ගිලන් ඇඳේ යවපු යුගයට හොඳට උත්තර දීලා තිබෙනවා. උත්තර දෙන්නත් මේ විපක්ෂය සූදානම් කියලා මම මුලින්ම කියනවා.

මේ රටේ පොදු ජනතාව, මේ රටට ආදරය කරන මිනිස්සු මේ රට ගොඩගන්න පුළුවන් එකම කණ්ඩායම ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු කණ්ඩායම කියලා හිතලා පසුගිය ජනාධිපතිවරණයේදී සහ ඊට පසුව මැතිවරණ දෙකකදී ඔබතුමන්ලාට ජන වරමක් දීලා තිබෙනවා. ඔවුන්ගේ ඒ උදාරතර බලාපොරොත්තුව අමු අමුවේ දූෂණය වෙන වෙලාවේ,- මේක, මේ ආණ්ඩුවේ දෙවැනි අය වැය නේ. පළමුවැනි අය වැය නම් කියන්න පුළුවන් පළමුවැනි අය වැය නිසා කරගන්න දෙයක් නැහැ කියලා. දෙවැනි අය වැයේදී ඔය වාගේ සුරංගනා කථාවලින් මේ දේවල් වහලා දමන්න සූදානම් වෙන එක ගැන අපි මේ වෙලාවේ මේ රටේ මිනිසුන්ගේ අවධානය යොමු කරවන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර කුමාර දිසානායක වත්මන් ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ අර පුටුවේ ඉඳගෙන කථා කරපු හැම කථාවකම හරය, අර්ථය වන්නේ මේ රටේ අහිංසක පොදු ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන්, රාජ්‍ය සේවකයා වෙනුවෙන්, උපාධිධාරියා වෙනුවෙන් එකම ගැලවුම්කාරයා ජේවීපී එක බවයි. එතුමා ඒක පාර්ලිමේන්තුවෙන් එළියට අරගෙන ගියා. පාර්ලිමේන්තුවෙන් එළියට අරගෙන ගිහින් වේදිකාවක්, වේදිකාවක් ගණනේ එතුමා ඒ ගැන කිව්වා. අද එතුමා කිසිම හිරිකිතයක් නැතිව ඒ අදහස් අනෙක් පැත්තට හැරෙව්වාට එදා එතුමා ජනතාව ඉදිරියට ගියාම ජනතාව අත්පුඩි ගැහුවා.

දැන් මම ජනාධිපතිතුමා කියපු විශේෂ කාරණා දෙක තුනක් ගැන මතක් කරන්න කැමැතියි. ඒවා ගැන මේ රටේ ජනතාව දන්නවා. අපේ රට 1950න් පසුව, නිදහසින් පසුව දිගින් දිගට ගත්ත ණය ප්‍රමාණය ගත්තාම, 'ඕක කජ්ජක්ද?' කියලා එතුමා ඇහුවා. අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, ඔය ණය කජ්ජක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2025 අවසන් වෙලා දැන් 2026 වසරට යනවා. 2026ට ගිහින් 2027 අවසන් වුණු ගමන් අපි ණය ගෙවන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා කජ්ජක්ද කියපු ණය ගෙවන්නේ කොහොමද කියලා අපි අහනවා. මේ දවස්වල හුස්ම ගන්නේ මෙතුමන්ලා ආර්ථිකය ශක්තිමත් කරලා, ආර්ථිකය හොඳ ස්ථාවර ගමනකට ගෙනැල්ලා, ඒ අනුව මේ රට පාලනය වෙන නිසා නොවෙයි. ඩොලර් මිලියන 1,982ක ණය සහනයක් ලැබිලා තිබෙනවා. ඒකෙන් තමයි මේ දවස් ටික ගෙවාගෙන යන්නේ. ලබන අවුරුද්දෙත් - 2026 - ලැබෙනවා. ඒකෙන් 2027 වසරත් දුවාගන්න පුළුවන්. හැබැයි, ඊට පසුව ඉදිරියට යන්නේ කොහොමද? මේ වෙලාවේ IMF එකෙන් ඩොලර් මිලියන 679ක්, World Bank එකෙන් සහ ADB එකෙන් ඩොලර් මිලියන 638ක් ලැබෙනවා. දැන් මේ ඔක්කොම ටික තිබෙනවා. ඒ නිසා මේ කාලය ගෙවාගෙන යන්න පුළුවන්. හැබැයි, මෙතැනින් එහාට 2028 දී ණය ගෙවන්න තිබෙන සැලසුම් මොනවාද? මොන ආයෝජකයාද මේ රටට අරගෙන ඇවිල්ලා තිබෙන්නේ? ඒ ආයෝජන හරහා ආදායමක් එන විධියට මේ රටේ හදලා තිබෙන ව්‍යාපෘතිය මොකක්ද? මේ රටේ අපනයන - exports - වැඩි කරන්න ගෙනැල්ලා තිබෙන යෝජනාව මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දක්වා මේ රටේ ඉතිහාසයේ මේ වාගේ ලුණු හිඟයක් ඇති වුණේ නැහැ. අවුරුදු දෙකකට ඇති වෙන්න ලුණු දැන් ගෙනැල්ලා තිබෙනවා. ලුණු ගෙනාපු විධිය ගැන, ලුණු ගෙනැල්ලා මංකොල්ලයක් සිදු වුණාය කියන එක ගැන උත්තරයක් දෙන්න බැහැ, නිර්දෝෂීභාවය ඉස්සරහා තබාගෙන සිටින මේ සුපිරිසිදු ආණ්ඩුවට. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා කියනවා ලුණු ගේනකොට දූෂණයක් වෙලා තිබෙනවා, සහල් ආනයනයේදී දූෂණයක් වෙලා තිබෙනවා, කන්ටේනර් 323 එළියට යනකොට දූෂණයක් වෙලා තිබෙනවා කියලා. නමුත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ඒවා ගැන අඩුම ගණනේ විමසීමක්වත් නැහැ.

මීට පෙර පාලනය කරපු හැම කෙනාටම චෝදනා තිබුණා. ඒ චෝදනාවලින් තොර පිරිසිදු ආණ්ඩුවක් තමයි අපේ රටේ මිනිස්සු බලාපොරොත්තු වුණේ. ඒ වාගේම, මේ රටේ මහජනතාව බලාපොරොත්තු වෙච්ච ආකාරයට හැම පැත්තෙන්ම නිවැරදි, නිර්දෝෂී මිනිස්සු ටිකක් මෙතැන හැදෙයි කියලා අපි හිතුවා. නිර්දෝෂීභාවය දැන් එතුමන්ලාම කෙළෙසා ගන්නවා නේ. එතුමන්ලාගේ පොරොන්දු පත්‍රිකාවේ කොච්චර තිබුණාද, විනිවිදභාවයෙන් වැඩ කරනවා කියලා? දැන් අපි අහනවා, විනිවිදභාවයෙන්ද ලුණු ටික ගෙනාවේ, විනිවිදභාවයෙන්ද කන්ටේනර් 323ක් එළියට ගියේ කියලා. අද අයිස් මත්ද්‍රව්‍යය ගැන එක එක චෝදනා ගේනවා. ඒවාත් එළියට ගියා. ඒවා කාගේද? මොන ඇමතිවරයාගේ වුවමනාවටද අයිස් මත්ද්‍රව්‍යය ගෙනාපු කන්ටේනර් එළියට ගියේ? අපි අහනවා, ඒ විධියට එළියට ගිය කන්ටේනර් ටික නිදහස් කරපු නිලධාරින් කවුද කියලා. අද වෙනකල් ඒවා ගැන සොයලා නැහැ. ඒ නිලධාරින් හෝ ඒකට අනුබල දුන් කවුරු හරි ඉන්නවා නම් ඒ පිරිස ඉදිරියට අරගෙන ඇවිල්ලා අර වුදිතයෝත් එක්කම මේ රටේ ජනතාවට දැක ගන්න අවස්ථාව දෙන්න. ඒකට තමයි කියන්නේ, විනිවිදභාවයෙන් වැඩ කරනවා කියලා. අපට පෙනෙන විනිවිදභාවය මොකක්ද? ආණ්ඩුවේ කවුරු හරි කුඩු විකුණුවා නම් හෝ ආණ්ඩුවට සම්බන්ධ කවුරුන් හෝ මන්ත්‍රීවරියක් හෝ ඇයගේ මහත්තයා හෝ කුඩු විකුණුවා නම් හෝ පොලිස්පතිතුමා මාධ්‍ය නිවේදනයක් නිකුත් කරනවා, ඒ කාරණය මාධ්‍යට ආවරණය කරන්න එපා කියලා. හැබැයි, විපක්ෂයට සම්බන්ධ කාගේ හරි එකක් නම් ඒක මාධ්‍යයේ පළ කරනවා. අපි කියන්නේ, ඒ දෙකම පළ කරන්න කියන එකයි. මාධ්‍ය තුළින් හෝ කොහෙන් හෝ මේ රටේ ඔය ජාවාරම්කාරයෝ නැති කරන්න පුළුවන් විධියට වැඩ කරන්න. ඒක මාලිමාවේ කෙනාට වුණාම වෙන විධියකටත්, වෙනත් දේශපාලන පක්ෂයක කෙනෙකුට වුණාම මාධ්‍යයට අදාළ කරන්න පුළුවන් විධියටත් කටයුතු කරන්න එපා.

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැති වුණත්, එතුමාගේ ආදරණීය කථා විලාශය අපට මතක් වෙනවා. එතුමා මාතර ජනතාවට, ඒ වාගේම මේ රටේ ජනතාවට පොරොන්දු රාශියක් දුන්නා. මහජනතාවට නැති කිසිම වරප්‍රසාදයක් අපට මොකටද කියලා කිව්වා. එතුමාගේ එම වචන ටික මේ වෙලාවේ මේ රටේ මිනිසුන් තුළ රැව් පිළිරැව් දෙනවා ඇති. මහජනතාවට නැති කිසිම දෙයක් අපට එපා කියලා කිව්වා. එතුමා කිව්වා, ගෙවල් ඕනෑ නැහැ කියලා. මහජනතාවට ගෙවල් නැත්නම් අපට නිල නිවාස මොකටද කියලා කිව්වා. අද මාදිවෙල නිල නිවාස අරගෙන තිබෙන විධිය ගැන සොයලා බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනතා විමුක්ති පෙරමුණේ හැම මන්ත්‍රීවරයෙකුම නිල නිවාසයක් අරගෙන තිබෙනවා. ගත්තේ නැති එක්කෙනෙක්වත් නැහැ. මම හිතන විධියට, දුර ඉඳලා එන මන්ත්‍රීවරුන්ගෙන් නිල නිවාසයක් අරගෙන නැත්තේ මම විතරක් වෙන්න ඇති.

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා වැටුප් ගන්නේ නැහැ කියලා කිව්වා. අපට ඒක ප්‍රශ්නයක් නැහැ. කොහේ ගියත් ටිල්වින් මහත්මයාගේ account එකෙන් මෙතුමන්ලා වැටුප් ගන්නවා කියලා රට දන්නවා නේ. වැටුප් ගන්නේ නැත්නම්, ඒ මුදල් මහා භාණ්ඩාගාරයට ගිහිල්ලා රටේ මිනිසුන්ට වාසියක් වෙන්න ඕනෑ. වැටුප් නොගන්නා වාසිය රටේ ජනතාවට දෙනවා නම් තමයි සුපිරිසිදු දේශප්‍රේමී මිනිස්සු වෙන්නේ. වැටුපට අදාළ මුදල් රටේ ජනතාවට යන්නේ නැතුව ඒ මුදල් තමන්ගේ account එකෙන් වෙන කොහේ හරි තැනකට යනවා නම්, එතැන "වැටුප් ගන්නේ නැහැ" කියන අර්ථය නොවෙයි තිබෙන්නේ. ඒක හරිම වැරදි අර්ථකථනයක්. ඒක රටේ මිනිස්සු තේරුම් අරගෙන තිබෙනවා.

ඒ වාගේම වාහන කථාව අරගෙන බලන්න. වාහන 1,700 ගණනක් ගේනවා කියලා කියනවා. ඒ විධියට ගෙනෙන වාහනවලට අදාළ ටෙන්ඩර් එකේදී විශාල වංචාවක්, දූෂණයක් සිද්ධවෙලා තිබෙනවා කියන එක ඒ Technical Committee එකේ සිදු වුණු ක්‍රියාදාමය අධ්‍යයනය කිරීමේදී පෙනී යනවා. ඔබතුමන්ලා මේ රටේ මිනිසුන්ට පොරොන්දු වුණේ, ශත 5ක්වත් වංචා කරන්නේ නැති සුපිරිසිදු පාලනයක් ගේනවා කියලා. ඒ කැබ් ටික ගන්නේ මොකටද කියන එක ගැන අද කථා කරන්න ඉස්සෙල්ලා, ඒ කැබ් ටික ගැනීමට අදාළ ටෙන්ඩරය දාපු විධිය හරිද කියලා කියන්න. මම දන්නවා, the Hon. (Dr.) Nihal Abeysinghe වාගේ හෘදය සාක්ෂියක් තිබෙන මන්ත්‍රීවරු ආණ්ඩුවේ ඉන්න බව. කිසිම චෝදනාවක් නැති, අබමල් රේණුවක වරදක් කරලා නැති මිනිස්සු ඉන්නවා. ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියට අනුව කල්පනා කර බලන්න, මේ ටෙන්ඩර් ක්‍රමවේදය, නැත්නම් මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිද කියලා. කවුරු හරි කියනවා නම් ඒක නිවැරදියි කියලා, අපි කැමැතියි එය නිවැරදි වෙන්නේ කොහොමද කියලා අහන්න. ඒ වාගේම ඊයේ ගරු නලින්ද ජයතිස්ස අපේ සහෝදර ඇමතිතුමා කියනවා මම දැක්කා, "මේක වැරදියට අර්ථකථනය කරන්න එපා, මේක වැරදියට කියන්න එපා, අපි 159දෙනාට වාහන ඕනෑ නැහැ" කියලා. "අපේ 159දෙනාට වාහන ඕනෑ නැහැ, අපේ වැඩිපුර ඉන්නේ ඇමතිවරු සහ නියෝජ්‍ය ඇමතිවරු. ඒ නිසා ඕනෑ කෙනෙක් විතරක් ගන්න. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත් කැමති නම් ගන්න" කියලා කිව්වා. ගරු ඇමතිතුමනි, ලජ්ජයි. අපේ නොවෙයි, ඔබතුමන්ලාගේ නේ, ආණ්ඩුව. අනුර දිසානායක ජනාධිපතිතුමා කරපු යෝජනාව ඔබතුමන්ලා අයින් කර ගන්නකෝ. "පාර්ලිමේන්තුවේ කිසිම මන්ත්‍රීවරයෙකුට පර්මිට් එකක් දෙන්නේත් නැහැ, වාහනයක් දෙන්නේත් නැහැ" කියන යෝජනාව ඔබතුමන්ලා ගෙනෙන්නකෝ. අපි ගැන දුක හිතිලා මේ යෝජනාව කරනවා වාගේ නේ දැන් පෙනෙන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට යන්න වාහන නැහැ, පයින් යනවා, බස් එකේ යනවා වාගේ දුක හිතිලා මේ යෝජනාව ගෙනාවා වාගේ නේ. නැහැ, අපි කවදාවත් කියලා නැහැ, බස් එකේ යනවා කියලා. අපේ හැම කෙනාටම වාහනයක් නැත්නම් අනුන්ගේ වාහනයකින් හරි එනවා. අපට එහෙම ගැටලුවක් නැහැ. ඔබතුමන්ලා අපි ගැන සානුකම්පිතව හිතන්න එපා. පුළුවන් නම්, මේ වෙලාවේ මේ යෝජනාව ඉල්ලා අස් කරගන්න කියලා ඔබතුමන්ලාට අපි අභියෝග කරනවා. නැහැ, එහෙම නොවෙයි වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ බලය ලබා ගත් විධිය මේ රටේ ජනතාවට තේරිලා තිබෙනවා. ජනතාව ඉස්සරහට ගිහිල්ලා කියපු සියල්ල දැන් බොරු වෙමින් යනවා. ඒ හැම කාරණාවක්ම පට්ටපල් බොරු විධියට ජනතාව තේරුම් අරගෙන ඉන්න කොට දැන් මේ අය ජන බලය හොයා ගන්න එක එක ක්‍රම පාවිච්චි කරනවා.

උතුරේ ජනතාවට සලකන්න ඕනෑ, උතුරේ ජනතාවට සහයෝගය දෙන්න ඕනෑය කියලා දැන් මේ අය හිතනවා. හැබැයි, මේ දේශපාලන ප්‍රවාහය තුළ පොඩි බලාපොරොත්තුවක් තිබෙනවා වාගේම මේ අය හිතාගෙන ඇති, ආපහු දකුණේ ජනතාව දිනාගන්න ඔවුන්ට පුළුවන්කමක් නැහැ, දකුණේ ජනතාවට දැන් බොරු කියලා වැඩියි, උතුර දිනාගන්න නම් උතුරට ටිකක් වැඩි හයියක් දෙන්න ඕනෑය කියලා. ඒ වාගේම ජේආර්ලා, ප්‍රේමදාසලා කරපු දේවල් එක්ක ද්‍රවිඩ ජනතාවගේ ඡන්ද ටිකත් මෙච්චර කල් එක්සත් ජාතික පක්ෂය, සමගි ජන බලවේගය වටේ තිබුණේ, දෙමළ ජනතාව දිනාගන්න නම් ටිකක් බරපතළ විධියට වැඩ කරන්න ඕනෑය කියලා දැන් ඔවුන් හිතාගෙන ඇති. අපි ඒකට කැමැතියි. මේ රටේ ද්‍රවිඩ ජනතාවට උදවු කරන්න ඕනෑ. ජේආර්ලාගෙන්, ප්‍රේමදාසලාගෙන් පස්සේ මේ රටේ සිටින ද්‍රවිඩ ජනතාවට කවුරුවත් හරියට දැනෙන්න උදවු කළේ නැහැ. හැබැයි, ඒක දේශපාලන අරමුණකින් යුතුව, ඔවුන්ගේ ඡන්ද ප්‍රමාණය සියයට තුනකට පහළට වැටෙන කොට ඒ තත්ත්වයෙන් මිදෙන්න ඔක්සිජන් ටික ගන්න හිතාගෙන කරනවා නම් ඒක මේ රටේ ජනතාව රවට්ටන්න කරන ක්‍රියාවලියක් කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. අද නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ගැන නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. මම මේ කථාව කියන්න හිටපු එකක් නොවෙයි. නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විධියට රටේ මිනිසුන්ගේ දැවෙන ප්‍රශ්නවලට ඇත්ත විධියට උත්තරයක් හොයපු නායකයෙක් ඉතිහාසයේ හිටියා නම් ඒ සජිත් ප්‍රේමදාස විතරයි. ඒ කටයුත්ත එදා ප්‍රායෝගිකව, මිනිසුන්ට ඇත්ත විධියට, දැනෙන විධියට එතුමා කළා. දේශපාලන අවශ්‍යතා විධියට නොවෙයි, මිනිසුන්ගේ අවශ්‍යතා විධියට සලකා තමයි එදා එතුමා ඒ කටයුතු කළේ. එහිදී ඒ පුද්ගලයා පොහොට්ටුවේද, ජේවීපී ද, සජබද, යූඑන්පී ද කියලා තේරුවේ නැහැ.

අපි බලයේ ඉන්නකොට මා නියෝජනය කරන රක්වාන ආසනයේ නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කළා, ඉන්දියානු ආධාර යටතේ. මම කලින් සඳහන් කරපු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැන් මම මේ කාරණය අහනවා. අපි ගෙවල් 30ක් හැදුවා, ඒ ගෙවල් 30 මිනිස්සුත් ඉන්නවා. හැබැයි ඔබතුමන්ලාගේ ඇමතිවරයෙක් ගිහිල්ලා එම නිවාස ව්‍යාපෘතිය විවෘත කරලා ආවා. 1,900ක් නොවෙයි, එහෙම විවෘත කරපු ඒවා 2,000ක් කියලා කියන්න පුළුවන්. ඔබතුමන්ලා විවෘත කළා කියලා දැන් ගණන් හිලව් කියන්නේ, සජිත් ප්‍රේමදාස මහත්තයා ආරම්භ කරපු නිවාස ව්‍යාපෘති. කොහොම වුණත්, අපට එක දෙයක් කියන්න පුළුවන්. නිවාස අලුතින් හදන එක කෙසේ වෙතත් නියෝජ්‍ය ඇමතිතුමා නම් මේ දවස්වල නිවාසය හදන්න පටන් අරගෙන තිබෙනවා කියලා තොරතුරු වාර්තා වෙනවා. ඒක හොඳට කෙරීගෙන යනවා. අපි සුබ පතනවා, ඉතා ඉක්මනින් හොඳට තට්ටු තුනේ, හතරේ නිවසක් හදා ගන්න එතුමාට වාසනාව ලැබේවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපාධිධාරින්ට මොකක්ද කිව්වේ? උපාධිධාරින්ට කිව්වා, "උඹලා පාරෙ ඉන්න එපා, හොඳට පාඩම් කරලා විභාගය ලියපල්ලා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජේවීපී එකේ කණ්ඩායම උපාධිධාරින් පෙරටු කරගෙන, මේ රටේ තරුණ පරම්පරාව ඉස්සරහට දාගෙන තමයි ඔවුන්ගේ දේශපාලනය අරගෙන ගියේ. හැබැයි අද අවසානයට කියනවා, "උඹලා පාරෙ ඉන්න එපා, දැන් පලයල්ලා" කියලා. ඒකෙන් කියන්නේ, උඹලාට කරන්න දෙයක් අපට නැහැ, අපේ ක්‍රමය මේක කියලා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. කථානායකතුමා මේක දැනගන්න ඕනෑ. කථානායකතුමා සද්භාවයෙන් යෝජනාවක් ගෙනාවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාත් කිව්වා, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විදේශ සංචාර යනකොට Business Class එකේ, නැත්නම් ව්‍යාපාරික පන්තිවල යන්නේ මොකටද? අපි වාගේ Economy Class ගිහිල්ලා මේ රටට සේවය කරන්න යන්න" කියලා. ජනාධිපතිතුමා නම් Economy Class එකේ යන්නේ නැහැ. ඒක රටම දන්නවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියනවා, ඔබතුමාගේ ප්‍රතිපත්තිය අවංක ප්‍රතිපත්තියක් නම්, ඔබතුමා සද්භාවයෙන් ගත් ප්‍රතිපත්තියක් නම් ඔබතුමාගේ ඉඳලා - ගරු කථානායකතුමාගේ ඉඳලා - මේ ඇමතිවරුනුත් ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමා යන්නේත් Business Class එකේ, මේ ඇමතිවරුන් යන්නේත් Business Class එකේ. හැබැයි, ඊයේ පෙරේදා අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා අපිත් එක්ක Economy Class එකේ ගියා. මම එච්චරයි දැක්කේ. රැට ලයිට් ඕෆ් කළාම විතරක් නොවෙයි, අනෙක් හැම ඇමතිවරයාම ශ්‍රීලන්කන් ගුවන් සේවයට අයත් ගුවන් යානාවල යනවා නම් කෙළින්ම ඒ කෙනා ඒ upgrade කිරීම කරනවා. ඒකේ කථා දෙකක් නැහැ. අපිත් කියන්නේ, ඒක දෙන්න කියලායි. "දෙන්නේ නැහැ" කියලා රටට බොරු කියලා දෙන්න එපා. රටට ඇත්ත කියන්න, ඔව්, ඉස්සර ඇමතිවරුන් ගියා වාගේ අපේ ඇමතිවරුනුත් යන්නේ Business Class කියලා, එහෙම කරන්න. ඒක දුන්නා කියලා පාඩුවකුත් නැහැ නේ. කොහොමත් ඒක ගන්නවා නේ. නිකම් යන එක නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි එක දෙයක් කියනවා. ඉතිහාසයේ මේ රටේ බිහි වෙච්ච හැම ආණ්ඩුවක්ම තමන්ට කරන්න පුළුවන් දේ -අඩුම ගණනේ සියයට 50ක් හරි- ජනතාවට කිව්වා. නමුත් වත්මන් ආණ්ඩුව තමන්ට කරන්න පුළුවන් දේ මොකක්ද කියන එක අවබෝධ කර ගන්නේ නැතුව අද මොකක්ද කරන්නේ? අද විපක්ෂය මොකුත් කියන්න ඕනෑ නැහැ. ඔවුන් ඉතිහාසයේ කියපු දේවල්වලටම ඔවුන්ට දැන් උත්තර සපයන්න වෙලා තිබෙනවා. මොකද, බලයට පත්වෙලා දැන් අවුරුදු එකහමාරක් ගිහිල්ලා තිබෙනවා. ලබන අවුරුද්දෙන් පස්සේ අර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ ගිලන් ඇඳේ යන්න වෙන්නේ විපක්ෂයටද, ආණ්ඩුවටද කියලා බලාගන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.*

[අ.භා. 4.55]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද, ජාතික ජන බලවේග ආණ්ඩුවේ දෙවන අය වැය විවාද කරන තුන්වන දිනය. මේ සාකච්ඡාව තවත් දින ගණනාවක් ඉස්සරහට තිබෙනවා. ඇත්තටම පසුගිය වසර 76ක ගමන් මාර්ගයේ අවසාන ප්‍රතිඵලය වශයෙන් පැවති සමාජ, ආර්ථික ක්‍රමයට අලුත් උත්තරයක් ඕනෑය කියලා රටේ ජනතාව විශාල අරගළයක් කිරීමෙන් පසුව තමයි අපි බලයට පත් වුණේ. අපි බලයට පත් වෙනකොට ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළ තමයි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය හදන්න අපි වසර ගණනාවක් තිස්සේ දිස්ත්‍රික්කවලට ගිහිල්ලා ජනතාව හම්බ වෙලා විශාල සංවාදයක් කළා. එහෙම තමයි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගොඩනැඟුවේ. එහෙම ගොඩනගලා, නොවැම්බර් මාසයේ ආණ්ඩුවක් හදලා, පළමුවැනි අවුරුද්ද සඳහා අපි ඊට සරිලන අය වැයක් ඉදිරිපත් කළා. ඒ අය වැය මේ වෙනකොට සමාජයේ සාකච්ඡාවට භාජන වෙනවා, සාර්ථකත්වයක් ලබා තිබෙන බවට. බිඳ වැටිච්ච රටක, ආර්ථික පදනම විනාශ කරපු රටක ආර්ථිකය ගොඩනැඟෙන පදනම වැටිලා තිබෙනවාය කියලා රට පුරාත්, ජාත්‍යන්තර වශයෙනුත් දැන් සාකච්ඡා වෙනවා. ඒකේ ඊළඟ පියවර තමයි, අපේ මේ දෙවන අය වැය. අපේ දෙවන අය වැය ඉදිරිපත් කරලා තිබෙන මේ මොහොතේ විපක්ෂය මේ ගැන අධ්‍යයනය කරලාද, නැතුවද කියන්න අපට තේරෙන්නේ නැහැ, නමුත් යම් චෝදනා ටිකක් එල්ල කරනවා. ඒ චෝදනාවල හරය ගත්තාම අපට පෙනෙන්නේ, යම් වෛරී සහගතභාවයක්, යම් අසත්‍ය කරුණු ප්‍රමාණයක් සමාජගත කරන්න හදනවා කියලායි. මම තනිව කල්පනා කරද්දි ඒ ඇයි කියලා හිතුවා. මට හිතෙන විධියට ඒකට හේතුව මෙයයි. මැතිවරණ කාලයේදී ඒගොල්ලන් ඇහුවා, "ජාතික ජන බලවේග ආණ්ඩුවක් ආවොත් ඇමතිකම් දරන්න මිනිස්සු කෝ? මන්ත්‍රීකම් කරන්න, සභාපතිකම් කරන්න මිනිස්සු කෝ?" කියලා. නමුත් රටේ ජනතාව ඓතිහාසික තීන්දුවක් ගත් නිසා අපි බලයට පත් වුණා. ආර්ථිකයේ පදනම බිඳ දමපු, රාජ්‍ය සේවය කඩා වට්ටපු, විදේශ ප්‍රතිපත්තිය අවුල් කරපු, ජාතික ගැටලු නිසා අවුල් වෙලා තිබුණු මේ රට නිවැරදි මාවතකට යොමු කරන්න අපි බලයට පත් වෙලා මාස අටක් ඇතුළත

[ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා]

අඩිතාලම දමනකොට ඇතිවන නරක, කුහක හැඟීම තමයි ඒ ප්‍රකාශ කරන්නේ. ඊයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, "159ක් ඉන්නවා, සිග්නල් ලයිට් වාගේ" කියලා. ඔව්, අපි සිග්නල් ලයිට් වාගේ නම්, දෙකෝටි විසිලක්ෂයක් වන මේ රටේ ජනතාවට නිවැරදි මාවත පෙන්වන්න තමයි අපි ලැහැස්ති වෙන්නේ. ඒ නිසා අපි විපක්ෂයට ආරාධනා කරනවා, මීට වඩා ප්‍රගතිශීලී විධියට මේ දිහා බලන්න කියලා.

ඉදිරි අවුරුද්ද සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අය වැයේ තිබෙන ප්‍රධානම කාරණයක් තමයි, රාජ්‍ය ප්‍රතිපත්ති ඉස්සරහට ගෙන යෑම. ඒ සඳහා හොඳ රාජ්‍ය සේවයක් ඕනෑ. පසුගිය කාලයේ රාජ්‍ය සේවය බිඳවට්ටලා, නැති කරලා ඒක අහෝසි කරන්න තමයි වැඩ කළේ. මේ 76 වසරක දේශපාලන න්‍යායාචාර්යවරුන් අතර හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ උපදෙස්, මහ පෙන්වීම් තමයි මේගොල්ලන් භාවිත කළේ. මොකක්ද, එතුමාගේ තීරණය? අපට මතකයි, 2001 දෙසැම්බර් 05වැනි දා පැවති මැතිවරණයෙන් බලයට පත් වෙච්ච වෙලාවේ රාජ්‍ය සේවයට මොකද කළේ කියලා. රාජ්‍ය සේවය හකුළන්න තීරණයක් ගත්තා. රාජ්‍ය සේවයේ යෙදෙන්න හේතු වුණු ප්‍රධානම කාරණය තමයි, රජයේ විශ්‍රාම වැටුප. ඒක අහෝසි කළා. විශ්‍රාම වැටුප් අහෝසි කරලා, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් නවත්වලා, රාජ්‍ය සේවය අඩපණ කරන්න තමයි ලැහැස්ති වුණේ. එතුමාට නැවත වරමක් ලැබුණා, 2022දී. 2022දීත් ඒකම කළා. 2016දී යහ පාලන ආණ්ඩුව නැවත රාජ්‍ය සේවයට තිබුණු විශාලම වරප්‍රසාදයක් වෙච්ච විශ්‍රාම වැටුප නැවැත්තුවා. ඉතින්, ඒ කරපු රාජ්‍ය සේවය දිය කර හැරීමට උත්තරයක් හැටියට අපි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලිව්වා, රාජ්‍ය සේවය නැවත ගොඩගන්නවා කියලා. ඒ අනුව අපි ප්‍රතිපත්ති ඉෂ්ට කළේ නැහැ, පොරොන්දු ඉෂ්ට කළේ නැහැ කියලා මොර දෙන විපක්ෂයට මම ආරාධනා කරනවා, ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ 42වන පිටුවේ සිට ඉදිරි පිටු දෙක තුන කියවන්න කියලා. ඒ පිටු දෙක තුනවත් කියවලා නැතුව ඇති කියලා තමයි මට හිතෙන්නේ.

2016දී නැති කරපු විශ්‍රාම වැටුප 2016න් පස්සේ බඳවා ගත් රාජ්‍ය සේවකයන්ට නැවත ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ වාගේම තමයි, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්වලදී දේශපාලන අතකොළුවකින් තොරව අවශ්‍ය රාජ්‍ය සේවකයින් 75,000ක් බඳවා ගැනීමට කටයුතු කරනවා. ඒ වාගේම, රාජ්‍ය සේවය අද විශාල ලිපිගොනුවලට - filesවලට - යටවෙලා තිබෙනවා. ඒකට උත්තරයක් හැටියට, ඩිජිටල්කරණය හරහා රාජ්‍ය සේවය කාර්යක්ෂම කර ගැනීමට කටයුතු කරනවා. ඒ වාගේම, රාජ්‍ය සේවයේ වැටුප් පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. විශ්‍රාම වැටුප් පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට උත්තරයක් හැටියට වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් ආරම්භ කර ඒකට සාර්ථක උත්තරයක් ලබා දීමටත් පියවර ගන්නවා. රාජ්‍ය සේවකයෝ විවිධ ක්ෂේත්‍රවල මුහුණ දෙන ප්‍රශ්නවලට ඉතාම සාර්ථක උත්තරයක් මේ දෙවැනි අය වැය ලේඛනය තුළ සඳහන් කර තිබෙනවා. අපි විපක්ෂයට ආරාධනා කරනවා, මේ අය වැය කථාවේ 42, 43 සහ 45 පිටු කියවා මේකට සූදානම් වෙන්න කියලා. මේ අය වැය වාර්තාවේ ඉලක්කම්, වචන තිබුණාට, ජාතික ජන බලවේගය හැටියට අපි කැබිනට් මණ්ඩලය, පාර්ලිමේන්තුව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු විතරක් නොවෙයි, ග්‍රාම නිලධාරි වසම් 14,022හිම ජනතාව ඒක රාශි කරලා දැවැන්ත බලවේගයක් ඇති කරලා, මේ ඉලක්කම්, වචන 2026 දෙසැම්බර් 31 දින වෙනකොට යථාර්ථයක් කරන්න පොර බදනවා කියන එක ජනතාවට සපථ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.02]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (වැඩබලන විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா பதில் அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Acting Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතනවා මේක ඉතාම වැදගත් මොහොතක් කියලා. අපි බංකොලොත්භාවයෙන් නිල වශයෙන් ගොඩ යෑමත් එක්ක, අපේ මුදල් අමාත්‍යාංශයට, විශේෂයෙන්ම ජනාධිපතිතුමාට අවස්ථාවක් ලැබී තිබෙනවා, අය වැයක් ඉදිරිපත් කරන්නට. ඒක ඉතාම සුවිශේෂී දෙයක්. මෙතැනදී අපි මතක් කරන්නට ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, අපි බංකොලොත්භාවයට පත් වෙන්න මුල් වුණු ප්‍රධානම හේතුවක් තමයි, මේ රටේ මූල්‍ය විනය අහිමි වීම. මූල්‍ය විනය හරියාකාරයෙන් තිබුණා නම් මේ රටට මේ තරම් ඉරණමකට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ නැහැ කියා මම හිතනවා. මේ තරම් සම්පත් බහුල රටක මෙවැනි තත්ත්වයක් උදා වෙන්න කිසිම හේතුවක් අපට තිබුණේ නැහැ. දූෂණය, වංචාව, නාස්තිය, අක්‍රමිකතාව, වැරදි දේශපාලන සංස්කෘතිය වැනි දේවල් නිසා අපට රටක් විධියට සෑහෙන ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. අපි දන්නවා, මේ රට ගොඩනඟන්නට ඕනෑ නම් අපට ඉතාම හොඳ රාජ්‍ය සේවයක් අවශ්‍ය බව. එතැනදී අපි මේ විසර්ජන පනත හරහා, විශේෂයෙන්ම මේ අය වැය හරහා යෝජනා කර තිබෙනවා, වාහන කිහිපයක් ගෙන්වන්න. වාහන වෙනුවෙන් පර්මිට් දෙන්න කියලා විපක්ෂයෙන් යම්කිසි ඉල්ලීමකුත් කරලා තිබුණා. මේ පර්මිට් සම්බන්ධව තිබෙන ප්‍රශ්නවලට අදාළව අපට ජනතාවට පැහැදිලි කිරීමක් කරන්නට තිබෙන උත්තරීතරම අවස්ථාවක් විධියට තමයි මම මේ අවස්ථාව ගන්නේ.

විශේෂයෙන්ම පර්මිට්, එහෙම නැත්නම් තීරු බදු රහිත බලපත්‍රය කියන එක ගත්තොත්, අපි දන්නවා යම්කිසි ආකාරයෙන් වාහනයක් ගෙන්වා ගන්නවා නම් ඒ වාහනයට අදාළව බදු අය කරන්නේ නැහැ කියලා. විශේෂයෙන්ම 1977 කාල වකවානුව තුළ තමයි මේක හඳුන්වා දෙන්නේ. මුලින්ම ගත්තොත්, මේ පර්මිට් ටික non-transferable. ඒ කියන්නේ, මේ පර්මිට් තව කෙනෙකුගේ නමට පවරන්න බැරි තත්ත්වයක් තමයි තිබුණේ. අපි දන්නවා, මුලින්ම අවුරුදු 5ක් වාගේ තිබුණා, 3ක් වාගේ තිබුණා. කාලයෙන් කාලයට දේශපාලනිකව යම්කිසි තර්ජනයක් ආණ්ඩුවට එනකොට විපක්ෂය එක්කත් කේවල් කරමින් මේ adjustments ටික ඔවුන් කරගෙන ආවා. 2012 අවුරුද්දෙන් පසුව තමයි මේක open permit එකක් විධියට දෙන්නේ. විශේෂයෙන්ම ඒ අදාළ මන්ත්‍රීවරයාට මේ බලපත්‍රය තවත් කෙනෙකුගේ නමට ඒ ගෙන්වා ගත්ත වාහනය ලියාපදිංචි කරපු පළමුවෙනි දවසේම පවරන්න අයිතිය ලැබෙනවා.

මට මේ සම්බන්ධව යම් අත්දැකීමක් තිබෙනවා. මම ඉගෙන ගන්න කාලයේ apprentice කෙනෙකු විධියට යම් වාහන sale එකක වැඩ කළා. එතැනදී මම ඉගෙන ගත්ත දේ මේකයි. විශාල මන්ත්‍රී සංඛ්‍යාවකගේ අදාළ ලිපි ලේඛන - documents - මම දැකලා තිබෙනවා. නමුත්, ඒ කාලයේ මට නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්න අයිතියක් තිබුණේ නැහැ. ඒකට හේතුව, එහෙම නීතිමය

ක්‍රියාමාර්ගයක් ගන්න තරම් නීතියක් රටේ එවකට තිබුණේ නැතිකම. ඉතාම ඉහළ මට්ටමින් හිටපු ඇමතිවරුන්ගේ අත්සන් පවා හිස් කොළයක තිබෙන බව මම දැක තිබෙනවා. හිස් transfer forms තමයි අත්සන් කර දෙන්නේ. දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරනවා. ඒ වාගේම හිස් කොළයක මුද්දරයක් උඩ අත්සන් කරලා දෙනවා. රටට ඉහළ මට්ටමෙන් සේවය කරපු ඇමතිවරුන්ගේ නම් පවා, අත්සන් පවා මම එහෙම දැකලා තිබෙනවා. එතැනදී මම දකින්නේ ඒක ඉතා අනතුරුදායක තත්ත්වයක් විධියටයි. මේ වාගේ තත්ත්වයක් ඇති කළේ ඒ දේශපාලන සංස්කෘතිය විසින්. නමුත් අද අපි සතුටු වෙනවා සහ හිතනවා මේ පර්මිට් ක්‍රමවේදය මුළුමනින්ම දේශපාලන භූමිකාවෙන් තුරන් කිරීමත් එක්ක රටට යම්කිසි ස්ථාවරභාවයක් හදා ගන්න අපට පුළුවන් වෙයි කියලා. ඒ විශ්වාසය මට තිබෙනවා.

විශේෂයෙන්ම මෙහිදී බදු සම්බන්ධව යම්කිසි කාරණාවක් කියන්න මම කැමැතියි. දළ වශයෙන් ගත්තොත්, මෙතැනදී Land Cruiser වාහන තමයි හිටපු මන්ත්‍රීවරු වැඩිපුරම ගෙන්වලා තිබෙන්නේ. සමහර අය දන්නේත් නැහැ, තමන්ගේ නමට මොන වාහනයද ගෙනාවේ කියලා. ඒකත් ප්‍රශ්නයක්. එවැනි තත්ත්වයක් තුළ ඒ කාලයේ පර්මිට් එකක් රුපියල් කෝටි දෙකහමාර, තුන අතර මුදලකට විකිණිලා තිබෙනවා. අපි CIF value එක පිළිබඳව පොඩි calculation එකක් කරලා බැලුවොත්, CIF කියන්නේ Cost, Insurance and Freight. ඒ මිලයි, ඒකට අදාළ කරන රක්ෂණයයි - insurance එකයි, ඒ වාගේම නැව් ගාස්තුවත් එක්ක තමයි අපි CIF එක calculate කරන්නේ. CIF ගාස්තුව ඩොලර් 85,000 නම් අද rate එක අනුව, සාමාන්‍යයෙන් දළ වශයෙන් රුපියල් 303 ගණනින් වැඩි කළාම CIF එක මිලියන 25.755ක් වෙනවා. ඒකට Excise Duty එකත් add වෙනවා. Excise Duty එක දළ වශයෙන් ගත්තොත්, මිලියන 39.76යි. ඒ වාගේම Customs Import Duty plus Customs surcharge එක ගත්තොත්, මිලියන 7.726යි. එමෙන්ම Vehicle Entitlement Levy කියලා එකක් තිබෙනවා. ඒක රුපියල් 15,000යි. ඒ වාගේම Luxury Motor Vehicle Tax එක රුපියල් මිලියන 24.906යි. VAT- Value Added Tax - එක add වෙනවා, රුපියල් මිලියන 17.67ක්. මේක තමයි සමස්ත tax එක. එතකොට tax එක සමස්තයක් විධියට එකතු වුණාම රුපියල් මිලියන 90.082ක් වෙනවා. දැන් මේ උදවිය ඉල්ලන්නේ මෙච්චර tax ගෙවන්නේ නැතුව මේක කරන්න ක්‍රමයක් හදා දෙන්න කියලා. දැන්, සාමාන්‍ය විධියට මේවා රටට ආනයනය කරනවා නම්, මේ tax එක ගෙවන්න ඕනෑ. නමුත්, වාහන ගෙන්වන්නේත් නැහැ. එහෙම නැත්නම් ඔවුන් පාවිච්චි කරන්න ගෙන්වන්නේත් නැහැ. කාට හරි මේක පවරනවා. පැවරුවාට පස්සේ මොකක්ද කරන්නේ? මේ බද්ද -tax- රටට අහිමි වෙනවා. ඒක ඉතාම වැරදි තත්ත්වයක්.

මෙතැනදී ඒ වාහනයට අදාළ කරන maintenance එක දෙන්නේත් නැහැ. විශේෂයෙන්ම maintenance ටික කරගන්න වෙන්නේත් ඒ අදාළ මන්ත්‍රීවරුන්ටම තමයි. ඒක ඉතාම සාධාරණ තත්ත්වයක්. යම්කිසි රාජ්‍ය නිලධාරියෙක් ඒ වාහනය පාවිච්චි කරලා නැවත දීලා යනවා වාගේ කාලය සම්පූර්ණ වනකොට නැවත ඒ වාහනය ලබා දීලා යන්න පුළුවන් තත්ත්වයක් මෙතැනදී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා ළඟ තිබෙන මේ තොරතුරු අනුව එය ඉතා දිග list එකක්. නමුත්, එම list එකේ ඉන්න බහුතරය අද පාර්ලිමේන්තුවේ නැහැ. ඒ අයට ඡන්දයෙන් පැරදිලා තම තමන්ගේ ගෙවල්වලට යන්න සිද්ධ වුණා. නමුත්, මේ list එක අනුව 2015-2019 කාලවකවානුව තුළ තමන්ගේ පර්මිට් එක transfer කළ 18දෙනෙක් අද මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මම මෙතැන කියන්නේ නැහැ, එය නීති විරෝධී ද නැද්ද කියන එක. සදාචාරාත්මක ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ. ඒ 18දෙනාගෙන් බහුතරය ඉන්නේ සමගි ජන බලවේගය පක්ෂයේ. පර්මිට් transfer කළ ඒ කිහිපදෙනෙකුගේ මුහුණුත් දැන් මට මෙතැන පෙනෙනවා. එවැනි තත්ත්වයන් අප වෙනස් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මීට වඩා හොඳ, සුන්දර රටක්, දියුණු ආර්ථිකයක් හදාගෙන රටක් විධියට ඉස්සරහට යන්න පුළුවන් උපරිම අවස්ථා හා ඉඩකඩ අපට ලැබිලා තිබෙනවා. ඒ අවස්ථා සහ ඉඩකඩ හරියට පාවිච්චි කරමින් යන්න ඕනෑ නම් අපි මේ රට තුළ හොඳ දේශපාලන සංස්කෘතියක් ඇති කරන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
හොඳයි.

මීට කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් අපි අධ්‍යාපනයට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය මදි කියමින් යම්කිසි කාරණාවක් ඉදිරිපත් කරලා තිබුණා. අපි අධ්‍යාපනයට සියයට එකක්වත් වෙන් කළේ නැහැ කියන චෝදනාව ඉදිරිපත් කරලා තිබුණා. එය සම්පූර්ණයෙන් අසත්‍යයක්. 2015 වර්ෂයේ සිට දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අධ්‍යාපනයට වෙන් කළ ප්‍රතිපාදනවල ප්‍රතිශත මා ළඟ තිබෙනවා. 2015දී සියයට 2.14යි; 2016දී සියයට 2.06යි; 2017දී සියයට 1.97යි; 2018දී සියයට 1.88යි; 2019දී සියයට 1.79යි; 2020දී සියයට 1.61යි; 2021දී සියයට 1.68යි; 2022දී සියයට 1.39යි; 2023දී සියයට 1.51යි; 2024දී සියයට 1.8යි; 2025දී සියයට 2.1යි. අපි සතුටු වෙන්නට ඕනෑ, 2026දී අධ්‍යාපනයට සියයට 2.5ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ, අපි පසුගිය අවුරුදු 10 ගත්තොත්, ඒ වෙන් කළ මුදල් ප්‍රතිපාදනවලට සාපේක්ෂව බැලුවොත්, 2026 වර්ෂයට තමයි අපි වැඩිපුර වෙන් කරලා තිබෙන්නේ. ඒක ඉතා සුවිශේෂී තත්ත්වයක්. අපි බංකොලොත්භාවයෙන් ගොඩ ගිහිල්ලා ඉදිරිපත් කළ පළමු අය වැයෙන්ම ඓතිහාසික වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මෙය ආරම්භයක් විතරයි. අපි අපේක්ෂා කරන සියයට 6ක ඉලක්කය හඹා යන්න අපි සූදානම් වෙලා ඉන්නවා. අපට ඒකට කෙටි කාලයක් යයි. නමුත්, ඒ ඉලක්කය සඳහා අපි යන්න සූදානමින්, ඒකට අදාළ වැඩ පිළිවෙළ සකස් කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වතුකරයේ ජනතාවගේ පඩි වැඩි කිරීමට අදාළව යම්කිසි අදහසක් ප්‍රකාශ වෙලා තිබුණා. මම හිතන්නේ නැහැ එය සාධාරණ අදහසක් කියලා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු, විශේෂයෙන්ම සජබය නියෝජනය කරන මන්ත්‍රීවරු කළ ඒ ප්‍රකාශය සජබයේ නිල ප්‍රකාශයක්ද කියන ප්‍රශ්නයකුත් තිබෙනවා. එම නිසා විපක්ෂයෙන් යම්කිසි පැහැදිලි කිරීමකුත් ඕනෑ. එය, වතුකරයේ ජනතාවට බදු මුදලෙන් ගෙවන ඒ රුපියල් 200 ගැන විවේචනයක් වාගේම සමහර කාරණා ගත්තොත්, යම්කිසි ජාතිවාදී ප්‍රකාශයක් විධියට තමයි අපි දකින්නේ. නමුත් මෙතැනදී අපි තේරුම් ගන්න ඕනෑ එම ජනතාව අපේ රටේ ආර්ථිකයට ලොකු දායකත්වයක් ලබා දෙන බවත්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

මේ රටේ ආර්ථිකයට දැවැන්ත දායකත්වයක් ලබා දුන් සහ ලබා දෙන වතුකරයේ ජන කොට්ඨාසයට ඒ රුපියල් 200 ගෙවනවා කියන්නේ, එය ඉතාම සාධාරණ දෙයක්. ඒ වාගේම තමයි, අපේ රටට විදේශ විනිමය ගෙන ඒමේදීත් දැවැන්ත දායකත්වයක් දක්වන ප්‍රජාවක්, ඔවුන්. අපි තේ කර්මාන්තය ගනිමු. තේ තමයි අපේ ප්‍රධාන ආර්ථික භෝගයක් විධියට තිබුණේ. අවුරුදු 200ක පමණ කාලයක සිට එම ජනතාව යම්කිසි ආකාරයේ ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දෙමින් සිටියා. අපි ඒවාට දැන් විසඳුමක් දෙනකොට ඒ විසඳුම්වලට පයින් ගහන ක්‍රියාවලිය අනුමත කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙය හොඳ, ප්‍රගතිශීලී, ඒ වාගේම රටේ ස්ථාවරභාවය ඇති කරන්න ඉදිරිපත් කළ අය වැයක්. මේ වෙනුවෙන් දායකත්වය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුදෙනාට ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.13]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு சனாதிபதியும் நிதி அமைச்சருமான அநுர குமார திஸாநாயக்க அவர்களால் 2026ஆம் ஆண்டுக்காக முன்வைக்கப்பட்டுள்ள வரவு செலவுத்திட்டமானது நாட்டை மீண்டும் கட்டியெழுப்பும் எமது பயணத்தின் ஒரு முக்கிய படிக்கல்லாகும். நாடு வீழ்ச்சியடைந்த சந்தர்ப்பத்தில் முன்னாள் சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் தலைமையிலான அரசாங்கத்தில் பங்கேற்ற இராஜாங்க அமைச்சர் என்ற வகையில், அன்று நாம் முன்மொழிந்த விடயங்கள் இன்று இந்த வரவு செலவுத்திட்டத்தில் முன்னெடுக்கப்படுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இந்த வரவு செலவுத்திட்டம் நாட்டின் பொருளாதாரத்தை நிலைநிறுத்துவதோடு மட்டுமன்றி, சமூக நீதியையும் பிராந்திய சமநிலையையும் உறுதி செய்யும் நோக்கத்துடன் முன்வைக்கப்பட்டு இருப்பதை நாம் பாராட்ட வேண்டும்.

வன்னித் தேர்தல் மாவட்டம், குறிப்பாக வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மாவட்டங்களை உள்ளடக்கிய பிரதேசம் நீண்ட காலமாகப் போரால் பாதிக்கப்பட்ட ஒரு பிரதேசமாகும். இப்பகுதியில் அடிப்படை வசதிகள், வேலைவாய்ப்புகள், கல்வி, சுகாதாரம் போன்ற துறைகள் இன்னமும் பல சவால்களை எதிர்நோக்குகின்றன. வவுனியா மற்றும் மன்னார் மாவட்டங்களில் தொழிற்பயிற்சி மையங்களை நிறுவுவதன் மூலம் இளைஞர்களிடத்தில் வேலைவாய்ப்புக்கான திறன்களை மேம்படுத்த உரிய நடவடிக்கை எடுக்கப்படல் வேண்டும்.

'அஸ்வெசும' சமூகப் பாதுகாப்புத்திட்டம் விரிவுபடுத்தப்பட்டு, வட மாகாணத்தில் உண்மையாகவே தேவையுள்ள குடும்பங்களுக்கு நேரடி நிதி உதவி கிடைக்கப் பெற வேண்டும். முதியோர், மாற்றுத்திறனாளிகள், பெண்கள் ஆகியோருக்கு வழங்கப்படும் உதவிகள் அதிகரிக்கப் பட்டுள்ளமை வரவேற்கத்தக்கது.

நாம் எமது வருமானத்தைக் கூட்டும் முகமாக முதலீட்டாளர்களைக் கவர வேண்டுமாயின், அவர்கள் நம்பிக்கையுடன் எமது நாட்டுக்கு வரும் விதத்தில் காணி மற்றும் ஏனைய விடயங்களுடன் சம்பந்தப்பட்ட சட்ட ஏற்பாடுகள் திருத்தி அமைக்கப்படல் வேண்டும். சுற்றுலாத் துறையை மேம்படுத்தும் திட்டங்கள் தற்கால சுற்றுலாப் பயணிகளின் எதிர்பார்ப்புகளை ஈடுசெய்யக்கூடியதாக நவீனமயப்படுத்தப்படல் வேண்டும். சுற்றுலாப் பயணிகளின் போக்குவரத்து வசதிகள் மேலும் பாதுகாப்பானதாகவும் தரமானதாகவும் மேம்படுத்தப்படல் வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விவசாய உற்பத்திகள் தொடர்பாகப் பல்வேறு பிரச்சினைகள் காணப்படுகின்றன. இது தொடர்பாக விரிவான ஆய்வுகள் மேற்கொள்ளப்பட்டும் நேரடியாக விவசாயிகளிடம் கேட்டறிந்தும் பொருத்தமான நடைமுறைகள் நடைமுறைப் படுத்தப்படல் வேண்டும். உரிய காலத்தில் விலை நிர்ணயம் செய்யப்பட்டு, விவசாயிகள் தங்களது உற்பத்திகளை நியாய விலைக்கு விற்பனை செய்வதற்கு நடவடிக்கை எடுக்கப்படல் வேண்டும். கம்யூனிஸ, சோசலிச கொள்கைகளை அடிப்படையாகக் கொண்டுள்ள நீங்கள், கூட்டுறவுத்துறை ஊடாக நாட்டின் பொருளாதார மேம்பாட்டை மேற்கொள்ள முடியும். இளைஞர், யுவதிகளை கூட்டுறவுத்துறையுடன் இணைத்து அபிவிருத்திக்குப் பயன்படுத்த முயற்சிக்கலாம். எமது நாட்டில் வருடாவருடம் வெளியாகும் பட்டதாரிகளை உள்வாங்கி, நாட்டின் அபிவிருத்திக்குப் பயன்படுத்தக்கூடிய புதிய திட்டங்களை வகுக்க வேண்டும். கிட்டத்தட்ட இருபது வருடங்கள் கல்வி கற்ற பின்னர், தங்களுக்கு வேலைவாய்ப்பு இல்லையெனும்பொழுது, அவர்கள் சமூகத்தில் பாரிய பிரச்சினைகளுக்கு முகங்கொடுக்கிறார்கள். எனவே, அவர்களுக்கான வேலைவாய்ப்பை உறுதிப்படுத்தக்கூடிய வகையில் திட்டங்களை வகுக்க வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டம் வன்னிப் பிரதேச மக்களுக்குப் புதிய நம்பிக்கையை ஏற்படுத்தி இருந்தாலும், இதிலுள்ள திட்டங்களின் வெற்றியானது அவற்றை நடைமுறைப் படுத்துவதிலேயே தங்கியுள்ளது. எனவே, இந்த நிதி ஒதுக்கீடுகள் வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள ஒவ்வொரு கிராமத்தையும் சென்றடைவதை அரசாங்கம் உறுதிப்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். தூய்மையான நிருவாகத்தை ஏற்படுத்துவதற்கும் மக்களை ஊழலற்றவர்களாக மாற்றுவதற்கும் டிஜிட்டல் பொருளாதாரத்தைக் கொண்டுவருவதற்காக மாண்புமிகு சனாதிபதி அவர்கள் எடுத்திருக்கின்ற முயற்சி உண்மையிலேயே பாராட்டத்தக்கது. இலங்கையின் பொருளாதாரமானது, கிட்டத்தட்ட 15 பில்லியன் அமெரிக்க டொலர் அளவுக்கு டிஜிட்டல் துறையில் வளர்ச்சி இலக்கைக் கொண்டுள்ளது. இதன்மூலம் வெளிப்படைத் தன்மையும் மக்கள் சேவையின் தரமும் உயர்த்தப்படுமென நாங்கள் நம்புகின்றோம். ஆனாலும், துரதிருஷ்டவசமாக அல்-குர்ஆன் பிரதிகளின் இறக்குமதி விடயத்தில் இந்த அரசாங்கம் கலியுகத்திலே வாழ்கிறது என்றுதான் கூறவேண்டி இருக்கிறது. ஒரு கையடக்கத் தொலைபேசி ஊடாக QR

Codeஐ scan பண்ணுவதன் மூலம் சுமார் ஐம்பது மொழிகளில் புனித அல்-குர்ஆன் மொழிபெயர்ப்பைத் தரவிறக்கம் செய்தும் வாசிக்க முடியும். அதற்குரிய QR code அடங்கிய ஆவணத்தை நான் இந்த இடத்தில் **table*** பண்ணுகின்றேன்.

தற்பொழுது எனது கையில் இருப்பதுதான் எங்களுடைய புனித அல்-குர்ஆன்! இலங்கையில் பல இலட்சம் அல்-குர்ஆன் பிரதிகள் இருக்கும்பொழுது, தற்பொழுது இதனை இறக்குமதி செய்ய முடியாத நிலை ஏற்பட்டுள்ளது. இதற்குக் காரணம், அல் -குர்ஆனின் தமிழ் மொழிபெயர்ப்புப் பிரதிகளை சுங்கத் திணைக்களம் தடுத்து வைத்திருப்பதுதான். இன்று நாங்கள் இங்கு டிஜிட்டல்மயமாக்கல் சம்பந்தமாகப் பேசிக்கொண்டு இருக்கின்றோம். டிஜிட்டல் முறை மூலம் கிட்டத்தட்ட 50 மொழிகளில் அல்-குர்ஆனின் மொழிபெயர்ப்பைத் தரவிறக்கம் செய்யலாம். அப்போதும் இதே மொழிபெயர்ப்புதான் கிடைக்கும். அதனை இங்குள்ள இளைஞர்களுக்கும் பார்க்கலாம். அவற்றில் ஒரு மொழிதான் தமிழ் மொழி! அல்-குர்ஆனின் தமிழ் மொழிபெயர்ப்புப் பிரதிகளை எமது நாட்டுக்கு இறக்குமதி செய்யக்கூடாது என்று கடந்த கால அரசாங்கம் எடுத்த முடிவை இந்த அரசாங்கமும் செயற்படுத்த வேண்டுமா? எனக் கேட்கின்றேன். இதன்மூலம் ஒரு மதத்தினரின் அடிப்படை உரிமை மீறப்படுகின்றது. மாண்புமிகு சனாதிபதி அவர்களின் டிஜிட்டல்மயப்படுத்தல் கொள்கையில் ஏன் இரட்டை வேடம்? கடந்த கால அரசாங்கங்கள் செய்த தவறுகளைத் திருத்துவதற்காகவே நீங்கள் system change என்று மக்களிடம் சென்று வாக்குக் கேட்டீர்கள்; அவர்களும் உங்களுக்கு வாக்களித்தார்கள். ஆனால், இன்று நீங்கள் அதைச் செய்யாமல் இருக்கிறீர்கள். இவ்வாறு ஒரு மதத்தினரின் அடிப்படை உரிமை மீறப்படுவதை மாண்புமிகு சனாதிபதி அவர்கள் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மேற்குறித்த விடயத்துடன் சம்பந்தப்பட்ட அதிகாரிகளையும் அமைச்சர்களையும் உடனடியாக அழைத்து, இந்த அல்-குர்ஆன் பிரதிகளை விடுவிப்பதற்குரிய நடவடிக்கைகளை சனாதிபதி அவர்கள் அவசரமாக எடுக்க வேண்டும். ஏனென்றால், இன்று இந்த விடயம் தொடர்பில் வாதப் பிரதிவாதங்கள் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றன. இந்த விடயத்தை ஆராய review committee ஒன்று நியமிக்கப்பட்டு இருக்கிறது. இந்த நாட்டில் வாழுகின்ற கிட்டத்தட்ட 25 இலட்சம் முஸ்லிம்கள் தொடர்பில் 7-8 பேர் கொண்ட review committee எவ்வாறு முடிவெடுக்க முடியும்? அதை ஏற்றுக்கொள்ளாதீர்கள்; நிராகரித்து விடுங்கள்! பழமைவாதத்திலிருந்து விடுபடுங்கள்! இன்று அல்-குர்ஆனின் மொழிபெயர்ப்பை டிஜிட்டல் முறை மூலம் எல்லா இடங்களிலும் பார்க்கக்கூடியதாக இருப்பதால், தடுத்து வைக்கப்பட்டுள்ள அல்-குர்ஆனின் தமிழ் மொழிபெயர்ப்புப் பிரதிகளை உடனடியாக விடுவிக்க நடவடிக்கையெடுக்க வேண்டுமென டிஜிட்டல் துறைக்கு இவ்வளவு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்ற இந்தச் சந்தாப்பத்தில் நான் கேட்டுக்கொள்கின்றேன்.

எமது மன்னார் மாவட்டத்தில் முன்னெடுக்கப்படுகின்ற காற்றாலை மின் உற்பத்தித் திட்டம் உண்மையிலேயே வரவேற்கக்கூடியதாக இருந்தாலும், தேர்தல் காலத்தில் கொடுக்கப்பட்ட வாக்குறுதியின் அடிப்படையில், அந்த மக்கள் மன்னார் தீவுக்குள் காற்றாலை மின் உற்பத்திக் கோபுரங்களை அமைக்க வேண்டாம் என்றுதான் சொல்கின்றார்கள். எனினும், அங்கு நான்கு காற்றாலை மின் உற்பத்திக் கோபுரங்கள் அமைக்கப்பட்டு இருக்கின்றன. இன்னும் 10 காற்றாலை மின் உற்பத்திக் கோபுரங்களை அமைப்பதற்கு tender கொடுக்கப் பட்டு இருக்கிறது. அவற்றை மன்னார் தீவுக்குள் அமைக்காமல், ஏனைய பகுதிகளில் அமைப்பதற்கு ஏற்பாடு செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இலவன்குளம் ஊடான புத்தளம்-மன்னார் வீதிக்கு இந்த Budgetஇல் எவ்வளவு நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது? குறித்த வீதியை அமைத்துத் தருவதாகக் கூறப்பட்டு இருக்கின்றது. அதையும் செய்துதருமாறு கேட்டுக் கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து, ஒரு நிமிடம் தாருங்கள்!

புத்தளம் வாழ் மக்களுக்கென கிட்டத்தட்ட 1,500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கின்றது. அருவக்காடு பகுதியில் குப்பை கொட்டும் திட்டத்தை எதிர்த்து கடந்த காலங்களில் அந்த மக்கள் ஆர்ப்பாட்டங்களை மேற்கொண்டிருந்தார்கள். அத்திட்டம் இடைநிறுத்தப் பட்டிருந்தது. எனினும், இந்த முறை அந்தத் திட்டத்துக்கு 2.5 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. அந்தத் திட்டத்தை முன்னெடுப்பது என்பது புத்தளம் மாவட்ட மக்களுக்கு இழைக்கப்படும் பாரிய அநீதியாகும். இவ்விடயம் தொடர்பில் அந்த மாவட்ட மக்களிடம் கருத்துகளைக் கேளுங்கள்! நீங்கள், மக்களிடம் கருத்துகளைக் கேட்டுத்தான் எந்தத் திட்டத்தையும் செயற்படுத்துவதாகக் கூறினீர்கள். ஆனால், அவ்வாறு நடைபெறவில்லை. இன்று அந்த மாவட்ட மக்கள் கொதித்தெழுந்து இருக்கிறார்கள். கடந்த தேர்தல்களில் நீங்கள் கூடுதலான மாவட்டங்களில் வெற்றி பெற்றீர்கள். எனவே, அந்த மாவட்ட மக்களின் கருத்துகளைக் கேட்டு, இவ்வாறான திட்டங்களை அமுல்படுத்த முயற்சிக்குமாறு கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Madam Presiding Member, I rise to a point of Order. එතුමාගේ නම සඳහන් කරලා තිබුණේ නැහැ. මම Privilege matter එකක් දානවාමයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නමක් ඕනෑ නැහැ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුන් හේමචන්ද්‍ර ඇමතිතුමා, ඔබතුමාගේ කාරණය සඳහන් කරන්න.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர் என்ற ரீதியில், சில விடயங்களை இந்த இடத்தில் தெளிவுபடுத்த வேண்டிய தேவை இருக்கின்றது. இந்த அல்-குர்ஆன் சம்பந்தப்பட்ட விடயம் தொடர்பாக அண்மையில் அகில இலங்கை ஜம்இய்யதுல் உலமாவின் செயலாளர் அவர்களின் நேர்காணல் ஒன்று இடம்பெற்றது. அதில் அவர் மிகவும் தெளிவாக விளங்கப்படுத்தி இருக்கிறார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
அதாவது, இந்த அல்-குர்ஆனின் மொழிபெயர்ப்பு சம்பந்தப்பட்ட விடயத்தில் பாரிய பிரச்சினை இருக்கின்றது. அதிலும் விசேடமாக, அடிக்குறிப்பு இல்லாமை சம்பந்தப்பட்ட விடயத்தை அவர் மிகவும் தெளிவாகக் குறிப்பிட்டிருந்தார்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, point of Order එකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔව්, ඔව්, point of Order එක කියන්න මේ යන්නේ. මම අනෙක් කට්ටිය වාගේ දෙකයි පණහේ වැඩ කරන්නේ නැහැ, point of Order එක කියන්නයි යන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ කියන්නේ. එක්කෙනෙකුට point of Order එකක් ගන්න පුළුවන් තමන්ගේ නම කිව්වොත්. නැත්නම් ඇමති කෙනෙකුට point of Order එකක් ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඉන්නකෝ පොඩ්ඩක්. හැබැයි නියෝජ්‍ය ඇමති කෙනෙකුට point of Order එකක් ගන්න ඉඩක් නැහැ. ඔබතුමියලා අවස්ථාව දීලා ඊට පස්සේ කියනවා, නවත්වන්න කියලා. මාර වැඩක් නේ මේක!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.25]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම 2026 සඳහා ඉදිරිපත් කර ඇති අය වැය ලේඛනය පිළිබඳ විවාදයට සහභාගි වීමට මාහට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීම්]* මම මේ අය වැය යෝජනා කෙටියෙන් විග්‍රහ කරන්නම්. 2026 වසර සඳහා මුළු ප්‍රාථමික වියදම් ලෙස රුපියල් බිලියන 4,485ක් වෙන් කර ඇති අතර, එහි සියලු අමාත්‍යාංශ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලට අමතරව වසරේ අය වැය ක්‍රියාත්මක කිරීම පිණිස බිලියන 109.42ක් ද අඩංගු වනවා. ඊට අමතරව ණය පොලිය ලෙස බිලියන 2,617ක්, අත්තිකාරම් ලෙස බිලියන 10ක්ද වශයෙන් මුළු වියදම බිලියන 7,102ක් වනවා. වසරේ අපේක්ෂිත ආදායම බිලියන 5,355ක් වනවා. එවිට අය වැය හිඟය රුපියල් බිලියන 1,757ක් තරම් පහළ අගයකට ගේන්න අපි උත්සාහ කර තිබෙනවා. ඊට අමතරව ගෙවිය යුතු ණය වාරික සඳහා බිලියන 1,878ක්ද, භාණ්ඩාගාර බිල්පත් ගැළපීම සඳහා බිලියන 109ක්ද අවශ්‍ය වනවා. ඒ අනුව පාර්ලිමේන්තුවෙන් අවසර ගත යුතු ණය ගැනීමේ සීමාව බිලියන 3,740ක් ලෙස සඳහන් වනවා.

රටේ බහුතර ජනතාව අපගේ රජය පිළිබඳව තැබූ විශ්වාසය කිසිදු අයුරකින් පලුදු නොකරමින් අප මේ රටේ ආර්ථිකය ස්ථාවරත්වය කරා මෙහෙයවා ඇති බව කාටත් රහසක් නොවේ. නමුත් අපි මෙහිදී කරන්නේ සාම්ප්‍රදායික අය වැයක් ඉදිරිපත් කිරීම නොවේ. ඒ කියන්නේ වසරින් වසර කඩලා එහි අය වැය ඉදිරිපත් කිරීම නොවේ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අවුරුද්දෙන් අවුරුද්ද ඉදිරියට යන ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීමේ නොනවතින වැඩ පිළිවෙළක් පිළිබඳ සැලසුමෙහි 2026 වසරට අයත් වන කාර්යභාරය තමයි අප මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. එහිදී අපි ප්‍රධාන උපාය මාර්ගික අරමුණු 6ක් අනුව කටයුතු කරනවා.

පළමුවෙනි එක, තිරසර සහ සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනයක්. එහිදී ආයෝජන කැඳවීම ප්‍රමුඛ වෙනවා. ආයෝජන කැඳවීම සඳහා අවශ්‍ය ප්‍රවාහන, මහාමාර්ග, සන්නිවේදන, ඩිජිටල්කරණය වාගේම බලශක්තිය වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අපගේ මූලික අරමුණක්. එහිදී විශේෂයෙන්ම බලශක්ති ප්‍රවර්ධනයේදී ආයෝජකයන්ගේ බලශක්ති අවශෝෂණය කිරීමට අවශ්‍ය සම්ප්‍රේෂණ පද්ධතිය කඩිනමින් වර්ධනය කිරීම ඉතා ඉහළ ප්‍රමුඛතාවෙන් යුතු කාර්යයක් ලෙස

සලකා නව හබරණ - කප්පල්තුරේ, කප්පල්තුරේ - සාම්පූර්, හබරණ - කිලිනොච්චි යන සම්ප්‍රේෂණ පද්ධති ගොඩනැඟීමට අවශ්‍ය මූලික කටයුතු දැනටමත් ආරම්භ කරලා තිබෙනවා. මීට අමතරව හබරණ - කිරිදිවැල, නොරොච්චෝලේ- වාරියපොල, මොනරාගල - හම්බන්තොට සම්ප්‍රේෂණ පද්ධති සැලසුම් කර ටෙන්ඩර් කැඳවා සෘජු විදේශ විනිමය මඟින් ගොඩනැඟීමට අපේක්ෂා කරනවා. ඒ වාගේම ආයෝජන කැඳවීමට අවශ්‍ය ණය තිරසරකරණය ඉදිරියට ගෙන යනවා. ඒ වාගේම ආයෝජකයන්ට හිතෛෂී ලෙස නීති රීති හඳුන්වා දී සැමට එක ලෙස සැලකීම සාධාරණව තහවුරු කරනවා. ආයෝජකයන්ගේ පහසුව පිණිස National Single Window එකක් ඇති කිරීමත් කරනු ලබනවා.

ඊළඟට, අපගේ 2වන උපාය මාර්ගික අරමුණ ලෙස අපනයන විවිධාංගීකරණය හඳුන්වා දෙන්න පුළුවන්. ඒ යටතේ භාණ්ඩ හා සේවා විවිධාංගීකරණය, වෙළෙඳ පොළ විවිධාංගීකරණය සහ අපනයනකරුවන්ගේ පහසුව පිණිස Trade National Single Window එකක් හඳුන්වා දීම සිදු කරනු ලබනවා.

අපගේ 3වන අරමුණ වන්නේ ණය තිරසරභාවයයි. මේ වනවිට ද ණය තිරසරභාවය ඉතා සාර්ථකව පවත්වා ගෙන යනු ලබන අප විසින් 2032 වනවිට ළඟා කර ගත යුතු ආර්ථික දර්ශක, එහෙම නැත්නම් ඉලක්ක දැනටමත් ළඟා කර ගැනීමට සමත්වීම විශාල ජයග්‍රහණයක් ලෙස සලකනවා. නමුත් මෙම ව්‍යායාමය අපි තවදුරටත් ඉදිරියටත් කරගෙන යනවා.

අපගේ 4වන අරමුණ වන්නේ නිෂ්පාදන ආර්ථිකයයි. ඒ යටතේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරි ගැන්වීම, ඛනිජ සම්පත් ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන ප්‍රවර්ධනය, දැනට ආනයනය කරනු ලබන පාරිභෝගික භාණ්ඩ මෙරටදීම නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු යෙදීම, ආහාර සුලභතාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම සහ ඇප රහිත මෙන්ම සහන ණය යෝජනා ක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම දක්වන්න පුළුවන්.

අපගේ 5වන උපාය මාර්ගික අරමුණ වනතේ දුප්පත්කම තුරන් කිරීමයි. එම අරමුණ යටතේ ආර්ථික වශයෙන් දුර්වල ජනතාව සවිබලගන්වා ආර්ථිකයට එකතු කිරීම සිදු කරනු ලබනවා. අපේ රටේ සිටින පවුල් සංඛ්‍යාවෙන් සියයට 75කට ආසන්න ප්‍රමාණයක් මේ වනවිට අස්වැසුම සහනාධාරය ඉල්ලා සිටිනවා. ඇත්තටම එම තත්ත්වය පිටුදකින්න ඕනෑය කියන තැන තමයි අපි ඉන්නේ. මොකද, දුප්පත්කම අඩු කරන්න ඕනෑ. පියවර කිහිපයක් යටතේ මෙම කොටස් ක්‍රමයෙන් දුගීබවින් ගලවා ගැනීම අපගේ රජයේ අරමුණයි. පැවැති රජයන් වාගේ එම ජනතාව තමන්ගේ දේශපාලන ව්‍යාපෘති සඳහා එම තත්ත්වයෙන්ම පවත්වාගෙන නඩත්තු කිරීම අපේ රජයේ ප්‍රතිපත්තිය නොවෙයි. දැනට අස්වැසුම ප්‍රතිලාභය ලබන ජනතාව පියවරෙන් පියවර ඉහළ ආර්ථික මට්ටමකට ඔසවා තබා ගන්නා ගමන්ම, යටින්ම පවතින මට්ටම තවදුරටත් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු අපි සිදු කරනු ලබනවා. ඒ සඳහා අවශ්‍ය මුදල් මෙම අය වැයෙන් වෙන් කර තිබෙනවා

අපගේ 6වන උපාය මාර්ගික අරමුණ වන්නේ ඩිජිටල්කරණයයි. එහිදී රාජ්‍ය සේවයේ විශේෂත්වයක්කොට අපි සලකනවා. ගෞරවනීය සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම පිණිස එක් ජාලයක් යටතට රාජ්‍ය සේවය ගෙන ඒම මේ හරහා සිදු කරනු ලබනවා. කාර්යක්ෂම ලෙස ආදායම් එකතු කිරීම, ධීවර කර්මාන්තකරුවන් මෙන්ම වෙනත් කර්මාන්තකරුවන් ජාලගත කර අවශ්‍ය පහසුකම් ලබා දීමත් මේ යටතේ සිදු කරනු ලබනවා. එහිදී විශේෂයෙන්ම ධීවර ජනතාවට අවශ්‍ය සන්නිවේදන පහසුකම් සපයා තාක්ෂණික ලෙස ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබනවා. ඒ කියන්නේ මාළු සිටින ස්ථාන, කාලගුණික තත්ත්වය, මුහුදේ තත්ත්වය යනාදී ඒ හැම දෙයක් ගැනම තොරතුරු ධීවර ජනතාවට පහසුවෙන් ලබා ගත හැකි ආකාරයට කටයුතු සම්පාදනය කිරීමට ආණ්ඩුව හැටියට අප විසින් කටයුතු කරගෙන යනවා.

ඊළඟට, ඩිජිටල්කරණය යටතේම පාරදෘශ්‍යභාවය සහ වගකීම තුළින් දූෂණය මුලිනුපුටා දැමීම. මේක වැදගත්. ඇත්තටම අපි ඉදිරියේදී ගොඩක් දුරට procurement පැත්ත ඩිජිටල්කරණය පැත්තෙන් කරගෙන යන්න බලාපොරොත්තු වෙනවා, *e*-procurements විධියට. ඒ අනුව අපිට ගොඩක් දුරට පාරදෘශ්‍යභාවය පවත්වා ගෙන යන්න පුළුවන් වෙනවා. ඒ වාගේම දූෂණය නැති කරන්නත් පුළුවන් වෙනවා. ඒ වාගේම ඉදිරියේදී හැම ගෙවීමක්ම cashless විධියට සිදු කිරීමට අවශ්‍ය සැලසුම් දැනට සකස් කර තිබෙනවා. එතකොට කිසිම තැනකදී දූෂණ කටයුතු කරන්න අමාරුයි, පාරදෘශ්‍යභාවය පෙන්වන්න සිද්ධ වෙන නිසා. ඒ නිසා අපි ඒ කටයුත්ත ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා අවශ්‍ය මූලික සැලසුම් ගොඩක් දැනටමත් ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවතිනවා.

ඊළඟට, ඩිජිටල් තාක්ෂණය කර්මාන්තයක් ලෙසටම ඉදිරියට ගෙන සංවර්ධනය කිරීමත් මේ යටතේ සිදු කරනු ලබනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඩිජිටල් තාක්ෂණය කිව්වාම, අපි ඒකම කර්මාන්තයක් විධියට ගෙනෙන්න ඕනෑ. ඩිජිටල් තාක්ෂණය අපි සාමාන්‍යයෙන් පාවිච්චි කරන්නේ supporting service එකක් විධියට. නමුත් මෙතැනින් එහාට ඩිජිටල් තාක්ෂණයම කර්මාන්තයක් විධියට ලොව ඉදිරියට ගෙන යැමට අවශ්‍ය සංවර්ධන කටයුතු අප විසින් දියත් කර තිබෙනවා. එහිදී ඩිජිටල් යටිතල පහසුකම් සැපයීම සඳහා මූලික කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම ලබන වසර තුළදී අපි සන්නිවේදන කුලුනු 100ක් ඇති කිරීමට කටයුතු සම්පාදනය කර තිබෙනවා. ඒ වාගේම බලශක්ති ක්ෂේත්‍රය සහ ඩිජිටල් ක්ෂේත්‍රය එකට බැඳුණු data centres ඇති කිරීමේ මූලික සැලසුම් ටිකත් අපි මේ වනවිට ආරම්භ කර තිබෙනවා. මොකද, ඒ සඳහා බොහොම වැඩි ආයෝජන සහිත සමාගම් සහ ඒකට අවශ්‍ය උනන්දුව සහිත පුද්ගලයන් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ අනුව අපි ඒකට අවශ්‍ය කටයුතුත් සිදු කරනු ලබනවා. මොකද, ඩිජිටල් data centres හරහා අපට ලොකු ආදායමක් උපයා ගන්න පුළුවන්. ඒ වාගේම අපගේ බලශක්තිය එතැනට යොදවන්නත් පුළුවන්. ඒ නිසා අපි එම සංවර්ධන කටයුතුත් කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම අපට කියන්න තිබෙන්නේ, මේ අය වැය නිකම් ඉලක්කම් හරඹයක්වත්, විපක්ෂයේ ඉන්න සමහර නායකයෝ කිව්වා වාගේ කිසිම දෙයක් තේරෙන්නේ නැති අය වැයක්වත් නොවෙයි කියලායි. සමහර විට මේ අයට කිසිම දෙයක් තේරෙන්නේ නැතිව ඇති. ඒකත් සාධාරණයි. ඒගොල්ලන්ට අනුකම්පා කරන්නත් ඕනෑ. මෙච්චර කල් එතුමන්ලා ගෙනාපු අය වැයවල ප්‍රතිඵල නේ දැන් තිබෙන්නේ. දැන්, එතුමන්ලා ම ඇවිල්ලා කියනවා නේ, මහා භාණ්ඩාගාරය උතුරලා යනවා, ඒක කරන්න අපට බැරි වුණා, අපි ෆේල් කියලා. ඇත්තටම ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට අද මේ හැම මන්ත්‍රීවරයෙකුම, හැම රජයේ සේවකයෙකුම කැපවීමෙන් මේ කර්තව්‍යය ඉටු කරන්නේ මේ කටයුතු සාර්ථකව ඉදිරියට ගෙනයන්න පුළුවන් කියන විශ්වාසයෙන්. අපි අවුරුද්දක් තුළ ගොඩක් දේවල් කරලා තිබෙනවා. ඒ නිසා අපට ඉතුරු අවුරුදු හතර ඇතුළත අපේ අරමුණු කරා බොහොම සැහැල්ලුවෙන්, වේගයෙන් යන්න පුළුවන් වෙයි කියලා ප්‍රකාශ කරමින් මම නවතිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) THUSHARI JAYASINGHA left the Chair and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.35]

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ දෙවැනි අය වැය, විපක්ෂය මවිත කරපු අය වැයක්. මොකද, අද විපක්ෂයේ හැම කෙනෙකුටම මේ අය වැය ගැන සාධාරණ විවේචනයක් ඉදිරිපත් කරන්න බැරිව, එහේ මෙහේ අතගාන තැනට පත් වෙලා තිබෙනවා. විපක්ෂයේ ගොඩක් අය මේ අය වැය සම්බන්ධ කරුණු කාරණා ඉදිරිපත් කිරීමේදී විශේෂයෙන්ම අවධානය යොමු කරපු කාරණයක් තමයි, අපි පරණ ගමනේම යනවාය කියන එක. එතුමන්ලා ළඝු කරන්න උත්සාහ කළා, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා ගිය ගමනේම අපි යනවා කියලා. ඒ නිසා මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, රනිල් නැවැත්තුවේ කොතැනින්ද කියලා. රනිල් නැවැත්තුවේ, මේ රටේ ජනතාව මත බදු බර පටවලා, ජනතාවගේ ඒ බදු මුදල් තමන්ගේ සුවච කීකරු ගෝලයන්ට, ව්‍යාපාරිකයන්ට බෙදලා. මම ඒකට විශේෂ නිදසුනක් කියන්නම්. රනිල් ජනතාවට බදු ගැහුවා. රනිල් කිව්වා, මේ ආර්ථිකය ගොඩක් අමාරුයි කියලා. ඒ නිසා ජනතාවට බදු ගහනවා කිව්වා. ජනතාවට බදු ගහලා ඔවුන් ඔවුන්ගේ සුඛ විහරණය වෙනුවෙන් ඒ බදු මුදල් පාවිච්චි කළා. එතුමා ජනාධිපති කරන්න අත ඔසවපු මන්ත්‍රීවරු 43 දෙනෙකුගේ නිවාස අරගළයේදී විනාශ වුණු නිසා, ඒ අයට වන්දි විධියට රුපියල් කෝටි 122ක් වෙන් කළා, ජනතාවට පටි තද කරගන්න කියලා. ඒ විධියට ගෝල බාලයන් වෙනුවෙන් මැදිහත්වීම කළා. එහෙම තමයි රනිල් මේ ආර්ථිකය කළමනාකරණය කළේ. ඒක අපි වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේම රනිල් ජනතාවගෙන් බදු එකතු කරලා මහා භාණ්ඩාගාරයට මුදල් එකතු කරගෙන 2023 මැයි මාසයේ ඉඳලා 2024 ජුනි මාසය දක්වා විදේශ සංචාර ලෙස රටවල් 9කට ගියා. නමුත් රටට සතයක වාසියක් ගෙනෙන්න බැරි වුණා. හැබැයි, රුපියල් මිලියන 62ක් වියදම් කළා. එහෙම තමයි රනිල් මේ ආර්ථිකය කළමනාකරණය කළේ. නමුත්, මේ ආර්ථිකය නිවැරදිව කළමනාකරණය කරන්න, අපේ ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ රජයට අද හැකිවෙලා තිබෙනවා. ඒක අපට සතුටට කාරණයක්. මෙහෙම ආර්ථික කළමනාකරණයක් කරනකොට විපක්ෂයට අද කියන්න දෙයක් නැතිවෙලා තිබෙනවා. අද විපක්ෂය තුෂ්ණීම්භූතවෙලා බලන්න ඉන්න තැනට පත්වෙලා තිබෙනවා.

විපක්ෂය ඉදිරිපත් කරන ලොකුම විවේචනය තමයි, මේ අය වැය ඉදිරිපත් කරපු කාලය වැඩියි, පැය හතරහමාරක් අය වැය ඉදිරිපත් කළාය කියන එක. මේ රටේ අහිංසක ජනතාව කෙරෙහි, මේ රටේ ඈත එපිට දුෂ්කර ලෙස ජීවත්වෙන ජනතාව කෙරෙහි අපට සාධනීය හැඟීමක් තිබෙනවා. ඒ හැඟීමත් එක්ක තමයි අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. ජනාධිපතිවරයා උතුර, දකුණ, නැඟෙනහිර, බස්නාහිර යා කරලා ඒ හැම කෙනෙකුටම සහන ලැබෙන විධියට මේ අය වැය ඉදිරිපත් කළා. ඉතින්, අපට ඒ පිළිබඳව සතුටක් තිබෙනවා. ඒ වෙන් කරපු මුදල් නාස්ති නොකර, නිවැරදිව කළමනාකරණය කරලා බිම් මට්ටම දක්වා -ඈත පිටිසර ඉන්න ජනතාව දක්වා- ගෙනියලා ඒ ජනතාවට සේවය කරන්න පුළුවන් විධියට අපි දිවිහිමියෙන් කටයුතු කරනවා. ඒ වාගේම ලබන අවුරුද්දේ -2026- ජනවාරි මාසයේ ඉඳලා මේ සංවර්ධන ව්‍යාපෘති, ජනතාවට සහන ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම ඒවා නිවැරදිව අධීක්ෂණය කරන්නත් අපි කටයුතු කරනවා. ඉතින්, ඒක නිසා අද අපිට සතුටක් තිබෙනවා. විපක්ෂය කියන මේ කාරණා අද ජනතාව පිළි ගන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එම නිසා තමයි මේ අය වැය විශේෂ කාරණා රාශියක් එක්ක ඉදිරිපත් කළේ.

මේ අය වැයේ මූලික උපාය මාර්ගික අරමුණු 6ක් අන්තර්ගත වෙලා තිබෙනවා. තිරසාර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්න මේ අය වැය තුළින් කටයුතු සකස් කර තිබෙනවා. ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරලා තිබෙනවා. මේ ආණ්ඩුව ඉදිරිපත් කරපු අය වැය ඇතුළේ ඉදිරි අවුරුදු දෙක තුන ඇතුළත සියයට 7ක ආර්ථික වර්ධන වේගයක් අනිවාර්යයෙන්ම ළඟා කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. එහෙම ළඟා කර ගත්තාට පසුව, ආර්ථික වර්ධනයෙන් ලැබෙන සියලු ප්‍රතිලාභ මේ රටේ ඈත පිටිසර සිටින ආදරණීය ජනතාවට ගලා යන්න පුළුවන් විධියට ආර්ථිකය කළමනාකරණය කරන්න පුළුවන් බව අපි දන්නවා.

ඒ වාගේම අපනයනය ඉලක්ක කර ගත් විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායම් ලබා ගැනීම සඳහා මේ අය වැය තුළ කටයුතු කරලා තිබෙන බව අපි දන්නවා. ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරලා තිබෙනවා. ඉතින් ඒක විශේෂ කාරණයක්. මේ අය වැය කථාව සම්බන්ධයෙන් විපක්ෂය මතු කරපු තව කාරණයක් තමයි 2028 වෙනකොට ණය ගෙවාගන්න බැරි වෙනවා කියන එක. හැබැයි, මේ අය වැය තුළ අපට ප්‍රධාන අරමුණක් තිබෙන බව අපි දන්නවා. ඒ තමයි, ණය තිරසරභාවය ඇති කිරීම.

විශේෂයෙන්ම 2019 වර්ෂයේ ඉඳලා 2025 වර්ෂය දක්වා ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත්වල සහ ඒවාට සිදු කරපු සංශෝධන අනුව රජයේ අනුමත ණය සංශෝධන සීමාවන් ඉක්මවා ගිහිල්ලා තිබුණා. 2019 අනුමත ණය සීමාව තිබුණේ රුපියල් බිලියන 990යි. හැබැයි, සංශෝධිත ණය සීමාව රුපියල් බිලියන 2,079 දක්වා වැඩි කර ගෙන තිබුණා. හැබැයි, 2023 රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පාලන කාලය ගත්තොත්, අනුමත ණය සීමාව රුපියල් බිලියන 4,979යි. එය රුපියල් බිලියන 13,979ක්

දක්වා වැඩි කර ගෙන -සංශෝධනය කරගෙන- තිබුණා. හැබැයි, 2025දී අපේ අනුමත ණය සීමාව රුපියල් බිලියන 4,000යි. අපි ඒක සංශෝධනය කර ගත්තේ නැහැ. එය රුපියල් බිලියන 4,000 සීමාවේ පවත්වා ගෙන යන්න අපට පුළුවන්කම ලැබුණා. ඉතින්, එහෙම තමයි අපි මේ ආර්ථිකය කළමනාකරණය කළේ. එම නිසා අද අපි ඇත්තටම සතුටු වෙනවා. මොකද, අපි සියලුදෙනා -අපේ මන්ත්‍රීවරු 159දෙනාම- සාමූහිකව එකට මැදිහත් වෙලා මේ අය වැයේ සාධනීය දේවල් ගමට ගෙන යන්න සූදානමින් ඉන්නවා. ජනවාරි මාසයේ ඉඳලා අපට ඒ වැඩකටයුතු කරන්න අවශ්‍ය පහසුකම් ටික සැලසෙන බව අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය අද වතුකරයේ ජනතාව ගැන කිඹුල් කඳුළු හෙළනවා. වතුකරයේ ජනතාවගේ වැටුප් වැඩි කරන්න රජයෙන් රුපියල් 200කුත්, ඒ වාගේම හාම්පුතුන් රුපියල් 200කුත් ගෙවන්න කියලා ජනාධිපතිතුමා අය වැය කථාවේදී ප්‍රකාශ කළා. ජනාධිපතිතුමා ඒ තුළ විශේෂ අවධානයක් යොමු කළා. මොකක්ද, ඒ? එතුමා හාම්පුතුන්ට කිව්වා, තමන්ගේ වත්ත හරියට සකස් කර ගන්න කියලා. සේවකයන්ට පඩි ගෙවන්න පුළුවන් විධියට එය සංවර්ධනය කර ගන්න, ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්න කියලා කිව්වා.

කාල වේලාව මදි නිසා මගේ කථාව දැන් අවසන් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය මේ අය වැය දිහා බැලුවේ මෙහෙමයි. අපි හඳ පෙන්වන කොට විපක්ෂය ඇඟිල්ල දිහා බලාගෙන ඇඟිල්ල විග්‍රහ කරනවා, ඇඟිල්ල මෙහෙමයි; අපිටත් ඔහොම එකක් තිබුණා; අපිත් ඔහොම තමයි වැඩ කළේ කියලා. අපි මේ ගමන ඉතාම සාර්ථකව ඉස්සරහට යනවා. මේ රටේ ජනතාව කෙරෙහි අපට තිබෙන ළෙන්ගතුකම, හැඟීමත් එක්ක අපි වැඩ කරනවා කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගමගෙදර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.43]

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අපේ අය වැය පිළිබඳව අද උදෑසන සිට මන්ත්‍රීතුමන්ලා සැලකිය යුතු ප්‍රමාණයක් අදහස් දැක්වූවා. විශේෂයෙන් ඒ අතරේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරපු අදහස් දිහා බැලුවාම අපට ඉතාම කනගාටුවක් දැනෙනවා. පරිණතයි කියන, අත්දැකීම් තිබෙනවා කියන විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට මේ අය වැය ලේඛනය විග්‍රහ කරලා තිබෙන්නේ කොහොමද කියලා හිතා ගන්න බැරි වීම පිළිබඳව අපි කනගාටු වෙනවා. මෙවර අපි ඉදිරිපත් කරපු අය වැය ඉතාම සැලසුම් සහගතව, ඉලක්ක සහගතව ඉදිරිපත් කරපු අය වැයක්. මේ අය වැය ඉදිරිපත් කරන අවස්ථාව වනකොට විපක්ෂය හිටියේ ආණ්ඩුව අද වැටෙයි, හෙට වැටෙයි, ඊළඟ මාසයේ වැටෙයි කියන මානසිකත්වයෙන්. ඔවුන් දින වකවානු කියලා කිව්වා, ජනාධිපතිවරු පත් වෙන කාල වකවානු ගැන. ආණ්ඩුව වට්ටන්න බලාගෙන හිටපු විපක්ෂයට මේ අය වැය ලේඛනය ඉදිරිපත් වුණාට පස්සේ සිද්ධ වෙච්ච ඉරණම තමයි තමන් හිටිය තැනිනුත් පහළට වැටිච්ච එක. කථාව තිබුණේ ආණ්ඩුව වට්ටන්න. හැබැයි, විපක්ෂයට සිද්ධ වුණේ, හිටපු තැනිනුත් තවත් පහළට වැටෙන්න. ඒ නිසා විපක්ෂයේ බලාපොරොත්තු සුන් වෙච්ච අය වැයක් බවට මේ අය වැය පත් වෙලා තිබෙනවා. අපේ බොහෝ මන්ත්‍රීවරු මතු කළා වාගේ ඉතාම උපායශීලීවත්, ඒ වාගේම උපක්‍රමශීලීවත් ගරු ජනාධිපතිතුමා විසින් අපේ මේ අය වැය සකස් කරලා ඉදිරිපත් කළා.

මේ පාර්ලිමේන්තුවට මුදල් ඇමතිවරු ඕනෑ තරම් අය වැය ලේඛන ඉදිරිපත් කරපු ආකාරය අපි දැක තිබෙනවා. මීට පෙරාතුව ආණ්ඩුවල හිටපු මුදල් ඇමතිවරු අය වැය ඉදිරිපත් කළේ කොහොමද කියලා මේ දවස්වල සමාජ මාධ්‍යවල ඉතාම හොඳ වීඩියෝ ටිකක් සංසරණය වෙනවා. අඩුම තරමින් තමන් කියන අදහස පිළිබඳව නිශ්චිත අදහසක් නැහැ. සමහර වෙලාවට අදහස් පැටලෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු තේරුම් ගන්න ඕනෑ, අපේ ගරු ජනාධිපතිතුමා පැය හතරහමාරක් තිස්සේ නොපැකිළව මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළ බව. ඒ වාගේම ඉදිරිපත් කරන හැම කරුණක් සම්බන්ධයෙන්ම සවිස්තරාත්මක අවබෝධයක් සහිතව එතුමා කථා කළා. එහෙමයි රටක නායකයෝ, විෂය භාර නායකයෝ කටයුතු කරන්නේ. එහෙම ඉදිරිපත් වෙච්ච අය වැයක් පිළිබඳව අද අසරණභාවයට පත් වෙච්ච විපක්ෂය විවිධ දේවල් කියමින්ඉන්නවා. මේ අය වැය දිහා දේශපාලන කුහකත්වයකින් තොරව බලනවා නම්, මේ වෙලාවේ හැම කෙනාටම මේ අය වැය පිළිබඳව සතුටු වෙන්න පුළුවන්කමක් තිබෙනවා කියලා මම හිතනවා. සමහර අවස්ථාවල විපක්ෂයේ මන්ත්‍රීවරුන්, ආර්ථික ඔස්තාර්ලා මේ අය වැයේ තිබෙන සාධනීය පැති පිළිබඳව සාකච්ඡා කරනවා අපි දැක්කා. ඒක හොඳයි. හැබැයි, දේශපාලන කුහකත්වයක් තිබෙන නිසා බොහෝ දෙනා ඒ කුහකත්වය මතු කරමින් මෙහි තිබෙන සාධනීය කාරණා යට කරන්න උත්සාහ කරනවා බොහෝ අවස්ථාවල අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළ තිබෙන විශේෂත්වය තමයි පසුගිය අවුරුද්දක් මුළුල්ලේ අපි ජාතික ජන බලවේගය හැටියට පෙන්වපු ඒ මූල්‍ය විනය. මම හිතන විධියට, පසුගිය කාල වකවානුවල පැවැති ආණ්ඩු මූල්‍ය විනය කියන කාරණය පිළිබඳව අංශු මාත්‍රයක්වත් තැකුවේ නැහැ. ඒ නිසා තමයි එයාලාගේ මැදිහත්වීම ඇතුළේ රට බංකොලොත්භාවයකට ඇද වට්ටන්න සිද්ධ වුණේ. නමුත් මේ අය වැය ඇතුළේ රටේ සෑම ජන කණ්ඩායමක්ම, සෑම ප්‍රජාවක්ම, සෑම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරමින් ඒ අයට ප්‍රතිලාභ අත් කරලා දෙන්න අපි සමත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වතුකරයේ ජනතාවට. ඉතිහාසයේ පළමු වතාවට වතු කම්කරු ජනතාවට රුපියල් 1,750ක වැටුපක් දෛනිකව දෙන්න විකල්ප යෝජනාවක් ආණ්ඩුවෙන් ඉදිරිපත් කළාම, ඒ ජනතාව වෙනුවෙන් පෙනී ඉන්නවා යයි කියන විපක්ෂය ඒකට රටේ නැති තර්ක ඉදිරිපත් කිරීම ඉතාම ලජ්ජා සහගතයි. අපේ මන්ත්‍රීවරයෙකුත් කිව්වා වාගේ, විපක්ෂ නායකතුමා හෝ විපක්ෂයේ වගකිව යුත්තෙක් මේ ඉදිරි දවස්වල කියන්න ඕනෑ, ඒ වතු කම්කරු ප්‍රජාවට මේ විධියට රජය මැදිහත් වෙලා ලබා දෙන රුපියල් 200ට එරෙහි වීම ඔවුන්ගේ පක්ෂයේ ස්ථාවරයද කියලා. එහෙමත් නැත්නම් ඒකට යම් යම් බාධාවන් එල්ල කිරීම තනි මතයක් හැටියටද ඉදිරිපත් වෙන්නේ, එහෙමත් නැත්නම් විපක්ෂයේ පොදු මතය හැටියටද ඉදිරිපත් වෙන්නේ කියන කාරණයත් කියන්න ඕනෑ.

අවසාන වශයෙන්, අද දවසේ මතු වෙච්ච ප්‍රශ්න, ගැටලු ගණනාවක් සම්බන්ධයෙන් මේ වෙලාවේදී කෙටියෙන් හෝ යම් පිළිතුරක් දෙන්න ඕනෑකම තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් අද උදේ වරුවේ මෙම විවාදය ආරම්භ කරමින් ගරු විපක්ෂ නායකතුමා කථා කළා. විපක්ෂ නායකතුමා කථා කළේ, කඩවුණු පොරොන්දු ගැන. ඒක ඇත්ත.

[ගරු ගමගෙදර දිසානායක මහතා]

එතුමාගේ කඩවුණු පොරොන්දු ගණනාවක් තිබෙනවා. ඒ කඩවුණු පොරොන්දු මතක් වෙමින් මේ අය වැය ලේඛනය හරහා විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායමේ බලාපොරොත්තුව බිඳ වැටීම පිළිබඳව සාකච්ඡා කරන එක අමුත්තක් නොවෙයි. විශේෂයෙන් එතුමා කිව්වා, මේ අය වැයෙන් රටම අනාථ කළා කියලා. රටම අනාථ වීම කෙසේ වෙතත්, හර්ෂ මන්ත්‍රීතුමා මාධ්‍යයට කියලා තිබෙනවා මම දැක්කා, පසුගිය විදේශ සංචාරය වෙලාවේ පක්ෂයත් අනාථ කරන්න විපක්ෂ නායකතුමා කටයුතු කළා කියලා. ඒ නිසා ඒ වේදනාව තමයි මේ ප්‍රකාශයට පත් වෙමින් තිබෙන්නේ.

එතුමා රජයේ රැකියා පිළිබඳවත් වැරදි ප්‍රකාශයක් නිකුත් කළා. රාජ්‍ය සේවයට බඳවා ගැනීම් කෙරෙන්නේ නැති බව එතුමා කිව්වා. අපි ජාතික ජන බලවේගය හැටියට පසුගිය කාලයේ මේ රටේ තරුණ පරම්පරාවත්, ඒ වාගේම විවිධ අධ්‍යාපන මට්ටම්වල සිටින පිරිස් සහ උපාධිධාරීන් ඒක රාශි කරගෙන විවිධ ක්‍රියාකාරකම් කළා. ඒක රටේ ජනතාව දන්නවා. හැබැයි එහෙම මැදිහත් වෙච්ච තරුණ තරුණියන්ට, උපාධිධාරීන්ට අපේ රජයෙන් රැකියාවක් ලැබෙන්නේ නැහැ, මුළාවක් කරනවාය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි වර්ෂය තුළ අපි ස්ථිරවම 70,000කට රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළක් යෝජනා කර තිබෙන බව පැහැදිලිව කියන්න ඕනෑ. ඒ රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළ ඇතුළේ නිසි විධියට එම බඳවා ගැනීම් කරන්න අපි සූදානම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ බඳවා ගැනීම් කරන්නේ අර සියඹලා ගහ යටට ගෙනැල්ලා, "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු" කියන න්‍යායෙන් නොවෙයි. හරියට සුදුසුකම් පරීක්ෂා කරලා බලා, ගැළපෙන විධියට අවශ්‍යතාව අනුව ඒ කටයුතු කරන්න අපි සූදානමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා විපක්ෂයට තව තවත් දවල් හීන දැක දැක ඉන්න පුළුවන්. මේ රටේ ජනතාව වෙනුවෙන් ස්ථාවරව, ශක්තිමත්ව දෙවැනි අය වැය ඉදිරිපත් කරන්න අපි සමත් වුණා. ඒ වාගේම, අනාගතයේදී ඉදිරිපත් වන අය වැය තුළින් මේ විපක්ෂය හාන්සි වෙනවාය කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.50]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்திலே கலந்துகொண்டு பேசுவதில் மகிழ்ச்சியடைகின்றேன். 2025ஆம் ஆண்டுக்காகச் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்ட முன்மொழிவுகளிலே, குறிப்பாக கிழக்கு மாகாண மக்கள் எதிர்பார்த்தது போன்ற நிதி ஒதுக்கீடுகள் அம்மாகாணத்திற்கு அமையவில்லை என்பதனை மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் நாடாளுமன்றத்திலே தெரிவித்திருந்தோம். கிழக்கு மாகாணத்தின் அபிவிருத்திக்கான நிதியை இந்திய அரசாங்கம் வழங்கும் நிதியிலிருந்து பெற்றுத்தருவதாக வரவு செலவுத்திட்ட உரையிலே மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களினால் தெரிவிக்கப்பட்டிருந்தது. ஆனால், ஒரு வருடமாகின்ற நிலையிலும் கிழக்கு மாகாணத்திலே இதுவரை இந்திய அரசாங்கத்தின் நிதியுதவியில் எந்த அபிவிருத்தித் திட்டமும் ஆரம்பிக்கப்படவில்லையென்ற கவலையான செய்தியை இந்தப் பாராளுமன்றத்துக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

2025ஆம் ஆண்டு கௌரவ ஜனாதிபதி அவர்களினால் பாராளுமன்றத்திலே சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத் திட்டத்தின்கீழ் அமைச்சுகளுக்கு ஒதுக்கப்பட்ட நிதிகள், 2025ஆம் ஆண்டு செப்ரெம்பர் 30ஆம் திகதிவரை செலவு செய்யப்பட்ட நிதிகள் பற்றிய விபரத்தை இந்தச் சபையிலே நான் ***சமர்ப்பிக்கின்றேன்**.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அதன்படி, தலைப்பு எண். 1 முதல் 25 வரையான விசேட செலவினக் கூறுகளுக்கென ஒதுக்கப்பட்டிருந்த 45,593 மில்லியன் ரூபாயில் 19,145 மில்லியன்தான் செலவழிக்கப் பட்டிருக்கின்றது; இது 42 சதவீதமாகும். புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சுக்கு 14,467 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனால், செலவு செய்யப்பட்டிருப்பது 5,670 மில்லியன் ரூபாய். அதுபோல், நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சுக்கு 5,162,926 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது; 3,411,539 மில்லியன் ரூபாய் செலவழிக்கப்பட்டிருக்கின்றது; இது 66 சதவீதமாகும். பாதுகாப்பு அமைச்சுக்கு ஒதுக்கப் பட்டிருந்தது 442,754 மில்லியன் ரூபாய்; செலவழிக்கப்பட்ட தொகை 297,291 மில்லியன்; இது 67 சதவீதமாகும். நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சுக்கு 54,307 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு, 26,566 மில்லியன் ரூபாய் செலவழிக்கப்பட்டுள்ளது; இது 49 சதவீதமாகும். சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சுக்கு 519,514 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது; இதில் 274,537 மில்லியன் ரூபாய் செலவழிக்கப்பட்டுள்ளது; இது 53 சதவீதமாக இருக்கிறது. வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலை வாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சுக்கு 21,773 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது; 12,445 மில்லியன் செலவு செய்யப்பட்டிருக்கின்றது; இது 57 சதவீதமாகும். அதுபோல, போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சுக்கு 489,230 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது; 240,805 மில்லியன் ரூபாய் செலவு செய்யப்பட்டிருக்கின்றது; இது 49 சதவீதமாகும். கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுக்கு 218,382 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது; 100,903 மில்லியன் ரூபாய் செலவழிக்கப்பட்டிருக்கின்றது; இது 46 சதவீதமாகக் காணப்படுகிறது.

இவ்வாறு 2025ஆம் ஆண்டுக்கு எல்லா அமைச்சுகளுக்கும் ஒதுக்கப்பட்ட நிதியிலே பெருந்தொகையான நிதி செலவுசெய்யப்படாமல் இருக்கின்றது. இவை ஏன் செலவு செய்யப்படாதிருக்கின்றது என்பது பற்றி நாம் யோசிக்க வேண்டும். ஏனென்றால் மக்கள் பிரதிநிதிகளான நாங்கள் 225 பேரும் நாட்டு மக்களுடைய பிரச்சினைகளை இங்கே முன்வைக்கின்றோம்; அமைச்சுகளுக்கெல்லாம் நிதி ஒதுக்கப்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

படுகின்றது. ஆனால், 10ஆம் மாதம் பார்க்கின்றபோது ஒதுக்கப்பட்ட பணம் செலவழிக்கப்படாமல் இருக்கின்ற நிலைமை காணப்படுகின்றது. இந்த வருடம் செலவழிக்கப்பட வேண்டிய பணம் செலவழிக்கப்படாத நிலையில் திறைசேரிக்குப் போய், அடுத்த வருடத்திற்கு மீண்டும் அதனைப் பெறவேண்டிய நிலை ஏற்படுத்தப்பட்டிருக்கின்றது. சில அமைச்சுகள் உண்மையிலே 60 - 70 சதவீதம்வரை செலவழித்திருக்கின்றது. ஆனால், சில அமைச்சுகள் 35 சதவீதம் வரைகூட செலவழிக்கவில்லை. எனவே, கௌரவ அமைச்சர்களும், நிதி அமைச்சரான மாண்புமிகு சனாதிபதியும் ஒன்றிணைந்து, அடுத்த வருடத்துக்கான நிதி ஒதுக்கீட்டில் எமது பிரதேசங்களின் அபிவிருத்திக்கு ஒதுக்கப்படுகின்ற நிதி திருப்பி அனுப்பப்படாத வகையில் விடயங்களை மேற்கொள்ள நடவடிக்கை எடுக்கவேண்டுமென்று நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, இந்த Budgetஇலே மக்கள் நிறைய எதிர்பார்த்தார்கள். குறிப்பாக, இந்த நாட்டு விவசாயிகள் தங்களுக்கு ஏதாவது நன்மை கிடைக்க வேண்டுமென்று எதிர்பார்த்தார்கள். அதேபோன்று, நாட்டிலே இருக்கின்ற 35,000 வேலையற்ற பட்டதாரிகளும் எதிர்பார்த்தார்கள். உண்மையிலே இந்த நாடு நல்லதொரு நிலைமையை அடைவதற்கு நீங்கள் உதவி செய்திருக்கிறீர்கள்; அதற்காகக் கஷ்டப்பட்டிருக்கிறீர்கள். இன்று நாடு நல்லதொரு சூழ்நிலைக்கு வந்திருக்கிறது; பொருளாதார வளர்ச்சி ஏற்பட்டிருக்கிறது. அதை நாங்கள் ஏற்றுக் கொள்கிறோம். ஆனால், எமக்கு வாக்களித்த மக்கள் நிறையப் பயனடையக்கூடிய ஏற்பாடுகளை நீங்கள் செய்ய வேண்டும். குறிப்பாக, விவசாயம் இந்த நாட்டிலே முக்கியமான ஒரு துறையாக இருக்கிறது. விவசாயிகளுடைய பிரச்சினைகளைத் தீர்க்கும் வகையில் ஏதாவதொரு வழியில் - ஒரு குறைநிரப்புப் பிரேரணையைக் கொண்டுவந்தாவது - நீங்கள் நல்ல பணிகளைச் செய்ய வேண்டும். அத்துடன், இந்த நாட்டிலே இருக்கின்ற 35,000 வேலையற்ற பட்டதாரிகள் தொடர்பிலும் இந்த வரவு செலவுத்திட்டத்தின் ஊடாக எந்தவொரு முன்மொழிவுகளும் செய்யப்படவில்லை. கடந்த காலங்களில் வரவு செலவுத்திட்டங்களினூடாகத்தான் பட்டதாரிகளுக்குரிய வாய்ப்புகள் ஏற்படுத்தப்பட்டிருக்கிறது. எனவே, இதற்கும் ஒரு மாற்றுத் தீர்மானத்தை நீங்கள் மேற்கொள்ளவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

கடந்த வருடங்களிலே சப்பிரகமுவ, மொறட்டுவ, ருஹுணு, ஊவா, வெல்லெஸ்ஸ மற்றும் கிழக்குப் பல்கலைக்கழகங்களில் புதிதாகத் தாபிக்கப்பட்டுள்ள மருத்துவ பீடங்களின் அபிவிருத்திக்காக இந்த வரவு செலவுத்திட்டத்திலே மாண்புமிகு சனாதிபதி அவர்கள் 11,000 மில்லியன் நிதியை ஒதுக்கியிருப்பது குறித்து நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். உண்மையிலே, கடந்தமுறை கிழக்கு மாகாணத்துக்கு ஒதுக்கிய நிதி போதாதென்று நாங்கள் சொன்னோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த Budgetஇலே குறிப்பாக எங்களுடைய கிழக்கு மாகாணத்திற்குக் கணிசமான அளவு நிதி ஒதுக்கியிருக்கின்றார். அதுபோல், எமது அம்பாறை மாவட்டத்துக்கும் அவர் உதவி செய்திருக்கிறார். அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு நான் அம்மாவட்ட மக்கள் சார்பில் நன்றி சொல்லக் கடமைப் பட்டிருக்கின்றேன்.

இலங்கைத் தென்கிழக்குப் பல்கலைக்கழகம் சுமார் 220 ஏக்கர் பரப்பளவிலே ஒலுவிலிலே அமைந்துள்ளது. ஏறத்தாழ 10,000 மாணவர்களையும் 250 ஆசிரிய, கல்வி ஊழியர் களையும் உள்ளடக்கிய அப்பல்கலைக்கழகம் 1996ஆம் ஆண்டு மே மாதம் 15ஆம் திகதியில் இருந்து ஒரு தேசிய பல்கலைக் கழகமாக இயங்கி வருகிறது. தற்போது தென்கிழக்குப் பல்கலைக்கழகம், கலை மற்றும் கலாசார பீடம், மேலாண்மை மற்றும் வணிகவியல் பீடம், பயன்பாட்டு அறிவியல் பீடம், இஸ்லாமிய ஆய்வுகள் மற்றும் அரபு மொழிப் பீடம், பொறியியல் பீடம் மற்றும் தொழில்நுட்பப் பீடம் ஆகிய 6 பீடங்களுடன் செயற்பட்டு வருகின்றது. இருப்பினும், தென்கிழக்குப் பல்கலைகழத்தின் மருத்துவ பீடம் இதுவரைக்கும் நிறுவப்படவில்லை. எனவே, அப்பல்கலைக் கழகத்துக்கு உரிய மருத்துவ பீடத்தை அவசரமாக நீங்கள் நிறுவ வேண்டும் என்று நான் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 15ක කාලයක් තිබුණා. කරුණාකරලා මගේ වෙලාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 10යි වෙන් කර තිබෙන්නේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට විනාඩි 15ක් තිබුණා, කමක් නැහැ.

தென்கிழக்குப் பிராந்தியத்தில் வளர்ந்துவரும் சுகாதாரத் தேவைகள் மற்றும் பல்கலைக்கழகத்தின் மூலோபாய ஆற்றலைக் கருத்திற்கொண்டு அக்கரைப்பற்று, நிந்தவூர், சம்மாந்துறை, கல்முனை, அட்டாளைச்சேனை, ஒலுவில், பாலமுனை ஆகிய வைத்தியசாலைகளால் சூழப்பட்டுள்ள தென்கிழக்குப் பல்கலைக்கழகத்துக்கான மருத்துவ பீடத்தை உருவாக்கித் தருமாறு எங்களுடைய நிதி அமைச்சையும், கல்வி உயர்கல்வி அமைச்சையும் கோருகின்றோம். பல்கலைக் கழகங்களுக்கு ஒதுக்கப்பட்ட நிதியில் ஏதாவது மாற்றம் செய்யக்கூடிய சந்தர்ப்பம் ஏற்பட்டால், எங்களுடைய தென்கிழக்குப் பல்கலைக்கழகத்துக்கு உரிய மருத்துவ பீடத்தை உருவாக்குவதற்கு உதவி செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன். அது எல்லா இன மக்களும் பயன்படுத்தக் கூடிய ஒரு தேசிய universityஆக இருப்பதால் அதனைச் செய்துதர வேண்டும்.

அடுத்தது, மாகாண சபைத் தேர்தல் சம்பந்தமாக இங்கே நிறையப் பேர் பேசினார்கள். உண்மையிலே, "எந்த வகையிலே மாகாண சபைத் தேர்தல் நடத்த வேண்டும் என்று நீங்களே முடிவுசெய்து, ஒரு பொறிமுறையை உருவாக்குங்கள்!" என மாண்புமிகு சனாதிபதி அவர்கள் பாராளுமன்றத்திலே எங்களிடம் பகிரங்கமாகவே சொல்லி விட்டார். அதற்காக 10 பில்லியன் ரூபாய் பணம் ஒதுக்கப்பட்டு இருக்கின்றதென்றும் சொன்னார். எனவே, இப்போது பாராளுமன்றத்துக்குத்தான் - நமக்குத்தான் - அந்தப் பொறுப்பு இருக்கிறது. கௌரவ பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்கள் ஒரு நீதியான

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

மனிதர்; நல்ல சேவை செய்யக்கூடிய ஓர் அமைச்சர். அவர், நீதி அமைச்சர் மற்றும் பாராளுமன்றத்திலே இருக்கின்ற கட்சித் தலைவர்களை அழைத்துச் சுமுகமான முறையிலே பேசி, பழைய முறையிலே இந்தத் தேர்தலை நடத்தும் விஷயத்திலே எல்லோருமே ஒன்றுபட்டு ஒரு தீர்மானத்தை எடுத்தால் உடனடியாகத் தேர்தலை நடத்தலாம். ஆனால், கடந்த காலத்தில் ரணில் விக்கிரமசிங்ஹ அவர்கள்தான் மாகாண சபைகளிடமிருந்த மாகாண சபைத் தேர்தல் நடத்தும் அதிகாரத்தை இல்லாமற் செய்தார் என்பது உங்களுக்குத் தெரியும். நானும் மாகாண சபையிலே இரண்டு தடவை அமைச்சராகவும், எதிர்க்கட்சித் தலைவராகவும் இருந்தேன். ஒரு வெள்ளைப் பேப்பரைக் காட்டித்தான் கிழக்கு மாகாண சபையிலே 20ஆவது ஷரத்துக்கு ஆதரவு பெற்றார். அதற்குத் தமிழ் பேசும் கட்சிகளும் support பண்ணினார்கள். எனவே, மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்கு நாங்கள் எல்லோருமே ஒத்துழைத்துக்க வேண்டும்; எல்லாக் கட்சிகளின் தலைவர்களும் அதற்கு உதவி செய்ய வேண்டும் எனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

***එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල්තබන ලදී.***

***එතැන් සිට විවාදය 2025 නොවැම්බර් 12වන බදාදා පවත්වනු ලැබේ.***

*அப்போது பி.ப. 6.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2025 நவம்பர் 12, புதன்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Wednesday, 12th November, 2025.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

## ත්‍රිරෝද රථ සඳහා විදේශීය සංචාරකයින්ට රියැදුරු බලපත්‍ර ලබා දීම නතර කිරීම
## வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகளுக்கு முச்சக்கர வண்டிகளுக்காக சாரதி அனுமதிப்பத்திரம் வழங்குவதை நிறுத்துதல்
## TERMINATION OF ISSUANCE OF DRIVING LICENCES FOR THREE-WHEELERS TO FOREIGN TOURISTS

[අ.භා. 6.00]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රධානතම කොටසක් ලෙස, ගුවන් තොටුපළේ සිට ක්‍රියාත්මක රථ වාහන මාර්ගයෙන් සංචාරකයින් ගමනාන්ත කරා රැගෙන යාම සැලකිය හැකිය. ලංකාවේ ආයතන 72ක් පමණ ක්‍රියාත්මක අතර, එයින් ආයතන 53ක් සංචාරක අමාත්‍යාංශයේ ලියාපදිංචි කර ඇත.

ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන විදෙස් ජාතිකයින් හට මෙරටදී රථ වාහන පැදවීමට අවශ්‍ය නම් ඒ සඳහා මෙතෙක් කලක් පැවැති, වේරහැරදී රුපියල් 2,000ක ගාස්තුවක් ගෙවා ලබා ගත හැකිව තිබූ ක්‍රමවේදය වෙනස් කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළින් රුපියල් 15,000ක් ගෙවා බලපත්‍රය ලබා ගත හැකි ක්‍රමයක් හඳුන්වා දී ඇත. නමුත්, තවම ගැසට් පත්‍රයට යවා අනුමැතිය ලබා ගෙන නොමැත. නමුත්, විදෙස් ජාතිකයින් ත්‍රිරෝද රථ ඇතුළු රථ වාහන ධාවනය කරමින්, මාර්ග නීති උල්ලංඝනය කරමින් ක්‍රියා කරති.

ශ්‍රී ලංකා පොලීසිය ද දේශීය රටවැසියන්ට වඩා ලිහිල් ප්‍රතිපත්තියක් විදේශීය සංචාරකයින් සඳහා ක්‍රියාත්මක කරමින් මෙම ක්‍රියාව සඳහා අනියම් අන්දමින් සහයෝගය ලබා දෙයි.

මේ හේතුවෙන් මාර්ග අනතුරු ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති අතර, මෙය ලංකාවේ සංචාරක කර්මාන්තයට ද අහිතකර ලෙස බලපායි. ඒ හැර ලංකාවේ ලියාපදිංචි සංචාරක සමාගම්වලට ද මෙය ඉතාමත් අහිතකර තත්ත්වයකි.

ඉහත හේතූන් නිසා විදේශීය සංචාරකයින් සඳහා ත්‍රිරෝද රථ සහ බර වාහන සඳහා බලපත්‍ර ලබා දීම නැවැත්විය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන විදෙස් ජාතිකයින්ට අපේ ගුවන් තොටුපළින් මේ වෙලාවේ ලබා දෙන මේ රියදුරු බලපත්‍රය නිසා දේශීය සංචාරක කර්මාන්තයේ යෙදී සිටින රියදුරන් ප්‍රශ්න කිහිපයකට මුහුණ දී සිටිනවා. මම හිතන විධියට, අවුරුද්දටම බලපත්‍ර 2,900ක් වාගේ ප්‍රමාණයක් තමයි ඒ කාලයේ වේරහැරින් ලැබුණේ. නමුත්, දැන් රුපියල් 2,000ක් දීලා මාසයකට බලපත්‍ර 3,000ක් ඉක්මවන ප්‍රමාණයක් අරගෙන සංචාරකයන් ත්‍රී වීලර් ඇතුළු වාහන ධාවනය කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ වාගේ දේවල් තුළින් අපේ සංචාරක ව්‍යාපාරය හා රියදුරන් අතර ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. දැන් ඇල්ල ප්‍රදේශයේ "Rent a Tuktuk" කියලා ආයතනයක් නෙදර්ලන්ත ජාතිකයෙක් පටන්ගෙන තිබෙනවා. අපේ කට්ටිය ගියාම කියනවා ලු, "ඔයාගේ ත්‍රී වීලර් එකත් අපේ ආයතනයට ගෙනැල්ලා දාන්න" කියලා.

2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනතේ 34වන වගන්තියේ, 132ආ යටතේ මෙසේ සඳහන් වෙනවා:

"132ආ. එක්දහස් නවසිය හැට අටේ නොවැම්බර් මස අටවන දින පවත්වන ලද වියානා සම්මුතියේ ගිවිසුම් රාජ්‍යවලින් එකක් හෝ එම ගිවිසුමට එකඟ වී ඇති රාජ්‍ය හෝ දේශවලින් එකක් විසින් නිකුත් කරන

> ලද වලංගු ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක සන්තකය දරන සහ ශ්‍රී ලංකාවේ සද්භාවී ආගන්තුකයකු වන යම් තැනැත්තෙක් මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක සහතිකය දරන්නකු ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රියදුරු අවසර පත්‍රයේ නිශ්චිතව දැක්වෙන පන්තියට හෝ පන්තිවලට අයත් වාහන පැදවීම සඳහා ඔහුට බලය පවරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය:"

සමහර විදෙස් ජාතිකයන් ඇවිල්ලා වාහන ධාවනය කිරීම නිසා අනතුරට ලක් වුණු අවස්ථා තිබෙනවා. මා ළඟ එම ෆොටෝ තිබෙනවා. මේ තිබෙන්නේ ත්‍රී වීලර් එකක් ධාවනය කරගෙන ගිහිල්ලා අනතුරකට ලක් වෙච්ච අවස්ථාවක් දැක්වෙන ෆොටෝ එකක්. එවැනි අනතුරකට ලක් වෙච්ච අවස්ථාවක් දැක්වෙන තව ෆොටෝ එකක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ බලපත්‍රයට රුපියල් 15,000ක් අය කිරීමේ චක්‍රලේඛය නිකුත් කරලා, විදෙස් ජාතිකයන්ට රුපියල් 15,000ට රියදුරු බලපත්‍රය ගන්න අවස්ථාව හදලා දුන්නොත් ඒක ටිකක් ආණ්ඩුවටත් සහනයක් වෙයි, රටටත් සහනයක් වෙයි. ඔවුන් බලපත්‍ර ගන්න එකත් අඩු වෙයි.  අද මේ වැඩ පිළිවෙළ නිසා සංචාරක කර්මාන්තයේ යෙදී සිටින අය තුළ මේ ගැටලුව සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා අපේ ගරු ඇමතිතුමාට මම කියනවා, පසුගිය කාලයේ ලබා දුන් විධියට රියදුරු බලපත්‍රය වේරහැරින්ම ලබා දෙන්න පුළුවන් නම් ඒක ඊට වැඩිය වටිනවා කියලා. නැත්නම් මේ අය ඔවුන්ට ඕනෑ ඕනෑ විධියට වාහන පදවයි. දැන් හැම තැනම සුද්දෝ ත්‍රී වීලර් පදින්න පටන් ගෙන තිබීම අපේ රටේ රියදුරන්ට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, මේ නිසා අපේ රටේ ඉන්න අයට රියදුරු රැකියා අවස්ථා අඩු වෙලා තිබෙනවා. මම මේ වෙලාවේදී මේ කාරණයත් අහන්න ඕනෑ. හදිසියේ මේ රියදුරෙක් අතින් හැප්පිලා අපේ කෙනෙක් මැරුණොත් ඊට පස්සේ ඔහු මේ රට දාලා යයි. ඊට පස්සේ ඔහුව නඩුවලට ගෙන්වා ගන්න පුළුවන්ද? ඒ වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා, මේ සංචාරක කර්මාන්තයේ යෙදිලා ඉන්න අයට.

කොවිඩ් වසංගතය පැවති කාලයේ අපේ රටේ අය නිකම්ම හිටියා, බඩගින්නේ හිටියා. ඔවුන්ට කරන්න රස්සාවක් තිබුණේ නැහැ. සුද්දෝ ටික රට දාලා ගියා, කොවිඩ් වසංගතය පැවති වෙලාවේ. කොවිඩ් වසංගතය ඉවර වුණාම සුද්දෝ ආපසු මේ රටට ආවා. එහෙම ඇවිල්ලා ජාත්‍යන්තර බිස්නස් ගොඩක් පටන් ගෙන තිබෙනවා. දැන් මේ සල්ලි ගොඩක් "Rent a Tuktuk" ආයතනය හරහා නෙදර්ලන්තයට යනවා. මම හිතන විධියට, මේකෙන් අපේ රටට වාසිදායක දේවල් අහිමි වෙන එකට වැඩිය ඒ කර්මාන්තවල යෙදිලා ඉන්න අපේ අයට අවස්ථාව දෙන්න වෙනවා. මේ රටේ හැම තැනකම මේ කාරණය කථා බහට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මම මේ පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් මේ වෙලාවේ පාර්ලිමේන්තුවට ගෙනාවේ. ඒ වෙලාවේදී ඔබතුමන්ලා ගත්ත තීන්දුව වැරදි නැහැ. සමහර තීන්දු හරියන්න පුළුවන්. හැබැයි, ඔබතුමන්ලා සංවාදයක යෙදිලා, කථා කරලා, මේකේ ගැටලුව හොයලා, අඩියක් පස්සට අරගෙන මේ බලපත්‍රයකට රුපියල් 15,000ක් ගන්න පුළුවන් නම් රුපියල් 15,000 ගන්න. නැත්නම් මේක  සංශෝධනය කරලා, අපේ රටේ ත්‍රිරෝද රථ හිමියන්ට, නැත්නම් අපේ ගමේ රියදුරන්ට වාසිදායක විධියට මේක හදලා දෙන්න. ඒ ගැන තමයි මම අද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව තුළින් මේ සභාවට ඉදිරිපත් කළේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.07]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද  දින සභාව කල් තබන අවස්ථාවේ ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව මා ස්ථිර කරනවා. එතුමාගේ යෝජනාවේ කියා තිබෙන්නේ, සියලුම වාහන බලපත්‍ර පිළිබඳව නොවෙයි. ත්‍රී වීලර් සම්බන්ධයෙන් තමයි එතුමා කථා කළේ. ඒ වාගේම බස් රථ සම්බන්ධයෙන්. මේ වෙනකොට සංචාරකයන් විශාල ප්‍රමාණයක් ලංකාවට පැමිණෙමින් තිබෙනවා. 2018 වර්ෂයේ පැමිණි ප්‍රමාණයට ආසන්නවම මේ වෙනකොට සංචාරකයින් ඇවිල්ලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා.

ඇත්තටම, යුරෝපය ඇතුළු ගොඩක් රටවල ත්‍රී වීලර් නැහැ. වාහනයක් පදවන එකයි, ත්‍රී රෝද රථයක් පදවන එකයි කියන්නේ දෙකක්. ඒ නිසා ඒ අයට පුහුණුවක් නැතුව මේ බලපත්‍ර ලබා දීම තුළ -මා දන්නේ නැහැ ඒක කොහොමද වෙන්නේ කියලා- යම් යම් ගැටලු ඇති වෙන්න පුළුවන්. ඒ තුළ සිදු වන අනතුරු කිහිපයක් ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා. මොකද, ත්‍රී රෝද රථයක් කියන්නේ, රෝද තුනේ වාහනයක්. ඒ නිසා ඒ ගැන හොයා බලලා කටයුතු කරනවා නම් හොඳයි කියන එක මේ යෝජනාව ස්ථිර කරන ගමන්ම මම මතක් කරනවා.

සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් කථා කළොත්, මේ වන විට එහි ගැටලු රාශියක් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ තිබෙන  five-star හෝටල්වල  කාමර මිල සම්බන්ධයෙන් කිසිම සීමාවක් නැති නිසා ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ලංකාව පුරාම තිබෙන හෝටල්වල ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. සමහර වෙලාවට අපේ අල්ලපු රට වන ඉන්දියාවට ගියත්, එහෙම නැත්නම් වෙනත් රටකට ගියත් අපිට ඩොලර් 100ට වඩා වැඩි මුදලක් දීලා තමයි මේ තත්ත්වයේ හෝටලයක කාමරයක් මිලදී ගන්න වෙන්නේ. නමුත්, අද ලංකාවේ තත්ත්වය ඊට වඩා අවාසනාවන්තයි. අද ලංකාවේ five-star හෝටලයක කාමරයක් ඩොලර් 60ට ගන්න පුළුවන්. ඊටත් අඩු තත්ත්වයට ඇවිත් තිබෙනවා. මීට පෙර මේ සම්බන්ධයෙන් සීමාවක් තිබුණා. ඒ කියන්නේ, ඩොලර් 100ට, 120ට අඩුවෙන් දෙන්න බැහැ කියලා සීමාවක් තිබුණා. දැන් ඒ සීමාව ඉවත් කර තිබෙන නිසා කොළඹ නගරය තුළ තිබෙන සමහර five-star හෝටල්වල කාමරයක් ඩොලර් 40ට, 50ට, 60ට ගන්න පුළුවන් කියලා web sitesවල පළ කර තිබෙනවා මම දැක්කා. එහෙම වුණාම අපේ රටට එන ආදායම අඩු වෙනවා. මම හිතන විධියට, ලාභයක් නොවෙයි, පාඩු තත්ත්වයක් තුළ තමයි ඒ කාමර විකුණන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් පෙර තිබුණු සීමාව ආපසු ඇතුළු කළොත් එවැනි අඩු ගණනකට දෙන්න බැරි වෙනවා. මොකද, අපේ රටට සංචාරකයන් එනවා වාගේම ඔවුන්ගේ මුදල් ටික අපි මේ රට තුළ වියදම් කරවන්න ඕනෑ. මොකද, අද වනකොට ඒ සංචාරකයන් ඇවිල්ලා අපට ලොකු මුදලක් දීලා යන්නේ නැහැ. සංචාරක ව්‍යාපාරය සම්බන්ධව  ඒ අදාළ වැය ශීර්ෂයේදී අපි කථා කරන්න බලාපොරොත්තු වෙනවා. කෙසේ නමුත්, මේ කාරණාව ගැනත් අවධානය යොමු කරන්න කියලා මතක් කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.10]

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ යෝජනාව සාධනීය යෝජනාවක් වුණත්, ඒකට මගේ පැත්තෙන් යම්කිසි කාරණා ටිකක් එකතු කරන්න ඕනෑ. මොකද, මේ යෝජනාවේ අවස්ථා කිහිපයකදී වැරදි අදහසක් එමින් තිබෙනවා. එකක් තමයි, අපි මේ රටේ සංචාරක ව්‍යාපාරයත් රැකගන්න ඕනෑ. ඒ වාගේම නීතියේ ආධිපත්‍යය කාටත් -විදේශිකයන්ට හෝ ශ්‍රී ලාංකිකයන්ට- සැම ලෙස තිබිය යුතුයි. ඒක රැක ගැනීමත් අපේ වගකීමක් වෙනවා. ඒ වාගේම බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කරගන්නත් ඕනෑ. මා ළඟ තිබෙනවා, 2025.08.03 සිට 2025.10.31 දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ඔය කියන විධියට බලපත්‍ර ලබා දීම සම්බන්ධ තොරතුරක්. අගෝස්තු මාසයේ සංචාරකයන් පැමිණ තිබෙනවා, 198,235ක්. බලපත්‍ර අරගෙන තිබෙන්නේ ඔය කියන විධියට සියයට 1.16යි. සැප්තැම්බර් මාසයේ සංචාරකයන් පැමිණ තිබෙනවා, 158,971ක්. ඔය විධියට ලයිසන් අරගෙන තිබෙන්නේ සියයට 1.23යි. ඒ වාගේම ඔක්තෝබර් මාසයේ සංචාරකයන් පැමිණ තිබෙනවා, 153,063ක්. සියයට 1.29ක් තමයි බලපත්‍ර අරගෙන තිබෙන්නේ. මේ කාලය තුළ රට ආදායම් ලබා තිබෙනවා, රුපියල් මිලියන 13.27ක්. ඒ කියන්නේ අගෝස්තු මාසයේ මිලියන 4.78ක්, සැප්තැම්බර් මාසයේ මිලියන 4.27ක් සහ ඔක්තෝබර් මාසයේ මිලියන 4.22ක්.

මේ යෝජනාවේ ත්‍රීවීලර් ගැනත් සඳහන් වෙනවා. ඇත්තටම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් තාවකාලික රියැදුරු බලපත්‍ර ලබා දෙන්නේ light vehiclesවලට විතරයි. ඒ කියන්නේ කාර්, වෑන් හා මෝටර් සයිකල්වලට විතරයි. ත්‍රි රෝද රථවලට ලබා දෙන්නේ නැහැ. ඒ කියන්නේ, බර වාහනවලටත්, ත්‍රි රෝද රථවලටත් එහෙම ලයිසන් ලබා දෙන්නේ නැහැ. ත්‍රි රෝද රථවලට එහෙම තාවකාලිකව බලපත්‍රයක් ලබා දෙන ආයතනයක් තිබෙනවා. ඒ තමයි, Automobile Association of Ceylon කියන එක. 1949 මෝටර් රථ පිළිබඳ ජිනීවා සම්මුතියට අත්සන් කරලා තමයි, ඒ අය මේක කරමින් ඉන්නේ. ඒගොල්ලන් ත්‍රි රෝද රථවලට එහෙම බලපත්‍රයක් දෙනවා කියන තත්ත්වයක් වාර්තා වෙලා තිබෙනවා. නමුත්, ගුවන් තොටුපළෙන් එහෙම ලබා දෙන්නේ නැහැ. මා ළඟ තිබෙනවා, එහෙම ලබා දුන්නු බලපත්‍රයක්. ඒකේ තිබෙන්නේ, "The Motor Car (Convention) Ordinance, No. 25 of 1932 as amended by the Motor Car (Convention) Ordinance, No.26 of 1935" කියලා. මේක විදේශිකයෙකුට ලබා දුන්නු එකක්.

ඊළඟට, ඔබතුමා සඳහන් කළ ආකාරයට මේ රටේ සිදුවන හැම අනතුරක්ම විදේශිකයන් නිසා සිදු වෙලා නැහැ. මොකද, ඉතා සුළු පිරිසක් තමයි, මෙහෙම බලපත්‍ර අරගෙනත් තිබෙන්නේ. කොහොම වුණත්, ඒක එහෙමමයි කියලා අපට විශ්වාස කරන්න බැහැ. මා දන්නා විධියට, මෑත කාලයේදී සංචාරකයන්ට බලපත්‍ර ලබා දීම නිසා වෙච්ච අනතුරු නම් වාර්තා වෙලා නැහැ. ඒ නිසා ඒක ඒ විධියටම අපට පිළිගන්න බැහැ. ඒ වාගේම, ඔබතුමා තවත් තැනක සඳහන් කරලා තිබෙනවා, රටේ ආරක්ෂක අංශ විසින් විදේශිකයන්ට සහ දේශීය අයට ක්‍රම දෙකකට සලකනවා කියලා. ඇත්තටම එහෙම වෙන්න විධියක් නැහැ. මොකද, මේ රටේ ආරක්ෂාව සම්බන්ධව කාටත් සමානව නීතිය ක්‍රියාත්මක කරන්න, ආණ්ඩුව මැදිහත් වෙනවා. නමුත්, ඔබ විසින් ඉදිරිපත් කරපු මේ යෝජනාවේ සඳහන් අඩුපාඩුකම් පිළිබඳව සලකා බලා කටයුතු කිරීමට, ආණ්ඩුවක් හැටියට අපි මැදිහත් වෙන්න ඕනෑ කියන එක මා විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු මන්ත්‍රීතුමා මගේ නම කියපු නිසා මම පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මේ යෝජනාවට අදාළවද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ඒකටම අදාළව තමයි. මට විනාඩියක් දෙන්න.

ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු දේවල් ඇවිල්ලා තිබෙන්නේ අපෙන් නොවෙයි. මගේ ත්‍රී වීලර් එකක් ධාවනය වෙන්නේ නැහැ. මේ රටේ සමාගම්, මේ රටේ ජීවත් වෙන සිංහල බෞද්ධ, දෙමළ, මුස්ලිම් රටවැසියන්ගෙන් තමයි මේ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙන්නේ. එහෙම නැතුව මේ ප්‍රශ්නය ඉන්දියාවේ කවුරුවත් හෝ වෙන රටක කවුරුවත් ඉදිරිපත් කරලා නැහැ. ඒකේ රුපියල් 100ද, 200 කියලා නැහැ, පාඩුව වෙන්නේ අපේ රටට. ඒ ගැන අපි කථා කරන්නේ. එහෙම නැතුව මේ අපි ඉදිරිපත් කරපු එකක් නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

[பி.ப. 6.15]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

மூலාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, வெளிநாட்டு சுற்றுலாப் பயணிகளுக்கு சாரதி அனுமதிப்பத்திரம் வழங்குவதை நிறுத்துதல் தொடர்பாக இன்று ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்தமைக்காக கௌரவ சாமர சம்பத் தசநாயக்க அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். உண்மையிலேயே வெளிநாட்டிலிருந்து எங்களுடைய நாட்டுக்கு சுற்றுலாவுக்கு வருகை தருகின்றவர்களால் கிடைக்கின்ற வருமானம் மிக முக்கியமானது. எங்களுடைய நாட்டின் சுற்றுலாத்துறைக்கு அதிகளவு வருமானம் கிடைப்பது European Unionஇல்

இருந்துதான். அதாவது, ஐரோப்பாவில் இருந்துதான் கிடைக்கிறது. நான் கடந்த ஒரு மாத காலமாக ஐரோப்பாவிலே இருந்தேன்.

நான் இங்கு முக்கியமானதொரு விடயத்தைச் சொல்ல வேண்டும். எங்களுடைய நாட்டுக்கு 2019ஆம் ஆண்டிலிருந்து 2025ஆம் ஆண்டுவரை World Bankஆல் US Dollars 58.63 millionஉம், European Unionஆல் US Dollars 28 millionஉம் ASMP Project என்று சொல்லப்படுகின்ற Agriculture Sector Modernization Projectக்குத் தரப்பட்டு இருக்கிறது. இந்த European Unionஇன் காசு மொத்தமாக 16 districtsஇல் பயன்படுத்தப்பட்டு இருக்கின்றது. வடக்கு மாகாணத்திலும் இந்த காசு பயன்படுத்தப்பட்டு இருக்கின்றது. இதில் நடைபெற்ற ஊழலை நான் ஆதாரத்தோடு முன்வைக்கின்றேன். கட்டிடமொன்றை ஒரு வருடத்துக்கு வாடகைக்கு எடுத்து, அந்தக் கட்டிடத்துக்கு 200 இலட்சம் - 2 கோடி - செலவழித்து paint அடித்திருக்கிறார்கள். இதோ! அதற்குரிய ஆதாரம் இருக்கிறது. ஒருவர் விஜிதன். மற்றையவர், Dr. Rohan Wijekoon. இவர்தான் அந்த projectஇன் Director. ஒரு buildingஐ வாடகைக்கு எடுத்து, அதற்கு paint பண்ணுவதற்கு 2 கோடி பணம் செலவழிக்கப்பட்டு இருக்கின்றது. இது European Union தந்த காசு! நாங்கள் இப்பொழுது வெளிநாட்டில் இருந்து வருகின்றவர்கள் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාවට අදාළව කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you.

வெளிநாட்டிலிருந்து எங்களுடைய நாட்டுக்கு வருகின்ற காசு சம்பந்தமாகத்தான் நான் கதைக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන දේවල් යෝජනාවට අදාළ නැහැ නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, பொறுங்கள்!

நான் இங்கு சொல்ல வருகின்ற முக்கியமான விடயம் என்னவென்றால், இப்படி European Unionஇல் இருந்து வருகின்ற பணத்தை எங்களுடைய நாட்டில் கொள்ளையடித்தும், இந்த அநுர அரசாங்கம் அதற்கு எதிராக ஒரு நடவடிக்கையையும் எடுக்கவில்லை என்றால், எவ்வாறு வெளிநாட்டில் இருக்கின்ற மக்கள் இந்த நாட்டுக்கு வருவார்கள் என்பதை யோசித்துப் பாருங்கள்! எங்களுடைய நாட்டில் வெளிநாட்டு சுற்றுலாப் பயணிகளுக்கு three-wheeler ஓடுவதற்கு licence கொடுப்பது சம்பந்தமாக நாங்கள் கதைக்கின்றோம். இப்போது நாங்கள் அது தொடர்பில் மட்டுமல்ல, இப்படி வெளிநாடுகள் தருகின்ற உதவிப் பணத்தை எப்படி களவு எடுக்கிறார்கள் என்பது தொடர்பாகவும் கதைக்க வேண்டும். இந்த ஆதாரத்தோடு சேர்த்து ஊழலுடன் சம்பந்தப்பட்ட ஐந்து ஆதாரங்களை நான் இந்தச் சபையில் சமர்ப்பித்து இருக்கின்றேன். அநுர அரசாங்கம் இதுவரை வடக்கு மாகாணத்தில் ஓர் ஊழலைக்கூட கண்டுபிடிக்கவில்லை. வீடு ஒன்றை ஒரு வருட வாடகைக்கு எடுத்து, அதனை renovate பண்ணுவதற்காக 2 கோடியை செலவழித்து இருக்கிறார்கள். அதற்குப் பிறகு, இன்னொரு வீட்டை renovate பண்ணுவதற்காக 73 இலட்சத்தை செலவழித்து இருக்கிறார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තත්පර විස්සක් දෙන්න.

அந்த projectஇன் Director உடைய பெயர் Dr. Rohan Wijekoon. இவர்தான் அந்த நேரத்தில் இருந்த Project Director. இந்த ஊழல் சம்பந்தமான ஆவணத்தை நான் **table*** பண்ணுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න. ගරු මන්ත්‍රීතුමනි, යෝජනාවට අදාළව නොවෙයි, ඔබතුමා කථා කරන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පර දහයක් දෙන්න. ඉවර කරනවා; I will wind up.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
இனிமேலும் அநுர அரசாங்கம் ஊழலுக்கு எதிராக நடவடிக்கை எடுக்கவில்லை என்றால், நான் நினைக்கின்றேன், இன்னும் 5 வருடங்களில் வடக்கு மாகாணத்தில் அரசாங்கத்தால் எந்தவொரு விடயத்தையும் செய்ய முடியாமல் இருக்கும் என்று. நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිතිඥ තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 6.19]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාවේ සඳහන් කාරණාවේදී පළමුවෙන්ම අපි අවබෝධ කර ගන්න ඕනෑ, ගුවන් තොටුපළේදී රියැදුරු බලපත්‍රය ලබා දෙන්නේ, ත්‍රි රෝද රථ සහ බර වාහන හැර අනෙකුත් වාහන සඳහායි කියන එක. ඒ වාගේම තමයි, ගුවන් තොටුපළේදී මේ බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රමාණය බැලුවොත්, අගෝස්තු මාසයේ පැමිණි සංචාරකයින්ගෙන් සියයට 1.16කුත්, සැප්තැම්බර් මාසයේ පැමිණි සංචාරකයින්ගෙන් සියයට 1.23කුත්, ඔක්තෝබර් මාසයේ පැමිණි සංචාරකයින්ගෙන් සියයට 1.19කුත් වශයෙන් තමයි මේ බලපත්‍ර ලබා ගැනීම කරලා තිබෙන්නේ.

කොහොම වුණත්, ත්‍රි රෝද රථ සම්බන්ධයෙන් තමයි මෙතැනදී දිගටම කථා වුණේ. ත්‍රි රෝද රථ සඳහා ගුවන් තොටුපළේදී බලපත්‍ර ලබා දෙන්නේ නැහැ. ඒක විශේෂ අවස්ථාවක්. ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා කිව්වා වාගේම අපි මේ සම්බන්ධයෙන් -මෝටර් රථ පිළිබඳව- වන 1949 ජිනීවා සම්මුතියට අත්සන් කර තිබෙනවා. ඒ සම්මුතියට අත්සන් කරනු ලබන පාර්ශ්ව ඒ සම්මුතිය අනුව බැඳෙනවා. අපට ජාත්‍යන්තරයත් එක්ක එක ගමනක් යන්න වෙනවා. ජාත්‍යන්තරයේ ගමන් මඟට වඩා වෙනස් ගමනක් යන්න අපට බැහැ. අපි ජාත්‍යන්තර මිනුම් දඬු අනුගමනය කරන්න ඕනෑ. ඒ measuresවලට අනුව තමයි අපේ රටේත් හැම දෙයක්ම සිදු කර ගන්න ඕනෑ. ලෝකය එක අතකට යද්දී අපට විතරක් උඩුගම් බලා යන්න බැහැ. ඉතින්, මේ වාගේ කාරණා නිසා ඒවාට අනුගත වෙමින් තමයි අපට අපේ නීති පද්ධතිය සකස් කර ගන්න වෙන්නේ. අප ඒ හැම දෙයකින්ම ජාත්‍යන්තරය හා බැඳිලා ඉන්න නිසා අපට ඒවා වෙනස් කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ සම්මුතියට අනුව ත්‍රි රෝද රථ සඳහා රියැදුරු බලපත්‍ර නිකුත් කරන්නේ Automobile Association of Ceylon කියන ආයතනයයි. මෙන්න මේ කියන ආයතනය තමයි ඒ බලපත්‍රය ලබා දෙන්නේ. ලංකාවේ, ඒ බලපත්‍රය ලබා ගත්තු අයට ත්‍රි රෝද රථ නිකුත් කරන, සංචාරකයන් සඳහා ත්‍රි රෝද රථ ලබා දෙන ආයතන කිහිපයක් තිබෙනවා. මේ හැම ආයතනයක්ම පැහැදිලිව අවධාරණය කරනවා, මේ කියන Automobile Association of Ceylon ආයතනයෙන් නිකුත් කරනු ලබන -මා මේ පෙන්වන ආකාරයේ- සහතික පත්‍රයක් තිබෙන අයට පමණයි ධාවනය සඳහා ත්‍රි රෝද රථ ලබා දෙන්නේ කියලා. ලංකාවේ ත්‍රි රෝද රථ සේවා සපයන ආයතන මේ බලපත්‍රයක් නොමැති කිසිම කෙනෙකුට -සංචාරකයන් සඳහා- ත්‍රි රෝද රථයක් ලබා දෙන්නේ නැහැ.

ඒ වාගේම කිව්වා, යුරෝපීය රටවල ත්‍රි රෝද රථ නැහැ කියලා. ත්‍රි රෝද රථ කියලා කියන මා පෙන්වන මෙන්න මේ ආකාරයේ වාහන එම රටවල තිබෙනවා. ඒ වාහන අපේ රටේ වාගේ පෙට්‍රල්, ඩීසල්වලින් ධාවනය වන ඒවා නොවෙයි. විදුලි බලයෙන් ක්‍රියා කරන ඒ වාහනත් රෝද තුනේ වාහන. ඒ අය ඒවා ඉතාම හොඳින් පාවිච්චි කරනවා. අපි ඒ ගැන දන්නවා. අපි ඒක දැකලා තිබෙනවා. යුරෝපීයන්ට ඒකේ අත්දැකීම් තිබෙනවා. ඒ රටවලත් මෙවැනි වාහන භාවිත කරනවා.

විදේශිකයෙකු ඇවිල්ලා මේ රටේදී අනතුරක් සිදු වුණොත් මොකක්ද කරන්නේ? විදේශිකයෙකු ඇවිල්ලා රථයක් පැදවීමෙන් විතරක් නොවෙයි, වෙන මොන ආකාරයකින් වරදක් සිදු වුණත්, ඒ වැරදි සම්බන්ධයෙන් රජය ක්‍රියා කරන්න ඕනෑ ආකාරය පිළිබඳව අපේ රටේ නීති පොත්වල සඳහන්ව තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා සභාවට බාධා කරන්න එපා.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, එහිදී ඒ නීති පොත්වල තිබෙන කාරණාවලට අනුව අපේ රටේ හැම නීතියක්ම ක්‍රියාත්මක කරනවා. රථ වාහන නීතිය විතරක් ඒකෙන් මිදෙන්නේ නැහැ. ඒ හැම නීතියක්ම මේ රටේ තිබෙන අණ පනත්වලට අනුව ක්‍රියාත්මක කරන්න හැකියාව තිබෙනවා. ඒක රථ වාහන නීතියේදී විතරක් වෙනස් වෙන්නේ නැහැ. මා නීතිඥවරියක හැටියට කටයුතු කරන නිසා ඒ ගැන පැහැදිලිව, අත්දැකීම් සහිතවයි කියන්නේ. ඕනෑම නීතියක් කඩ කිරීමක් සිදු වෙනවා නම් මේ රටේ තිබෙන අණ පනත් ඒවාට අදාළ වෙනවා. ඒ සඳහා තමයි ඇත්තටම බලපත්‍රයක් තාවකාලිකව හෝ නිකුත් කිරීම කරන්නේ. එහෙම නිකුත් කළේ නැත්නම් එවැනි අය නීතියකට ඇතුළත් කර ගන්නවත් හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ ආකාරයේ නියාමනයක් කිරීම ඉතාම හොඳයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.23]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මම ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන කථික ලැයිස්තුවේ හිටපු සමහරු accident කර ගත්තා කියලායි මට හිතෙන්නේ.

ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට මම ඉතාම ඉක්මනින් උත්තර දීගෙන යන්නම්. පළමුවෙන්ම, ලංකාවේ සංචාරක කර්මාන්තය සහ ඒ කර්මාන්තයේ යෙදෙන වෘත්තිකයන් ආරක්ෂා කර ගැනීම කියන ඔබතුමාගේ අරමුණ අපි අගය කරනවා. නමුත්, ඔබතුමා නිශ්චිත වශයෙන් මතු කරන කාරණය සම්බන්ධව ගත්තොත්, අපි කිසිසේත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළින් ත්‍රි රෝද රථ සඳහා සහ heavy vehicles සඳහා - ඒ කියන්නේ බස් රථ සඳහා - driving licences ලබා දෙන්නේ නැහැ. මට කලින් කථා කරපු අයත් මේ ගැන කිව්වා. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් drving licences ලබා දෙන්නේ කාර්, වෑන් සහ බයික්වලට පමණයි.

ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා මෙය අප පටන් ගත්තත්, විදේශීය රියැදුරු බලපත්‍රය පරිවර්තනය කර තාවකාලික බලපත්‍ර ලබා දීමේ සේවාව බණ්ඩාරනායක ගුවන් තොටුපොළේදීම ලබා දිය යුතුයි කියලා තීන්දු කරලා තිබෙන්නේ 2019දීයි කියලා. ඇත්තටම මෙහි මිල ගණන් පිළිබඳව කථා කළොත්, ඒ සඳහා අය කරනු ලැබිය යුතු අය ප්‍රමාණය සම්බන්ධයෙන් අප දැනුත් අනුගමනය කරන, 2301/17 සහ 2022 ඔක්තෝබර් 10 දිනැති ගැසට් පත්‍රයෙහි පළ කර ඇති නියෝගවල තමයි දක්වා තිබෙන්නේ, රුපියල් 2,000 කියන එක. ඒ නිසා අප දැනට ඒ සම්බන්ධයෙන් අය කරන්නේ, 2022 ඔක්තෝබර් 10 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් මිල ගණන්. එහි තමයි රුපියල් 2,000ක් කියලා සඳහන් කර තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මා නැවත ඔබතුමාට කියන්න ඕනෑ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී ත්‍රි රෝද රථ සඳහා හෝ heavy vehicles සඳහා කිසිම driving licence එකක් ලබා දෙන්නේ නැති බව.

මෙය අප ආරම්භ කරපු දෙයක් නොවෙයි. අපට කලින් ආණ්ඩු දෙකක් විතර මේ තීන්දුව අරන් කරන්න බැරි වෙලා තිබෙනවා. නමුත්, අපි ඒක පටන් ගැනීම කළා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමියත් මීට අදාළ සංඛ්‍යාලේඛන කිහිපයක් කිව්වා. ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට ඔබතුමාට ඒක ඇහෙන්නේ නැතිව ඇති, ඔබතුමාගේ පැත්තේ කථිකයෙකු අතින් මෙතැන වාහන accident එකක් වාගේ දෙයක් වුණු නිසා. ඒ හින්දා මමත් ඒ කාරණය ගැන කියන්නම්. මේ රියැදුරු බලපත්‍ර ලබා දීමෙන් ඇත්තටම වෙන්නේ සංචාරකයන් පැමිණීම ප්‍රවර්ධනය වීමක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, ඇල්ලට එන සංචාරකයින් මිලියන්, බිලියන් සංචාරකයින් නොවෙයි කියලා. මා හිතන විධියට, ඔබතුමා ඇල්ල සංචාරක පුරවරය නිර්මාණය කිරීමට ගොඩක් මැදිහත් වුණු, ඒ ප්‍රදේශයේ නායකයෙක්. අපි වුණත් දන්නවා, පිට රටවලට ගියාම දැන් ඉස්සර වගේ ලොකුවට tourist guidesලා තියාගෙන ලොකුවට සංචාරය කරන්නේ නැහැ කියලා. ගොඩක් මිනිස්සු දැන් Internet එකෙන් බලාගෙනයි එන්නේ. ඒ නිසා ඒ මිනිස්සු දන්නවා තනිවම සංචාරය කරන්න. ඔය ගාල්ලේ මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා ඇති. මොකද, එතුමාත් ගොඩක් ලොකු සංචාරක පුරවරයකයි ඉන්නේ. අපි ඕනෑවට වඩා සීමා දැම්මොත් සංචාරකයන් එන්නේ නැති වෙයි. ලංකාව විතරක් නොවෙයි නේ, travel කරන්න තිබෙන්නේ. ඒ නිසා මේක වටිනා දෙයක්. මට වඩා ඔබතුමා සංචාරක කර්මාන්තය පිළිබඳව දන්නවා කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය මෙයයි. අපි survey එකක් කරපු නිසා දන්නවා, මෙම සේවාව ලබා ගන්නේ දීර්ඝ කාලයක් නවාතැන් ගන්නා හෝ නැවත නැවත පැමිණෙන සංචාරකයන් වැනි විශේෂිත කණ්ඩායමක් පමණයි කියලා. දැන් එන සංචාරකයන්ගෙන් සියයට 99ක්ම මේ බලපත්‍රය ලබා ගන්නේ නැහැ. එම නිසා ඔබතුමා කිව්ව විධියට මේ මඟින් රැකියාවලට විශාල බාධාවක් වෙලා තිබෙනවා කියන එකේ එතරම් විශාල තර්කයක් නැහැ. නමුත් ඔබතුමා ලොකු තර්කයක් ඉදිරිපත් කළා, 100ක්, 200ක් නැති වුණත් පාඩුවක් තමයි වෙන්නේ කියලා. ඔබතුමාට පිළිගන්න වෙනවා, සංචාරක කර්මාන්තය තනිකරම දේශීය කර්මාන්තකරුවන් මඟින්ම ක්‍රියාත්මක වන දෙයක් නොවෙයි, අනිවාර්යයෙන්ම ඒ සඳහා යම්කිසි විදේශීය මැදිහත් වීමක් තිබෙනවා කියලා. එවැනි තත්ත්වයක් තමයි ලෝකයේ හැම තැනකම තිබෙන්නේ. ඒ නිසා මම හිතනවා, tourist-friendly country එකක් විධියට, අපේ රටේ මිනිසුන්ගේ හිනාව, අපේ රටේ මිනිසුන් තුළ තිබෙන උදව් පදව් කරන ගතිය, ඒ වාගේම අපේ රටේ කඳුකරය, සීතල, කෝච්චි ආදි මේ ඔක්කෝම එක්ක මේ facility එකත් positive එකක් මිසක් සංචාරක කර්මාන්තයට negative එකක් වෙන්නේ නැහැ කියලා. නමුත්, ඔබතුමා ඉදිරිපත් කළ කාරණය සංචාරක අමාත්‍යාංශය හැටියට අපට කිව්වාට පස්සේ අපි සංචාරක වෘත්තිකයන් සමඟත් කථා කළා. ඒ අනුව මෙම මිල ගණන් වැඩි කරන්න අපි පැහැදිලි තීන්දුවක් ගත්තා. ඒක ඇත්ත. අපි ඒක පිළිගන්නවා. මොකද, මෙය ගැසට් කරලා තිබෙන්නේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හෝ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති කාලයේයි. ඒ කාලයේ තමයි මේ කියන රුපියල් 2,000ක් මිල නියම කරලා තිබෙන්නේ. අපිත් පිළිගන්නවා, දැන් එය පොඩි ගණනක් කියලා. මොකද, රුපියල් 2,000ක් කියන්නේ යූරෝ 6ක් වගේ මුදලක් නේ ගරු මැතිතුමනි, එම නිසා ඒ මිල ගණන් වැඩි කරන්න අපි දැන් තීන්දුවක් අරගෙන තිබෙනවා. මේක ගැසට් වීමට නියමිතව තිබෙන එකක්. පරිවර්තන ප්‍රශ්න නිසාත් මෙහි පොඩි ප්‍රමාදයක් වෙලා තිබෙනවා. සරලව ගත්තොත්, මාසයකට එන සංචාරකයෙකුට රුපියල් 15,000කට තමයි එම බලපත්‍රය දෙන්න යන්නේ. මාස 2ක් සිටින සංචාරකයෙකුට රුපියල් 21,000කටත්, මාස දෙකකට වැඩි කාලයක් සිටින සංචාරකයෙකුට රුපියල් 30,000කටත්, මාස 6කට වඩා වැඩි අවුරුද්දක් දක්වා සිටින කෙනෙකුට රුපියල් 45,000කටත් තමයි අපි මේ බලපත්‍රය දෙන්න යන්නේ. ඔන්න ඔය විධියට තමයි අපි එය දෙන්න හදන්නේ. අපි හිතනවා, ඒ ගැසට් එක ඉතා ඉක්මනින් අනුමත කර ගත්තාම, යම්කිසි සීමා වීමක් වෙයි කියලා.

ඒ වාගේම මෙහි තවත් කාරණයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන ත්‍රි රෝද රථ සඳහා licences නිකුත් කරන්නේ Automobile Association of Ceylon කියන ආයතනයෙන්. ඒ ගැන අපේ ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියත් කිව්වා. ඒගොල්ලෝ තමයි ලංකාවේ valid විධියට එකී ත්‍රි රෝද රථ සඳහා ඒ licences ලබා දෙන්නේ. ඇත්තටම ඒකට මෝටර් වාහන පනත තුළ නීතියක් හදා දීලා නැහැ. නමුත්, 1949දී මෝටර් රථ පිළිබඳ ජිනීවා සම්මුතිය අනුව තමයි Automobile Association of Ceylon ආයතනයට මේ බලය ලැබී තිබෙන්නේ. මේක නීත්‍යානුකූලම බලයක්ද, නැද්ද කියන එක සම්බන්ධවත් යම් කිසි විවාදයක් තිබෙනවා. මේක අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ තිබුණු practice එකක්. ඒක ජිනීවා සම්මුතිය අනුව තමයි යන්නේ. නමුත් ඔබතුමාත් දන්නවා, ඊට පසුව 1968 වියානා සම්මුතිය ලෝකයේ රටවල් අතිවිශාල ප්‍රමාණයක් සම්මත කර තිබෙන බව. දැන් ලෝකය පුරාම යන්නේ වියානා සම්මුතිය අනුවයි. එතැනට තමයි ලංකාව ඉදිරියේදී යා යුතු වෙන්නේ. විදේශීය සංචාරක සමාගම්, විවිධ සමාගම් BoI ව්‍යාපෘති යටතේ ඇවිල්ලා කාර් rent කරනවාද, hotels කරනවාද කියලා අපි දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා කියපු අර වාහන rent කරන සමාගම එහෙම කටයුතු කරන්නේ BoI එක හරහා ඇවිල්ලා නම්, ඒකට මට නීත්‍යානුකූලව කියන්න දෙයක් නැහැ. නමුත් නීති විරෝධීව කරනවා නම්, විදේශිකයෙක් කළත්, දේශීය කෙනෙක් කළත් ඒක වැරදියි කියලා අපි හිතනවා.

අවසාන වශයෙන් මට ගරු මන්ත්‍රීතුමාට කියන්න තිබෙන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් විදේශිකයන්ට driving licences ලබා දෙන්නේ නැහැ කියන එකයි. දෙවනුව, අපි මෙහි මිල වැඩි කරන්න යනවා මම ඔබතුමාට කියපු විධියට. මම හිතන විධියට, විදේශිකයන් ලංකාවට ඇවිල්ලා වාහන හප්පා ගන්නවා කියන පණිවුඩය එච්චර හොඳ පණිවුඩයක් නොවෙයි. ගොඩක් විදේශිකයන් අපට වඩා හොඳට ඒගොල්ලන්ගේ රටවලදී වාහන පදවනවා. අපි අපේ රටේ traffic discipline තවත් හදන්න ඕනෑ. මට ඒ ටික තමයි කියන්න තිබෙන්නේ.

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා මේ ටික කියන්න අපට අවස්ථාවක් ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවලදී අදාළ මාතෘකාවට අනුව කථා කරන කථිකයන් නම් කරගැනීම සඳහා සැලකිලිමත් වෙන්න කියන කාරුණික ඉල්ලීම සිදු කරනවා.

***එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ඔක්තෝබර් 23 වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 12 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி. ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2025 ஒக்ரோபர் 23ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 12, புதன்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Wednesday, 12th November, 2025, pursuant to the Resolution of Parliament of 23rd October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.